207 වන කාණ්ඩය - 4 වන කලාපය
தொகுதி 207 - இல. 4
**Volume 207 - No. 4**

2012 මාර්තු 06වන අඟහරුවාදා
2012 மார்ச் 06, செவ்வாய்க்கிழமை
**Tuesday, 06th March, 2012**

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ප්‍රථම වාර්තාව සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පවත්වන ලද විමර්ශනයන්හි ප්‍රගතිය පිළිබඳ වාර්තා

වරප්‍රසාද :

සභාගර්භ ආලින්දයේදී පහර දීම

ගරු පාලිත රංගෙ බණ්ඩාර මැතිතුමා විසින් කරන ලද තර්ජනය

නැඟෙනහිර පළාතේ පුරාවිද්‍යාත්මක නටබුන් ප්‍රඥප්ති කෙටුම්පත

**විගණකාධිපතිවරයාගේ වාර්තාව**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**

සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය (සංස්ථාගත කිරීමේ)- [ගරු නාමල් රාජපක්ෂ මහතා]- පළමුවන වර කියවන ලදී

ද පේරන්ට්ස් පදනම (සංස්ථාගත කිරීමේ)- [ගරු නාමල් රාජපක්ෂ මහතා]- පළමුවන වර කියවන ලදී

පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල විශ්‍රාමිකයන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ)- [ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා]- පළමුවන වර කියවන ලදී

**සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත:**

නියෝග

**කල්තැබීමේ යෝජනාව:**

භික්ෂූන් වහන්සේලාට නොමිලේ ප්‍රවාහන පහසුකම්

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**

அரசாங்க பொறுப்பு முயற்சிகள் பற்றிய குழுவினது முதலாவது அறிக்கை தொடர்பான இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவினது முன்னேற்ற அறிக்கைகள்

சிறப்புரிமை:

சபாமண்டப ஓய்விடத்தில் தாக்குதல் நடத்தியமை

மாண்புமிகு பாலித ரங்கே பண்டாரவினால் விடுக்கப்பட்ட அச்சுறுத்தல்

கிழக்கு மாகாணத்தின் தொல்பொருள் சிதைவுகள் வரைவு நியதிச்சட்டம்

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**

சமஸ்த லங்கா சாசனாரக்சக மண்டலய (கூட்டிணைத்தல்) - [மாண்புமிகு நாமல் ராஜபக்ஷ]- முதன்முறை மதிப்பிடப்பட்டது

த பேரண்ட்ஸ் மன்றம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு நாமல் ராஜபக்ஷ]- முதன்முறை மதிப்பிடப்பட்டது

பாராளுமன்றத்தின் இளைப்பாறிய பணியாளர் சங்கம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க]- முதன்முறை மதிப்பிடப்பட்டது

**கடல்சார் தீழ்ப்புத் தடைச் சட்டம் :**

ஒழுங்குவிதிகள்

**ஒத்திவைப்புப் பிரேரணை:**

பிக்குமாருக்கு இலவச போக்குவரத்து வசதிகள்

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Reports on the Progress of Investigations carried out by the Commission to Investigate Allegations of Bribery or Corruption on the First Report of the Committee on Public Enterprises

Privilege:

Attack in the Lobby

Threat posed by Hon. Palitha Range Bandara

Archaeological Remains Draft Statute of the Eastern Province

AUDITOR-GENERAL’S REPORT

ORAL ANSWERS TO QUESTIONS

PRIVATE MEMBERS' BILLS:

Samastha Lanka Shasanarakshaka Mandalaya (Incorporation) – [The Hon. Namal Rajapaksa ] - Read the First time

The Parents Foundation (Incorporation) – [The Hon. Namal Rajapaksa] – Read the First time

Parliament Staff Pensioners’ Association (Incorporation) – [The Hon. (Prof.) Rajiva Wijesinha] – Read the First time

MARINE POLLUTION PREVENTION ACT:

Regulations

ADJOURNMENT MOTION:

Free Transport Facilities for Buddhist Monks

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

*2012 මාර්තු 06වන අඟහරුවාදා*
*2012 மார்ச் 06, செவ்வாய்க்கிழமை*
*Tuesday, 06th March, 2012*

***අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය. නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.00 p. m.,* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *in the Chair.*

# නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

## I

### පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ප්‍රථම වාර්තාව සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පවත්වන ලද විමර්ශනයන්හි ප්‍රගතිය පිළිබඳ වාර්තා
அரசாங்க பொறுப்புமுயற்சிகள் பற்றிய குழுவினது முதலாவது அறிக்கை தொடர்பான இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவினது முன்னேற்ற அறிக்கைகள்
REPORTS ON THE PROGRESS OF INVESTIGATIONS CARRIED OUT BY THE COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION ON THE FIRST REPORT OF THE COMMITTEE ON PUBLIC ENTERPRISES

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

හයවැනි පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ප්‍රථම වාර්තාව සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පවත්වන ලද විමර්ශනයන්හි ප්‍රගතිය පිළිබඳ වාර්තා දෙකක් පාර්ලිමේන්තුව වෙත ලැබී ඇති බව දැන්වීමට කැමැත්තෙමි.

මෙම වාර්තා අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි මම නියෝග කරමි.

*වාර්තා:*
*அறிக்கைகள்:*
*Reports:*

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**
**இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு**
**COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION**
තැ. පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 7. ● த.பெ.1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 7.● P. O. Box 1431, 36, Malalasekera Mawatha, Colombo 7.
දුරකථන අංක / தொலைபேசி / Telephone: 2559923, 2596360 ෆැක්ස් / பெக்ஸ் / Fax: 2596014

මගේ අංකය: බිසි/2950 -10/07

2012.02.02

පාර්ලිමේන්තුවේ මහ ලේකම්
පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ.

<u>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ප්‍රථම වාර්තාව</u>

2008.09.28 වන දින මෙම කොමිෂන් සභාව වෙත එවන ලද පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ප්‍රථම වාර්තාවේ ඇතුළත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සම්බන්ධයෙන් කරන ලද විමර්ශනය අවසන් කර ඇති අතර, එකී විමර්ශනයේ දී අනාවරණය වූ කරුණු අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ නඩු පැවරීමට ප්‍රමාණවත් නොවන බවට කොමිෂන් සභාව 2011.12.07 දින තීරණය කර ඇති බව කොමිෂන් සභාවේ නියෝග පරිදි දන්වමි.

තවද, ඉහත ආයතනය සම්බන්ධයෙන් කරන ලද විමර්ශනයේ සංක්ෂිප්ත වාර්තාවක් මේ සමග ඉදිරිපත් කරමි.

කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලක්ෂ්මි ජයවික්‍රම
අධ්‍යක්ෂ ජනරාල්
ලක්ෂ්මි ජයවික්‍රම
අධ්‍යක්ෂ ජනරාල්
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන
කොමිෂන් සභාව
අංක. 36, මලලසේකර මාවත,
කොළඹ 07.

<u>ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය</u>

පොදු ව්‍යාපාර කාරක සභා වාර්තාවේ ඇතුළත් කරුණු මත ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සම්බන්ධයෙන් සිදු කරන ලද දූෂණ සම්බන්ධ පරීක්ෂණය.

01. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ පිහිටි ගොඩනැගිල්ලේ ප්‍රමාණවත් ඉඩකඩ තිබියදී ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ මහල් කුලියට ගැනීම.
    i. 1995 වර්ෂයේ දී ශ්‍රීමත් බාරොන් මාවතේ වූ ගොඩනැගිල්ලේ ඇති වූ ගින්න හේතුවෙන් ගොඩනැගිල්ලේ තත්වයේ ඇති වූ අඩුපාඩුකම්.
    ii. ආයෝජන මණ්ඩලයේ සිටින සේවකයින් සඳහා ප්‍රමාණවත් ඉඩකඩ නොතිබීම.
    iii. ආයෝජකයන්ට රට ගාල් කිරීමට ප්‍රමාණවත් ඉඩකඩ පහසුකම් සැපයීමට නොහැකි වීම.
    iv. එම ගොඩනැගිල්ලේ සිට ජනාධිපති මන්දිරය නිරීක්ෂණය කිරීමට හැකි වීම.

    ඉහත කරුණු සැලකිල්ලට ගෙන ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ මහල් බදු ගෙන ආයෝජන මණ්ඩලය එහි රැගෙන යාම සඳහා 1997 ජූලි 23 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

02. හොරණ ස්ථාපනය කර ඇති මර්බොක් ලංකා සමාගම ආරම්භ කිරීමේ දී විදුලි බිල ප්‍රතිපූර්ණය කිරීම සඳහා ගිවිසුම් ගත වීම.
    විදුලි බිල ප්‍රතිපූර්ණය කිරීමේ කරුණ සම්බන්ධයෙන් විමර්ශනය කළද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 70වන වගන්තිය යටතේ නඩු පැවරීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි නොමැත.

[ගරු නියෝජ්‍ය කථානායකතුමා මහතා]

**03. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාවට වැඩියෙන් සේවකයින් බඳවා ගැනීම.**

සිදු කරන ලද විමර්ශනයට අනුව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව වන්නේ 1253 දෙනෙකි. නමුත් සේවය සඳහා බඳවා ගෙන ඇති සේවක සංඛ්‍යාව වන්නේ 1155කි. මේ අනුව අනුමත සේවක සංඛ්‍යාව අභිබවා සේවකයින් බඳවා ගෙන නොමැත.

**04. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් මිලේනියම් සිටි නිවාස යෝජනා ක්‍රමයේ දී නිවස සහිත ඉඩමේ ඉඩම සඳහා පමණක් ඔප්පු ලිවීමෙන් මුද්දර ගාස්තු රජයට අහිමිවීම.**

විමර්ශනයේ දී ඉදිරිපත් වූ කරුණු අනුව මෙම නිවාස යෝජනා ක්‍රමයේ නිවාස ඉදිකර ඇත්තේ අඩු අදායම් ලාභීන් සඳහා වේ. නිවාස ඉදිකිරීම සඳහා එකවර මුදල් ගෙවීමට එම ගැනුම්කරුවන්ට මුදල් නොමැති බැවින් ඉමම කොටස ඇපයට තබා ණයක් ලබා ගැනීමේ පහසුකම සපයා දීම සඳහා ඉඩම් කොටස පමණක් මුලින් ගැනුම්කරුවන්ට ලබාදී ඇත. එය ඇපයට තබා ලබා ගත් බැංකු ණය මුදලින් නිවසේ ඉදිකිරීම් සිදුකර ඇත. ඔප්පු ලියන අවස්ථාවේ නිවාස ඉදිකර නොතිබීම නිසා ඔප්පුවට එය ඇතුළත් කර නොමැත.

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**

இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சாத்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு

**COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION**

තැ. පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 7. • த.பெ.1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 7. • P. O. Box 1431, 36, Malalasekera Mawatha, Colombo 7.
දුරකථන අංක / தொலைபேசி / Telephone: 2559923, 2596360 ෆැක්ස් / பெக்ஸ் / Fax: 2596014

මගේ අංකය: බීසී/2950 -02/07

2012.02.02

පාර්ලිමේන්තුවේ මහ ලේකම්
පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ.

<u>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ප්‍රථම වාර්තාව</u>

2007.08.31 වන දින මෙම කොමිෂන් සභාව වෙත එවන ලද පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ප්‍රථම වාර්තාවේ ඇතුළත් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සම්බන්ධයෙන් කරන ලද විමර්ශනය අවසන් කර ඇති අතර, එකී විමර්ශනයේ දී අනාවරණය වූ කරුණු අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ නඩු පැවරීමට ප්‍රමාණවත් නොවන බවට කොමිෂන් සභාව 2010.03.25 දින තීරණය කර ඇති බව කොමිෂන් සභාවේ නියෝග පරිදි දන්වමි.

තවද, ඉහත ආයතනය සම්බන්ධයෙන් කරන ලද විමර්ශනයේ සංක්ෂිප්ත වාර්තාවක් මේ සමග ඉදිරිපත් කරමි.

කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලක්ෂ්මි ජයවික්‍රම
අධ්‍යක්ෂ ජනරාල්
ලක්ෂ්මි ජයවික්‍රම
අධ්‍යක්ෂ ජනරාල්
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන
කොමිෂන් සභාව
අංක. 36, මලලසේකර මාවත,
කොළඹ 07.

<u>ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව</u>

**පොදු ව්‍යාපාර කාරක සභාව මගින් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට අදාළව සඳහන් කර ඇති කරුණු සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂණය**

**1. රු.මිලියන 22ක් වියදම් කර විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සඳහා ප්‍රමිතියෙන් තොර සංයුක්ත සැලැස්මක් සකස් කිරීම.**

විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට ජාතික විදුලි සංදේශ ප්‍රතිපත්තියක් හා සංයුක්ත සැලැස්මක් සකස් කිරීම සඳහා ඇමෙරිකා එක්සත් ජනපදයේ ඩේවිඩ් එන් ටවුන්සෙන්ඩ් ඇන්ඩ් ඇසෝසියේටඩ් සමාගමට රු.මිලියන 22ක් ගෙවා ඇති අතර, එම කාර්යය 2002.10.10 දින අංක 02/1838/125/035 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අනුමත කර නැවත ඊ ශ්‍රී ලංකා ආරම්භයත් සමග 2003.02.06 දිනැති අංක 03/0239/199-035(1) FC/127 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි නැවත දැනුම් දෙනතුරු කල් තබා ඇත.
මෙහි දී මෙම ගෙවීම් තුළින් විදුලි සදංදේශ නියාමන කොමිෂන් සභාවේ කිසියම් නිළධාරියෙකු වෙත යම්කිසි වාසියක් සැලසුනේද යන්න පිළිබඳව සනාථ වී නොමැත.

**2. අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන නිළධාරීන් හා සේවකයන් වෙත වැටුප් වැඩිකිරීම හා අනෙකුත් දීමනා ගෙවීම.**

විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා තීරණ අනුව නිළධාරීන් හා සේවකයන් වෙත වැටුප් වැඩිකිරීම හා අනෙකුත් දීමනා ගෙවීම සම්බන්ධයෙන් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා පනතේ ඇති ප්‍රතිපාදන පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුවෙන් විමසා ඇති අතර, නීතිපති දෙපාර්තමේන්තුවේ අර්ථකථනයන් අනුව කාර්යමණ්ඩල නිළධාරීන් හා සේවකයන් සඳහා වැටුප් වැඩිකිරීම හා දීමනා ගෙවීම සිදුකර ඇත.
මෙසේ කටයුතු කිරීම හේතුවෙන් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කිසියම් නිළධාරියෙකුට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ කටයුතු කිරීමට තරම් ප්‍රමාණවත් කරුණු අනාවරණය වී නොමැත.

**3. 2003 වර්ෂයේ දී මිලියන 140ක භාණ්ඩාගාර බිල්පත් හා මිලියන 30ක ස්ථිර තැන්පත් ආයෝජනය කිරීම.**

විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් කෙටි කාලීන අතිරික්ත මුදල් පොලියක් ලැබෙන අකාරයෙන් ආයෝජනය කළයුතු බවට විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ගන්නා ලද තීරණයක් අනුව, වැඩිම පොලියක් ලැබෙන ආකාරයෙන් රු.මිලියන 140ක් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර ඇති අතර, රු.මිලියන 30ක් ලංකා බැංකුවේ ආයෝජනය කර ඇති බවටත් අනාවරණය වී ඇත. එකී තීරණය නිසා එකී කොමිසමට හිතාමතා පාඩුවක් හෝ එහි පුද්ගලයෙකුට අයුතු ලාභයක් ලබා ගැනීම සඳහා සනාථ කිරීමට කිසිද කරුණක් ඉදිරිපත් නොවිය.

**4. 2004.12.31 දිනට රාජ්‍ය ආයතන හැර නිතර පාවිච්චි කරන්නන්ගෙන් අවුරුදු 02ක කාලසීමාව තුළ හිඟ වශයෙන් කොමිෂන් සභාවට ලැබිය යුතු රු.39,280,407/= ක මුදල අයකර නොගැනීම.**

විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට වර්ෂ 02කට වඩා වැඩි කාලසීමාවක් තුළ හිඟ මුදල් වශයෙන් පොදු සංඛ්‍යාත භාවිත කරන්නන්ගෙන් හා ධීවර අමාත්‍යංශය මගින් ක්‍රියාත්මක කළ වැඩසටහන් යටතේ ධීවරයන් වෙත ලබා දී ඇති රේඩියෝ කට්ටල වෙනුවෙන් මෙසේ මුදල් අයවිය යුතුව ඇත. මෙම මුදල් අදාළ තැනැත්තන්ගෙන් අයකර ගැනීමට විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව කටයුතු කර ඇති අතර, ඒ අනුව රු.1,436,679/17ක මුදලක් අයකරගෙන ඇත.
එසේම අනෙකුත් මුදල් ද අයකර ගැනීමට මෙන්ම, සංඛ්‍යාත භාවිතා කරන්නන්ගෙන් එම සංඛ්‍යාත ආපසු විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත පවරා ගැනීමට ද කටයුතු කර ඇත.

## II

## වරප්‍රසාද : සභාගර්භ ආලින්දයේදී පහර දීම
சிறப்புரிமை: சபாமண்டப ஓய்விடத்தில் தாக்குதல் நடத்தியமை
PRIVILEGE : ATTACK IN THE LOBBY

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩ වී ඇති බවට 2011 දෙසැම්බර් මස 20 වන දින පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය.

## III

## වරප්‍රසාද : ගරු පාලිත රංගෙ බණ්ඩාර මැතිතුමා විසින් කරන ලද තර්ජනය
சிறப்புரிமை: மாண்புமிகு பாலித ரங்கே பண்டாரவினால் விடுக்கப்பட்ட அச்சுறுத்தல்
PRIVILEGE: THREAT POSED BY HON. PALITHA RANGE BANDARA

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩ වී ඇති බවට 2011 දෙසැම්බර් මස 21 වන දින පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය.

## IV

## නැඟෙනහිර පළාතේ පුරාවිද්‍යාත්මක නටබුන් ප්‍රඥප්ති කෙටුම්පත
கிழக்கு மாகாணத்தின் தொல்பொருள் சிதைவுகள் வரைபு நியதிச்சட்டம்
ARCHAEOLOGICAL REMAINS DRAFT STATUTE OF THE EASTERN PROVINCE

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

"නැඟෙනහිර පළාතේ පුරාවිද්‍යාත්මක නටබුන් ප්‍රඥප්ති කෙටුම්පත" සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ අදහස් විමසමින් නැඟෙනහිර පළාත් සභාවෙන් දැනුම් දීමක් ලැබී ඇති බව ස්ථාවර නියෝග අංක 46අ (3) (අ) ප්‍රකාරව නිවේදනය කරනු කැමැත්තෙමි.

මෙම දැනුම් දීම "බී" ස්ථාවර කාරක සභාව වෙත යොමු කරනු ලැබේ.

මෙම ප්‍රඥප්ති කෙටුම්පතේ පිටපත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සපයා ඇත.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාර 2009 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ හයවැනි කාණ්ඩයේ XXIIසහ XXIIIවැනි කොටස්; 2010 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ Vසහ Viවැනි කොටස්; 2010 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ හතරවැනි කාණ්ඩයේ II සහ IIIවැනි කොටස්; 2010 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ තුන්වැනි කාණ්ඩයේ IIවැනි කොටස; සහ 2010 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ IIවැනි කොටස ඉදිරිපත් කරමි.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය"යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

**ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டி.எம்.ஜயரத்ன - பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும்)
(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ (SLECIC) වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව මුදල් හා ක්‍රම සම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම 2006, 2007, 2008 සහ 2009 වර්ෂ සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

මෙම වාර්තා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2010 වර්ෂය සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව. - [අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමාජ සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2010 වර්ෂය සඳහා ජාතික සමාජ සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සමාජ සේවා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම 2010 වර්ෂය සඳහා රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු පී. දයාරත්න මහතා (ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. தயாரத்ன - உணவுப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. P. Dayaratna - Minister of Food Security)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) දෙහිඅත්තකණ්ඩිය, බක්මීදෙනිය, අංක 320 යන ලිපිනයෙහි පදිංචි විජයරත්න සුදසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) මඩවලලන්ද, අම්බලන්ඔය යන ලිපිනයෙහි පදිංචි එම්.ඩී.එස්. ජයලත් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) බලංගොඩ, ගුරුබැබිල, පහලපත්දෙනිය යන ලිපිනයෙහි පදිංචි එස්.ඒ. සුනිල් මහතාගෙන් ලැබුණු පෙත්සම.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා - පැමිණ නැත.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා (යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு டலஸ் அழகப்பெரும - இளைஞர் அலுவல்கள், திறன் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Dullas Alahapperuma - Minister of Youth Affairs and Skills Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කුරුණෑගල, වයඹ පළාත් සභාව, පළාත් සහා කාර්යාල සංකීර්ණය යන ලිපිනයෙහි සේවය කරන එස්.වී. ජයන්ත සේරසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) පුහුල්වැල්ල, කිරින්ද, "පින්සරු" යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ඒ. පියතිලක මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් පහ පිළිගන්වමි.

(1) අම්පාර, ගල්මඩුව, පොලිස් උප ගරාජය යන ලිපිනයෙහි පදිංචි පී.ඩබ්ලිව්. නිහාල් සේනාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) ඉබ්බාගමුව, බක්මීගොල්ල, "රජසිසිල", අංක 115 යන ලිපිනයෙහි පදිංචි ආර්.පී.ඩී. ද සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) රත්මලාන, දෙවන පටුමග, අංක 38 යන ලිපිනයෙහි පදිංචි ඩී.ඒ. පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) අනුරාධපුර, සාලියපුර, අංක 48 යන ලිපිනයෙහි පදිංචි ආර්.එම්.සෝමරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(5) පරකඩුව, බෙන්දළුව, අංක 111 'ඒ' යන ලිපිනයෙහි පදිංචි ඒ.වී. රංජිත් ආටිගල මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - கடற்றொழில், நீரக வள மூலங்கள் அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Deputy Minister of Fisheries and Aquatic Resources Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කන්තලේ, ත්‍රිකුණාමලය පාර, අංක 131/1 යන ලිපිනයෙහි පදිංචි එච්. එම්. ජයලත් බණ්ඩාර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කොල්ලුපිටිය, පොලිස් නිවාස, අංක 137/32 යන ලිපිනයෙහි පදිංචි ඊ.එම්.ආර්. ඒකනායක මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudharshini Fernandopulle)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) මින්නේරිය, 1 කණුව, බැංකු නිවස, හිඟුරක්ගොඩ යන ලිපිනයෙහි පදිංචි ඩී.එස්. ආටිගල මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) වේයන්ගොඩ, පාරමුල්ල, අංක 26 යන ලිපිනයෙහි පදිංචි ඊ. ගුණපාල මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### බලපත්‍රලාභී කැසිනෝ ශාලා : විස්තර
### உரிமம் பெற்ற கெசினோ விடுதிகள்: விபரம்
### LICENSED CASINOS : DETAILS

0959/'10

2. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (5) :

(අ) (i) ශ්‍රී ලංකාවේ නීතිගත කරන ලද බලපත්‍රලාභී කැසිනෝ ශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පවත්වාගෙන යන ස්ථාන කවරේද;

(iii) ඒවායේ අයිතිකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එම එක් එක් ආයතනය ආරම්භ කළ වර්ෂය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2005 සිට මේ දක්වා කැසිනෝ ශාලා වෙතින් රජයට ලැබුණු බදු ආදායම වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) කැසිනෝ ශාලාවක් ආරම්භ කිරීමට බලපත්‍රයක් ලබා ගන්නා ක්‍රමවේදය කවරේද;

(iii) බලපත්‍ර ලබාදීමේදී අවසන් අනුමතිය ලබා දෙන්නා කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2010 වර්ෂයේදී කැසිනෝ ශාලා නව බලපත්‍ර ලබා ගැනීම සඳහා ඉල්ලුම් කර ඇති සංඛ්‍යාව කවරේද;

(ii) ඒ අතරින් බලපත්‍ර ලබා දෙන සංඛ්‍යාව කවරේද;

(iii) එසේ බලපත්‍ර ලබන අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் சட்டபூர்வமாக்கப்பட்டுள்ள உரிமம் பெற்ற கெசினோ விடுதிகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(ii) அவை கொண்டு நடாத்தப்படும் இடங்கள் யாவை என்பதையும்,

(iii) அவற்றின் உரிமையாளர்களது பெயர் மற்றும் முகவரிகள் யாவை என்பதையும்,

(iv) அவ்வாறான ஒவ்வொரு விடுதியும் ஆரம்பிக்கப் பட்ட ஆண்டு யாது என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) 2005 ஆம் ஆண்டு தொடக்கம் இன்று வரை கெசினோ விடுதிகளின்மூலம் அரசிற்குக் கிடைத்துள்ள வரி வருமானம் ஆண்டுவாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்,

(ii) கெசினோ விடுதியொன்றை ஆரம்பிப்பதற்கு உரிமத்தைப் பெற்றுக்கொள்ள வேண்டிய வழிமுறை யாது என்பதையும்,

(iii) உரிமம் வழங்கும் போது இறுதி அனுமதி யளிக்கும் நபர் யாரென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) 2010 ஆம் ஆண்டில் கெசினோ விடுதிகளுக்கான புதிய உரிமப்பத்திரங்களுக்கென விண்ணப்பித் துள்ளவர்களின் எண்ணிக்கை யாது என்ப தையும்,

(ii) இவர்களில் உரிமப்பத்திரம் வழங்கப்பட வுள்ளோரின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) அவ்வாறு உரிமப் பத்திரங்களைப் பெற்றவர் களின் பெயர்களும் முகவரிகளும் யாதென்ப தையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he state -

(i) the number of licensed casinos legalized in Sri Lanka;

(ii) the places where they are run;

(iii) the names and addresses of the owners of the aforesaid casinos; and

(iv) the year in which each of the aforesaid casinos was started?

[ගරු දයාසිරි ජයසේකර මහතා]

(b) Will he inform this House -

(i) the annual tax income received by the Government from casinos from the year 2005 up to now, separately;

(ii) the methodology which should be adopted in obtaining a licence to start a casino; and

(iii) the person who gives the final approval in issuing licences?

(c) Will he state -

(i) the number of persons who have applied for obtaining new licences for casino in the year 2010;

(ii) out of them, the number of persons to whom licences will be issued; and

(iii) the names and addresses of the recipients of licences as mentioned above?

(d) If not, why?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
*(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)*
(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Finance and Planning)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර පනත අනුව මෙවැනි බලපත්‍ර නිකුත් කර නැත.

(ii) ඉහත (i) පරිදි පැන නොනඟී.

(iii) ඉහත (i) පරිදි පැන නොනඟී. ඉහත (i) පරිදි පැන නොනඟී.

(ආ) (i) 1988 අංක 40 දරන ඔට්ටු හා සූදු පනත යටතේ රැස් කර ගත් බදු මුදල් ප්‍රමාණය පහත දැක්වේ.

| වසර | සූදු බදු ආදායම (රුපියල් මිලියන ) |
|---|---|
| 2005 | 196.4 |
| 2006 | 282.0 |
| 2007 | 268.0 |
| 2008 | 270.0 |
| 2009 | 269.0 |
| 2010 | 295.0 |

(ii) ඉහත (අ)(i) පරිදි පැන නොනඟී.[බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
*(மாண்புமிகு தயாசிறி ஜயசேகர)*
(The Hon. Dayasiri Jayasekara)
මම ඔබතුමාගෙන් අහන්න හැදුවේ-

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
*(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)*
(The Hon. Gitanjana Gunawardena)
ප්‍රශ්නයට උත්තරය සම්පූර්ණ කරලා ඔබතුමාගේ පැහැදිලි කිරීම-

**ගරු දයාසිරි ජයසේකර මහතා**
*(மாண்புமிகு தயாசிறி ஜயசேகர)*
(The Hon. Dayasiri Jayasekara)
2011 වර්ෂයට නැද්ද? 2010ට විතරද?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
*(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)*
(The Hon. Gitanjana Gunawardena)
නැහැ. 2010ට විතරයි. [බාධා කිරීම්]

(iii) ඉහත (අ)(i) පරිදි පැන නොනඟී.

(ඇ) (i) ඉහත (අ)(i) පරිදි පැන නොනඟී.

(ii) (අ)(i) පරිදි පැන නොනඟී.

(iii) ඉහත (අ)(i) පරිදි පැන නොනඟී.

(ඈ) පැන නොනඟී.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
*(மாண்புமிகு தயாசிறி ஜயசேகர)*
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ප්‍රශ්නය ඇහුවේ ශ්‍රී ලංකාවේ නීතිගත කරන ලද බලපත්‍රලාභී කැසිනෝ ශාලා සංඛ්‍යාව කොපමණද කියලායි. ඒක 2008 ද, 1988 අංක 40 දරන සූදු සහ ඔට්ටු පනත යටතේද කියලා නොවෙයි මම ඇහුවේ. දැනට ශ්‍රී ලංකාවේ නීතිගත කරලා තිබෙන බලපත්‍රලාභී කැසිනෝ ශාලා සංඛ්‍යාවයි ඇහුවේ. ඔබතුමා ඒකට උත්තරයක් දීලා නැහැ. මම ඒක දැන ගන්න කැමැතියි. ඒක තමයි මේ ප්‍රශ්නයේ ප්‍රධානම අරමුණ.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
*(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)*
(The Hon. Gitanjana Gunawardena)
ගරු මන්ත්‍රීතුමනි, මම උත්තරය දුන්නා. කැසිනෝ නීතිගත කිරීම 2010 අංක 17 දරන පනත යටතේ ක්‍රියාත්මක වෙලා නැහැ. 2011න් පසුව තමයි ඒ පනත ක්‍රියාත්මක වෙන්නේ. 2011 දෙසැම්බර් 31න් පසුව. මේ අවුරුද්දේ ඉඳලා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
*(மாண்புமிகு தயாசிறி ஜயசேகர)*
(The Hon. Dayasiri Jayasekara)
ඊට කලින් පවත්වා ගෙන ගිය ඒවා? ඒවා ගැනයි මම ඇහුවේ.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
*(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)*
(The Hon. Gitanjana Gunawardena)
ඊට කලින් තිබුණ සූදු සහ ඔට්ටු පනත යටතේ තමයි මම පැහැදිලි කළේ. 1988 අංක 40 දරන සූදු සහ ඔට්ටු පනත යටතේ තමයි සමස්ත බදු ආදායම ලැබුණේ. මීට පෙරත් අපේ හිටපු ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ අමාත්‍යතුමාත් මේ පිළිබඳව උත්තර දුන්නා, 2005.05.04වෙනි දා. 1994 සිට 2004 දක්වා වූ සමස්ත ආදායම පිළිබඳව එතුමා මේ සභාවට පිළිතුරු දීලා තිබෙන්නේත් මේ ආකාරයටමයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ලංකාව පුරාම තිබෙන කැසිනෝ ශාලා බලපත්‍ර නැතුව පවත්වාගෙන ගිහිල්ලා තිබෙනවා කියලාද ඔබතුමා කියන්නේ?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත යටතේ ලංකාව පුරාම එවැනි ස්ථාන 810ක් පමණ තිබෙනවා. ඒ සූදු සියල්ලම -බෙට්න් ශාලා, ජීව සූදු, සජීව සූදු, තුන්ඩු කියන මේ ඔක්කෝම- ඒවාට සම්බන්ධයි. ඒවා ලියා පදිංචි කරලා තිබෙන්නේ පළාත් පාලන ආයතන යටතේයි. ඒ ආයතනවලින් බලපත්‍ර ගන්න ඕනෑ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. 2010 දී ඔබතුමන්ලා සම්මත කරපු කැසිනෝ ව්‍යාපාර නියාමනය කිරීමේ පනතට අනුව, මේ වන විට ලංකාවේ කැසිනෝ ව්‍යාපාර කොපමණ සංඛ්‍යාවක් නීතිගත කරන්න අවශ්‍ය කටයුතු ලැස්ති කරලා තිබෙනවාද, එහෙම නැත්නම් බලපත්‍ර දීලා තිබෙනවාද?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
මේ වන තුරු බලපත්‍ර දීලා නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, 1988 පනත තිබියදී තමයි 2010 වර්ෂයේ තවත් පනතක් ගෙනාවේ.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ඔව්. නමුත් තවමත් ක්‍රියාත්මක වන්නේ1988 වර්ෂයේ පනතයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතකොට, 2010 වර්ෂයේ ඔබතුමන්ලා ගෙනාපු කැසිනෝ ව්‍යාපාර නියාමනය කිරීමේ පනත යටතේ තවම කැසිනෝ ශාලා ඇති කරලා නැද්ද? එහෙම නැත්නම් ඒ ගැන මොකක්ද ගන්න පියවර? ඇත්තටම ලියා පදිංචි වෙලා නැද්ද?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ඒ යටතේ තවම ලියා පදිංචි කරලා නැහැ. ජනවාරි මාසයේ ඉඳලා ඒ ක්‍රියාදාමය ආරම්භ වෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
2012 ජනවාරි මාසයේද, 2011 ජනවාරි මාසයේද?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
2012 ජනවාරි මාසයේ සිට.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
2010 වර්ෂයේ පනත් කෙටුම්පත සම්මත කළාට, 2012 වර්ෂයේදීද පටන් ගන්න හදන්නේ?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ඔව්. ඒ පනත අනුව පටන් ගන්නේ 2012 වර්ෂයේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඊට අමතරව "සූදු වීදියක්" පවත්වාගෙන යන්න ඔබතුමන්ලා කිසියම් වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවාද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවේ සංචාරක ව්‍යාපාරය වර්ධනය වෙන කොට ආණ්ඩුව කල්පනා කරනවා, හැම සංචාරකයාම සූදු කෙළින්න මෙහාට එයි කියලා. සූදු කෙළින්න වෙනම තැන් තිබෙනවා, මැකාවු, ලාස් වේගාස් වාගේ නගරවල. ලංකාවට එන හැම මිනිහෙක්ම සූදු කෙළින්න එන්නේ නැහැ. මේ වෙලාවේ ගරු එල්ලාවල මේධානන්ද ගෞරවනීය නායක හාමුදුරුවෝත් වැඩ ඉන්නවා. ඔබතුමන්ලා මේ සිංහල බෞද්ධ රාජ්‍යයේ සූදුවලින් අංග සම්පූර්ණ වීදියක් ස්ථාපිත කරන්න හදනවාද කියලායි මම අහන්නේ. සුද්දන්ට සහ ලංකාවේ කට්ටියට සූදු කෙළින්න සූදු වීදියක් ඔබතුමන්ලා ස්ථාපිත කරනවාද කියලා මම අහන්න කැමැතියි.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
එය අදාළ නොවේ. එවැනි කිසිදු දෙයක් ස්ථාපිත කරන්න සැලසුම් කරලා නැහැ.

## නිර්මාණකරණය හා තාක්‍ෂණවේදය යන විෂයය : ගුරු හිඟය
## ஆக்கத்திறனும் தொழில்நுட்பவியலும் எனும் பாடம்: ஆசிரியர் பற்றாக்குறை
## SUBJECT OF DESIGN AND TECHNOLOGY : TEACHER SHORTAGE

1073/'11

3. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) කොළඹ ක්‍රමය යටතේ රජයේ පාසල්වල සිසුන්ගේ තාක්‍ෂණ දැනුම වැඩි කිරීමේ අරමුණ ඇතිව ලී වැඩ, ලෝහ වැඩ, මැටි වැඩ, විවීම, පෙදරේරු ශිල්පය හා ගුවන් විදුලි තාක්‍ෂණ ශිල්පය වැනි විෂයයන් උගන්වනු ලැබූ බවත්;

(ii) මේ වන විට එම විෂයයන් ඒකාබද්ධ කොට නිර්මාණකරණය හා තාක්‍ෂණවේදය නම් වූ නව සමෝධානික විෂයයක් හඳුන්වා දී ඇති බවත්;

[ගරු බුද්ධික පතිරණ මහතා]

(iii) එම විෂයය හඳුන්වා දුන්නද පාසල් තුළ එම විෂය සඳහා දැඩි ගුරු හිඟයක් පවතින බවත්;

(iv) දැනට එම විෂය උගන්වන ගුරුවරුන්ට ප්‍රමාණවත් පුහුණුවක් ලබා නොදෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) නිර්මාණකරණය හා තාක්ෂණවේදය විෂයය සඳහා අලුතින් ගුරුවරුන් බඳවා ගැනීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගත වන කාලය කොපමණද;

(iii) ඒ සඳහා 2011 අය වැය මඟින් ප්‍රතිපාදන ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම ගුරුවරුන් සඳහා නව විෂය ඉගැන්වීමට ක්‍රමවත් පුහුණුවක් ලබා දීමට සැලසුම් සකස් කර තිබේද;

(ii) එසේ නම්, එම පුහුණු වැඩමුළු සංවිධානය කරන දින වකවානු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்புத் திட்டத்தின்கீழ் அரசாங்க பாடசாலை மாணவர்களின் தொழில்நுட்ப அறிவினை மேம்படுத்தும் நோக்கத்துடன் மர வேலைகள், உலோக வேலைகள், மட்பாண்ட வேலைகள், நெசவு, மேசன் கலை மற்றும் வானொலிக் கலை ஆகிய பாடங்கள் கற்பிக்கப்பட்டன வென்பதையும்;

(ii) தற்போது இப்பாடங்கள் ஒருங்கிணைக்கப்பட்டு ஆக்கத்திறனும் தொழில்நுட்பவியலும் எனப்படு கின்ற புதிய ஒருங்கிணைந்த பாடமொன்று அறிமுகப்படுத்தப்பட்டுள்ளது என்பதையும்;

(iii) இப்பாடம் அறிமுகப்படுத்தப்பட்டிருந்த போதிலும் பாடசாலைகளில் இப்பாடத்திற்கான பாரிய ஆசிரியர் பற்றாக்குறை காணப்படு கின்றது என்பதையும்;

(iv) தற்போது இப்பாடத்தைக் கற்பிக்கும் ஆசிரியர்க ளுக்குப் போதுமான பயிற்சி வழங்கப்படுவ தில்லையென்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) ஆக்கத்திறனும் தொழில்நுட்பவியலும் பாடத் திற்கு புதிதாக ஆசிரியர்களை ஆட்சேர்ப்புச் செய்வதற்காக நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(ii) ஆமெனில் அதற்காக எடுக்கப்படும் காலம் எவ்வளவென்பதையும்;

(iii) இதன்பொருட்டு 2011ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டத்தின்கீழ் நிதி ஒதுக் கீடுகள் மேற்கொள்ளப்பட்டுள்ளனவா என்ப தையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) புதிய பாடத்தைக் கற்பிக்கும்பொருட்டு மேற்படி ஆசிரியர்களுக்கு முறைசார்ந்த பயிற்சியை வழங்குவதற்காக திட்டங்கள் தயாரிக்கப் பட்டுள்ளனவா என்பதையும்;

(ii) ஆமெனில் இப்பயிற்சிப் பட்டறைகள் ஒழுங்கு செய்யப்படும் திகதிகள் யவையென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that -

(i) subjects such as carpentry, metal work, pottery, weaving, masonry and radio technology were taught under the Colombo Plan with the aim of improving technical knowledge of students of the government schools;

(ii) these subjects have now been integrated and an integrated subject known as Design and Technology has been introduced;

(iii) there is a severe shortage of teachers to teach the aforesaid subject even though the said subject was introduced to schools; and

(iv) the teachers who teach the aforesaid subject are not provided with proper training at present ?

(b) Will he inform this House-

(i) whether action will be taken to recruit new teachers for the subject of Design and Technology;

(ii) if so, the period of time to be taken for this purpose; and

(iii) whether provisions have been allocated for this purpose from the Budget of 2011?

(c) Will he state-

(i) whether plans have been made to provide systematic training to those teachers for the teaching of the new subject; and

(ii) if so, the dates on which such training workshops will be organized ?

(d) If not, why ?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා ( අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)

(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යාතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) කන්නන්ගර ක්‍රමය යටතේ ආරම්භ කරන ලද හස්ත කර්මාන්ත (ලී වැඩ, මැටි ශිල්පය, පෙදරේරු ශිල්පය, පේෂ කර්මාන්තය, ගුවන් විදුලි කාර්මික ශිල්පය) විෂය සඳහා කොළඹ ක්‍රමය යටතේ පාසල් කර්මාන්තශාලා සහ විෂය උපකරණ ලබා දී ඇත.

1997 අධ්‍යාපන සංශෝධනවලදී හස්ත කර්මාන්ත විෂය "තාක්ෂණ කුසලතා" වශයෙන් නම් කර ඒ යටතේ "ඉදි කිරීමේ තාක්ෂණය, යාන්ත්‍රික තාක්ෂණය, විදුලිය හා ඉලෙක්ට්‍රෝනික තාක්ෂණය, කලා ශිල්ප" යන විෂයයන් පාසල්වල උගන්වන ලදී.

2005 අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලදී එම විෂය නැවත "නිර්මාණකරණය හා තාක්ෂණවේදය, ශිල්ප කලා" යනුවෙන් සමෝධානය කරන ලදී.

(iii) දැඩි ගුරු හිඟයක් නැත. සිටින ගුරුවරුන් තුලනය කිරීම සිදු වෙමින් පවතින අතර, වාර්ෂිකව සියනෑ අධ්‍යාපන විද්‍යා පීඨයෙන් සිංහල මාධ්‍ය ගුරුභවතුන් 60ක් බැගින්ද, අඩ්ඩාලච්චේන අධ්‍යාපන විද්‍යාපීඨයෙන් දෙමළ මාධ්‍ය ගුරුභවතුන් 15ක් බැගින්ද, පද්ධතියට එකතු වේ.

(iv) සියනෑ අධ්‍යාපන විද්‍යාපීඨයේ (සිංහල මාධ්‍ය) මේ සම්බන්ධයෙන් තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් හා ජාතික අධ්‍යාපන ආයතනයත්, අධ්‍යාපන අමාත්‍යාංශයත් එක්ව සේවාස්ථ පුහුණු පාඨමාලා පවත්වමින් පුහුණු කටයුතු විධිමත් ලෙස සිදු කරනු ලැබේ.

(ආ) (i) දැනට පවතින පුහුණු කිරීමේ පහසුකම් මත බඳවාගත හැකි උපරිම ගුරු ශිෂ්‍ය ප්‍රමාණය ලෙසට වාර්ෂිකව 75 දෙනකු බඳවා ගනු ලැබේ. (සිංහල මාධ්‍ය - 60 - දෙමළ මාධ්‍ය 15)

(ii) සෑම වර්ෂයකම ඉහත (ආ) (i) දැක්වෙන ප්‍රමාණය බඳවා ගැනේ.

(iii) ඔව්.

(ඇ) (i) එම ගුරුවරුන්ට මෙම විෂය ඉගැන්වීම සඳහා ක්‍රමවත් පුහුණුවක් ලබා දීම පිණිස තුන් අවුරුදු ආයතනික පුහුණුවෙන් අනතුරුව, අඛණ්ඩව සේවාස්ථ පුහුණු හා දිශානතිමුඛ කිරීමේ වැඩසටහන් සෑම වර්ෂයකම සැලසුම් කර ඇත.

(ii) අඛණ්ඩව සෑම වර්ෂයකම සේවාස්ථ පුහුණු හා නවක ගුරුවරුන් දිශානතිමුඛ කිරීමේ වැඩසටහන් පැවැත්වේ.

(ඈ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මගේ පළමු වැනි අතුරු ප්‍රශ්නය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ පිළිතුරේ සඳහන් වුණා, වාර්ෂිකව 75 දෙනෙකු බඳවා ගන්නවා කියලා. ඒ අනුව අඩ්ඩාලච්චේන විද්‍යාපීඨයට දමිළ මාධ්‍යයෙන් 15කුත්, සියනෑ විද්‍යාපීඨයට සිංහල මාධ්‍යයෙන් 60කුත් බඳවා ගන්නවා. එතකොට 75යි. හැබැයි තුලනය කිරීමෙන් පමණක් මේ ප්‍රශ්නය විසඳන්න බැහැ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඔබතුමා කවුරු හරි කණ්ඩායමක් යවලා බැලුවොත් පෙනේවි, සත්‍ය වශයෙන්ම තුලනය කළත් පාසල්වල නිර්මාණකරණය හා තාක්ෂණවේදයේ ගුරු ඌනතා තිබෙන බව. ඒ පළමුවන කාරණය.

දෙවැනි කාරණය, මේ විෂයය පරිගණක තාක්ෂණය වාගේම තමයි. ක්ෂණිකව වෙනස් වනවා. මේ තුළින් බලාපොරොත්තු වන්නේ දරුවකු රැකියා ලෝකයට - වැඩ ලෝකයට- එකතු කරන්නයි. ඒ කාරණයේදී ෆැක්ස් එකක් යවන්නේ කොහොමද, ෆොටෝ කොපි ගහන්නේ කොහොමද කියන දේවලුත් මේ විෂයයට ඇතුළත් වන්න ඕනෑ. ඒ නිසා ක්ෂණිකව වෙනස් වන තත්ත්වයන්ට ගැළපෙන විධියට මේ පාඨමාලා යාවත්කාලීන වන්නේ නැහැයි කියන එක ඒ උපදේශකවරුන්ගේත් මතයක්. ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය අවධානය යොමු කරනවාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ තාක්ෂණික විෂයයන් සම්බන්ධයෙන් පසුගාමී තත්ත්වයක් මුළු රටේම තිබුණත්, ඒ තත්ත්වය තේරුම් අර ගෙන නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ -මහෞෂධ පණ්ඩිතයෝ ඉපදෙන කොට සඳුන් කැටයක් අර ගෙන ඉපදුනා වාගේ - පාසල්ගත වන සෑම දරුවකුම සමාජගත වන කොට නිපුණතා සහතිකයක් සහිතව සමාජගත කිරීමේ වැඩ පිළිවෙළ අධ්‍යාපන අමාත්‍යාංශය සහ යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය පෙරදැරි කර ගෙන පාසල් දහසේ ව්‍යාපෘතියට ඉතා පැහැදිලිව සම්බන්ධ කර තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දිග කථාවක් කරනවාද, ප්‍රශ්නය අහනවාද?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
නැහැ,නැහැ. පළමු වැනි ප්‍රශ්නය ටිකක් වැඩියෙන් අහන්න තිබුණා. ඉතිරි ප්‍රශ්න දෙක බොහොම කෙටියෙන් අහන්නේ. ඔබතුමාට කරදරයක් වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගුරු භවතුන් ගැන කථා කරන කොට, ඔබතුමාත් නියෝජනය කරන දකුණු පළාතේ නරක පූර්වාදර්ශයක් සිද්ධ වෙමින් තිබෙනවා. පළාත් සභාවේ අධ්‍යාපන ඇමතිතුමා පාසල් නිරීක්ෂණයට ගිහිල්ලා ඒ පාසල්වල කොච්චර කාලයක් හිටියාද කියලා ගුරුවරුන්ගෙන් අහලා, මෙයා මේ ඉස්කෝලෙට යවන්න, මෙයා මේ ඉස්කෝලෙට යවන්නය කියලා ක්ෂණිකවම කියනවා. මේක ගුරුවරුන්ට අදාළ ප්‍රශ්නයක්.

මේ ගුරු මාරු ප්‍රතිපත්තියක් සහ ක්‍රමවේදයක් අනුව සිද්ධ කරනවා මිසක් මුහුණ බලලා "මෙයා මෙහාට දැන් යවන්න, දැන් මෙයා මෙහාට යවන්න" කියලා නිලධාරින්ට නියෝග දීමේ ක්‍රමයට තිත තියන්න රේඛීය අමාත්‍යාංශයට යමක් කරන්න පුළුවන්ද කියලා දැන ගන්න අවශ්‍යයි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන පුද්ගලයන්ගේ චර්යාවන් පිළිබඳව අප මෙතැන සාකච්ඡා කරන එක සදාචාරසම්පන්න නැහැ. කෙසේ නමුත් යම් කිසි දෝෂයක් වෙලා තිබෙනවා නම් එතුමාට මෙතැන උත්තර දෙන්න පුළුවන්කමක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාගේ ඉල්ලීම පරිදි අපට ඒ ගැන සොයා බලන්න පුළුවන්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දකුණු පළාත් සභාවේ අධ්‍යාපන ඇමතිතුමා හොඳ සේවයක් කරනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
සේවය කරන්න ඕනෑ, හොඳට හරියට. වැරදියට කරලා වැඩක් නැහැ නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ක්‍රමවේදය අනුව, සේවය හොඳට වාගේම හරියට කරන්නත් ඕනෑ. මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපනය සම්බන්ධ ගොඩක් කාරණාවලදී අතුරු ප්‍රශ්න විධියට අපට මේවා විමසන්න වෙන්නේ නැහැ, අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශ කාරක සභාව තිබෙනවා නම්.

අපි පිළිගන්නවා, අධ්‍යාපන කටයුතු පිළිබඳ විශේෂ උපදේශක කාරක සභාව අවස්ථා ගණනාවක් පැවැත්වූවාය කියන එක. ඒක අගය කරනවා. හැබැයි අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභා රැස්වීම පසු ගිය පාර්ලිමේන්තු කාලය තුළම කැඳවලා තිබෙන වාර ගණන කියන්න බැරි තරම් අල්පයි. ඒ නිසා අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභා රැස්වීම් කැඳවන්නට කටයුතු කරන්න. මම වැරදි නම් නිවැරදි කරන්න. මම හිතන්නේ මේ පාර්ලිමේන්තුව තුළ අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව කැඳවලාම නැහැ කියලායි. හැබැයි අධ්‍යාපන කටයුතු පිළිබඳ විශේෂ කාරක සභාව කැඳවලා තිබෙනවා. ඒක අගය කරනවා. ඒ පනත් කෙටුම්පත හදන්න ගරු ඇමතිතුමා, ගරු නියෝජ්‍ය ඇමතිතුමා දරන කැපවීම අගය කරනවා. මේ අවුරුද්දේ තුන්වැනි මාසයත් ඇවිල්ලායි තියෙන්නේ. අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව ඉක්මනින් කැඳවන්න කටයුතු කරනවාද, එසේ නොකරනවා නම් ඒකට හේතුව මොකක්ද කියලා මා දැන ගන්න කැමැතියි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මම දන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මෙහෙම මුසාවාද කියන කොට කටේ පුත්තලම් හොරි දාන්න ඕනෑ. මගේ ගරු අධ්‍යාපන ඇමතිතුමා ඉතාම කැපවීමෙන් හැම මාසයකම මේ අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව පවත්වනවා. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරු ඒකට සහභාගි වනවා. ඒ නිසා කරුණාකරලා ඒ කාරණය ඉල්ලා අස් කර ගන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
නැහැ, නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා අසත්‍ය ප්‍රකාශ කරනවා. [බාධා කිරීමක්]

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
අසත්‍ය පැවසුවාම අර මා කියාපුව දමනවා. ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, ඒ නිසා අසත්‍ය කියන්න එපා හොඳේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
හැම මාසයකම අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභා වාර්තාව දෙන්නැයි කියන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමනි, ඔබතුමා සමහර වෙලාවට ඒ රැස්වීම්වලට එන්නෙත් නැහැ. තේරුණාද? අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමාට දොස් කියන්න එපා. කරුණාකරලා මගේ ඇමතිතුමාට පාර්ලිමේන්තුවේදී දොස් කියන්න එපා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උපදේශක කාරක සභා කාර්යාංශයෙන් වාර්තාවක් අරන් බලන්න, මාස් පතා එම උපදේශක කාරක සභාව කැඳවා තිබෙනවාද කියලා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒ පිළිබඳව මම ගරු කථානායකතුමාට යොමු කරලා අධ්‍යාපන උපදේශක කාරක සභාව කැඳවා නැත්නම් එය කැඳවීමට නියෝග කිරීමට එතුමාගේ අවධානය යොමු කරවන්නම්.

ප්‍රශ්න අංක 6-1731/'11-(1), ගරු අනුර දිසානායක මහතා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## නානුඔය - නුවරඑළිය දුම්රිය සේවය : යළි ආරම්භ කිරීම
## நானுஓயா-நுவரெலியா புகையிரதச் சேவை: மீள ஆரம்பித்தல்
## NANUOYA-NUWARA ELIYA TRAIN SERVICE : RECOMMENCEMENT

1993/'11

10. **ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) නානුඔයෙන් දුම්රියෙන් බැස යන දුම්රිය මගීන්, නුවරඑළිය දක්වා මහා මාර්ගයෙන් ගමන් කිරීමට යෑමේදී දුෂ්කරතාවලට මුහුණ පාන බවත්;

(ii) නානුඔය සහ නුවරඑළිය සම්බන්ධ කරමින් බ්‍රිතාන්‍ය යටත් විජිතවාදීන් විසින් ඉදි කරන ලද ප්‍රයෝජනවත් දුම්රිය සේවයක් 1900 වකවානුවේදී පැවැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) රජය විසින් සාමය ප්‍රතිස්ථාපනය කිරීමෙන් අනතුරුව රට තුළට සංචාරකයන් ඇදී ඒමක් සිදු වන හෙයින්, නානුඔය සිට නුවරඑළිය දක්වා වූ කිලෝමීටර් හතක දුර ප්‍රමාණය සඳහා වූ දුම්රිය සේවය යළි ආරම්භ කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நானுஓயாவில் இறங்கும் புகையிரதப் பயணிகள், நுவரெலியாவிற்கு வீதியால் பயணிப்பதில் சிரமங்களை எதிர்கொள்கிறார்கள் என்பதையும்;

(ii) 1900 களில் பிரித்தானிய காலனித்துவத்தினால் நானுஓயாவையும் நுவரெலியாவையும் இணைக் கும் பயனுள்ள புகையிரதச் சேவை நடத்தப் பட்டது என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) அரசாங்கத்தால் அமைதி நிலைநாட்டப்பட்ட பிற்பாடு தீவிலே உல்லாசப் பயணிகள் பெருமளவில் வருவதால், ஏழு கிலோமீற்றர் நீளமான நானுஓயாவி லிருந்து நுவரெலியா வரையிலான புகையிரதச் சேவையை மீள ஆரம்பிக்க நடவடிக்கை எடுக்கப் படுமா என அவர் கூறுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport:

(a) Is he aware that -

(i) the railway passengers who get off the train at Nanuoya face difficulties to travel to Nuwara Eliya by road transport; and

(ii) there was a useful train service built by the British Colonials connecting Nanuoya and Nuwara Eliya in 1900?

(iii) Will he state whether action will be taken to restart the train service from Nanuoya to Nuwara Eliya running for a distance of seven kilometres, since there is an influx of tourists in the Island after peace being restored by the Government?

(c) If not, why?

**ගරු කුමාර වෙල්ගම මහතා (ප්‍රවාහන අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார வெல்கம - போக்குவரத்து அமைச்சர்)
(The Hon. Kumara Welgama - Minister of Transport)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) නුවරඑළිය දක්වා වූ දුම්රිය මාර්ගය පටු දුම්රිය මාර්ගයක් ලෙස ක්‍රියාත්මකව තිබූ අතර එහි දුම්රිය ධාවනය අත් හිටුවීමෙන් පසු අනවසර පදිංචිකරුවෝ විශාල සංඛ්‍යාවක් මේ වන විට පදිංචිව සිටිති. මෙම දුම්රිය ධාවනය නැවත ස්ථාපිත කිරීමට සියලු අනවසර පදිංචිකරුවන් ඉවත් කර පුළුල් දුම්රිය මාර්ගයක් ස්ථාපිත කළ යුතු අතර ඊට සුදුසු පාලම්, බෝක්කු හා දුම්රිය ස්ථාන අලුතින් ස්ථාපිත කළ යුතුව ඇත. මෙවැනි කාර්යයක් පවත්නා තත්ත්වය යටතේ භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් ඉටු කිරීමට අපහසුය. මූලික ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමට කටයුතු කරනු ලබන අතර ඉන් පසු සවිස්තර ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර ඒ අනුව ඇස්තමේන්තු කරන මූලික ප්‍රතිපාදන ලබා ගැනීම ආයෝජකයන් හරහා කළ යුතුද, නො එසේ නම් රජයේ මුදල් වැය කිරීමෙන් කළ යුතුද යන්න තීරණය කළ යුතුව ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙකයි. ගරු ඇමතිතුමනි, කවදාද ඒ සේවය නැවැත්වූවේ?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මා හිතන හැටියට ඒ සේවය නවත්තලා දැනට ගොඩක් කල් [බාධා කිරීම්] මා ඉපදෙන්නත් ඉස්සර වෙලායි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පොඩ්ඩක් එතුමාගේ ළඟට ගිහින් කථා කර ගන්න.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඒ වැඩේ අපි හොඳ ලස්සනට කර ගන්නම්.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒ කාලයේයි; සුද්දාගේ කාලයෙනුත් පස්සේයි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ආන්න ඇහුණාද? එය ආරම්භ කිරීමේ දිනයක් නියම කර තිබෙනවාද? කවදාද ආරම්භ කරන්නේ කියන එක?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නය හරියට පැහැදිලි නැහැ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
කවදාද ඒ සේවය ආරම්භ කරන්නේ කියන එක.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
තවම නැහැ. එහි ඉන්න මිනිසුන් අයින් කරන්න ඕනෑ. විශාල සංඛ්‍යාවක් පදිංචි වෙලා ඉන්නවා. ඒකට මුදල් සොයා ගන්නත් ඕනෑ. ඊට පස්සේ, රේල් පාර දමන්නත් මුදල් සොයා ගන්න ඕනෑ. මොකද, එතැන තිබුණේ පටු දුම්රිය මාර්ගයක්. දැන් ඒ පටු දුම්රිය මාර්ගය වැඩක් නැහැ. නුවරඑළියට යනවා නම් යන්න ඕනෑ සාමාන්‍ය දුම්රියක්. ඒ නිසා කාලයක් යාවි. මේ ගැන අධ්‍යයනය කරලා ඔබතුමාට දැනුම් දෙන්න පුළුවන් ගරු මන්ත්‍රීතුමනි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
බොහොම ස්තුතියි. මගේ අන්තිම ප්‍රශ්නය මෙසේයි. සංචාරකයෝ වැඩි ගණනක් දැන් ලංකාවට පැමිණ බොහෝ විට නුවරඑළියටත් යන නිසා මේ වැඩය ඉක්මන් කර අවසන් කිරීමට ගරු ඇමතිතුමා කටයුතු කරන්නේද?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඔබතුමා කියන ආකාරයට ඉක්මනින් ඒ කටයුතු අධ්‍යයනය කරන බවත් මේ ගරු සභාවට දැනුම් දෙනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 11 -2051/'11- (1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. Rohitha Abeygunawardana - Deputy Minister of Ports and Highways)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ප්‍රවාහන අමාත්‍යාංශයට අයත් නොවන ගොඩනැඟිලි සහ වාහන: කුලිය/බද්ද
## போக்குவரத்து அமைச்சுக்குச் சொந்தமில்லாத கட்டிடங்கள் மற்றும் வாகனங்கள்: வாடகை/குத்தகை
BUILDINGS AND VEHICLES NOT OWNED BY MINISTRY OF TRANSPORT : RENT/LEASE

1520/'11

12. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 2010 සහ 2011 වර්ෂයන්හිදී,

(i) ප්‍රවාහන අමාත්‍යාංශය විසින්, එම අමාත්‍යාංශයට අයත් නොවන ගොඩනැඟිලි කුලියට හෝ බද්දට ලබා ගැනීම සඳහා දරන ලද මුළු පිරිවැය කොපමණද;

(ii) කුලියට හෝ බද්දට ලබා ගත් ගොඩනැඟිලිවල වර්ග අඩියක් සඳහා කුලිය කොපමණද;

(iii) එම ගොඩනැඟිලිවල බදු කාලය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශය යටතේ ඇති කිසිදු ආයතනයකට අයත් නොවන වාහන කුලියට හෝ බද්දට ලබා ගැනීම සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

(ii) කුලියට හෝ බද්දට ලබාගත් මුළු වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) බාහිරින් ලබාගත් අනෙකුත් සේවාවන් කවරේද;

(iv) ඉහත සඳහන් බාහිරින් ලබාගත් සේවාවන් වෙනුවෙන් දරන ලද පිරිවැය කොපමණද;

(v) බාහිරින් සේවා ලබා ගැනීමේ පදනමින් ගිවිසුම්වලට එළඹීමෙන් අනතුරුව සේවය සපයන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද; සහ

(vi) කාර්ය මණ්ඩලයේ මුළු සේවක සංඛ්‍යාව කොපමණද;

යන්න ප්‍රවාහන අමාත්‍යාංශයට අදාළව, ඉහත කී වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2010 மற்றும் 2011 ஆகிய வருடங்களில்,

(i) போக்குவரத்து அமைச்சுக்குச் சொந்தமில்லாத கட்டிடங்களை வாடகைக்கு அல்லது குத்தகைக் குப் பெற்றுக்கொள்வதற்கான மொத்த செல வினம் யாது என்பதையும்;

(ii) வாடகைக்கு அல்லது குத்தகைக்குப் பெற்றுக் கொள்ளப்பட்ட கட்டிடங்களின் சதுரஅடிக்கான பெறுமதி யாது என்பதையும்;

(iii) இக் கட்டிடங்களுக்கான குத்தகைக் காலம் எவ்வளவு என்பதையும்;

அவர் வெவ்வேறாகக் குறிப்பிடுவாரா?

(ஆ) போக்குவரத்து அமைச்சு தொடர்பாக மேற்படி வருடங்களில்,

(i) அமைச்சுடன் தொடர்புடைய ஏதாவது நிறுவ னங்களுக்கு சொந்தமில்லாத வாகனங் களை வாடகைக்கு அல்லது குத்தகைக்குப் பெற்றுக் கொள்வதற்குச் செலவு செய்த மொத்தப் பணம் எவ்வளவு என்பதையும்;

(ii) வாடகைக்கு அல்லது குத்தகைக்கு பெற்றுக் கொண்ட வாகனங்களின் மொத்த எண்ணிக்கை யாது என்பதையும்;

(iii) ஏனைய வெளிவள சேவைகள் யாவை என்ப தையும்;

(iv) மேற்கூறப்பட்ட வெளிவள சேவைகளுக்கு ஏற்பட்ட செலவினம் யாது என்பதையும்;

(v) வெளிவள அடிப்படையில் ஒப்பந்தம் செய்யப் பட்ட நபர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(vi) மொத்த பணியாட்களின் எண்ணிக்கை யாது என்பதையும்

அவர் வெவ்வேறாகக் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport:

(a) Will he state for years 2010 and 2011, separately-

(i) the total cost for renting or leasing of buildings which are not owned by the Ministry of Transport;

(ii) the rate per square feet of rented or leased buildings; and

(iii) the leasing period of the buildings?

(b) Will he also state in relation to the Ministry of Transport for aforesaid years separately-

(i) the total money spent on renting or leasing of vehicles which do not belong to any of the Ministry related entities;

(ii) the total number of vehicles rented or leased;

(iii) the other outsourced services;

(iv) the cost incurred in outsourced services mentioned;

(v) the number of people who have been contracted on outsourced basis; and

(vi) the total staff strength?

(c) If not, why?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි:

(අ) (i) ප්‍රවාහන අමාත්‍යාංශය ස්ථාපිත කර තිබෙනුයේ දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක බැවින් කුලියක් හෝ බදු ගෙවීමක් සිදු නොකරයි.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ආ) (i) 2010 වර්ෂය සඳහා - රු. 2,604,404.92යි. (විසිහය ලක්ෂ හාරදහස් හාරසිය හතරයි ශත අනූ දෙකයි.)

2011 වර්ෂය සඳහා - රු. 4,355,737.30යි. (හතළිස් තුන් ලක්ෂ පනස් පන්දහස් හත්සිය තිස් හතයි ශත තිහයි.)

(ii) 2010 වර්ෂය සඳහා - වාහන 08කි.

2011 වර්ෂය සඳහා - වාහන 08කි.

(iii) 1. පවිත්‍රතා සේවා

2. අමාත්‍යාංශයේ යන්ත්‍ර සූත්‍රවල නඩත්තු කටයුතු.

අනෙක් විස්තරත් කියන්න ඕනෑද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සභාගත කරන්න ගරු ඇමතිතුමනි.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒවාත් සභාගත කරන්න කියලා දැන් කියනවාද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ලෙහෙසියි නේ. මම අතුරු ප්‍රශ්නය ඇහුවාම ඔබතුමාට වැඩි වේලාවක් ඒ සඳහා ගන්න පුළුවන් නේ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒක අපි දෙන්නාටත් පස්සේ අහගත හැකියි නේ? ඔබතුමාත් මාත් එක ළඟ හිටපු දෙන්නා නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්, ඔව්.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

එහෙම නම් පිළිතුරේ ඉතිරි කොටස මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුරේ ඉතිරි කොටස:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடையின் எஞ்சிய பகுதி :*
** Rest of the Answer tabled:*

(iv) 1. පවිත්‍රතා සේවා

2010 වර්ෂය සඳහා රු.239,025.90 (රුපියල් දෙලක්ෂ තිස්නවදහස් විසිපහයි ශත අනූවකි.)

2011 වර්ෂය සඳහා රු.1,175,529.00 (රුපියල් එකොලොස් ලක්ෂ හැත්තෑපන්දහස් පන්සිය විසි නවයකි.)

2. අමාත්‍යාංශයේ යන්ත්‍ර සූත්‍රවල නඩත්තු කටයුතු

2010 වර්ෂය සඳහා රු.1,042,537.23 (රුපියල් දසලක්ෂ හතළිස්දෙදහස් පන්සිය තිස්හතයි ශත විසිතුනයි.)

2011 වර්ෂය සඳහා රු.1,026,383.61 (රුපියල් දසලක්ෂ විසිහයදහස් තුන්සිය අසූතුනයි ශත හැටඑකකි.)

(v) 2010 වර්ෂය - ආයතන 08කි.

2011 වර්ෂය - ආයතන 08කි.

(vi) කාර්ය මණ්ඩලයේ මුළු සේවක සංඛ්‍යාව 2010 - 147කි. කාර්ය මණ්ඩලයේ මුළු සේවක සංඛ්‍යාව 2011 - 136කි.

(ඇ) අදාළ නොවේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, මාගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. IIFA එක කාලයේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව, දුම්රිය දෙපාර්තමේන්තුව යටතේ රුපියල් කෝටි 1,180ක් වියදම් කරලා කටුනායක සිට කොළඹට දුම්රිය මාර්ගයක් ඇති කළා. මම හිතන හැටියට ඒ Katunayake Airport එකේ සිට එන දුම්රිය මාර්ගය. දැන් එය ක්‍රියාත්මක කරනවාද? කොතරම් වියදමක් දරලා තිබෙනවාද? ඇයි එහි කටයුතු නවත්වලා තිබෙන්නේ?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

ඒ ප්‍රශ්නය නැවත මගෙන් ඇහුවොත් මම ඒකට උත්තරයක් දෙන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

IIFA එක කාලයේ -

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

නැහැ, නැහැ. එය ප්‍රශ්නයක් හැටියට නැවත ඉදිරිපත් කළොත් හොඳයි ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ප්‍රශ්නයක් වශයෙන්ද?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

ඔව්. නැත්නම් මට ඕවා මතක නැහැ නේ. වෙන වෙන දේවල් මගේ ඔළුවේ තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

එහෙම නම් මම ඔබතුමාට ලෙහෙසි වෙන්න "ඇයි දැන් වැඩ කරන්නේ නැත්තේ?" කියලා ඇහුවොත්?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

වැඩ කරනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නැහැ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

වැඩ කෙරුවාට එහි ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ප්‍රශ්නය මොකක්ද?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

ඒ කියන්නේ කටුනායකින් බැහැපු මඟියා ආපහු වෑන් එකක නැඟලා station එකට එන්න ඕනෑ. ඉතින් එහෙම එන්නේ නැහැ නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඇයි එහෙම නම් ඔබතුමන්ලාගේ ආණ්ඩුව ඒක කළේ?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

ඒ මාර්ගය කෙළින්ම Katunayake Airport එකට හැදුවා නම් අන්න එතැනින් බැස්සා; බෑග් ටික ඇදගෙන ඇවිල්ලා නැග්ගා; ගියා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඉතින් ඔය මහින්ද චින්තන දුම්රියක් නේ?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

ඒක තමයි මම දැන් කරන්න යන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

දැන් පෙනෙනවා නේ යථාර්ථය මොකක්ද කියලා?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මහින්ද චින්තනයට අනුව අපි කටයුතු කරනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ කියන්නේ, හදනවා, කඩනවා, ගලවනවා-

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
නැහැ, නැහැ. හදනවා, කඩනවා නොවෙයි. කඩලාත් නැහැ-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය ගරු ඇමතිතුමනි. ඔබතුමන්ලා පෙබරවාරි මාසයේ 04 වන දා අනුරාධපුරයේ "දැයට කිරුළ" පැවැත්තුවා. අපේ නායකතුමාටත්, තිස්ස අත්තනායක මහතාටත්, මටත් "දැයට කිරුළ" පැවැති ස්ථානය බලන්න යන්න අවස්ථාවක් දැනට දවස් දෙකකට ඉස්සෙල්ලා හම්බ වුණා. ඒ යන අවස්ථාවේදී අපට පෙනුණා, රුපියල් මිලියන ගණනාවක් වියදම් කළ ඔයාමඩුවේ, "දැයට කිරුළ" තිබුණ ස්ථානයේ දැන් රේල් පීලි ගලවන බව. එතැන තිබුණු station එක ගලවලා කුඩු පට්ටම් කරලා. දැන් නිකම් සුසාන භූමියක් වාගේයි තිබෙන්නේ. ඔබතුමන්ලා මේ දවස් අටක සැණකෙළියකට ද මේ වාගේ වියදමක් දැරුවේ ඇමතිතුමනි?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒක ඒ සැණකෙළිය අනුවයි සිදු වන්නේ ගරු මන්ත්‍රීතුමනි. ඒ කාලයේ ගම් උදාවත් පැවැත්වූවා නේ. ඒ ගම් උදාවටත් ඕවා ගෙන ගියා. මේ සජිත් ප්‍රේමදාස මහත්මයා ඉන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගම් උදාව සැණකෙළියක් නොවෙයි. ඒවා තවමත් තිබෙනවා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒ කෝච්චියේ දැන් ඉතින් කවුරු යන්නද? දැන් ඒක තිබුණාය කියලා කවුද ඒකෙ යන්නේ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
යන කට්ටිය ඉන්නවා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
කවුරුවත් යන්නේ නැහැ. කොහේ යන්නද? ඒක දැන් නිකම් පැත්තකට දමලා තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලා මේවා විකෘති කරන්න හදනවා. එකක් සැණකෙළියක්, එකක් ආයෝජනයක්.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
නැහැ, නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගම් උදාව ආයෝජනයක්, මේක සැණකෙළියක්.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
නැහැ, නැහැ. මේක මිනිසුන් දැනුවත් කිරීම සඳහා කරපු ආකෘතියක්. ඉතින් ඒවා ගලවන්නේ නැතිව එතැන තියලා තියන්න යැ. ඒවා ආපසු අරගෙන යන්න එපා යැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
දැන් අතුරු ප්‍රශ්න පහක් විතර ඇහුවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අවසාන අතුරු ප්‍රශ්නය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මේකයි ගරු ඇමතිතුමනි. මා එතැන - දැයට කිරුළ සුසාන භූමිය ළඟ- සිටින අවස්ථාවේ දී -

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
දැයට කිරුළට ඔච්චර බය මොකද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, බයක් නැහැ. ඔබතුමන්ලා මේ අහිංසක ජනතාවගේ -

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
දැයට කිරුළ ගැනමයි කියන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
[බාධා කිරීමක්] අන්න, ණයට කිරුළක් කියලා කියනවා. දැයට කිරුළ, ණයට කිරුළක් බවට පත් වෙලා තිබෙන මේ සුසාන භූමිය ළඟ සිටි ඒ රේල් පීලි ගලවන එම්.ජී. සමරවීර අවුරුදු 22ක් සේවය කරලා තිබෙනවා, තවම ස්ථිර කරලා නැහැ. එම ස්ථානයේ හිටපු අංක 07, කන්ගිය, අනුරාධපුරය ලිපිනයේ පදිංචි එන්.ජී. ගුණරත්න යන අය අවුරුදු 19ක් සේවය කර තිබෙනවා, තවම ස්ථිර කරලා නැහැ. ඒ අය අපට කියනවා, "මෙතැනට ඇවිල්ලා මේ වාගේ මිලියන ගණනක් මුදල් නාස්ති කරනවා, අපි වාගේ අයව ස්ථිර කරන්නේ නැත්තේ ඇයි කියලා කරුණාකරලා කුමාර වෙල්ගම ඇමතිතුමාගෙන් අහන්න" කියලා. ඉතින් මා ඔබතුමාගෙන් අහනවා. ඔබතුමාගේ උත්තරය මොකක්ද?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
නැහැ, නැහැ. ඒ අය ඉවත් කරන්නේ නැහැ ඔබතුමා ප්‍රශ්නය ඇහුවා කියලා. ඒ අයව ස්ථිර කරනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ස්ථිර කරනවා?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ෆයිල් එක ගෙනැල්ලා බලලා සුදුසු නම් ස්ථිර කරනවා

## ඇත්ගාල නව නගරයේ වෙළඳ සංකීර්ණය ඉදි කිරීම : වැය වූ මුදල
## எத்கால புதிய நகர சந்தைத்தொகுதி நிர்மாணம் : செலவிட்ட பணம்
## CONSTRUCTION OF SHOPPING COMPLEX IN ETHGALA NEW TOWN: MONEY SPENT

1578/'11

13. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව මගින් ඉදි කරන ලද ඇත්ගාල නව නගරයේ වෙළඳ සංකීර්ණයේ කඩ කාමර රැසක් ප්‍රයෝජනයට නොගෙන වසා දමා ඇති බවත්;

(ii) මෙම කඩ කාමර බදු දීම මගින් විශාල මුදල් ප්‍රමාණයක් ප්‍රාදේශීය සභාවට උපයා ගත හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වෙළඳ සංකීර්ණයේ ඉදි කිරීම් කටයුතු සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

(ii) වසා දමා ඇති කඩ කාමර බදු දී ආදායම් උපයා ගැනීමට කටයුතු නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඇත්ගාල නව නගර වෙළඳ සංකීර්ණයේ දැනට වසා දමා ඇති කඩ කාමර ජනතා අයිතියට පැවරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கண்டி மாவட்டத்தின் கங்க இஹல கோரளே பிரதேச சபையினால் நிர்மாணிக்கப்பட்ட எத்கால புதிய நகரத்தின் சந்தைத் தொகுதியின் பல கடை அறைகள் பயன்படுத்தப்படாது மூடப் பட்டுள்ளதென்பதையும்;

(ii) இக்கடை அறைகளை குத்தகைக்கு வழங்கு வதன் மூலம் பிரதேச சபையினால் பெருந் தொகைப் பணத்தை ஈட்டிக்கொள்ளலாமென் பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி கடைத்தொகுதியின் நிர்மாணப் பணி களுக்காக செலவிடப்பட்டுள்ள மொத்தப் பணத்தொகை எவ்வளவென்பதையும்;

(ii) மூடப்பட்டுள்ள கடை அறைகளை குத்தகைக்குக் கொடுத்து வருமானம் ஈட்டிக்கொள்ளாமைக் கான காரணங்கள் யாவையென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) எத்கால புதிய நகரத்தின் சந்தைத் தொகுதியில் தற்போது மூடப்பட்டுள்ள கடை அறைகளை மக்கள் உரிமைக்காக ஒப்படைப்பதற்கு நட வடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) ஆமெனில், அத்திகதி யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Local Government and Provincial Councils:

(a) Is he aware that-

(i) a number of shops in the shopping complex in the Ethgala new town built by the Ganga Ihala Korale Pradeshiya Sabha in the Kandy District have been closed down without making any use of; and

(ii) the Pradeshiya Sabha can earn a substantial income by leasing out these shops?

(b) Will he state-

(i) the total sum of money spent to construct this shopping complex; and

(ii) the reasons for not making arrangements to lease out those shops and generate an income?

(c) Will he inform this House-

(i) whether action will be taken to make the closed down shops in the shopping complex of the Ethgala new town available for the use of people; and

(ii) if so, the date on which it will be done?

(d) If not, why?

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා (පළාත් පාලන හා පළාත් සභා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க - உள்ளூராட்சி, மாகாண சபைகள் பிரதி அமைச்சர்)
(The Hon. Indika Bandaranayake - Deputy Minister of Local Government and Provincial Councils)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) (i) රු. 12,959,751.10 ( එක්කෝටි විසිනවලක්ෂ පනස්නවදහස් හත්සිය පනස්එකයි ශත දහයයි)

(ii) වෙළෙඳ සංකීර්ණයේ පහත මාලයේ කඩ කාමර 19ක් වන අතර ඉන් කඩ කාමර 12ක් ටෙන්ඩර් මඟින් ලබා දී ඇත. එම බදුකරුවන් ගිවිසුම් ප්‍රකාරව ටෙන්ඩර් මුදල් සභාව වෙත නොගෙවීම හේතුවෙන් සභාව මඟින් ඒවා විවෘත කිරීම සඳහා ඉඩ ලබා දී නැත. ඉතිරි කඩ කාමර 07 ලබා දීම සඳහා ටෙන්ඩර් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(ඇ) (i) ඔව්.

(ii) 2012.03.29 වන දින නැවත ටෙන්ඩර් කැඳවීමට මහ සභාව තීරණය කර ඇති අතර ඒ අනුව බදුකරුවන් තෝරා ගත් වහාම.

(ඈ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මේකයි. මහනුවර දිස්ත්‍රික්කයේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇත්ගාල නව නගරයේ වෙළෙඳ සංකීර්ණයේ පමණක් නොවෙයි, තවත් බොහෝ වෙළෙඳ සංකීර්ණවල තිබෙන ගැටලුවක් තමයි, බදු මුදලක් ගෙවා ලබා ගන්නා කඩ කාමර දිගටම වසා තිබෙන එක. බදු මුදලත් ගෙවනවා. හැබැයි ඒ කඩ කාමර දිගටම වසා තිබෙනවා. එහෙම නැත්නම් ප්‍රාදේශීය සභාව එක වෙළෙන්දකුගෙන් බදු මුදලක් අරගෙන, ඊට පස්සේ ඊට වඩා වැඩි ගණනකට තවත් කෙනකුට බදු දෙනවා. මේ අක්‍රමිකතා සම්බන්ධයෙන් මැදිහත් වන්නේ කොහොමද?

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා අහලා තිබෙන්නේ ඇත්ගාල නව නගරයේ වෙළෙඳ සංකීර්ණය ගැන විතරයි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ඇත්ගාල නව නගරයේ වෙළෙඳ සංකීර්ණය ඇතුළුව තවත් බොහෝ තැන්වල මේ ප්‍රශ්නය තිබෙනවා.

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)

ඇත්ගාල නව නගරයේ වෙළෙඳ සංකීර්ණය ගැන ඔබතුමා මේ ප්‍රශ්නය ඇහුවා එක ඇත්තටම හොඳයි. කෙසේ වෙතත්, ඉතුරු ප්‍රාදේශීය සභාවලත් ඒ වැඩි ගෙන යන කඩ කාමර පිළිබඳව තොරතුරු ඔබතුමා අපට ලබා දීලා අපව දැනුවත් කරනවා නම් ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන්න පුළුවන්. දැනට ඔබතුමා අහලා තිබෙන ප්‍රශ්නයට අපි සාධාරණ පිළිතුරක් ලබා දීලා තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මගේ දෙවන අතුරු ප්‍රශ්නය මේකයි. බොහෝ වෙළෙඳ සංකීර්ණවල තිබෙන ගැටලුවක් තමයි, කඩ කාමර ගන්න බොහෝ දෙනකුට කප්පම්කරුවන්ගෙන් තිබෙන ප්‍රශ්නය. සමහර දේශපාලනඥයන් මැදිහත් වෙලා කප්පම් ගැනීමේ සිද්ධි පිළිබඳව වාර්තා වනවාය කියලා ඊයේ පෙරේදා මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමාත් කියා තිබෙනවා අපි දැක්කා. මේ වාගේ වෙළෙඳ සංකීර්ණවල සහ ආර්ථික මධ්‍යස්ථානවල සිටින කප්පම්කරුවන් මර්දනය කිරීම සඳහා ගන්නා ක්‍රියා මාර්ග මොනවාද, ඒ සඳහා මැදිහත් වන්නේ කොහොමද? මොකද, මිනිස්සු මේ කඩ කාමර පාවිච්චි නොකිරීමට ඒකත් බලපානවා.

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)

මෙතැන කප්පම්කරුවන් පිළිබඳව ප්‍රශ්නයක් ඇති වෙලා නැහැ, මන්ත්‍රීතුමා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මුළු රටටම ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ.

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)

මේ ප්‍රශ්නයට අදාළ නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා, කප්පම් සම්බන්ධයෙන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයෙන් ඇසිය යුතුයි. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මේකයි. කප්පම්කරුවන් ගැන අහන කොට ආරක්ෂක අමාත්‍යාංශයට බෝලය පාස් කරනවා. ඒකට කමක් නැහැ. ඒක ඔබතුමන්ලාගේ අභ්‍යන්තර ප්‍රශ්නයක්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය යටතේ ලබා දෙන මෙවැනි කඩ කාමර සම්බන්ධයෙන් සමහර පළාත් පාලන ආයතන ගන්නා ක්‍රියා මාර්ග ඒ ප්‍රදේශවල ව්‍යාපාර කටයුතුවල, වෙළහෙළදාම්වල යෙදෙන්න බලාපොරොත්තු වන අයට අහිතකර විධියට බලපානවා. එම නිසා අමාත්‍යාංශය කල්පනා කරන්නේ නැද්ද, රටටම ගැළපෙන විධියට පොදු නිර්ණායක මාලාවක් පළාත් පාලන ආයතන වෙත යොමු කළොත් මීට වඩා කාර්යක්ෂමව මේ වෙළෙඳ සංකීර්ණවල කඩ කාමර වෙළෙන්දන්ට ලබා දෙන්න පුළුවන්ය කියලා සහ ඒ වෙනුවෙන් පළාත් පාලන ආයතනවලට වැඩි ආදායමක් ලබා ගන්න පුළුවන්ය කියලා.

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon.  Indika  Bandaranayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවැනි වැඩ කටයුතු කරන්නේ ඒ පළාත් පාලන ආයතන හරහායි.  ඇත්ත වශයෙන්ම මෙතුමා කියන විධියේ ගැටලුවක් අපිට ඇති වෙලා නැහැ. එහෙම ගැටලුවක් ඇති වුණොත් අපිට ඒවාට මැදිහත් වීමේ අවස්ථාව තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

හොඳයි.

## රංගිරි දඹුලු ක්‍රිකට් ක්‍රීඩාංගණය : ආසන
## ரங்கிரி தம்புள்ளை கிரிக்கட் விளையாட்டரங்கு: இருக்கைகள்
## RANGIRI DAMBULU CRICKET STADIUM : SEATS

1813/'11

15. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon.  Dayasiri Jayasekara)

ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) රංගිරි දඹුලු ක්‍රිකට් ක්‍රීඩාංගණය ජාත්‍යන්තර ක්‍රිකට් තරග සඳහා භාවිතයෙන් ඉවත් කිරීමට තීරණය කර තිබේද;

(ii) එම ක්‍රීඩාංගණය සඳහා මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

(iii) එහි තරග නරඹන ප්‍රේක්ෂකයින් සඳහා සවි කර ඇති ආසන (නැරඹුම් පුටු) සංඛ්‍යාව කොපමණද;

(iv) එම ආසනවලින් කොටසක් ගලවා ඉවත් කර තිබේද;

(v) එසේ නම්, ඉවත් කරන ලද ආසන සංඛ්‍යාව සහ ඊට හේතු කවරේද;

(vi) ඉවත් කරන ලද ආසන වෙනුවට වෙනත් ආසන සවි කරන්නේද;

(vii) ගලවා ඉවත් කරන ලද එක් ආසනයක වෙළඳ පළ වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ரங்கிரி தம்புள்ளை கிரிக்கட் விளையாட்டரங்கை சர்வதேச கிரிக்கட் போட்டிகளுக்கு பயன்படுத்து வதிலிருந்து நீக்குவதற்கு தீர்மானிக்கப் பட்டுள்ளதா என்பதையும்;

(ii) மேற்படி விளையாட்டரங்கிற்காக இதுவரை செலவிடப்பட்டுள்ள பணத்தொகை எவ்வள வென்பதையும்;

(iii) இங்கு போட்டிகளைக் கண்டுகளிக்கும் பார்வை யாளர்களுக்காகப் பொருத்தப்பட்டுள்ள இருக் கைகளின் (பார்வையாளர் கதிரைகள்) எண் ணிக்கை எவ்வளவென்பதையும்;

(iv) மேற்படி இருக்கைகளில் ஒரு பகுதி கழற்றி அகற்றப்பட்டுள்ளதா என்பதையும்;

(v) ஆமெனின், அகற்றப்பட்ட இருக்கைகளின் எண்ணிக்கை மற்றும் அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(vi) அகற்றப்பட்ட இருக்கைகளுக்கு பதிலாக வேறு இருக்கைகள் பொருத்தப்படுமா என்பதையும்;

(vii) கழற்றி அகற்றப்பட்ட ஒவ்வொரு இருக்கை யினதும் சந்தைப் பெறுமதி எவ்வளவென் பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Sports:

(a) Will he state-

(i) whether it has been decided not to make use of the Rangiri Dambulu International Cricket Stadium for international cricket matches;

(ii) the amount of money spent on the above named cricket stadium up to now;

(iii) the number of seats fixed therein for the use of the viewers;

(iv) whether a portion of such seats has been removed;

(v) if so, the numbers of seats so removed and the reason for such an action;

(vi) whether these removed will be replaced with new seats; and

(vii) the market value of a seat so removed?

(b) If not, why?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - விளையாட்டுத் துறை அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Sports )

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි:

(අ) (i) ඒ ක්‍රීඩාංගණය ජාත්‍යන්තර ක්‍රිකට් සංචිතයෙන් ඉවත් කරලා නැහැ. නමුත් දිවා රාත්‍රී තරග සඳහා පමණක් ඉවත් කරලා තිබෙනවා.

(ii) එම ක්‍රීඩාංගණය සඳහා මේ වන විට වැය කර ඇති මුදල රු. 590,962,402යි.

(iii) රංගිරි දඹුලු ක්‍රීඩාංගණයේ ඇති නැරඹුම් පුටු සංඛ්‍යාව 8,938.

(iv) එහි ආසනවලින් කොටසක් ගලවා ඉවත් කර නැත.

(v) අදාළ නොවේ.

(vi) අදාළ නොවේ.

(vii) අදාළ නොවේ.

(ආ) පැන නොනඟී.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මේකයි. රංගිරි දඹුලු ක්‍රිකට් ක්‍රීඩාංගණය ඒ කාලයේ ස්ථාපිත කළේ, විශේෂයෙන් කුරුණෑගල, පොළොන්නරුව, මාතලේ සහ අනුරාධපුර ප්‍රදේශවල ඉන්න අයට පහසු නිසායි. ඇත්තටම පසු ගිය අවුරුදු පහ ගත්තාම එක අවුරුද්දක විතරයි -පසු ගිය අවුරුද්දේ තිබුණ ලෝක කුසලාන ක්‍රිකට් තරගයේදී විතරයි- ඒ ක්‍රීඩාංගණය පාවිච්චි කළේ. දිවා රාත්‍රී තරග පවත්වන්නත් පුළුවන් විධියට විශාල වියදමක් දරලායි ඒ ක්‍රීඩාංගණය මේ තත්ත්වයට ගෙනැල්ලා තිබෙන්නේ. ඒ රංගිරි දඹුලු ක්‍රීඩාංගණය ක්‍රිකට් ක්‍රීඩාව සඳහා පාවිච්චියට ගන්නේ නැත්තේ ඇයි? ඔබතුමන්ලා ඒකේ football ගහන්නවත් බලාපොරොත්තු වනවාද කියලා මම අහන්න කැමැතියි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ඕනෑ නම් අපිට football ගහන්න පුළුවන් විපක්ෂ නායකතුමාගෙයි, තමුන්නාන්සේලාගේ සජිත් ප්‍රේමදාස මහත්තයාගෙයි team එකක් දුන්නොත්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මම ප්‍රශ්නයක් ඇහුවාම ඒකට- [බාධා කිරීමක්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා මගෙන් ක්‍රිකට් ගැන ඇහුවා නම් උත්තරය දෙනවා. එතුමා football ගැන ඇහුවේ. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ක්‍රිකට් ගැන අහන්න කෝ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

අපි ගහන්නේ- [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පිළිතුර දුන්නාද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

අපි සාමාන්‍යයෙන් ක්‍රිකට් ක්‍රීඩාංගණයේ football ගහන්නේ නැහැ. ඔබතුමන්ලා එහෙම ගහනවා නම් අපි දෙන්නම් team එකක් ක්‍රිකට් ක්‍රීඩාංගණයේ football ගහන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

අනේ! වික්‍රමසිංහ මහත්තයා විහිළුවක් කළා. මම ඇහුවාමයි විපක්ෂ නායකතුමා විහිළුවක් කළා. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමා, හෙට අනිද්දා ඔබතුමාවත් එළියට දමන්නයි ඉන්නේ. [බාධා කිරීමක්] අපි මාතෘකාවට යමු. සමා වෙන්න. ඔබතුමා මගේ මිත්‍රයා නේ. ගරු මන්ත්‍රීතුමා, ඒ ක්‍රීඩාංගණය අපි මොනම හේතුවකටවත් ඉවත් කරන්න බලාපොරොත්තුවක් නැහැ. ඒ ප්‍රදේශයේ වෙනත් ක්‍රීඩාංගණ නැහැ කියා ඔබතුමා කියන එකට මම එකඟයි. ඒක අපිට තිබෙන ඉතාම හොඳ ක්‍රීඩාංගණයක්. 2010 අපි Asian Cup එක ගැහුවේ ඒ ක්‍රීඩාංගණයේ. තරගාවලි 15ක් තිබුණා.

ඊට කලින් Triangular Cup එක තිබුණා. Tri-nation Tournament එක ගැහුවේත් දඹුල්ලේයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වැරදි තොරතුරක් දී තිබෙනවා. මම දන්නවා, ඔබතුමාට ඔය තොරතුර දුන්නේ කවුද කියලා. අපේ පැත්තෙන්මයි ඔය තොරතුර දුන්නේ. [බාධා කිරීමක්] මට විනාඩියක් දෙන්න. මම කියන්නම්. මම උත්තර දීලා ඉවර නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

කවුද ඔය තොරතුර දුන්නේ?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මම දන්නවා. මම කියන්නේ නැහැ. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා අවුරුදු පහක් මේ ක්‍රීඩාංගණයේ - [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ ආසනයේ ලයිට් එක පත්තු කරන්න. -[බාධා කිරීමක්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒ මන්ත්‍රීතුමාගේ ලයිට් එක දැන් නැහැ. පිච්චිලා. [බාධා කිරීම්] මයික් එකේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
හරි. දැන් පත්තු වෙනවා. [බාධා කිරීමක්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මගේ මිත්‍ර ගරු මන්ත්‍රීතුමනි, මේ සභාවේ කාලය නාස්ති කරන්න එපා. ඔබතුමා කිව්වා, අවුරුදු පහක් මේ ක්‍රීඩාංගණයේ තරග පවත්වා නැහැ කියලා. මම ඔබතුමාට කිව්වා තරගාවලි - tournaments - දෙකක් ගැහුවාය කියලා. ඊට අමතරව ගරු මන්ත්‍රීතුමනි, මේ අවුරුද්දේ මැයි, ජූනිවල Pakistan tour එකත්, ඉන්දියානු tour එක July, Augustවලට දමන්නත් තීරණය කළා. ගරු මන්ත්‍රීතුමනි, T-20 එක ගහන්න මම පෞද්ගලිකව මැදිහත් වුණා. T-20 World Cup එක දඹුල්ලට දමන්නය කියා මම පෞද්ගලිකව කිව්වා. Tournament Committee එක ඒක තෝරලා තිබුණේ නැහැ. නමුත් ICC එක ගියාට පසුව එතැන training venue එකක් නැහැ. ඒ match එක ගහනකොට train කරන්න venue එකක් නැහැ. විනාඩි 45ක් ඇතුළත පිට්ටනියක් නැහැ. ඒ නිසා T-20 එක ගහන්න අපට බැරි වුණා. නමුත් ඉදිරියේදී පැවැත්වීමට නියමිත සියලුම ක්‍රීඩා තරගාවලි සඳහා දඹුල්ල ක්‍රීඩාංගණය පාවිච්චි කරනවා. අපි එහෙම පාවිච්චි නොකර ඉන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම මේ අහන්නේ දෙවන අතුරු ප්‍රශ්නය නොවෙයි. ඔබතුමන්ලාගේ පැත්තේ කෙනෙක් මට තොරතුරු දුන්නාය කිව්වා. ඒ තොරතුරු දුන්නේ කවුද කියා මම අහන්න කැමැතියි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමාගේ මිත්‍රයා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කවුද මිත්‍රයා?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
විපක්ෂ නායකතුමා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඉතින් එතුමා අපේ පැත්තේනේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
දන්නේ නැද්ද විපක්ෂ නායකතුමා අපේය කියලා? එතුමා අපේය කියා දන්නේ නැද්ද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ ඔබතුමන්ලා කියන හැටියට නේ. එතුමා අපේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමන්ලා නේ වේදිකාවේ කියන්නේ විපක්ෂ නායකතුමා ආණ්ඩුවට කඩේ යනවාය කියලා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතුමා අපේ විපක්ෂ නායකතුමා. ඔබතුමන්ලාගේ වෙන්නේ කොහොමද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
එතුමා අපේ තමයි. අපේ විපක්ෂ නායකතුමා. තව අවුරුදු 100ක් විපක්ෂ නායක වෙන්න ඕනෑ. මගේ ආයුෂත් අරගෙන හැමදාම විපක්ෂ නායක වෙන්න ඕනෑ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම දෙවන අතුරු ප්‍රශ්නය අහනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම අහන්නේ, පුටු ගැලවීම සම්බන්ධයෙනුයි. ඇත්තෙන්ම මේ රංගිරි දඹුලු ක්‍රීඩාංගණයේ පුටු ගලවා රැගෙන යාමට තැත් කරනකොට විශේෂයෙන්ම නගරාධිපති ජාලිය ඕපාත මැතිතුමාත්, දඹුල්ල මහ නගර සභාවේ විපක්ෂ නායක තිස්ස බණ්ඩාර හේරත් මැතිතුමාද ඇතුළු දඹුල්ල මහ නගර සභාවේ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් සියලු දෙනාම ගිහින් ඒකට විරුද්ධ වෙලා, ලොකු උද්ඝෝෂණයක් කරලා පුටු ගලවාගෙන යන්න හදපු එක නතර කළා. ඒ ගැන අපි ස්තුතිවන්ත වෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කියන්නේ එහෙම මොකක්වත් කරලා නැහැ කියලායි. දැන් එතැන තිබෙන හැටියට ඔවුන්ගේ ප්‍රකාශනවල තිබෙනවා-

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමා, මමයි ක්‍රීඩා ඇමති. ඔබතුමා නොවෙයි නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා දන්නේ නැතිව පුටු ටික ගලවනවානේ. ඒකයි මම කියන්නේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මම ඔබතුමාට උත්තර දෙන්නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ. නැහැ. විනාඩියක් ඉන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ලෝක කුසලානය වෙලාවේ-

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
විනාඩියක් ඉන්න. මම ප්‍රශ්නය අහලා ඉවර නැහැ. තවම අහගෙන යනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මම දන්නවා. දඹුල්ලේ පුටු ගැලෙව්වාද? නැද්ද? ඒකයි ප්‍රශ්නය.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එක මම නේ අහන්න ඕනෑ. ඔබතුමා අහලා හරියන්නේ නැහැ නේ. එහෙනම් ප්‍රශ්නයයි උත්තරයයි අතුරු ප්‍රශ්නයි ඔබතුමාම අහගන්න. මම ඉඳ ගන්නම්.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
කියන්න. කියන්නකෝ. ඒකත් විපක්ෂ නායකතුමා ද කිව්වේ?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතුමාගෙන් අහගෙන නේන්නම් අප වැඩ කරන්නේ. අපේ විපක්ෂ නායකතුමානේ. ඔබතුමාලාගේ යැ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා වමෙන්ද අහන්නේ? දකුණෙන්ද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ. එතකොට මේ පුටු ගලවපු ඡායාරූප ඔක්කොම තිබෙනවා. මම ඒකයි එතුමන්ලාට ස්තුති කළේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමාට උත්තරය දෙන්න ඔබතුමා මට ඉඩ දුන්නේ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එහෙම සිද්ධියක් සිද්ධ වුණේ නැහැ කියා ඔබතුමා කියා තිබෙනවා. එහෙම සිද්ධියක් සිද්ධ වුණාය කියා ඔබතුමා දැන්වත් පිළිගන්නවාද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මම ඔබතුමාට කිව්වේ ගලවා අරගෙන ගියේ නැහැ කියන එකයි. ගරු මන්ත්‍රීතුමා ලෝක කුසලානය වෙලාවේ අපට-

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගැලෙව්වා; අරගෙන ගියේ නැහැ?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අහගෙන ඉන්නකෝ. අප ඇණවුම් කර තිබුණු පුටු ප්‍රමාණය ලැබෙන්න ප්‍රමාදයක් වුණා. ඒ අනුව අප පුටු ප්‍රමාණයක් දඹුල්ලෙන් ගෙනෙන්න උත්සාහ කළා. එතැනදී මතු වෙච්ච විරෝධතාවක් නිසා අප පුටු ගෙනාවේ නැහැ. හැබැයි අපේ කලින් පුටු shipment එක වෙලාවට ආව නිසා අපට පුටු අවශ්‍ය වුණේ නැහැ. එහෙම යෝජනාවක් තිබුණා. නමුත් අප ඒක ක්‍රියාත්මක කළේ නැහැ. විපක්ෂ නායකතුමා ඔබතුමාව නොමඟ යවා තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ. එතුමා ඔබතුමන්ලාව නොමඟ යවනවා. එච්චරයි කරන්නේ. මම තුන්වන අතුරු ප්‍රශ්නය අහනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මට අතුරු ප්‍රශ්නයක් ඔබතුමාගෙන් අහන්න පුළුවන්ද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මගෙන්ද? එළියේදී අහමු. මම තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න කැමැතියි. ඔබතුමා දන්නවා, ක්‍රිකට් බෝර්ඩ් එකේ-ශ්‍රී ලන්කන් ක්‍රිකට් ආයතනයේ- තවම විගණකාධිපති වාර්තාව ඉදිරිපත් වෙලා නැහැ කියා. සාමාන්‍යයෙන් මාස තුනකින් ඉදිරිපත් කරන්නට ඕනෑ. ඔබතුමන්ලා පිට රටවල් එක්ක වෙන වෙන විධියට ගනුදෙනු කළාට ක්‍රිකට් ක්‍රීඩාවේ තිබෙන ප්‍රශ්න ඔබතුමා දන්නවා. එම වාර්තාව ඉදිරිපත් කර නැති නිසා තමයි, අපට තවත් හම්බ වෙන්න තිබෙන විශාල මුදල් ප්‍රමාණයක්-

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා කියන්නේ World Cup එකෙන්ද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
World Cup එකෙන්.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
World Cup එකේ accounts ටික ඔක්කොම Auditor-Generalට යවලා ඉවරයි. අපට දැන් queries වගයක් එවා තිබෙනවා. ඒවාටත් අප උත්තර යැව්වා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එක තමයි මම කියන්නේ. මාස තුනකින් සාමාන්‍යයෙන්-

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමා, මාස දෙකකට කලින් අප විගණකාධිපතිතුමාට යැව්වේ. විගණකාධිපතිතුමා අපෙන් queries අහලා එවා තිබෙනවා. ඒකටත් ගිය මාසයේ අප උත්තර ටික යැව්වා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමාගේ කාලය ගැන නොවෙයි මා මේ කියන්නේ. දැන් අවුරුද්දක් වෙනවා, මේක ඉවර කරලා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමා ඉන්දියාව, බංග්ලා දේශය අපට පස්සේ යැව්වේ. මේ World Cup ගහපු රටවල් තුනෙන් ලංකාව තමයි ඉස්සෙලාම යැව්වේ ගරු මන්ත්‍රීතුමා. ප්‍රමාදයක් වුණා. අප පිළිගන්නවා. හැබැයි, අප යැව්වා. අපට එන සල්ලි ටිකත් මේ මාසයේ අන්තිමට එනවා. දැන් ඒකේ ගැටලුවක් නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දැන් යවලා තිබෙනවා ද? යවලා නැහැනේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
යවලා තිබෙනවා ගරු මන්ත්‍රීතුමා. මුදල් ටික මේ මාසයේ අන්තිමට එනවා. දැන් ඒ ගැටලුව නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන වටය.

## හම්බන්තොට වරාය ව්‍යාපෘතිය : විස්තර
## அம்பாந்தோட்டை துறைமுகக் கருத்திட்டம்:விபரம்
## HAMBANTOTA HARBOUR PROJECT : DETAILS

0562/,10

1. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (4):

(අ) (i) හම්බන්තොට වරාය ව්‍යාපෘතියේ පළමු අදියරේ කොන්ත්‍රාත්කරුවන්ගේ නම් කවරේද;

(ii) එකී කොන්ත්‍රාත්කරුවන් තෝරා ගනු ලැබුවේ ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කිරීමෙන්ද;

(iii) එසේ නම්, එම ටෙන්ඩර්කරුවන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හම්බන්තොට වරාය ව්‍යාපෘතියේ දෙවැනි අදියර ආරම්භ කරන දිනය සහ අවසන් කරන දිනය කවරේද;

(ii) ඒ සඳහා මුදල් සම්පාදනය කරන්නේ කෙසේද;

(iii) පොලිය සහ ඉදිකිරීම් වියදමට අනුව සම්පූර්ණ පිරිවැය කොපමණද;

(iv) ඉදිරි වර්ෂ හය සඳහා වූ මුදල් ප්‍රවාහය පිළිබඳ පුරෝකථනය කවරේද;

(v) ප්‍රාග්ධනය සහ පොලිය සඳහා වන වියදම ද, අනෙකුත් මෙහෙයුම් වියදම් ද, ඉදිරි වර්ෂ දහය තුළ එක් එක් වර්ෂයේ දී ලැබීමට නියමිත ආදායම් ද ඇතුළුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) කොළඹ වරායෙන් ලැබෙන ආදායම හම්බන්තොට වරාය ව්‍යාපෘතිය සඳහා ලබා ගත් ණය ගෙවීම සඳහා යොදා ගන්නේද;

(ii) ණය මුදල ආපසු ගෙවීම ආරම්භ වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அம்பாந்தோட்டை துறைமுகக் கருத்திட்டத்தின் முதலாம் கட்டத்தின் ஒப்பந்தக்காரர்களின் பெயர்களையும்,

(ii) கேள்வி பத்திர செயன்முறை மூலமாகவா மேலே குறிப்பிடப்பட்டுள்ள ஒப்பந்தக்காரர்கள் தெரிவு செய்யப்பட்டனர் என்பதையும்,

(iii) அவ்வாறாயின், கேள்விப்பத்திரதாரர்களின் பெயர்களையும்,

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) அம்பாந்தோட்டை துறைமுகக் கருத்திட்டத்தின் இரண்டாம் கட்டமானது எப்போது ஆரம்பிக்கப் பட்டு பூர்த்தி செய்யப்படும் என்பதையும்,

(ii) அதற்கு எவ்வாறு நிதியிடப்படும் என்பதையும்,

(iii) வட்டி மற்றும் நிர்மாணச் செலவு ஆகியவற்றி னடிப்படையில் மொத்தச் செலவினையும்,

(iv) அடுத்த 6 வருடங்களுக்கான காசுப்பாய்ச்சல் எதிர்வு கூறலையும்,

(v) மூலதனச் செலவு மற்றும் வட்டிச் செலவு, ஏனைய இயக்குச் செலவுகள் மற்றும் அடுத்த 10 வருடங்களுள் பெறப்படவுள்ள வருமானம் ஆகியவை உள்ளிட்ட காசுப்பாய்ச்சல் கூற்றினை வருட அடிப்படையிலும்

அவர் மேலும் குறிப்பிடுவாரா?

(இ) (i) அம்பாந்தோட்டை துறைமுகக் கருத்திட்ட நிர்மாணச் செலவுகளுக்காக எடுத்த கடனை மீளச் செலுத்த கொழும்புத் துறைமுகத்தின் வருமானம் பயன்படுத்தப்படுமா என்பதையும்,

(ii) கடனை மீளச் செலுத்தத் தொடங்க வேண்டிய திகதியினையும்

அவர் இச்சபைக்கு அறியத் தருவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways:

(a) Will he state-

(i) the names of the contractors of phase I of the Hambantota Harbour Project;

(ii) whether the aforesaid contractors were selected through a tender procedure; and

(iii) if so, the names of the tenderers?

(b) Will he also state-

(i) as to when phase II of the Hambantota Harbour Project will be commenced and completed;

(ii) as to how it will be financed;

(iii) the total cost in terms of interest and construction cost;

(iv) the forecast of cash flow for the next six years; and

(v) the cash flow statement inclusive of the capital and interest cost, other operational cost and the revenue to be gained for the next 10 years on per year basis?

(c) Will he inform this House-

(i) whether the income of the Colombo Port will be utilized to pay the loan taken for the Hambantota Harbour Project; and

(ii) the date from which the loan is payable?

(d) If not, why?

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) චයිනා හාබර් සමාගම සහ සයිනො හයිඩ්‍රෝ සමාගම යන සමාගම්වලින් සමන්විත පොදු සමාගම (CHEC - SCL Joint Venture).

(ii) මෙම කොන්ත්‍රාත්තුව චීන රජය විසින් නම් කරනු ලැබූ ඉහත විදේශ සමාගම වෙත අදාළ ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරමින්, සාකච්ඡා කර එකඟ වූ මිල ගණන් මත අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ ලබා දෙන ලදී.

(iii) චයිනා හාබර් සමාගම සහ සයිනො හයිඩ්‍රෝ සමාගම යන සමාගම්වලින් සමන්විත පොදු සමාගම (CHEC - SCL Joint Venture).

(ආ) (i) ආරම්භ කරන දිනය - 2012

අවසන් කරන දිනය - 2015

මෙම අදියරේ ඉදි කිරීම් ආරම්භ කිරීම සඳහා කටයුතු සූදානම් කරමින් සිටින අතර නිශ්චිත දිනය තීරණය වී නොමැත. අවසන් කරන දිනය ලෙස 2015 වර්ෂය ඉලක්ක කරනවා.

(ii) චීනයේ Exim බැංකුවෙන් ලබා ගන්නා ණය මුදල් මඟිනි.

(iii) ඇස්තමේන්තුගත මුළු පිරිවැය ඇමෙරිකානු ඩොලර් මිලියන 808කි.

(iv) සහ (v) සඳහා ඇමුණුම 01 සහ 02 **සභාගත*** කරමි.

(ඇ) (i) හම්බන්තොට වරාය ව්‍යාපෘතියේ පළමු අදියරට අදාළ ණය ගෙවීම සඳහා අවශ්‍ය වන අතිරේක මුදල් පළමු වසර තුන තුළදී පමණක් කොළඹ වරායෙන් ලැබෙන ආදායමෙන් ලබා ගන්නා අතර, පසුව සම්පූර්ණයෙන්ම හම්බන්තොට වරායෙන් ලැබෙන ආදායමෙන් පියවා ගැනීමට සැලසුම් කර ඇත.

(ii) අදාළ ගිවිසුම අනුව ව්‍යාපෘතිය නිම වී වසරකට පසුව ණය මුදල ආපසු ගෙවීම ආරම්භ කරනු ඇත. ඒ අනුව පළමුවන අදියරේ ණය පියවීම 2012 වර්ෂයේදී ආරම්භ කරනු ලැබේ.

(ඈ) පැන නොනඟී.

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

***සභාමේසය මත තබන ලද ඇමුණුම්:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு கள்:*
*Annexes tabled:*

**Annexe I**

## Hambantota Port Development Project (Phase II) Port Work

Report of Feasibility Study

| | Year | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 | 2031 | 2032 | 2033 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | Cash inflow | | | | 54.58 | 65.36 | 81.43 | 97.54 | 108.43 | 108.85 | 109.33 | 109.87 | 110.48 | 111.17 | 111.96 | 112.84 | 113.84 | 114.96 | 116.24 | 117.67 | 119.30 | 121.14 | 123.21 | 566.87 |
| 1.1 | Revenue | | | | 54.58 | 65.36 | 81.43 | 97.54 | 108.43 | 108.85 | 109.33 | 109.87 | 110.48 | 111.17 | 111.96 | 112.84 | 113.84 | 114.96 | 116.24 | 117.67 | 119.30 | 121.14 | 123.21 | 125.56 |
| 1.2 | Residual value of the fixed assets | | | | | | | | | | | | | | | | | | | | | | | 427.34 |
| 1.3 | Circulating fund recovery | | | | | | | | | | | | | | | | | | | | | | | 13.97 |
| 2 | Cash outflow | 271.33 | 271.33 | 271.33 | 11.04 | 7.14 | 9.21 | 10.70 | 11.10 | 9.94 | 9.95 | 9.97 | 9.99 | 10.00 | 10.03 | 39.29 | 39.66 | 40.08 | 40.56 | 41.09 | 41.70 | 42.38 | 43.16 | 44.03 |
| 2.1 | Construction investment | 271.33 | 271.33 | 271.33 | | | | | | | | | | | | | | | | | | | | |
| 2.2 | Increased circulating fund | | | | 6.09 | 1.20 | 1.79 | 1.80 | 1.22 | 0.05 | 0.05 | 0.06 | 0.07 | 0.08 | 0.08 | 0.10 | 0.11 | 0.12 | 0.14 | 0.16 | 0.18 | 0.20 | 0.23 | 0.25 |
| 2.3 | Operational cost | | | | 4.95 | 5.94 | 7.42 | 8.90 | 9.89 | 9.89 | 9.90 | 9.91 | 9.92 | 9.93 | 9.94 | 9.95 | 9.97 | 9.99 | 10.01 | 10.03 | 10.05 | 10.08 | 10.11 | 10.14 |
| 2.4 | Business tax | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 2.5 | Corporate tax | | | | | | | | | | | | | | | 29.24 | 29.59 | 29.98 | 30.41 | 30.91 | 31.47 | 32.10 | 32.82 | 33.63 |
| 2.6 | Renew of fixed assets | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 3 | Net cash flow (pre-tax) | -271.33 | -271.33 | -271.33 | 43.54 | 58.22 | 72.22 | 86.84 | 97.32 | 98.91 | 99.38 | 99.90 | 100.50 | 101.17 | 101.93 | 102.79 | 103.76 | 104.85 | 106.09 | 107.49 | 109.07 | 110.86 | 112.88 | 556.47 |
| 4 | Cumulation of net cash flow (pre-tax) | -271.33 | -542.65 | -813.98 | -770.44 | -712.22 | -640.00 | -553.17 | -455.84 | -356.93 | -257.55 | -157.65 | -57.15 | 44.02 | 145.94 | 248.73 | 352.49 | 457.34 | 563.44 | 670.93 | 780.00 | 890.86 | 1,003.74 | 1,560.21 |
| 5 | Net cash flow (after-tax) | -271.33 | -271.33 | -271.33 | 43.54 | 58.22 | 72.22 | 86.84 | 97.32 | 98.91 | 99.38 | 99.90 | 100.50 | 101.17 | 101.93 | 73.54 | 74.17 | 74.88 | 75.68 | 76.58 | 77.60 | 78.76 | 80.06 | 522.84 |
| 6 | Cumulation of net cash flow (after-tax) | -271.33 | -542.65 | -813.98 | -770.44 | -712.22 | -640.00 | -553.17 | -455.84 | -356.93 | -257.55 | -157.65 | -57.15 | 44.02 | 145.94 | 219.49 | 293.66 | 368.54 | 444.22 | 520.80 | 598.40 | 677.15 | 757.21 | 1,280.05 |

| Indicator: | After-Tax | Pre-Tax |
|---|---|---|
| FIRR | 8.1% | 9.0% |
| FNPV (million US $) | 177.55 | 270.58 |

*Annex 4: Loan and amortizing schedule of Step 1 of Alternative 2 (million US $)*

**Annexe II**

# Hambantota Port Development Project (Phase II) Port Work

Report of Feasibility Study

| | | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | Loan and interest | | | | | | | | | | | | | | | | | | | | |
| 1.1 | Accumulated principal | | 257.76 | 515.52 | 773.28 | 773.28 | 773.28 | 721.73 | 670.18 | 618.62 | 567.07 | 515.52 | 463.97 | 412.42 | 360.86 | 309.31 | 257.76 | 206.21 | 154.66 | 103.10 | 51.55 |
| 1.1.1 | Principal | | 257.76 | 515.52 | 773.28 | 773.28 | 773.28 | 721.73 | 670.18 | 618.62 | 567.07 | 515.52 | 463.97 | 412.42 | 360.86 | 309.31 | 257.76 | 206.21 | 154.66 | 103.10 | 51.55 |
| 1.1.2 | Accumulated Interest incurred during construction | | | | | | | | | | | | | | | | | | | | |
| 1.2 | Loan | 257.76 | 257.76 | 257.76 | | | | | | | | | | | | | | | | | |
| 1.3 | Accrued interest | 2.58 | 7.73 | 12.89 | 15.47 | 15.47 | 15.47 | 14.43 | 13.40 | 12.37 | 11.34 | 10.31 | 9.28 | 8.25 | 7.22 | 6.19 | 5.16 | 4.12 | 3.09 | 2.06 | 1.03 |
| 1.4 | Debt repayment | | | | | | 51.55 | 51.55 | 51.55 | 51.55 | 51.55 | 51.55 | 51.55 | 51.55 | 51.55 | 51.55 | 51.55 | 51.55 | 51.55 | 51.55 | 51.55 |
| 1.5 | Interest Payment | 2.58 | 7.73 | 12.89 | 15.47 | 15.47 | 15.47 | 14.43 | 13.40 | 12.37 | 11.34 | 10.31 | 9.28 | 8.25 | 7.22 | 6.19 | 5.16 | 4.12 | 3.09 | 2.06 | 1.03 |
| 2 | Sources of debt repayment | | | | 34.17 | 43.96 | 58.55 | 74.20 | 85.14 | 86.58 | 88.09 | 89.65 | 91.28 | 93.00 | 94.80 | 69.81 | 71.12 | 72.51 | 74.00 | 75.59 | 77.30 |
| 2.1 | Net profit | | | | 14.28 | 24.07 | 38.66 | 54.32 | 65.25 | 66.70 | 68.20 | 69.77 | 71.40 | 73.11 | 74.91 | 49.93 | 51.24 | 52.63 | 54.12 | 55.71 | 57.42 |
| 2.2 | Depreciation | | | | 19.88 | 19.88 | 19.88 | 19.88 | 19.88 | 19.88 | 19.88 | 19.88 | 19.88 | 19.88 | 19.88 | 19.88 | 19.88 | 19.88 | 19.88 | 19.88 | 19.88 |

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, බොහොම ස්තුතියි. ඔබතුමාගේ පිළිතුර තුළින් අතුරු ප්‍රශ්න තුනක් පැන නඟිනවා. පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. පළමුවෙනි අදියර ඉවර කරලා දැන් මාස 15ක් වෙනවා. ඒ මාස 15 තුළ නැව් 5ක් ඇවිත් තිබෙනවා කියලායි දැනට වාර්තාගත වෙලා තිබෙන්නේ. ඒ අතරින් වාණිජ මට්ටමේ නැව් එකක්වත් ඇවිල්ලා නැහැ. ඒ සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 568කුත්, අප දන්නා විධියට ගල පුපුරවන්නට ශ්‍රී ලංකාවේ මුදල්වලින් රුපියල් මිලියන 4,000ක් වියදම් කරලා තිබෙනවා. ඒ සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 600ක් වියදම් කරලා තිබෙනවා. දෙවෙනි අදියර සඳහා මිලියන 808ක් වියදම් කරන්න යනවා නම් මේ ණය ගෙවන්න ආදායම් ලැබෙන්නේ කොහෙන්ද?

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයේ (ආ) (iv) සහ (v) කොටස්වලට පිළිතුරු වශයෙන් ඇමුණුම් 01 සහ 02 හි 2012 සිට 2030 දක්වා ආදායම්, වියදම් සම්බන්ධයෙන් සම්පූර්ණ වාර්තා ඔබතුමාට සභාගත කරලා තිබෙනවා. ඔබතුමාට ඒක දැන ගන්න පුළුවන්කම ලැබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුරට අනුව 2012, 2013, 2014 වර්ෂවල අපේක්ෂිත ආදායම කොපමණද කියලා පෙනෙනවා. කොළඹ වරායෙන් පළමුවැනි අවුරුද්දට රුපියල් මිලියන 5,800ක් ගෙවන්න තිබෙනවා. රුපියල බාල්දු වීම නිසා දෙවැනි අවුරුද්දට රුපියල් මිලියන 6,200ක් ගෙවන්න තිබෙනවා. ඊට පස්සේ ඩොලර් එක 135ට, 140ට ගියොත් රුපියල් මිලියන 7,000ක් විතර ගෙවන්න සිදු වේවි. කොළඹ වරායත් අලාභ ලබන වෙලාවක අවුරුදු තුනක් හම්බන්තොට වරායටත් ගෙවලා ඒ බරත් දරාගෙන වරායක් විධියට කොහොමද කොළඹ වරාය ඉදිරියට ගෙන යන්න පුළුවන් වන්නේ?

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)

ගරු මන්ත්‍රීතුමනි, බොහොම පැහැදිලිව මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. හම්බන්තොට වරාය කලින් ආරම්භ කරපු වරායක් නොවෙයි. මේ රටේ මොන යම් ව්‍යාපාරයක් ආරම්භ කළත් ආරම්භ කරපු වසරවලදී ආදායම් ලබන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. දෙවන අදියර, පළමුවන අදියරත් එක්ක සමගාමීව යන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, වරායට අවශ්‍ය ඉතුරු කොටස් ටික ඉදි කිරීම දෙවන අදියරට තමයි ඇතුළත් කරලා තිබෙන්නේ. ඒ වෙන කොට තමයි ආදායම් වැඩි කර ගැනීමට හැකියාව තිබෙන්නේ. අපි කොළඹ වරායේ ආදායමෙන් අවුරුදු තුනක් හම්බන්තොට වරායට ගෙවීම් කරනවා. ඊට පස්සේ අපි බලාපොරොත්තු වෙන්නේ හම්බන්තොට වරායෙන් ගෙවීම් කරගෙන යන්නයි. ඔබතුමා ව්‍යාපාරිකයකු හැටියට දන්නවා, මේ රටේ තිබෙන Cargills Food City වුණත් පටන් ගත්තේ කොළඹින් බව. ඊට පස්සේ තමයි ඒවා මොනරාගල, බදුල්ල වාගේ පැතිවලට ගියේ. ඒවායෙත් මුලදී ගෙවීම් කරගෙන ගියේ ඒ විධියටයි. ඕනෑම ව්‍යාපාර කටයුත්තක් කරන්නේ එහෙමයි. ඒ නිසා අපට ගැටලුවක් මතු වෙන්නේ නැහැ. මේක ගෙවා ගෙන යන්න පුළුවන්කමක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමා නියෝජ්‍ය ඇමතිවරයා විධියට අඩුම ගණනේ විෂය සම්බන්ධයෙන් ඉගෙන ගෙන ඉදිරියට යන බවක් පෙනෙනවා. නමුත් වරාය අධිකාරියේ ඉන්න සභාපතිතුමා දන්නේ නැහැ, කොහොමද වරායක් දුවන්න පුළුවන් වන්නේ කියලා. ඒ නිසා කරුණාකරලා-[බාධා කිරීමක්] මම අහන්නේ, නියෝජ්‍ය ඇමතිවරයකුගෙන් මිසක් පනින ඔබතුමාගෙන් නොවෙයි. [බාධා කිරීමක්] නියෝජ්‍ය ඇමතිතුමා දක්ෂයෙක්. [බාධා කිරීමක්] සභාපති පට්ට පල් හොරෙක් කියලා මම නියෝජ්‍ය ඇමතිතුමාට කියනවා. [බාධා කිරීමක්] එතුමා දන්නවා, මොනවාද සිදු වන්නේ කියලා. කරුණාකරලා මේ කොළඹ වරායත් ගිලින්න ඉඩ දෙන්නේ නැතුව හම්බන්තොට ඔය කියන කරන දේවල් කර ගෙන යන්න කියලා මම කියනවා. කොළඹ දකුණු වරායත් - Colombo South Port එකත්- තිබෙනවා. ඉන්දියාවේ නිෂ්පාදනය කරන බඩු චීන වරාය තුළින් ලංකාවට ගෙන එන්න පුළුවන් හැකියාවක් තිබෙනවාද කියන එක මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහනවා. කොළඹ දකුණු වරායෙන් සියයට 85ක් චීන කොම්පැනියකට අයිතියි. ඔබතුමා නැහැ කියලා කිව්වාට සියයට 85ක් China Merchants Holdings අරන් තිබෙනවාය කියලා ඊට පස්සේ සනාථ වෙලා තිබෙනවා. හම්බන්තොට වරායත් චීන ණය තුළින් ඉදි කරලා තිබෙන්නේ. ඒකේ අයිතියත් චීන වරායට යනවා කියලා තිබෙනවා. ඉන්දියාවේ නිෂ්පාදන ගෙන්වන්නේ නැතුව ලංකාවේ වරායන්වල කන්ටේනර් පුරවන්න පුළුවන්ද, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි?

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)

ගරු මන්ත්‍රීතුමනි, බොහොම පැහැදිලිව ඔබතුමාට මතක් කරන්නට ඕනෑ, ඔබතුමා මේ විෂය පථයට සම්බන්ධ වෙලා සිටියේ මේ කාලයේ විතරක් නොවෙයි කියන එක. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තිබුණු කාලයේත් ඔබතුමා වරාය විෂය පථය ගැන හොඳට හදාරපු මන්ත්‍රීවරයෙක්. ජය බහලුම් පර්යන්තය -JCT එක- පෞද්ගලික අංශයට විකුණන්න ඒ කාලයේ සැලසුම් සකස් කළ බව ඔබතුමාට මතක ඇති. ඔබතුමාත් ඒ ආණ්ඩුව ඇතුළේ හිටියා. ඒක විකුණන්න සැලසුම් සකස් කරන කොට ඔබතුමාත් ඒ ආණ්ඩුව ඇතුළේ හිටියා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නැහැ, නැහැ. එතකොට චන්ද්‍රිකා කුමාරණතුංග ආණ්ඩුව තිබුණේ.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)

නැහැ, නැහැ. මේක අහපු නිසා ඔබතුමාට මතක් කරලා දෙන්න වෙනවා. චන්ද්‍රිකා මැතිනියගේ කාලයේ SAGT එක වික්කා. මම ඒක බොහොම පැහැදිලිව පිළිගන්නවා. නමුත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව කාලයේ ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් එක බිම් අඟලක්වත් විකුණලා නැහැ. බොහොම පැහැදිලිව ඒක කියන්න පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

බිම් අඟලක් විකුණලා නැහැ. නමුත් අක්කර ගණන් විකුණලා තිබෙනවා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
කොහේද විකුණලා තිබෙන්නේ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
යුද හමුදා මූලස්ථානය.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
අපි ලෝකයත් එක්ක සම්බන්ධ වෙන්න ඕනෑ. ෂැංග්‍රි-ලා සමාගම ලංකාවට ඇවිල්ලා ආයෝජනය කිරීම අපේ රටට ලොකු භාග්‍යයක්. ඒ කාලයේ කර ගන්න බැරි වෙච්ච ඒවා දැන් කරන කොට තමුන්නාන්සේලාට ඇඟේ අමාරුව. ඒකයි වෙලා තිබෙන්නේ. කරන්නත් බැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා කිව්වේ වික්කේ නැහැ කියලා. මම කියන්නේ තොග ගණන් වික්කා කියලා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
විකුණලා නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව එක බිම් අඟලක්වත් විකුණලා නැහැ කියන එක බොහොම වගකීමකින් කියනවා. [බාධා කිරීම්] තමුන්නාන්සේලා විකුණපු ඒවායේ ලැයිස්තුව මම දෙන්නම්. මගේ ළඟ තිබෙනවා. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අක්කර 12ක් විකුණලා තිබෙනවා. [බාධා කිරීම්]

## මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ උපදේශකයන් : විස්තර
## நிதி, திட்டமிடல் அமைச்சின் ஆலோசகர்கள் : விபரம்
## ADVISERS UNDER MINISTRY OF FINANCE AND PLANNING : DETAILS

1433/'11

4. **ගරු ජෝන් අමරතුංග මහතා (ගරු අජිත් කුමාර මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு அஜித் குமார சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Ajith Kumara)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ මේ වන විට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන්ට ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසු ගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිල රථ ලබා දී ඇති උපදේශකයින්ගේ නම්, ලබා දී ඇති නිල රථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන්ට ඉන්ධන දීමනා ලබා දෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන්ට දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நிதி, திட்டமிடல் அமைச்சின் கீழ் தற்போது சேவையாற்றுகின்ற ஆலோசகர்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) இவர்களின் பெயர்கள், கல்வித் தகைமைகள் மற்றும் பொறுப்புகள் யாவையென்பதையும்;

(iii) இவர்களுக்குச் செலுத்தப்படும் சம்பளம் மற்றும் கொடுப்பனவுகள் யாவையென்பதையும்;

(iv) கடந்த மாதத்திற்காகச் செலுத்தப்பட்ட அனைத்துக் கொடுப்பனவுகளினதும் கூட்டுத்தொகை எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) உத்தியோகபூர்வ வாகனங்கள் வழங்கப்பட்டுள்ள ஆலோசகர்களின் பெயர்கள், வழங்கப்பட்டுள்ள வாகனங்களின் எண்ணிக்கை மற்றும் அவற்றின் விபரங்கள் யாவையென்பதையும்;

(ii) இவர்களுக்கு எரிபொருள் கொடுப்பனவு வழங்கப்படும் எனின், ஒவ்வொரு ஆலோசகருக்கும் வழங்கப்படுகின்ற எரிபொருள் கொடுப்பனவு தனித்தனியாக யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) இவர்களுக்குத் தொலைபேசி வசதிகள் வழங்கப்படுமெனின், தற்போது தொலைபேசி வசதிகள் வழங்கப்பட்டுள்ள ஆலோசகர்களின் பெயர்கள் யாவையென்பதையும்;

(ii) தொலைபேசிக் கொடுப்பனவுத் தொகையொன்று வழங்கப்படுமெனின் ஒவ்வொரு ஆலோசகருக்கும் வழங்கப்பட்டுள்ள கொடுப்பனவுத் தொகை தனித்தனியாக எவ்வளவென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

[ගරු ජෝන් අමරතුංග මහතා]

asked the Minister of Finance and Planning:

(a) Will he state-

(i) the number of advisers who serve under the Ministry of Finance and Planning at present;

(ii) their names, educational qualifications and responsibilities;

(iii) the salaries and allowances paid to them; and

(iv) the total of all the allowances paid during the previous month?

(b) Will he inform this House-

(i) the names of the advisers to whom official vehicles have been provided, the number of official vehicles provided and the details of those vehicles; and

(ii) separately of the fuel allowance provided to each adviser, if they are provided with a fuel allowance?

(c) Will he state-

(i) the names of the advisers to whom telephone facilities have been provided by now if telephone facilities are provided to them; and

(ii) separately of the amount of the telephone allowance paid to each adviser, if they are paid a telephone allowance?

(d) If not, why?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 02යි.

(ii)

| | නම | අධ්‍යාපන සුදුසුකම් | වගකීම් |
|---|---|---|---|
| 1. | එම්.එම්.ආර්. අබ්දුල් කාදර් මයා | නීතිඥ, ශ්‍රී ලංකා නීති විද්‍යාලය | කොටස් වෙළෙඳ පොළ සංවර්ධනය සඳහා වන ජ්‍යෙෂ්ඨ උපදේශක. ❖ ආර්ථික සංවර්ධනය සඳහා වැදගත් හා ප්‍රමුඛතාව දිය යුතු අංශයක් බවට පත්ව ඇති කොටස් වෙළෙඳ පොළ අවශ්‍යතා නිසි පරිදි හඳුනාගෙන සාංගමික ණය හා කොටස් වෙළෙඳ පොළ සඳහා සංවර්ධන සැලසුම්, උපාය මාර්ග හඳුනා ගැනීම සහ ඒවා ක්‍රියාත්මක කරවීම. |
| 2. | ඩී.ජී.පී.ඩබ්ලිව්. ගුණතිලක මෙනවිය ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවය (I පන්තිය) | (1) බී.එස්.සී. විශේෂ උපාධිය (රාජ්‍ය මුදල් හා බදු) - දෙවන පෙළ ඉහළ සමාර්ථය 1981 (කොළඹ විශ්වවිද්‍යාලය) (2) තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව - 2004 (ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය) | බදු ප්‍රතිපත්ති උපදේශක ❖ බදු ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳව උපදෙස් ලබා දීම, බදු සම්බන්ධ ආයතන සමඟ එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කිරීම, බදු නීති සැකසීමේ කටයුතු පිළිබඳව උපදෙස් ලබා දීම. |

(iii)

| | මාසික වැටුප (රු.) | ජී.වි.දී. (රු.) | අන්තර් දීමනා (රු.) | ඉන්ධන දීමනා (රු.) | අර්ථසාධක දායක (රු.) |
|---|---|---|---|---|---|
| එම්.එම්.ආර්. අබ්දුල් කාදර් මයා | 225,600.00 | 5,850.00 | 11,280.00 | 20,550.00 | 33,840.00 |
| ඩී.ජී.පී.ඩබ්ලිව්. ගුණතිලක මෙනවිය | මාසික වැටුප රු.48,305.00කි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මඟින් මෙම වැටුප ගෙවනු ලබන අතර, වැටුපෙන් 1/3ක දීමනාව වන රු.16,101.67ක් මාසිකව මෙම අමාත්‍යාංශය මඟින් ගෙවනු ලබයි. | | | | |

(iv)

| | |
|---|---|
| එම්.එම්.ආර්. අබ්දුල් කාදර් මයා | රු.71,520.00 |
| ඩී.ජී.පී.ඩබ්ලිව්. ගුණතිලක මෙනවිය | රු.16,101.67 |

(ආ) (i)

| | නිල රථ සංඛ්‍යාව | වාහන අංකය | ඉන්ධන වර්ගය |
|---|---|---|---|
| එම්.එම්.ආර්. අබ්දුල් කාදර් මයා | 01 | KA - 2030 | පැට්රෝල් |
| ඩී.ජී.පී.ඩබ්ලිව්. ගුණතිලක මෙනවිය | නැත. (මාසිකව රු.30,000.00ක දීමනාවක් රජය මඟින් ගෙවනු ලැබේ. පෞද්ගලික රථය භාවිතා කරයි.) | | |

(ii)

| | |
|---|---|
| එම්.එම්.ආර්. අබ්දුල් කාදර් මයා | රු.20,550.00 |
| ඩී.ජී.පී.ඩබ්ලිව්. ගුණතිලක මෙනවිය | රු.19,180.00 ❖ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මඟින් ඉන්ධන දීමනාව ගෙවනු ලැබේ. |

(ඇ) (i)

| |
|---|
| එම්.එම්.ආර්. අබ්දුල් කාදර් මයා |
| ඩී.ජී.පී.ඩබ්ලිව්. ගුණතිලක මෙනවිය |

(ii) උපදේශකවරුන් දෙදෙනාට කාර්යාලයීය හා නිවාස දුරකථන පහසුකම් ලබා දී ඇත. අදාළ බිල්පත් නියමිත මුදල් සීමාවන් තුළ රජය මඟින් ගෙවනු ලැබේ.

(ඈ) පැන නොනඟී.

## ප්‍රවාහන ක්ෂේත්‍රයේ සංවර්ධන ව්‍යාපෘති : ප්‍රතිලාභ
## போக்குவரத்துத் துறை அபிவிருத்திக் கருத்திட்டங்கள் : நன்மைகள்
## DEVELOPMENT PROJECTS IN FIELD OF TRANSPORT : BENEFITS

1677/'11

5. **ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා (ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා වෙනුවට)**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் - மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா சார்பாக)
(The Hon. Alhaj A.H.M. Azwer on behalf of the Hon. Mohan Priyadarshana De Silva)
ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඇති කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(ii) මෙම ව්‍යාපෘතීන් හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(iv) ඒවායින් අපේක්ෂිත ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2006ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரையான காலப்பகுதியில் போக்குவரத்துத் துறையில் நடைமுறைப்படுத்தப்பட்ட அபிவிருத்திக் கருத் திட்டங்கள் யாவை என்பதையும்;

(ii) இக்கருத்திட்டங்களினூடாக மக்களுக்குக் கிடைத்துள்ள நன்மைகள் யாவை என்பதையும்;

(iii) போக்குவரத்துத் துறையில் எதிர்காலத்தில் நடைமுறைப்படுத்த எதிர்பார்த்துள்ள அபிவிருத் திக் கருத்திட்டங்கள் யாவை என்பதையும்;

(iv) அவற்றிலிருந்து எதிர்பார்க்கப்படுகின்ற நன் மைகள் யாவை என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport:

(a) Will he inform this House -

(i) the development projects implemented in the field of transport during the period from year 2006 up to now;

(ii) the benefits received by the people through these projects;

(iii) the development projects expected to be implemented in the field of transport, in future; and

(iv) the results expected through them?

(b) If not, why?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம )
(The Hon. Kumara Welgama )
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

(අ) (i), (ii) දුම්රිය දෙපාර්තමේන්තුව

| අනු අංකය | සංවර්ධන ව්‍යාපෘතිය | ප්‍රතිලාභ |
|---|---|---|
| 01 | මඟී මැදිරි 100 ක් චීනයෙන් මිලදී ගැනීම. | කාර්යක්ෂම හා ගුණාත්මක දුම්රිය සේවයක් ලබාදීම. |
| 02 | වැම්පින් මැෂින් මිලදී ගැනීම. | මෙතෙක් ශ්‍රමය යොදාගෙන දුම්රිය මාර්ග නඩත්තු කළ අතර, මෙමගින් නඩත්තු කටයුතු කඩිනම් කිරීමත් වේග සීමා ඉවත් කිරීමත් තුළින් කාර්යක්ෂම හා ගුණාත්මක දුම්රිය සේවයක් ලබාදීම. |
| 03 | රාගම පුත්තලම මාර්ගය වැඩි දියුණු කිරීම. | රාගම සිට සීදූව දක්වා මාර්ගය ද්විත්ව මාර්ගයක් බවට පත් කර දුම්රිය ධාවනය සඳහා යොදා ගැනීමෙන් ගමන් කාලය අඩු කර කාර්යක්ෂම හා ගුණාත්මක දුම්රිය සේවයක් ලබාදීම. |
| 04 | දුම්රිය හරස් මාර්ග 35 ක් ඉදි කිරීම. | දුම්රිය අනතුරු අවම කර ගැනීම තුළින් දුම්රිය සේවාව නගා සිටුවීම. |
| 05 | මුහුදුබඩ දුම්රිය මාර්ගය සංවර්ධනය කිරීම. | මුහුදුබඩ දුම්රිය මාර්ගයේ ගමන් කාලය අඩු කර පැයට කි.මී.100 ක වේගයෙන් ධාවනය කිරීමෙන් කාර්යක්ෂම හා ගුණාත්මක දුම්රිය සේවයක් ලබාදීම. |
| 06 | මැදවච්චිය සිට මඩු පාර දක්වා දුම්රිය මාර්ගය නැවත ඉදි කිරීම. | උතුරු දුම්රිය මාර්ගයේ මඩු පාර දක්වා කාර්යක්ෂම හා ගුණාත්මක දුම්රිය සේවයක් ලබාදීම. |
| 07 | මඩු පාර සිට තලෙයි මන්නාරම දක්වා දුම්රිය මාර්ගය නැවත ඉදි කිරීම. | තලෙයි මන්නාරම දක්වා කාර්යක්ෂම හා ගුණාත්මක දුම්රිය සේවයක් ලබාදීම. |
| 08 | ඕමන්තෙයි සිට කන්කසන්තුරේ දක්වා දුම්රිය මාර්ගය නැවත ඉදි කිරීම. | උතුරු දුම්රිය මාර්ගයේ පලෙයි දක්වා කාර්යක්ෂම හා ගුණාත්මක දුම්රිය සේවයක් ලබාදීම. |
| 09 | පලෙයි සිට කන්කසන්තුරේ දක්වා දුම්රිය මාර්ගය නැවත ඉදි කිරීම. | කන්කසන්තුරේ දක්වා කාර්යක්ෂම හා ගුණාත්මක දුම්රිය සේවයක් ලබාදීම. |
| 10 | මාතර සිට බෙලිඅත්ත දක්වා දුම්රිය මාර්ගය ඉදි කිරීම. | බෙලිඅත්ත දක්වා කාර්යක්ෂම හා ගුණාත්මක දුම්රිය සේවයක් ලබාදීම. |

[ගරු කුමාර වෙල්ගම මහතා]

6 ව්‍යාපෘතියේ ප්‍රතිලාභ

- ධාවන කටයුතු නිසි පරිදි පවත්වා ගෙන යාමට හැකිවීම, බස් රථ බිඳ වැටීම් අවම කිරීම නිසා මජනතාවට කාර්යක්ෂම, ඵලදායී බස් සේවා ලැබීම.

7 ව්‍යාපෘතියේ ප්‍රතිලාභ

- මුලතිව් ප්‍රදේශයේ සිටින මගී ජනතාවට ප්‍රවාහන සඳහා ශක්තිමත් බස් නැවතුම්පළක් ස්ථාපිත වීම හා හොඳ බස් ප්‍රවාහනයක් ලැබීම.

8 ව්‍යාපෘතියේ ප්‍රතිලාභ

- කොග්ගල හා වලපනේ නව ඉන්ධන පිරවුම්හල් ඉදිකිරීම නිසා වාහනවල ගමන්ගන්නා පුද්ගලයින්ට තම වාහනවලට ඉන්ධන ලබා ගත හැකි වීම.
- ශ්‍රීලංගම බස්රථවලට එම ඉන්ධන පිරවුම්හල්වලින් ඉන්ධන ලබා ගත හැකිවීම නිසා කාර්යක්ෂම බස් සේවාවක් ලබා ගත හැකි වීම.

9 ව්‍යාපෘතියේ ප්‍රතිලාභ

- ඉහළ හා මධ්‍යම ආදායම් ලබන මගීන්ට හොඳ බස් සේවාවක් ලබා ගත හැකි වීම
- ගාල්ල කොළඹ මාර්ගයේ බස්වල ගමන් කරන මගීන්ට කෙටි වේලාවකින් ගමනාන්තයට ලඟා වීමට හැකිවීම.

10 ව්‍යාපෘතියේ ප්‍රතිලාභ

- තදාසන්න නගරවල සිට කොළඹ කාර්යාල දක්වා කුඩා මාදිලි වාහන මගින් ගමන් කරන රජයේ නිලධාරීන් හා මගීන් ඉලක්ක කර ගෙන ආරම්භ කරන ලද මෙම සේවාව නිසා ක්‍රමානුකූලව කොළඹ නගරයට ඇදී එන කුඩා වාහන අඩු කිරීමට පෙළඹවීම වර්ධනය කිරීම හා මගීන්ගේ ගමන් පහසුව වඩාත් වැඩි දියුණු කිරීම.

(ආ) අදාළ නොවේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 7-1908/'11- (2), ගරු එම්.ටී. හසන් අලි මහතා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු එම්.ටී. හසන් අලි මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## හොරණ අධිකරණ සංකීර්ණය : සෝපානය
## ஹொரணை நீதிமன்றக் கட்டிடத்தொகுதி: மின்னுயர்த்தி
HORANA COURTS COMPLEX : ELEVATOR

1920/'11

8. **ගරු රවි කරුණානායක මහතා (ගරු අජිත් පී. පෙරේරා මහතා වෙනුවට)**
(மாண்புமிகு ரவி கருணாநாயக்க - மாண்புமிகு அஜித் பீ. பெரேரா சார்பாக)
(The Hon. Ravi Karunanayake on behalf of the Hon. Ajith P. Perera)
අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) හොරණ මහේස්ත්‍රාත් අධිකරණය සහ හොරණ දිසා අධිකරණය පිහිටි ගොඩනැගිල්ල මහල් 3කින් සමන්විත බවත්;

(ii) එම අධිකරණ ගොඩනැගිල්ල සැලසුම් කර ඇති ආකාරය අනුව, දැනට ඇති පඩිපෙළ භාවිත කිරීම ආබාධිත තැනැත්තන්ට, මහලු තැනැත්තන්ට හා ගර්භනී කාන්තාවන්ට ඉතා අපහසු බවත්;

(iii) එකී ගොඩනැගිල්ලේ පඩිපෙළ භාවිතා කිරීමේදී නීතිඥවරුන්, නීතිඥවරියන් සහ අධිකරණයේ කාර්ය මණ්ඩලයද දුෂ්කරතාවන්ට පත් වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) හොරණ අධිකරණ සංකීර්ණයේ ප්‍රධාන ගොඩනැගිල්ල සඳහා "විදුලි සෝපානයක්" සවි කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஹொரணை நீதவான் நீதிமன்றமும் ஹொரணை மாவட்ட நீதிமன்றமும் அமைந்துள்ள கட்டிடம் மூன்று மாடிகளைக் கொண்டுள்ளது என்பதையும்;

(ii) மேற்படி நீதிமன்றக் கட்டிடம் திட்டவமைப்பு செய்யப்பட்டுள்ளதன் பிரகாரம் தற்போதுள்ள படிக்கட்டுகளை அங்கவீனமுற்றவர்கள், முதிய வர்கள் மற்றும் கர்ப்பிணிப் பெண்கள் பயன் படுத்துவது மிகவும் சிரமமாகும் என்பதையும்;

(iii) மேற்படி கட்டிடத்தின் படிக்கட்டுகளைப் பயன் படுத்தும்போது சட்டத்தரணிகளும் நீதிமன்ற பணியாட்டொகுதியினரும் சிரமங்களுக்கு உள்ளாகியுள்ளனர் என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) ஹொரணை நீதிமன்றக் கட்டிடத்தொகுதியின் பிரதான கட்டிடத்திற்கு மின்னுயர்த்தி ஒன்றைப் பொருத்துவதற்கு அவர் நடவடிக்கை எடுப்பாரா என்பதைக் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Justice:

(a) Is he aware that-

(i) the District Court and the Magistrate Court of Horana are housed in a three-storeyed building ;

(ii) owing to the way in which the aforesaid Court building has been designed, the disabled persons, elderly persons and pregnant mothers find it difficult to use the staircase of that building which is being used at present ; and

(iii) lawyers and the staff attached to the aforesaid Court Complex face difficulties when using the staircase of this building?

(b) Will he state whether he will take action to install an electric elevator in the main building of the Horana Courts Complex?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) දනිමි.
(ii) දනිමි.
(iii) දනිමි.

(ආ) විදුලි සෝපානය සවි කිරීම සඳහා 2009.11.26 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

ඒ අනුව සෝපානය සවි කිරීම සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට පවරා ඇත.

රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මඟින් රුපියල් 14,280,046.88ක ඇස්තමේන්තුවක් 2012.02.06 වන දින නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

(ඇ) දැනටමත් මෙම කටයුතු ආරම්භ කර ඇති බව සඳහන් කරමි.

## මාකඳුර කර්මාන්තපුරයේ සොසේජස් කර්මාන්තශාලාව : කල් ඉකුත් වූ නිෂ්පාදන
## மாகந்துர கைத்தொழில் பேட்டை சொசேஜஸ் தொழிற்சாலை: காலாவதியான உற்பத்திகள்
## SAUSAGE FACTORY IN MAKANDURA INDUSTRIAL ESTATE : EXPIRED PRODUCTS

1921/'11

9. **ගරු ජෝන් අමරතුංග මහතා (ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Gamini Jayawickrama Perera)

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල, මාකඳුර කර්මාන්තපුරයේ ආයෝජන මණ්ඩලයේ අනුමත සොසේජස් කර්මාන්තශාලාවක් තිබෙන බවත්;
(ii) එහි සොසේජස් නිෂ්පාදනය සඳහා කල් ඉකුත් වූ මස් යොදා ගන්නා බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) සොසේජස් සෑදීම සඳහා එම කර්මාන්තශාලාවට කුකුළු මස් ආනයනය කරන රටවල් කවරේද;
(ii) එම කර්මාන්තශාලාවේ නිෂ්පාදනය කරන සොසේජස් වර්ග අපනයනය කරන රටවල් කවරේද;
(iii) දේශීය වෙළඳ පොළේ එම නිෂ්පාදනය බෙදා හරින හා අළෙවි කරන සමාගම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මාකඳුර කර්මාන්තශාලාවේ සොසේජස් නිෂ්පාදනයේදී කල් ඉකුත් වූ ටෙක්ස්ටර්ඩ් සෝයා ප්‍රෝටීන් නම් අමු ද්‍රව්‍ය යොදා ගෙන ඇති බව දන්නේද;
(ii) එම කර්මාන්තශාලාවේ තිබී හමු වූ කල් ඉකුත් වී තිබූ එම අමු ද්‍රව්‍ය ප්‍රමාණය කොපමණද;
(iii) ලේබල් යොදා අසුරුම් කර එම කර්මාන්තශාලාවේ අධි ශීතකරණවල ගබඩා කර තිබියදී සොයා ගත් කල් ඉකුත් වූ සොසේජස් ප්‍රමාණයේ බර කිලෝ ග්‍රෑම් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) සෞඛ්‍යයට අහිතකර වන පරිදි සොසේජස් නිපදවන එම කර්මාන්තශාලාවට එරෙහිව ගත් පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

கைத்தொழில், வாணிப அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குருநாகல் மாவட்டத்தில் பன்னல, மாகந்துர கைத்தொழில் பேட்டையில் முதலீட்டுச் சபையினால் அங்கீகரிக்கப்பட்ட `சொசேஜஸ்' தொழிற்சாலை ஒன்று உள்ளதென்பதையும்;
(ii) அங்கு `சொசேஜஸ்' உற்பத்திக்காக காலாவதியான இறைச்சி பயன்படுத்தப்படுகின்றதென்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) `சொசேஜஸ்' உற்பத்திக்காக குறித்த தொழிற்சாலைக்கு கோழி இறைச்சி இறக்குமதி செய்யப்படுகின்ற நாடுகள் யாவை என்பதையும்;
(ii) மேற்படி தொழிற்சாலையில் உற்பத்தி செய்யப்படுகின்ற `சொசேஜஸ்' வகைகள் ஏற்றுமதி செய்யப்படுகின்ற நாடுகள் யாவை என்பதையும்;
(iii) உள்நாட்டு சந்தையில் மேற்படி உற்பத்திகளை விநியோகிக்கின்ற மற்றும் சந்தைப்படுத்துகின்ற கம்பனிகள் யாவை என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) மாகந்துர தொழிற்சாலையில் `சொசேஜஸ்' உற்பத்தியின்போது காலாவதியான "ரெக்ஸ்டர்ட் சோயா புறோட்டீன்" எனப்படும் மூலப்பொருள் பயன்படுத்தப்பட்டுள்ளதை அவர் அறிவாரா என்பதையும்;
(ii) மேற்படி தொழிற்சாலையிலிருந்து கண்டு பிடிக்கப்பட்ட காலாவதியான குறித்த மூலப்பொருட்களின் அளவு யாதென்பதையும்;
(iii) மேற்படி தொழிற்சாலையில் இலச்சினை பொறிக்கப்பட்டு பொதிசெய்யப்பட்ட நிலையில் குளிரூட்டிகளில் வைக்கப்பட்டிருந்தபோது கண்டுபிடிக்கப்பட்ட காலாவதியான `சொசேஜஸ்'களின் நிறை எத்தனை கிலோ கிராம் என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) சுகாதாரத்திற்கு கேடு விளைவிக்கும் விதத்தில் `சொசேஜஸ்' உற்பத்திசெய்யும் தொழிற்சாலைக்கு எதிராக எடுக்கப்பட்ட நடவடிக்கைகள் யாவை என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(உ) இன்றேல், ஏன்?

[ගරු ජෝන් අමරතුංග මහතා]

asked the Minister of Industry and Commerce:

(a) Is he aware that-

(i) there is a sausage factory approved by the Board of Investment in the Makandura Industrial Estate in Pannala in the Kurunegala District; and

(ii) meat which has passed the expiry date is used to produce sausages in this factory?

(b) Will he inform this House-

(i) the names of the countries from which chicken is imported to this factory for producing sausages;

(ii) the names of the countries to which sausages are exported from this factory; and

(iii) the names of the companies that distribute and sell the produce from this company, in the local market?

(c) Will he state-

(i) whether he is aware that the raw material called textured soya protein which has passed the expiry date is used in order to produce sausages at the factory in Makandura ;

(ii) the amount of this raw material which has passed the expiry date found from this factory ; and

(iii) the kilogram weight of the consignment of packed and labelled sausages passed the expiry date found stored in this factory?

(iv) Will he inform this House of the action taken against this factory, which produces sausages that are hazardous to health?

(d) If not, why ?

**ගරු ජයරත්න හේරත් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத் - கைத்தொழில், வாணிப அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Jayarathne Herath - Deputy Minister of Industry and Commerce)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල, මාකඳුර කර්මාන්තපුරයේ ආයෝජන මණ්ඩලයේ අනුමත සොසේජස් කර්මාන්ත ශාලාවක් ඇත.

(ii) එහි සොසේජස් නිෂ්පාදනය සඳහා පහත සඳහන් ද්‍රව්‍ය යොදා ගනී.

කටු ඉවත් කරන ලද කුකුළු මස් (MDM)

ලූණු

කුළු බඩු

ආවරණ (Caseings)

එහෙත් මෙම කර්මාන්තශාලාවේ සොසේජස් නිෂ්පාදනය සඳහා කල් ඉකුත් වූ මස් යොදා නොගනී.

(ආ) (i) බෙල්ජියම

යුරෝපීය රටවල්

ඕස්ට්‍රේලියාව

බ්‍රසීලය

(ii) ඉන්දියාව

මාලදිවයින

අප්‍රිකානු රටවල්

මැද පෙරදිග රටවල්

ෂී සෙල්ස්

මුරුසු දිවයින ඇතුළු මෙම කර්මාන්තශාලාවේ නිපදවනු ලබන සොසේජස් වර්ග අපනයනය කරන රටවල් ගණන 32කි.

(iii) සී/ස වික්‍රමරත්න ඉන්ටර්නැෂනල් ට්‍රේඩින් සමාගම.

(ඇ) (i) මාකඳුර කර්මාන්තශාලාවේ සොසේජස් නිෂ්පාදනයේදී කල් ඉකුත් වූ ටෙක්ස්චර්ඩ් සෝයා ප්‍රෝටීන් නම් අමු ද්‍රව්‍ය යොදා ගෙන නැත.

(ii) එම කර්මාන්තශාලාවේ ගබඩා කර තිබියදී හමු වූ කල් ඉකුත් වූ අමුද්‍රව්‍ය ප්‍රමාණය මෙට්‍රික් ටොන් 32.9ක් වේ.

(iii) අපනයනය කිරීම සඳහා සකස් කොට ලේබල් යොදා ගබඩා කර තිබියදී කල් ඉකුත් වූ බවට හඳුනා ගෙන ඇති සොසේජස් ප්‍රමාණයේ බර කිලෝ ග්‍රෑම් 71,563කි.

(ඈ) අපරාධ නඩු විධිවිධාන සංග්‍රහයේ මහජන පීඩා ඉවත් කිරීම යටතේ කල් ඉකුත් වූ ආහාර ද්‍රව්‍ය විනාශ කිරීම සඳහා උසාවි නියෝගයක් ලබා ගැනීම සඳහා එක් නඩුවකුත්, ආහාර පනත යටතේ ආහාර නිෂ්පාදනයට නුසුදුසු අමු ද්‍රව්‍ය ගබඩා කර තැබීම හා පරිභෝජනයට නුසුදුසු ආහාර ද්‍රව්‍ය ගබඩා කර තැබීම සම්බන්ධව තවත් නඩුවකුත් ලෙස නඩු දෙකක් පන්නල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට අනුයුක්ත මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් කුලියාපිටිය ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ පවරනු ලැබූ අතර, දැනට එම නඩු දෙකම විභාග කර අවසන් කර ඇත.

(ඉ) පැන නොනඟී.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ප්‍රශ්න අංක 14 -1758/'11- (1), ගරු අජිත් කුමාර මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake )

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අජිත් කුමාර මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா )
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2012 මාර්තු මස 08 වැනි බ්‍රහස්පතින්දා අ.භා. 1.00 වන තෙක් කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

### සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### சமஸ்த லங்கா சாசனாரக்சக மண்டலய (கூட்டிணைத்தல்) சட்டமூலம்
### SAMASTHA LANKA SHASANARAKSHAKA MANDALAYA (INCORPORATION) BILL

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***
***වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக் கட்டளை இல. 47 (5) இன்படி பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Buddha Sasana and Religious Affairs for report.*

### ද පේරන්ට්ස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### த பேரண்ட்ஸ் மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### THE PARENTS FOUNDATION (INCORPORATION) BILL

**ගරු නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා :

"ද පේරන්ට්ස් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***
***වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සමාජ සේවා අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக் கட்டளை இல.47 (5) இன்படி சமூக சேவைகள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Social Services for report.*

### පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල විශ්‍රාමිකයන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### பாராளுமன்றத்தின் இளைப்பாறிய பணியாளர் சங்கம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### PARLIAMENT STAFF PENSIONERS' ASSOCIATION (INCORPORATION) BILL

**ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு பேராசிரியர் ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)

Sir, I move,

"That leave be granted to introduce a Bill to incorporate the Parliament Staff Pensioners' Association".

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

[ගරු මහාචාර්ය රාජීව විජේසිංහ මහතා]

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***
***වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සමාජ සේවා අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக் கட்டளை இல. 47 (5) இன்படி சமூக சேவைகள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Social Services for report.*

## සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත : නියෝග
## கடல்சார் தீழ்ப்புத் தடைச் சட்டம் : ஒழுங்குவிதிகள்
## MARINE POLLUTION PREVENTION ACT : REGULATIONS

[අ.භා. 2.02]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - சுற்றாடல் அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Environment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 40 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 51 වැනි වගන්තිය යටතේ පරිසර අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ විධානයන්ට අනුකූලව සාදන ලදුව, 2011 ජූනි 07 දිනැති අංක 1709/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.02.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,1981 අංක 59 දරන සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනත ස්ථාපිත කෙරුවාට පස්සේ, 2009 ජනවාරි 01 වැනිදා ඉඳලා සමුද්‍ර දූෂණය වැළැක්වීමේ නව පනතක් යටතේ සමුද්‍රයීය පරිසර ආරක්ෂණ අධිකාරිය පිහිටුවා තිබෙනවා. අපට අයිති මුහුදු සීමාවේ සිදු වන සමුද්‍ර දූෂණය පිළිබඳ සියලුම තීන්දු ගැනීමේ අයිතිය මේ සමුද්‍රයීය පරිසර ආරක්ෂණ අධිකාරියට පැවරිලා තියෙනවා. ඉතින් ඒ අනුව විවිධ අවස්ථාවල මේ සඳහා අවශ්‍ය නියෝග පැනවීමට අපට සිදු වෙලා තියෙනවා. විශේෂයෙන්ම මේ දවස්වල මේ නියෝග පනවන්නේ, ඛනිජ තෙල් ඇතුළු ස්වාභාවික සම්පත් කැනීමේදී හෝ වෙනත් අදාළ කටයුතුවල නියැලීමේදී ඇති වන දූෂණය වැළැක්වීම සඳහා පියවර ගැනීමට පනතේ 10 වැනි වගන්තිය යටතේ විශේෂ ප්‍රතිපාදන ඇතුළත් කර තිබෙන නිසායි. ඛනිජ තෙල් ගවේෂණය අපි පටන් ගත්තාම, ඒ හරහා යම් ආකාරයකින් සමුද්‍ර දූෂණයක් සිදු වුණොත්, ඒවා කළමනාකරණය කරලා අවශ්‍ය ආරක්ෂක විධිවිධාන ගන්න එක අපේ අධිකාරියේ වග කීමක් වෙනවා.

එවැනි අවස්ථාවක මෙවැනි නියෝග තිබුණේ නැත්නම්, ඒ හානිය සිදු කරන පාර්ශ්වයට විරුද්ධව ක්‍රියා මාර්ග ගැනීමේ ක්‍රමයක් අපට නැහැ. ඒ නිසා තමයි සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 6 වැනි වගන්තියට අනුව, ඛනිජ තෙල් ආශ්‍රිත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ස්වාභාවික සම්පත් ගවේෂණය කිරීමේ හෝ එහි යෙදී සිටින කොන්ත්‍රාත්කරුවන්, සේවා උපකොන්ත්‍රාත්කරුවන් හෝ වෙනත් තැනැත්තන්ගේ ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම, විධිමත් කිරීම සහ පරීක්ෂා කිරීම මේ අධිකාරියේ කර්තව්‍යයන් හැටියට තිබෙන්නේ.

ඛනිජ තෙල් කර්මාන්තයේ යෙදෙන අවස්ථාවේ සිදු වන පරිසර දූෂණ වළක්වා ගැනීම සඳහා සහ එවැනි දූෂණ සිදු වුවහොත් ඒ පිළිබඳ වගකීම අදාළ පාර්ශ්වයට පවරලා, ඒ වෙනුවෙන් වන්දි ලබා ගැනීම සඳහා වන රීති පද්ධතියක් තමයි අද අපි ඉදිරිපත් කරන්නේ.

ඛනිජ තෙල් කර්මාන්තය ආශ්‍රිතව ලෝකයේ විවිධ රටවල විවිධ ක්‍රියා සිදු වුණ බව අපි දන්නවා. විශේෂයෙන්ම ඇමෙරිකාවේ British Petroleum සමාගමට අයත් Deepwater Horizon කියන තෙල් ළිඳ ආශ්‍රයෙන් ඇති වූ අනතුර හා පරිසර දූෂණය පිළිබඳව මේ වෙලාවේ මතක් කිරීම වැදගත්. විශේෂයෙන් අපේ රටේත් ඒ වාගේ අවස්ථාවක් ඇති වුණොත්, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය හරහා ක්‍රියා මාර්ග ගැනීමට අවශ්‍ය බලතල මේ මඟින් අපට ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දැන් ලංකාවේ ස්වාභාවික සම්පත් පිළිබඳව දැඩි අවධානයක් යොමු කරන වකවානුවක. ලෝකයේ දියුණු වන හැම රටක්ම තමන්ගේ ස්වාභාවික සම්පත් කළමනාකරණය කරලා ඒවායින් ලබා ගන්නා ආදායම රටේ දියුණුව සඳහා යොදා ගැනීම සුලබ කරුණක්. මට තේරෙන හැටියට ඊළඟ දශකය තුළ අපේ රටේත් වියදම් සඳහා සුවිසල් ආදායමක් ලබා ගන්නට පුළුවන් වන්නේ ස්වාභාවික සම්පත්වලින් පමණයි. මේ ස්වාභාවික සම්පත් පිළිබඳව කටයුතු කිරීම සම්පූර්ණයෙන්ම අපේ අමාත්‍යාංශයට පැවරිලා තිබෙන වග කීමක්. ඒ නිසාම රට තුළ තිබෙන ස්වාභාවික සම්පත් ගවේෂණය කරන්න - airborne survey එකක් කරන්න- අවශ්‍ය කරන කටයුතු අපි දැන් සම්පාදනය කරමින් යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ වෙරළ තීරයත් හැතැප්ම 200ක් වනවා. අපේ ඒ මුහුදු තීරයේ තිබෙන සම්පත් ප්‍රයෝජනයට ගැනීමත් රටක් හැටියට අපි ඉදිරියේ දී කළ යුතුව තිබෙනවා. මුළු ලෝකයේ හැම රටකම ස්වාභාවික සම්පත්වලට ලොකු ඉල්ලුමක් තිබෙනවා. අපේ ලංකාවේ වුණත්, ස්වාභාවික සම්පත්වලට විශාල ඉල්ලුමක් තිබෙනවා.

රටේ සංවර්ධනය ඉහළ යාමෙන් පාරවල් හදන්න, වරායවල් හදන්න, වෙනත් කාර්යයන් කරන්න ස්වාභාවික සම්පත්වලට ලොකු ඉල්ලුමක් ඇති වනවා. විශේෂයෙන් කළු ගල්, වැලි, පස්, මැටි වාගේ දේවල්වලටත් ලොකු ඉල්ලුමක් ඇතිවෙලා තිබෙනවා. ඒ නිසා ඒවා කළමනාකරණය කිරීමත් අපි කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම පරිසරයටත් ප්‍රශ්නයක් නොවන විධියට ඒ ස්වාභාවික සම්පත් ගන්නේ කොහොමද, ඒ ස්වාභාවික සම්පත් ගත්තාට පස්සේ ඒවා නැවත පුනරුත්ථාපනය කරන්නේ කොහොමද කියන එක අපේ අමාත්‍යාංශය යටතේ ගැනෙන සුවිසල් කාර්යයක් හැටියට තමයි මට සලකන්න වෙන්නේ. අපේ රටේ ස්වාභාවික සම්පත් පිළිබඳ සමහර නීතිරීති ටිකක් දරදඬු වැඩියි කියන එකයි මගේ අදහස. මේ පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා එක්කත් කථා කළා. එතුමාත් ඒ අදහසට එකඟ වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොකද සමහර වෙලාවට මේ ස්වාභාවික සම්පත් කැණීම අපරාධයක් හැටියට සලකන විධියේ පුවත් පත් වාර්තා පළ වෙනවා. අපේ අරමුණ නම් ස්වාභාවික සම්පත් ගන්නත් ඕනෑ, ඒවා නැවත පුනරුත්ථාපනය

කරන්නත් ඕනෑය කියන එකයි. ලෝකයේ හැම රටක්ම එහෙම තමයි කරලා තියෙන්නේ. මේ මඟින් තමයි අපේ ආර්ථිකය පුළුල් වන විධියේ වැඩ පිළිවෙළවල් අපට කරන්න පුළුවන් වන්නේ. ගෘහ භාණ්ඩ එහෙම නැත්නම් ගෙවල්වලට අවශ්‍ය කරන දැව සකස් කිරීමේදී අපේ දැඩි නීතිරීති තියෙනවාය කියලා ඔබතුමන්ලා දන්නවා. ඒ නීති රීති පැනවුණේ සියයට 80ක් රජයට කැලෑව තියෙන කාලයේ. වනය එදා සියයට 80ක් තිබුණා. අද වන කොට අපට වනය තියෙන්නේ සියයට 27ත් සියයට 29ත් අතර ප්‍රමාණයක්.

අද මම සංඛ්‍යා ලේඛන බැලුවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. සංඛ්‍යා ලේඛන අනුව රටේ දැව අවශ්‍යතාවෙන් සියයට 70ක් සපයන්නේ පෞද්ගලික ඉඩම්වලින්. නමුත් මේ පෞද්ගලික ඉඩමක ගහක් කපලා ප්‍රවාහනය කරන්න බලපත්‍රය ගන්න විශාල කාලයක් යනවා. ඒ බලපත්‍රය නැතිව පාරට දැම්මොත් ඒක පොලීසිය අල්ලනවා. ඊට පස්සේ පත්තරේ පළ කරනවා, ඒක "විශාල වන අපරාධයක්" කියලා. වන අපරාධ ගණයට ගැනෙන්නේ රජයට අයත් කැලෑවල්වල සිදු වන අපරාධ පමණයි. අනික් ඒවාට තිබෙන්නේ බලපත්‍ර උල්ලංඝනය කිරීම පිළිබඳ කාරණාවක් විතරයි. මම ඒකේත් සංඛ්‍යා ලේඛන ගත්තා. මට අද ඒ සංඛ්‍යා ලේඛන ගෙනෙන්න බැරි වුණා. බහුතරයක් තිබෙන්නේ බලපත්‍ර උල්ලංඝනය කිරීම් පමණයි. කැලෑවල් ඇතුළේ ගස් කැපීම පිළිබඳව සමහර කාරණා අද වාර්තා වුණත් ඒවා ඇත්තටම ඉතා අල්ප වශයෙන් තමයි සිදු වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම අපේ නිලධාරින් මේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හරහා ඉතාම හොඳ සේවාවක් කරනවා. ඒ නිසා මේ ස්වාභාවික සම්පත් ප්‍රමාණය අපි අරගෙන ඒ ස්වාභාවික සම්පත් තිබෙන ස්ථාන නැවත පුනරුත්ථාපනය කිරීම තමයි මම හිතන හැටියට අපේ බලාපොරොත්තුව විය යුත්තේ. ඔබතුමන්ලා දන්නවා අපේ රටේ විදුලිබල නිෂ්පාදනයෙන් විශාල ප්‍රමාණයක් අපට කුඩා ජල විදුලි බලාගාර ඔස්සේ සපයන්න පුළුවන් බව.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please!
මේ අවස්ථාවේදී මූලාසනය සඳහා ගරු උදිත් ලොකුබණ්ඩාර මහතාගේ නම යෝජනා කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, "ගරු උදිත් ලොකුබණ්ඩාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு உதித் லொக்குபண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. UDITH LOKUBANDARA *took the Chair.*

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියා ගෙන ආවේ අපේ රටේ තිබෙන ස්වාභාවික සම්පත් පිළිබඳවයි. අප ඕස්ට්‍රේලියාව වාගේ රටක් ගත්තොත්, ඔවුන් අද තමන්ගේ විදේශ වත්කම් බොහොමයක් සොයා ගනු ලබන්නේ ස්වාභාවික සම්පත් අලෙවි කිරීමෙනුයි. අපේ රටේ එවැනි ස්වාභාවික සම්පත් නැති වුණත්, අපේ තිබෙන ස්වාභාවික සම්පත අපේ රටේ ජනතාවගේ අවශ්‍යතාවට අප ඇති කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පරිසර අමාත්‍යවරයා වශයෙන් පත් වුණාට පස්සේ, අපේ කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඇතිව අප වැදගත් යෝජනා කීපයක් සම්මත කළා. අපට දැන ගන්න ලැබුණා, අධික ලෙස නීති පැන වීම පිළිබඳව. එහෙම නැත්නම් නීතිවල බරපතළකම නිලධාරි දූෂණයට හේතු වන කාරණාවක් බව මට වැටහුණා. ඒ නිසා සාමාන්‍ය ජනතාවට අවශ්‍ය විධියට ඒ නීතිරීති සරල කරන එක, ඒවා අඩු කරන එක ප්‍රතිපත්තියක් හැටියට පිළිගැනීමට අප කවුරුත් එකඟ වෙලා තිබෙනවා. ඒ අනුව මම මේ විෂයය භාර ඇමතිවරයා වශයෙන් පත් වුණාට පස්සේ විශේෂයෙන්ම වැලි ගෙන යන සාමාන්‍ය ජනතාවට ඇති ප්‍රශ්න අඩු කරන්න කටයුතු කළා. ඒ අනුව ප්‍රාදේශීය ලේකම්වරුන් හරහා මසකට වැලි කියුබ් 200 බැගින් වන ප්‍රමාණයක් සඳහා ප්‍රවාහන බලපත්‍ර සාමාන්‍ය ජනතාවට ලබා දෙන්න අප නීතිය සම්මත කරලා තිබෙනවා. ඒ නිසා ඇත්තටම එවැනි කාරණාවලින් සාමාන්‍ය ජනතාවගේ අවශ්‍යතා හුඟක් ඉටු කරන්න අපට පුළුවන් වුණා.

දෙවනුව, අප වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවත් එක්ක කථා කරලා යම් පුද්ගලයෙකුට තමන්ගේ ඉඩමකින් ඕනෑම වර්ගයේ ගස් දෙකක් කපාගෙන ප්‍රවාහනය කරන්න අවශ්‍ය කරන බලපත්‍රය ප්‍රාදේශීය ලේකම්වරයා හරහා දෙන්න අප දැන් නීති සම්පාදනය කරලා තිබෙනවා. ඒවා දැන් අප පළ කරලා තිබෙනවා. ඒ අනුව දැන් ඒ නීති ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය හරහා ඕනෑම කෙනෙකුට කුඩා අත් ට්‍රැක්ටරයක්, ට්‍රැක්ටරයක් භාවිත කරලා කියුබ් තුන්කාලක වැලි හෝ මැටි හෝ පස් ප්‍රමාණයක් කිසිම බලපත්‍රයක් නැතිව රැගෙන යාමටත් -ඔවුන්ගේ පෞද්ගලික කාර්යයකට- අවශ්‍ය නීතිරීති අප සම්පාදනය කරලා, දන්වලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට පැති දෙකක් තිබෙනවා. එක කාරණයක් තමයි ස්වාභාවික සම්පත් කළමනාකරණය කිරීමේදී වාණිජමය වශයෙන් කෙරෙන කටයුතු අප කළමනාකරණය කරන්නේ කොහොමද කියන එක. දෙවැනි කාරණාව තමයි ස්වාභාවික සම්පතක් අපේ කුඩා මිනිහෙකුගේ වුවමනාවට අප යොදා ගන්නේ කොහොමද කියන එක.

ඉතින් මේවා සියල්ලටම එක සමාන දැඩි නීතිරීති පනවලා තිබුණොත් ඒ නීතිරීතිවලින් අවසානයේදී විශාල හිරිහැරයකට ලක් වන්නේ සාමාන්‍ය ජනයායි. මේ ගැන අපේ ආණ්ඩුව බොහොම තදින් කල්පනා කළා. අප නීති සම්පාදනය කළාට පස්සේ වුණත් ඒ නීති සම්බන්ධයෙන් වන ප්‍රායෝගික ස්වරූපය ගැන කල්පනා කරලා තමයි අපි වැඩ කරන්නේ. ඒ නිසා අප හැමවිටම අවශ්‍ය ස්වාභාවික සම්පත් මහ ජනයාගේ ප්‍රයෝජනයට ගන්නත්, ඒවායෙන් ඇති වන පරිසර හානිය කළමනාකරණය කරන්නත් අපි කටයුතු කරන්න ඕනෑ. මෙයට තමයි තිරසාර පරිසර කළමනාකරණය කියන්නේ. ඒ ස්වාභාවික සම්පත් ගන්නේ නැතිව, ඒවා තියා ගෙන ඉඳලා අපට "කළමනාකරණය කරනවා" කියන වචන ගෙනෙන්න බැහැ.

ජනතාවගේ ජීවන මට්ටම වැඩි වෙන කොට, අපේ ඒක පුද්ගල ආදායම වැඩි වෙන කොට, අපේ මිනිසුන්ගේ අවශ්‍යතා

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

වැඩි වෙන කොට ඒ හා සමාන මට්ටමකට අප නීතිරීති සම්පාදනය කළ යුතුව තිබෙනවා. ඒ අනුව තමයි අපි ක්‍රියා කළේ. අමාත්‍යවරුන් හැටියට අප හැම අවස්ථාවකම ප්‍රතිපත්ති තීන්දුයි ගන්නේ. ඒ ප්‍රතිපත්ති තීන්දු ක්‍රියාත්මක කරන්නේ අදාළ ආයතන හරහායි. අමාත්‍යවරයා කවදාවත් බලපත්‍ර ලබා දෙන්නේ නැහැ. අද ගෙනෙන නියෝගවලට අදාළ බලපත්‍ර ලබා දෙන්නේ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියයි. ඒක අමාත්‍යවරයාගේ කාර්යයක් නොවෙයි. මට පෙනෙනවා, සමහර නාළිකා කල්පනා කරනවා අමාත්‍යවරයා ගිහිල්ලා හැම දෙයක්ම බලන්න ඕනෑය කියලා. එහෙම එකක් ලෝකයේ කොහේවත් සටහන් වෙලා නැහැ. අමාත්‍යවරයා ගන්නේ ප්‍රතිපත්ති තීන්දු නම් ඒ බලපත්‍ර, කොන්දේසි උල්ලංඝනය කළොත් ඒක අදාළ ආයතනයට දන්නලා ඒ පිළිබඳව ක්‍රියාත්මක වෙන්න පුළුවන්. එහෙමත් නැත්නම් ඕනෑම කෙනකුට අධිකරණයට ගිහින් දණ්ඩ නීති සංග්‍රහය යටතේත්, අධිකරණ සංවිධාන පනත යටතේත් අවශ්‍ය කරන තීන්දුවක් අර ගන්න පුළුවන්. එහෙම නැතිව හැම වළක් දිහාම බල බලා ඉන්න ඇමතිවරුන්ට වෙලාවක් නැහැ. යන ගමන් ඒ වළවල්වල බැහැලා යන්නත් ඇමතිවරුන්ට වෙලාවක් නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මොනවාද කියන්නේ?

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ඔබතුමා අහ ගෙන ඉන්න කෝ. මා මේ ප්‍රතිපත්තියක් පැහැදිලි කරන්නේ. ස්වාභාවික සම්පත් සම්බන්ධ ප්‍රතිපත්තිය පැහැදිලි කිරීම අවශ්‍යයි නේ. එහෙම තමයි අප වැඩ කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ තෙල් ගවේෂණ ඉතිහාසය 1960 දශකයට දිව යනවා. ඒ කාලයේ ඉඳලා අද වන තෙක් විවිධ අවස්ථාවල තෙල් ගවේෂණය පිළිබඳව අපි ක්‍රියාත්මක වෙලා තිබෙනවා. නමුත් ඒ අවස්ථාවල තිබුණු තාක්ෂණය මඳකම නිසා වෙන්න පුළුවන්, එහෙම නැත්නම් එහි තිබුණු වෙනත් කරුණු නිසා වෙන්න පුළුවන්, අපට එය සාර්ථක කර ගන්න බැරි වුණා. ද අපි තෙල් ගවේෂණයේ යම් සාර්ථකත්වයක් ලබනවා කියා අපට පෙනෙනවා. ඒ තොරතුරු සම්පූර්ණයෙන්ම මා ළඟ නැහැ. නමුත් අපට පෙනෙනවා, තෙල් ගවේෂණයේ සාර්ථකත්වයක් තිබෙනවා කියලා.

මෙම කරුණු අපි ඉදිරිපත් කරන්නේ ඒ පිළිබඳව ප්‍රතිපත්තිමය තීන්දු ගන්න. ඒ ප්‍රතිපත්තිමය තීන්දු වඩා ප්‍රායෝගිකව ගන්න ඕනෑ කරන නියෝග මාලාවන් තමයි අපි පනවන්නේ. සෑම විටම අපි හිතනවා, ඒ නියෝග මාලාවන් එම ආයතන හරහා හොඳින් ක්‍රියාත්මක වෙයි කියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්වභාවික සම්පත් පරිහරණය අද ලෝකයේ හැම රටකටම අවශ්‍ය දෙයක්. ස්වභාවික සම්පත් පරිහරණය වඩා ක්‍රමවත්ව කරන්නේ කොහොමද කියන එකයි අද අපි කල්පනා කරන්නේ. අමාත්‍යවරු හැටියට අප ගන්නා ප්‍රතිපත්ති තීන්දු අප සතු ආයතනවල ක්‍රියාත්මක කරනවා. ඒ ආයතනවලින් ක්‍රියාත්මක වන දේවල්වල යම් අඩු පාඩුවක් තිබෙනවා නම් ඒවා කළ යුතු ආකාරය තමයි මා පැහැදිලි කළේ. [බාධා කිරීමක්] කුරුණෑගල මේකයි සිද්ධ වුණේ. ඊයේ සිද්ධ වුණු කාරණාව මෙයයි. එක්තරා පුද්ගලයෙක් පොලීසියට අහු වෙලා තිබෙනවා. වැලිවේරිය පැත්තේ කෙනෙක් වැලි බලපත්‍ර ප්‍රමාණයක් හොරෙන් මුද්‍රණය කරලා ව්‍යාජ ලෙස සකස් කර ඒවා අලෙවි කර තිබෙනවා. ඒ වැලි බලපත්‍ර සංඛ්‍යාව හොයන්න කුරුණෑගල මාර්ගයේ ගමන් කරපු සියලුම ලොරි ටික නවත්වා තිබෙනවා. ව්‍යාජ ලේඛන ඇති කිරීම පිළිබඳව ගනිමු. ලංකාවේ උප්පැන්න සහතිකවලටත් ව්‍යාජ ලේඛන හදනවා. එදාට සියලුම උප්පැන්න තහනම් කරන්නේ නැහැ නේ. අදාළ එක හොයා ගන්න ඕනෑ.

අපි මේ බලපත්‍ර සකස් කරන්නේ විශේෂයෙන් ගෙන්වූ කඩදාසිවල. ඒකට අවශ්‍ය කරන watermark එකක් තිබෙනවා. මේවා මුද්‍රණය කරන්නේ "ලේක් හවුස්" ආයතනය. ඒ මුද්‍රණය කරන හැම එකකම serial number එකක් අපි ළඟ තිබෙනවා. ඒ අංකයේ පිටපත අපි ළඟ තියාගෙන ඉන්නවා. එතකොට නගරවල විවිධ ස්ථාන ගණනාවකින් අපි බලපත්‍ර නිකුත් කිරීම කරනවා. අනුරාධපුරයෙන් දෙනවා; කුරුණෑගලින් දෙනවා; කොළඹින් දෙනවා; මහියංගනයෙන් දෙනවා; හසලකින් දෙනවා; මේ විධියට බලපත්‍ර නිකුත් කිරීම කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මොහොත වන විට වැලි අධික වශයෙන් ගෙනෙන්නේ මනම්පිටිය අනෙක් පැත්තෙන් ලග්ගල පල්ලේගම, මහියංගන ප්‍රදේශවලින් පමණයි. ඒ කියන්නේ ස්ථාන තුනකින්. දවසකට ලොරි රථ විශාල ප්‍රමාණයක් කොළඹ එනවා. මට දැන ගන්න ලැබුණු හැටියට පොලීසිය මේ ලොරි 300ක් නවත්වා ඒවා පරීක්ෂා කරන්න අවශ්‍ය බව ඉරිදා දවසක අපට කියා තිබෙනවා. ප්‍රායෝගිකව එහෙම තොරතුරු දෙන්න අපේ නිලධාරින් ඉරිදා වැඩ කරන්නේ නැහැ. මම ඊයේ - සඳුදා- මගේ නිලධාරින්ට නියෝග කළා, අවශ්‍ය තොරතුරු සියල්ලම දෙන්න කියා. ඒ තොරතුරු ලබා ගත්තාට පසු පොලීසියට පුළුවන් ඒ පිළිබඳව ක්‍රියා කරලා ඒවායේ තිබෙන ව්‍යාජභාවය හොයන්න.

එහෙම නැතුව පාරේ යන ලොරි ටික නවත්වලා තියා ගෙන හිටියා කියා ඒ බලපත්‍ර ව්‍යාජද නැද්ද කියලා සොයන්න අමාරුයි. ඒකත් මම ඒ ගොල්ලන්ට කිව්වා. ඒ අවශ්‍ය කරන තොරතුරු එකතු කරලා, මධ්‍යම කාර්යාංශයෙන් දැන් ලබා දී ගෙන යනවා. මම හිතනවා, දැන් ඒ ගැටලුව විසඳන්න පුළුවන් වෙයි කියලා. ඒ අනුව අපේ විශේෂිත කඩදාසියක මුද්‍රණය කරන එම ලියවිල්ල එහෙම නැත්නම් ඒ බලපත්‍රය එහෙම ලෙහෙසියෙන් කූට ලෙස හදන්න අමාරුයි. එහෙම කළොත් ඒක සොයා ගන්න පුළුවන්. ඒකට අපට serial අංකයක් තිබෙනවා. ඒ අංකය අනුව අපට පැහැදිලිව සොයන්න පුළුවන්, අපි නිකුත් කළ බලපත්‍රයක්ද, එහෙමත් නැත්නම් ව්‍යාජ ලෙස හදපු ලියවිල්ලක්ද කියලා. සඳහන් කරන අන්දමට මේ පුද්ගලයා මේ ව්‍යාජ ලියවිලි සෑහෙන ප්‍රමාණයක් අලෙවි කරලා තිබෙනවා ලු. "ලු" කියන එකයි මට දැන ගන්න තිබෙන්නේ. මේ සම්බන්ධයෙන් පරීක්ෂණ කරන්න, අවශ්‍ය කටයුතු කරන්න පොලීසියට අවශ්‍ය සියලුම සහයෝගය අපි ලබා දෙනවා. ඇත්ත වශයෙන්ම එක පැත්තකින් අපි පොලීසියට ස්තුතිවන්ත වනවා, මේ වාගේ වැදගත් තොරතුරක් ලබා දීම ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොකද, මේ ස්වාභාවික සම්පත් අලෙවියෙන් අපි විශාල මුදලක් අපේ අමාත්‍යාංශය හරහා මධ්‍යම රජයේ භාණ්ඩාගාරයට ලබා දෙනවා. භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය හරහා පමණක් අපි ගිය අවුරුද්දේ රුපියල් බිලියනයක් මධ්‍යම රජයේ භාණ්ඩාගාරයට ලබා දුන්නා. අපේ අමාත්‍යාංශය යටතේ ඇති දැව සංස්ථාව වාගේ සියලුම ආයතනවලින් අපි විශාල මුදල් ප්‍රමාණයක් මධ්‍යම රජයේ භාණ්ඩාගාරයට ලබා දෙනවා. ඒක තමයි අපේ වගකීම. අපි ආණ්ඩුව වෙනුවෙනුයි මුදල් එකතු කරන්නේ. ආයතනයක් හැටියට ආයතනයේ වියදම් ගියාට පසුව ලාභයෙන් අපි අපේ ඉදිරි කටයුතුවලට වියදම් කරන ප්‍රමාණය විතරක් ඉතුරු කර ගෙන අනෙක් මුදල් සියල්ලම මධ්‍යම රජයේ භාණ්ඩාගාරය වෙත ලබා දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොකද, මම කලින් කිව්වා වාගේ, මේ ස්වාභාවික සම්පත තමයි අපේ රටේ අනාගත ආදායම් මාර්ගය කියලා මම මේ අවස්ථාවේදී පැහැදිලිව කියන්න

කැමැතියි. ස්වාභාවික සම්පත් නිසි ලෙස කළමනාකරණය කිරීමෙන් පමණයි එය කරන්න පුළුවන් වන්නේ. ඒ නිසාම රජය අපට තීන්දුවක් දීලා තිබෙනවා, අගය එකතු කිරීමකින් තොරව කිසිම දෙයක් පිටරට පටවන්න එපා කියලා. යම් ආකාරයකට ලංකාවේ තිබෙන ඛනිජ ද්‍රව්‍යයක් පිටරටකට දෙනවා නම් අගය එකතු කිරීම අත්‍යවශ්‍යයි. නමුත් අපට අද ලංකාවේ තිබෙන ඛනිජ ද්‍රව්‍යය සම්බන්ධයෙන් විශාල ඉල්ලුමක් තිබෙනවා. ඒ ඉල්ලුම ලැබෙන්නේ තිබෙන සංවර්ධනය හින්දා. ඒ සංවර්ධනයේදී වාණිජ වශයෙන් කරන දේවල්වලට අවශ්‍ය කරන නීති රීති සම්පාදනය කරන අතරේ, සාමාන්‍ය ජනතාවට පාවිච්චි කරන්න ඕනෑ ඛනිජ ද්‍රව්‍ය සඳහා නීතිරීති ලිහිල් කිරීම සඳහා අවශ්‍ය කරන ගැසට් නිවේදන මම නුදුරු අනාගතයේදීම මෙම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න සූදානම් වෙලායි ඉන්නේ. එසේ කරන්නයි අපි අදහස් කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඛනිජ තෙල් ගැන කියනවා නම්, මීට අවුරුදු හතළිහකට පෙර තමයි ඛනිජ තෙල් කැණීම ආරම්භ වෙලා තිබෙන්නේ. 1967, 1968 වර්ෂවල තමයි ප්‍රථම වරට ඛනිජ තෙල් සංස්ථාව එක්ක රුසියානු සමාගමක් එකතු වෙලා, භූ කම්පන තරංග සමීක්ෂණ ආශ්‍රිත දත්ත ලබා ගෙන තිබෙන්නේ.

ඒ අනුව ඛනිජ තෙල් කැණීම් අවස්ථා කිහිපයක් අපට සටහන් වෙනවා. නමුත් ඒවායේ තිබෙන තෙල් ප්‍රමාණය හෝ ගෑස් ප්‍රමාණය වාණිජ මට්ටමට ප්‍රමාණවත් නොවන නිසා ඒවා ඒ අවස්ථාවේ දී අත්හැරලා දමලා තිබෙනවා. ඒ අනුව දැනට මේ ඛනිජ තෙල් කණින සමාගමේ කරන කටයුතුවලදී ඇති වන සමුද්‍ර දූෂණයන් සම්බන්ධයෙන් අපි ක්‍රියා කරනවා.

ඔබතුමන්ලා දන්නවා ඇති, ලංකාව අවටින් විශාල නැව් ප්‍රමාණයක් ගමන් කරන බව. [බාධා කිරීමක්] ඔව්, සමාගමෙන් සිදු වන පරිසර දූෂණය සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කිරීමට තමයි මෙම නියෝග පනවා තිබෙන්නේ. සාමාන්‍යයෙන් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියට අයිති කාර්යක් තමයි, යම් කිසි නෞකාවක් ලංකා වරායකට සේන්දු වුණාට පසුව එම නෞකාවේ තිබෙන අප ද්‍රව්‍ය නිසි ලෙස බැහැර කළාද කියන එක සහතික කරලා, ඒ පිළිබඳව සහතිකයක් ලබා දීම. එම සහතිකය ලබා දුන්නාට පසුව තමයි අපේ වරායෙන් එම නැවට ඉවත් වන්නට පුළුවන් වන්නේ. එම බලතල තිබෙන්නේත් මේ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියටයි. එම නිසා මා හිතනවා, මේ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය ලංකාවේ අනාගතය සඳහා ඉතාම වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි කියලා. විශේෂයෙන් දැන් එක දිගට අපේ වරායවල් පහක් සංවර්ධනය වනවා. කොළඹ වරාය පුළුල් වෙනවා. ගාල්ල ඇතුළු අනෙකුත් වරායන් සංවර්ධනය වෙනවා. හම්බන්තොට වැනි අලුත් වරායවල් හැදෙනවා. අනාගතයේ දී අපේ එම වරායවල්වලට පැමිණෙන නෞකාවලින් සිදු වන සමුද්‍රීය දූෂණයන් වැළැක්වීම සඳහා අවශ්‍ය වන නීතිරීති ක්‍රියාත්මක කිරීමේ බලය තිබෙන්නේ මේ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියටයි. ඒ නිසා අවශ්‍ය කරන සියලු නියෝග පනවා මේ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය ශක්තිමත් කිරීම අපේ අරමුණ වෙලා තිබෙනවා. ඒ අනුව තමයි අපි මේ කටයුත්ත කරන්නේ. ඒ නිසා මේ අවස්ථාවේ දී මා තමුන්නාන්සේලාට මතක් කරන්නට කැමැතියි, මෙවැනි නීතිරීති නොමැති නම් අනාගතයේ ඇති වන තත්ත්වයන් යටතේ සමහරවිට අපි ලොකු අමාරුවක වැටෙන්නට පුළුවන් බව.

ඔබතුමන්ලාට මතක ඇති, British Petroleum සමාගමට අයිති Deepwater Horizon කියන තෙල් ළිඳ ආශ්‍රිතව සිදු වුණු විශාල හානිය පිළිබඳව. එවැනි අවස්ථාවක, ඒ රටේ තිබුණු නීති නිසා එම BP සමාගමට සිදු වුණා, ඒ සිදු වුණු පරිසර දූෂණය වෙනුවෙන් ගෙවන්න. ඒ සඳහා නීතිරීති සම්පාදනය වන්නට ඕනෑ. යම් කිසි ගිවිසුමක් අත්සන් කරනකොට ඒ ගිවිසුමට මේ කොන්දේසි ඇතුළත් වන්නට ඕනෑ. ඒ අනුව අපෙන් බලපත්‍රයක් ලබා ගන්නට ඕනෑ. ඒ බලපත්‍රයට ගෙවීම් කළ යුතුව තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය කරන නියෝග අපට නැත්නම්, යම් ආකාරයක හිඩැසක් තිබුණොත් එවැනි තත්ත්වයකට මුහුණ දෙන්න පුළුවන්කමක් අපට ඇති වන්නේ නැහැ. අන්න ඒ නිසා තමයි අපි අද මේ අවස්ථාවේ දී මේ නියෝග ගෙන එන්නේ.

අපි විශ්වාස කරනවා, මේ නියෝග හරහා අපේ තෙල් ගවේෂණයට විශාල රුකුලක් ඇතිවෙයි කියලා. ඒ වාගේම එම තෙල් ගවේෂණය වඩාත් හොඳින් කරන්නත් අවශ්‍ය කරන නෛතික යාන්ත්‍රණය අපට ලබා ගන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. මෙන්න මේ විධියට තමයි අපි වැඩ කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන් මේ රටේ ස්වාභාවික සම්පත්වල භාරකාර අමාත්‍යාංශය හැටියට, එහි ඇමතිවරයා හැටියට අපි මේ කාරණා ගැන විශාල අවධානයක් යොමු කරලා තිබෙනවා. ඒ වාගේම අපේ අනෙකුත් නීතිරීතිවලටත් අවශ්‍ය කරන වෙනත් සංශෝධන ගෙන ඒම සඳහා අපි දැන් නීති කෙටුම්පත් සම්පාදකවරයාට භාර දීලා තිබෙනවා. ඒ අනුව විශේෂයෙන්ම ඒ හැම අංශයකම යම් කිසි ප්‍රශ්නයක් තමුන්නාන්සේලාගේ ප්‍රදේශවල තිබෙනවා නම්, ඒවා අපිට දැන්වුවොත් ඒ හැම අවස්ථාවකදීම කළමනාකරණය කරන්න, එහෙම නැත්නම් ඒ පිළිබඳව ක්‍රියාත්මක වන්න අපේ නිලධාරින් සම්පූර්ණයෙන් ඒ වෙනුවෙන් යොදවන්න අපට පුළුවන්. එයට හේතුව මේ සියලු ස්වාභාවික සම්පත්, අවසානයේ මේ රටේ ජනතාවගේ යහපත වෙනුවෙන් පාවිච්චි කරන්නට අපට සිදු වන නිසායි. විශේෂයෙන් අපි දැන් කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා.

අපේ ගංගාවල වැලි කැණීම් දැන් විශාල වශයෙන් සිදු වනවා. ගංගාවල විශාල වශයෙන් වැලි කැණීම අපේ පරිසරයට අහිතකරයි. ගංගාවලින් වැලි යම් ප්‍රමාණයක් ගන්න ඕනෑ. නමුත් බහුල වශයෙන් වැලි ඉවත් කරනකොට ඇති වන තත්ත්වයට මුහුණ දීම සඳහා අපේ කැබිනට් මණ්ඩලය දැන් අනුමත කර තිබෙනවා, මුහුදු වැලි අරගෙන ඒවා සෝදා, ඒවා ජනතාවගේ ප්‍රයෝජනයට දෙන්න. දැන් ඒ පිළිබඳව අවශ්‍ය කටයුතු කෙරෙනවා. එක වැලි නිධියක් අපි ඒ විධියට ජනතාවට ලබා දුන්නා. ඒ අනුව ඉදිරියේදීත් වැලි කැණීම් කරලා පුළුවන් තරම් ජනතාවට ලබා දුන්නොත්, අද පවතින අධික මිල ගණන් අපට අඩු කරන්න පුළුවන් වෙයි කියලා මා හිතනවා. එම නිසා තමයි අපි මේ වාගේ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරන්නේ. සමහර විට අවශ්‍ය කරන මූළු ඛනිජ ප්‍රමාණයම දෙන්න අපට අමාරුයි. මා කලින් කිව්වා වාගේ විශේෂයෙන් මහවැලි ගඟේ වැලි ප්‍රමාණයක් කොළඹ නගරයට ගෙන ඒමෙන් තමයි අපි කොළඹ නගරයේ වැලි මිල පාලනය කරන්නේ. ඒ මඟින් විශාල රැකියා ප්‍රමාණයකුත් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම අතුරු ප්‍රතිඵලයනුත් ඇති වෙලා තිබෙනවා. වැලි කැණීම් හරහා ඒ ප්‍රදේශවල ප්‍රාදේශීය සභාවලට අපි විශේෂ දීමනාවක් ගෙවනවා. විශේෂයෙන් හසලක ප්‍රදේශයේ වැලි කැණීම්වලින් විතරක් ඒ ප්‍රාදේශීය සභාවට දළ වශයෙන් මසකට රුපියල් මිලියනයකට වඩා වැඩි මුදලක් අපි ලබා දීලා තිබෙනවා. මනම්පිටිය ප්‍රදේශයේ වැලි කැණීම්වලදී මනම්පිටිය ප්‍රාදේශීය සභාවටත් අපි එලෙසම භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය හරහා මුදල් ලබා දෙනවා. එම නිසා හැම විටම ඒ ප්‍රදේශවලට යහපතක් වීමටත්, අපේ රටට යහපතක් වීමටත් ඒ කටයුතු ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කරන නෛතික ප්‍රතිපාදනත්, ක්‍රියා මාර්ගත් ගනිමින් සිටිනවා. සාමාන්‍ය ජනතාවට වඩාත් සරල, වඩාත් යහපත් ක්‍රමවේදයන් ඔස්සේ ඒ අවශ්‍යතා ඉටු කරන්න අවශ්‍ය කරන නීති ලිහිල් කිරීමටත් අමාත්‍යවරයා හැටියට මා කටයුතු කරනවා. ඒ අනුව මේ නියෝග සම්මත කිරීමට ඔබතුමන්ලාගේ සහාය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමා. ඊ ළඟට ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා.

[අ.භා. 2.28]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තිබෙන ප්‍රශ්න රාශියකට විසඳුම් දෙන්න ලෑස්ති වෙලා ඒ සඳහා අවශ්‍ය පරිසරය සකස් කරන්න සූදානම් වීම ගැන ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා. මගේ කථාව ආරම්භ කරන්න පෙර ගරු ඇමතිතුමාගෙන් පැහැදිලි කිරීමක් කර ගන්න කැමැතියි. මුහුදුබඩ පත්තුවේ කෝකිලායි ප්‍රදේශය ධීවර ගම්මානයක්. ඒ ගම්මානයේ සිටින ධීවරයන්ට එතැනින් අයින් වෙන්න කියා තිබෙනවා. එතැනින් ඒ වැලි අරගෙන - [බාධා කිරීමක්] ඔහොම කිව්වාට හරි යන්නේ නැහැ. අමාත්‍යතුමා නැඟිටලා නැහැයි කිව්වොත් ඒක මට සැනසීමක්. ඒ නිසා අමාත්‍යතුමාට මයික් එක දෙන්න.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
හෙට වන කොට මේ සම්බන්ධයෙන් පැහැදිලි පිළිතුරක් තමුන්නාන්සේට දෙන්න පුළුවන්. මා දැනුවත්ව එවැනි කණ්ඩායම්, පුද්ගලයන් අයින් කරලා ස්වාභාවික සම්පත් ලබා ගන්න අපි කිසිම තීන්දුවක් අරගෙන නැහැ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
හොඳයි. ස්තුතියි. මැතිවරණ කාලයේදී අපි කෝකිලායි ගම්මානයට ගියා. මීගමුව දූව ප්‍රදේශයේ රැකියාව කරන විශාල පිරිසක් තමයි ඒ ගම්මානයේ ඉන්නේ. ඒ ගම්මානයට ගිය වෙලාවේ ඔවුන් අපට කරපු පැමිණිල්ල තමයි, මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් සහ තවත් ඇමතිවරු ඇවිල්ලා වෙනත් තැන්වලින් ගෙවල් දෙන්නම් කියා ඔවුන්ට එතැනින් ඉවත් වන්න කිව්වාය කියන එක. ගරු ඇමතිතුමා මේ පිළිබඳව තමුන්නාන්සේ දන්නේ නැත්නම්, තමුන්නාන්සේට කියන්න තිබෙන්නේ, මේ මොන නීතිරීති ගෙනාවත් අද මේ රටේ -

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ඔබතුමාට පැහැදිලි පිළිතුරක් දෙන්න මට පුළුවන්. ඒ කැණීම් කවුරු කළත් ඒ බලපත්‍ර ලබා දෙන්න බලය තිබෙන්නේ අපේ භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයටයි. එවැනි තොරතුරක් මට ලැබිලා නැහැ. අපි එහෙම බලපත්‍රයක් ලබා දෙන්න කටයුතු කරලාත් නැහැයි කියන එක මට කියන්න පුළුවන්. ඒ පිළිබඳ වෙනස් තත්ත්වයක් තිබෙනවා නම් මා ඔබතුමාට දන්වන්නම්.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
හොඳයි. ස්තුතියි. තමුන්නාන්සේ ඇමතිවරයා. මා මේ කාරණාව කිව්වේ, මෙය ඇමතිවරයාත් දන්නේ නැතුව සිද්ධ වන දෙයක් නිසායි. මේක තමයි මහා මං කොල්ලය. මේ පිළිබඳව සොයා බලන්න. දැන් තමුන්නාන්සේ කියපු කථාව ඇතුළත් මේ හැන්සාඩ් වාර්තාව මා ධීවරයින්ට යවනවා. ඒ අය භය වෙලායි ඉන්නේ. එතුමා මහා බලගතු මන්ත්‍රීවරයෙක්. ඒ අයට ඇමතිතුමා භය වෙයිද දන්නේ නැහැ. ඒකයි තිබෙන ප්‍රශ්නයත්. [බාධා කිරීමක්] ගරු හිස්බුල්ලා නියෝජ්‍ය ඇමතිතුමාත් ඉන්නවා. තමුන්නාන්සේගේ නායකයෙක් තමයි මේ කටයුත්ත කරන්නේ. නම් අහගන්න එපා. යූඑන්පී එකේ ඉන්න අපේක්ෂකයන්වත් කොන්ත්‍රාත් දීලා සල්ලිවලට අරගෙන.

**ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා (ළමා සංවර්ධන හා කාන්තා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் - சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. M.L.A.M. Hisbullah - Deputy Minister of Child Development and Women's Affairs)
ඔබතුමාත් කියන්න භය නැතුව ඉන්න කියලා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මොකක්ද?

**ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා**
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. M.L.A.M. Hisbullah)
ඔබතුමාත් කියන්න භය නැතුව ඉන්න කියලා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
භය නැතුව ඉන්න කියලා, එතැනට ගිහිල්ලා භය ගන්වලා සල්ලි ගන්නවා. භය නැතුව ඉන්න කියලා මෙතැන කිව්වාට හරි යන්නේ නැහැ නේ. [බාධා කිරීමක්] පොඩ්ඩක් ශබ්ද නැතුව ඉන්න.

තවත් සිද්ධීන් කිහිපයක් පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරවනවා. විශේෂයෙන්ම ලංකාවේ හැම තැනමත් මේ තත්ත්වය තිබෙනවා. ගම්පහ දිස්ත්‍රික්කයේ ආසන කිහිපයක මේ තත්ත්වය තිබෙනවා. ඒ ප්‍රදේශයේ මැටි ගන්න ගොඩ බිමක් තිබෙනවා. ඒක ගහ නොවෙයි. [බාධා කිරීමක්] එහා පැත්තේ නේ ඇමතිතුමා ඉන්නේ.

ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ කථාන්දරය දන්නවා මම කියන කොටම. මැටි අරගෙන ඉවර වන කොට යට තිබෙනවා වැලි. ඒ වැලිත් ගන්නවා. නමුත් ඒ වළවල් වහලා නැහැ. දැන් තමුන්නාන්සේ කරපු ප්‍රකාශය ගැන මම සතුටු වෙනවා. මම ඒකයි ස්තුති කළේ. දැන් ඒ කැණීම් කරපුවා අපායට ගිහිල්ලා තිබෙද්දිත් යම් කිසි ප්‍රතිකර්මයක් යොදන්න-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතාගේ නම යෝජනා කරන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு உதித் லொக்குபண்டார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. UDITH LOKUBANDARA *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

කරදරයක් නැතුව කථාව කර ගෙන යන්න පුළුවන්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

කවදත් එහෙම කරන්න පුළුවන්.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

තමුන්නාන්සේට නොවෙයි කිව්වේ. කලබල වෙන්න එපා. ගරු ඇමතිතුමනි, ඒ පරිසරය තුළ විශාල ප්‍රශ්න මතු වුණා.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

ගරු මන්ත්‍රීතුමනි, මම කෙටියෙන් පැහැදිලි කිරීමක් කරන්න කැමැතියි.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

මට තිබෙන කාලය කොහොමද දන්නේ නැහැ. මට ආණ්ඩු පක්ෂයෙන් වෙලාව දෙනවා නම්- [බාධා කිරීමක්] කටාන හා දිවුලපිටිය යන දෙකේම-

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

ගරු මන්ත්‍රීතුමා, අපි ඒකේ වගකීම් පවරලා තිබෙනවා. ඒ ගොල්ලෝ දැන් ඒ පරිසරය සංරක්ෂණය කර ගෙන යනවා. අඩු පාඩු තිබෙන බව මම පිළිගන්නවා. ඒක දීර්ඝ කාලයක් තිස්සේ සිදු වෙච්ච දෙයක්. අපි අවශ්‍ය පියවර ගනිමින් ඉන්නවා. අපි සමහර අවස්ථාවලදී අපේ කාර්යාංශයේ වියදමිනුත් සමහර දේවල් කරලා තිබෙනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ස්තුතියි. මම හුඟක් කැමැතියි තමුන්නාන්සේත් එක්ක වැඩ කරන්න. ඔය සාකච්ඡාවලදී ගම්පහ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙකු හැටියට, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන කෙනෙකු හැටියට මාවත් සාකච්ඡාවට කැඳවලා අපි ඒක එකඟතාවෙන් කළා නම් වඩා හොඳයි.

ගරු ඇමතිතුමනි, ඒ එක්කම මම කියන්න ඕනෑ මේ දෙන permits පිළිබඳවත් ලොකු ප්‍රශ්නයක් තිබෙන බව. පරම්පරාගතව ඒ අය ගඟෙන් වැලි ගොඩ දැම්මේ කුඩෙන්. විශාල පිරිසක් ඒ රක්ෂාව කළා. දැන් ඒ අයගේ රක්ෂාව නැති වෙලා. මුදලාලිලා කිහිප දෙනකු අතට ඒ ව්‍යාපාරය පත් වෙලා. අලුත් තාක්ෂණය යොදවාට අපිට කමක් නැහැ. නමුත් කුඩෙන්, ඔළුවෙන් වැලි ගොඩ දාපු ඒ ජනතාවට අපි යම් කිසි විධියක වන්දියක් ගෙවීමේ අවශ්‍යතාවක් පැන නැඟිලා තිබෙනවා. ඒක පරම්පරාගතව කරපු රක්ෂාවක්.

අනෙක් කාරණය ගරු ඇමතිතුමා, ඒ permits දෙන කොට එය දීමේ ක්‍රමවේදයක් සකස් කරන්න. ඒ ගොල්ලෝ අවුරුදු ගණනක් රැකියාව කරලා තිබෙනවා. වාහන අරගෙන තිබෙනවා. ඒවාට බැංකු ණය ගෙවන්නට ඕනෑ. ඒ ඔක්කෝම අහකට දාලා මේ අලුත් පරම්පරාවකට දේශපාලන හේතුන් උඩ- [බාධා කිරීමක්]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

ගරු මන්ත්‍රීතුමා, එහෙම වෙන්නේ නැහැ. මේ පිළිබඳව නඩුවක් - [බාධා කිරීමක්]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

හොඳයි, හොඳයි. තමුන්නාන්සේ වෙන්නේ නැහැ කියනවා නේ.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

ඒ නඩුවේ අපේ එකඟතාවක් තිබෙනවා. ඒ අනුව තමයි ඇත්තටම අපි permits ලබා දෙන්නේ. යම් විධියක ප්‍රශ්නයක් තිබෙනවා නම් ඔබතුමා මට දැනුම් දෙන්න.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

හොඳයි, මම කියන්නම්.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

අපි කොයි විධියකටවත් දේශපාලන හේතු මත permits දෙන්නේ නැහැ. ඒවා එහෙම දෙන්න පුළුවන් ක්‍රමයකුත් නැහැ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

හොඳයි, ඔබතුමාගේ ප්‍රකාශයට ස්තුතියි. මම ඒ සම්බන්ධව දැනුම් දෙන්නම්.

ගරු ඇමතිතුමනි, දැන් මේ පරිසරය ගැන කථා කරන කොට මම තමුන්නාන්සේගේ අවධානයට යොමු කරන්න කැමැතියි, මේ පරිසරය ආශ්‍රිතව තිබෙන මුහුද, ඒ ආශ්‍රිතව තිබෙන ධීවර කර්මාන්තය ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ධීවර කර්මාන්තයේ පාරම්පරිකව තිබෙන කර්මාන්තයක් තමයි මාදැල් කර්මාන්තය. ඒ මාදැල් කර්මාන්තය විශාල වශයෙන් කෙරුණු කර්මාන්තයක්; ලාභදායි කර්මාන්තයක්. අද ඒ කර්මාන්තය වැනසී ගෙන යන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. දැනුත් ඒ අයට සිද්ධ වෙලා තිබෙනවා මාදැල් වහලා තමුන් කරපු රැකියාවෙන් අයින් වෙන්න. ඊට පස්සේ ආවේ බෝට්ටු ක්‍රමය. ඔරු ක්‍රමයත් වෙනස් වෙලා බෝට්ටු ක්‍රමය එන කොට ඒවා යාන්ත්‍රික බෝට්ටු බවට පත් වුණා. ඒ යාන්ත්‍රික බෝට්ටු බහුදින යාත්‍රා බවට පත් වුණා. දැන් තමුන්නාන්සේ දන්නවා මේ තිබෙන ඉන්ධන මිලේ වැඩි වීමත් එක්ක අද ඒ ධීවර කර්මාන්තය අපේ අයට කරන්න ලැබෙන්නේ නැහැ කියලා. ඒ ලකුණු පෙනෙන්න තිබෙනවා. ධීවර කර්මාන්තය

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

නැව් මාර්ගයෙන් ලාභයට කරලා, එතැන ඉඳලාම පිට රට යවන්න පුළුවන් විධියට වැඩ සකස් වේ ගෙන යන්නේ. ඒ නිසා තෙල් මිල වැඩි වීම ගැන කියන කොට අපි විශේෂයෙන්ම කල්පනා කරන්න ඕනෑ වෙරළාශ්‍රිතව, එතකොට ඈත මුහුදේ ධීවර රැකියාව කරන ජනතාව දිරිමත් කරන්න, ආරක්ෂා කරන්න යම් කිසි වැඩ වැඩ පිළිවෙළක් ගැන. තෙල් මිල වැඩි වුණාය කියලා සලාකයට තෙල් දුන්නාට හරි යන්නේ නැහැ. ලෝකයේ තෙල් මිල වැඩි වෙලාත් නොවෙයි ඒක වෙලා තිබෙන්නේ. දැන් තමුන්නාන්සේ දන්නවා නේ ඇත්ත කථාන්දරය. මේ පාඩු පිරිමසා ගන්න, රජයේ නාස්තිය පිරිමසා ගන්න - [බාධා කිරීමක්]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා වැරදියි.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඉන්න, ඉන්න. තමුන්නාන්සේට ඒ ගැන කථා කරන්න මට ඉඩ දෙන්න බැහැ.

තමුන්නාන්සේගේ අමාත්‍යාංශයට අයිති දෙයක් නොවෙයි නේ. ඒ නිසා මට තමුන්නාන්සේට ඉඩ දෙන්නට බැහැ. හොඳයි, තෙල් සංස්ථාව ලාභද? පාඩුයි. ඇයි පාඩු වෙලා තිබෙන්නේ? රටේ ජනතාව පැහැදිලිව දන්නවා, මේ පාඩු වෙලා තිබෙන්නේ අදක්ෂතාව සහ සොරකම නිසායි කියලා. දැන් මේවාට වන්දි ගෙවන්නට වෙලා තිබෙන්නේ මේ රටේ සුළු ජනතාවට; විශේෂයෙන්ම ධීවර ජනතාවට. එම නිසා මේ සලාක ක්‍රමයටත් permit ක්‍රමයටත් තෙල් දීලා මේ ජනතාවට වෙන්නේ මුහුදු යන්නට නොවෙයි, ග්‍රාම නිලධාරි ළඟට ගිහින්, රජයේ නිලධාරින් ළඟට ගිහින්, දේශපාලඥයෝ ළඟට ගිහින් මේ තෙල් quota එක ගන්න එතුමන්ලාගේ කාලය විනාශ කර ගන්නයි. එම නිසා පරිසරයට ආදරය කරන කෙනෙක් හැටියට, මුහුද සහ වෙරළ ආරක්ෂා කරන ඇමතිවරයා හැටියට ඊට සම්බන්ධ ධීවර කර්මාන්තය ජීවනෝපාය කර ගත් ධීවරයා ශක්තිමත් කරන්නේ කොහොමද කියා ධීවර ඇමතිතුමාත් එක්ක ඔබතුමා කථා කරන්න කියා අප ඔබතුමාගෙන් ඉල්ලනවා. ඒ සඳහාත් අප එන්නට කැමැතියි. හැම දෙයටම සහනාධාර තිබෙනවා. මිල වැඩි වුණු නිසා නොවෙයි. මේ කර්මාන්තය දියුණු කරන්නයි. නමුත් ධීවරයාට සහනයක් ලැබෙන්නේ නැහැ. එම නිසා අප මේ පිළිබඳව සාකච්ඡා කිරීම වැදගත්ය කියන එක මා කියන්න ඕනෑ.

ධීවරයාට තෙල් මිල පිළිබඳව ප්‍රශ්නය විතරක් නොවෙයි, ධීවර කර්මාන්තය පිළිබඳ ප්‍රශ්නයත් ඇවිත් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අප කථා කර බේරා ගන්න ඕනෑය කියන එකයි මම තමුන්නාන්සේට මතක් කරන්නේ.

ගරු අමාත්‍යතුමනි, තමුන්නාන්සේගේ පරිසර අමාත්‍යාංශයට අයිති වන්නේ මුහුද විතරක් නෙවෙයි; මුහුදු වෙරළ විතරක් නොවෙයි; කළපුව කියන ප්‍රදේශත් තමුන්නාන්සේගේ අමාත්‍යාංශයට අයිතියි. තමුන්නාන්සේ දන්නවා, මීගමුවේ කළපුවට seaplane ගේන්න ගිහින් වෙච්ච අවුල පිළිබඳව. කළපුව භාරලාත්, ධීවරයෝ ඔක්කොම වට කරපු නිසා ඒ ව්‍යාපෘතිය ආපසු ගෙනි යන්න සිද්ධ වුණා. මේ කළපු පරිසරය තුළ තමයි ඉස්සෝ හැදුණේ; කඩොලාන තුළ තමයි, ඉස්සෝ බෝවීම ඇති වුණේ. මේ විධියේ වැඩ කරන කොට මේ කළපුව කියන එක ආරක්ෂා කිරීමට ධීවර ඇමතිතුමාත් එක්ක එකතුවී එහෙම නැත්නම් ධීවර ඇමතිතුමා නොමැතිව වුවත් තමුන්නාන්සේ කළ යුතු මෙහෙයක් තිබෙනවා. අද මේ කළපුව ආශ්‍රිතව තිබෙන්නේ කඩොලාන.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
කඩොලාන හිටුවීමේ ව්‍යාපෘතිය පටන් අර ගෙන තිබෙනවා. හලාවත තීරය දැන් හැදුවා. අපි බලන්නම් මීගමු තීරයටත් එන්න.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
කඩොලාන හිටුවීම විතරක් නෙවෙයි. මේ කළපුව ආරක්ෂා කරන්න ඕනෑ. නිදහස් වෙළඳ කලාපයෙන් ගලාගෙන යන අප ද්‍රව්‍ය ඔක්කොම ගිහින් වැටෙන්නේ කොහාටද? කළපුවට. අද තමුන්නාන්සේගේ අමාත්‍යාංශය අතිවිශාල බලගතු අමාත්‍යාංශයක් වුණත්, තමුන්නාන්සේට පිටින් ඉඳගෙන වෙනත් අය ඇඹිලි ගහන ක්‍රමය ගැන තමයි මම කිව්වේ.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
මම ඉතාම පැහැදිලිව කියනවා-[බාධා කිරීමක්]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
හරි. මට වැටහුණා.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
සියලු අවස්ථාවල අපෙන් අහලා තමයි යමක් කරන්නේ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
දැන් ඇහුවෙත් නැහැ නේ.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ඔබතුමා එහෙම හිතනවා නම් මට කරන්න දෙයක් නැහැ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අපි දෙදෙනාගෙන්ම අහමුකෝ.[බාධා කිරීමක්] මුලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අර කෝකිලායිවල ඉන්න මිනිසුන්ට ගිහින් අයින් වෙන්න කියලා, එතැන වැලි ටික භාරලා පුල්මුඩේට දෙන්න ඕනෑය කියලා කිව්වේ කවුද? ඒක ඇඹිලි ගැසීමක් නෙවෙයිද? මම මේ දන්නා දේ. මම තමුන්නාන්සේ පෞද්ගලිකව හමු වුණාම කියන්නම් කවුද කියා. පාර්ලිමේන්තුවේ කියන්න හොඳ නැහැ. බලගතු ඇමතිවරයෙක්. ඒ ඇත්ත කථාව. ඒ ප්‍රශ්නය එන කොට අපි කථා කරමු, අසවල් දා මා මෙහෙම දෙයක් කිව්වා; මෙන්න දැන් මේ තත්ත්වය ඇති වෙලා තිබෙනවා කියා. එතකොට තමුන්නාන්සේට තිබෙන්නේ අර ධීවරයෝ ටික එතැනින් එලවලා licence එක දෙන්න විතරයි. ඒකට එහා වැඩ කරනවා නම් තමුන්නාන්සේ මේ පැත්තට ඇවිත් වාඩි වෙන්නට ඕනෑ. ඔය පැත්තේ ඉන්න හම්බු වෙන්නේ නැහැ.

විශේෂයෙන්ම මැටි, වැලි, ගල් ප්‍රවාහනය කරන අය පුදුම අමාරුවකින් තමයි මේ කර්මාන්තයේ යෙදිලා ඉන්නේ. සමහර තැන්වල පොලීසිවලට මේ කර්මාන්තය පුදුම විධියේ ආදායම් මාර්ගයක් වෙලා තිබෙනවා. දැන් මේවා ප්‍රවාහනය කරන අයට පුදුම විධියට මේ කර්මාන්තය දාලා යන තරමට හිසරදයක් වෙලා

තිබෙනවා. ලොරිය අල්ලා ගන්නවා; ලොරිය තියා ගන්නවා; උසාවි දානවා. සමහර විට රාජ සන්තක කරනවා. ඒ තමුන්නාන්සේ කියපු දෙය හරි. මේ මිනිස්සු ජීවත් වුණේ මේ කර්මාන්තයෙන්. අද ඒ කර්මාන්තය කර ගන්නට බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මේවා සම්බන්ධයෙන් තිබෙන නීති අපි ලිහිල් කළා. නමුත් තමුන්නාන්සේගෙන් මා ඉල්ලන්නේ, ඒ ලිහිල් වෙනවාය කියන එක යම් කිසි චක්‍රලේඛයක් මඟින් ප්‍රකාශයට පත් කරලා අපි එකඟතාවකට ඇවිත් -[බාධා කිරීමක්] මම නම් තවම ඒ චක්‍රලේඛය දැක්කේ නැහැ. ඒ චක්‍රලේඛ අපිටත් එවනවා නම් ඉතා වැදගත්.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

ස්ථානයකින් ස්ථානයකට ගෙන යන්න තිබෙන අපහසුකම් චක්‍රලේඛන මාර්ගයෙන් නිවැරදි කර තිබෙන්නේ. මම ඒ ගැන ඔබතුමා සමඟ සාකච්ඡාවක් කරන්නම්. එතකොට මම කියන්නම්.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

හොඳයි. අපේ ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමා ඉතාම හොඳ සාකච්ඡාවක් කළා. මම ඒ Consultative Committee එකට ගියා. එතුමා ජලය බෙදා හැරීමේ වැඩ පිළිවෙළ -ජා ඇල, මීගමුව ප්‍රදේශය තුළ- චක්‍රලේඛ මඟින් වෙනස් කරලා, ඉතාම හොඳ තත්ත්වයට පත් කරලා වැඩ කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම මම ඔබතුමාගෙනුත් ඉල්ලන්නේ මුළු රටටම බලපාන මේ ප්‍රශ්නය -කටානට විතරක් නොවෙයි, දිවුලපිටියට විතරක් නොවෙයි, විශේෂයෙන් දකුණට බලපානවා- සම්බන්ධයෙන් සාකච්ඡා කර වැඩ පිළිවෙළක් සකස් කරන ලෙසයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම සංචාරක කර්මාන්තයත් එක්ක ධීවර කර්මාන්තය පැටලිලා තිබෙනවා. සංචාරක කර්මාන්තයත් දියුණු වෙන්න ඕනෑ. ධීවර කර්මාන්තය ආරක්ෂා වෙන්නත් ඕනෑ. ධීවරයන්ව වෙරළින් එළවලා වෙනත් අයට මුහුදු වෙරළ පාවිච්චි කරන්න -සංචාරක කර්මාන්තය දියුණු කරන්න- ඉඩ ප්‍රස්ථා ලබා දෙන අවස්ථා හුඟාක් අපි දැකලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, අපේ Consultative Committee එකට මේ නිලධාරීන් ඔක්කොම ගෙනැල්ලා, ඔක්කොම ප්‍රශ්න කථා කරන්න බැහැ. [බාධා කිරීමක්] Consultative Committee එකට නොවෙයි, අපි වෙනම මේ පිළිබඳව කථා කරමු. Consultative Committee එකට ගියාම වෙන වෙන ප්‍රශ්න තිබෙනවා නේ. ඔබතුමා දන්නවා නේ. අපිත් පෝලිමේ ඉන්න ඕනෑ නේ. ඒ නිසා ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ, නිලධාරීන් සමඟ අපි වෙනම සාකච්ඡා කරමු කියලායි. එතකොට ඒ දිස්ත්‍රික්කවල ප්‍රශ්න ගැන අපිට වෙනම කථා කරන්න පුළුවන්. මේ ප්‍රශ්නය පැහැදිලිවම ගම්පහ දිස්ත්‍රික්කයට විතරක් බලපාන ප්‍රශ්නයක් නොවෙයි. මුළු රටටම බලපාන ප්‍රශ්නයක්. මම හිතනවා තමුන්නාන්සේ බොහොම හොඳ අධ්‍යයනයකින් පසුව, මේ කර්මාන්තයට සම්බන්ධ ප්‍රදේශයක ඇමතිවරයෙක් හැටියට පොඩි මිනිසුන් ගැන හිතලා, මේ කර්මාන්තයේ යෙදිලා ඉන්න මිනිසුන් ගැන හිතලා, හොඳ වැඩ පිළිවෙළකට අවතීර්ණ වෙලා තිබෙනවා කියා. ඒ වෙනුවෙන් අපේ ගෞරවය තමුන්නාන්සේට හිමි වෙනවා. දේශපාලන වශයෙන් අපි එතැනදී ප්‍රවේශම් වෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොහේවත් ගිහිල්ලා -ජිනීවා ගිහිල්ලා- මූලික අයිතිවාසිකම් ගැන කථා කරන්න ඉස්සෙල්ලා දේශපාලන වශයෙන් බෙදන්නේ නැතිව අපේ රටේ මිනිසුන් ටික එකතු කර ගන්න බලන්න ඕනෑ. අපි කථා කරන්නේ උතුර, නැඟෙනහිර සහ දකුණ ගැන. දකුණේ ඉන්න මිනිසුන්ගේත් එකමුතුතාව ඇති කර ගන්න. වැලි permit එකක් දෙන විට, රක්ෂාවක් දෙන විට ඒ එකමුතුකම තිබෙන්නට ඕනෑ. මේවාත් මූලික අයිතිවාසිකම්. අද ඒ අවස්ථාව නැති වෙලා තිබෙනවා. තමුන්නාන්සේට මම කාරණයක් කියන්නම්. ලංකා බැංකුවේ interview කරනවා. කොහොමද ගන්නේ? අපි දන්නා ක්‍රමවේදයක් නැහැ.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

විභාගයක් තියලා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

නැහැ. විභාගයක් නැතිව. මම ඒකයි කියන්නේ. National Savings Bank එකට ගත්තා. ලැයිස්තු පිටින් ගත්තා. සමහර විට තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරුන්ගෙන් ගත්තෙත් නැහැ. එක බලගතු මන්ත්‍රීවරයකුගෙන් ලැයිස්තුව එනවා; ගන්නවා. ඊට එහා දෙයක් නැහැ. එතකොට මෙතැන බෙදීමක් ඇති වෙන්නේ නැද්ද? දකුණ එකතු කරන්න නම් එතැන විනිවිදභාවයක්, ප්‍රජාතන්ත්‍රවාදයක් තිබෙන්නට ඕනෑ. ඒකයි අපේ විශේෂ ඉල්ලීම. ඒවා අපට ජිනීවාවලට ගිහින් කියන්න ඕනෑ නැහැ. අපිට අපේ ප්‍රශ්න ටික මෙහේදී බේරා ගන්න පුළුවන්. අද මෙහේදී ඒ ප්‍රශ්න ටික බේරා ගන්න බැරි නිසා තමයි සමහර අය ජිනීවා ගිහින් කෑ ගහන්නේ.

ඊළඟට, මම ඔබතුමාට මතක් කරනවා LLRC වාර්තාව දිහා බැලුවාම එහි වැඩිපුරම තිබෙන්නේ උතුරු නැඟෙනහිර ප්‍රශ්න ගැන නොවෙයි කියන එක. එහි තිබෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව මුළු රටේම තිබෙන ප්‍රශ්න. මේක තමයි වැදගත් වෙන්නේ. තමුන්නාන්සේගේ අමාත්‍යාංශය යටතේ නියෝග ඉදිරිපත් කර තිබෙන වෙලාවේ මම ඒ ගැන කථා කරලා කාලය නාස්ති කරන්නේ නැහැ. මම තමුන්නාන්සේගෙන් විශේෂයෙන්ම ඉල්ලන්නේ මේ කර්මාන්තවල යෙදිලා ඉන්න අය ආරක්ෂා කරන්න කියලායි. විශේෂයෙන්ම ධීවර කර්මාන්තයේ යෙදිලා ඉන්න අය, ඒ වාගේම මැටි, වැලි, ගඩොල්, ගල් යනාදී කර්මාන්තවල යෙදිලා ඉන්න අය ආරක්ෂා කරන්න කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුහුද ආශ්‍රිතව තිබෙන වෙරළ ආරක්ෂා කරලා දෙන්න කියාත් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ වෙරළේ තමයි අපේ ධීවරයෝ ධීවර කර්මාන්තය කරන්නේ; බෝට්ටු ටික තියා ගන්නේ. ඔවුන් ජීවත් වන්නේත් මේ වෙරළේ. ඒ ජනතාව ආරක්ෂා කිරීම ඉතාම වැදගත් කාර්යයක් හැටියටයි මම සලකන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් මම මේ ගරු සභාවේදී මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. පසු ගිය දිනවල තෙල් මිල වැඩි වීම නිසා ඇති වුණ ධීවර ප්‍රශ්නවලදී ධීවරයෝ මහත්සේ කනගාටුවට පත් වුණු කරුණු කිහිපයක් සිදු වුණා. එකක් තමයි හලාවත ඇන්ටනී ප්‍රනාන්දු කියලා අපේ ධීවර සහෝදරයෙක් මරණයට පත් වීම. මේ ප්‍රශ්න ටික වේලාසන විසඳන්න තිබුණා. තෙල් මිල වැඩි වෙන්න යනවා, තමුන්නාන්සේලා වෙනුවෙන් අපි මොනවාද කරන්නේ කියලා ධීවර ජනතාව එක්ක කථා කරලා කරන්න තිබුණු වැඩේ ආණ්ඩුව නොකළ නිසා ඒ ඇන්ටනී ප්‍රනාන්දු මහතාට ජීවිතයෙන් වන්දි ගෙවන්න සිදු වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේමයි කටුනායක සිද්ධිය. විශ්‍රාම වැටුප් පනතක් ගේන්න යනවා කියලා ඒ සේවකයින් එක්ක කථා කළා නම් වෙනස් කිරීම් රාශියක් කරන්න තිබුණා. නමුත් ආණ්ඩුව හිතුවක්කාර වුණු නිසා තවත් එක

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

සහෝදරයකුට ජීවිතයෙන් වන්දි ගෙවන්න සිද්ධ වුණා. මම තමුන්නාන්සේට මතක් කරනවා, අද අපි මේ වැඩ පිළිවෙළ ගැන කථා කළත් ආණ්ඩුව ගමන් කරන වෙනත් අංශයක් තිබෙන බව. ඒ වෙනත් අංශය හරහා තමුන්නාන්සේලාගේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු නොදන්න, තමුන්නාන්සේලාගේ ඇමතිවරු නොදන්න බොහෝ දේවල් මේ ආණ්ඩුව ඇතුළේ සිද්ධ වෙනවා. අපේ අගමැතිතුමා කථාවක් කළා මම අහගෙන හිටියා, රූපවාහිනියේ හෝ මොකක් හරි මාධ්‍යයක. එතුමා කිව්වා, "මේ රටේ මිනිස්සු නීතිය අතට ගත්තොත් දොස් කියන්න බැරි තත්ත්වයකට අප පත් වෙලා ඉන්නවා. එහෙම කරන්න එපා." කියලා. හිටපු අගමැතිතුමනි, ඔබතුමා ඒ කථාව කිව්වා. මම ඒක අහගෙන හිටියා. ඒක ඉතාම හොඳ වැදගත් කථාවක්. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරින් ඉන්නේ විධායකයේ. නීතිය අතට ගන්න මේ රටේ ජනතාවට විධායකය ඉඩ දීලා තිබෙනවා නම්, ඒක මහා භයානක තත්ත්වයක්. ඒ නිසා තමයි මම කියන්නේ, මේ වැඩ පිළිවෙළ තුළ මේ පනවන නීති ගරු ඇමතිතුමාගේ අතේ තියා ගන්න, වෙනත් අයට ඇඟිලි ගහන්න දෙන්න එපා කියලා.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ගරු මන්ත්‍රීතුමනි, ඊයේ පෙරේදා කතරගම ප්‍රදේශයේ පාරක විශාල මැණික් නිධියක් හම්බ වුණා. විශාල පිරිසක් ඒකට කඩා වදින්න උත්සාහ කෙරුවා. අපි කථානායකතුමාටත්, ජනාධිපතිතුමාටත්, ඔක්කෝටමත් දන්වලා, ඒ ස්ථානයට පොලීසිය, හමුදාව දමලා ආරක්ෂා කළා. එතැනින් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට මෙතෙක් නොලබපු ආදායමක් ලබන්න පුළුවන් වුණා. රුපියල් මිලියන 270ට අපි ඒ අක්කර තුනහමාර වෙන්දේසි කළා. මිලියන 270ක ආදායමක් අපට හම්බ වුණා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගමේ අයටත් කොටසක් දුන්නා?

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ගමේ අය ඒ වෙනකොට අරගෙන ගිහින් ඉවරයි. පාරේ මැණික් තිබුණා නේ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
නැහැ, මැණික් හාරන්න ඉඩම විකුණන කොට?

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
තවත් ඒ විධියට දෙන්න බැහැ නේ. ඒ අයටත් අපි කොටස් තුනක් දීලා තිබෙනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඒ කොටසේ මැණික් නැහැ.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ඒ ගොල්ලන්ගේ සමුපකාර සමිති එක්ක ඒ කටයුතු කරන්න කියලා කොටස් තුනක් දීලා තිබෙනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
කොටස් තුනක් දුන්නාට ඒවායේ මැණික් නැහැ.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
නැහැ, නැහැ. එහෙම එකක් නැහැ. තමුන්නාන්සේ කොහොමද කියන්නේ මැණික් නැහැ කියලා. ඔබතුමා මෙතැන ඉඳන් කිව්වාට එතැනට යන්න. ගිහින් බලන්නකෝ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ කැල්ලේ ගඩොල් කපන්න පුළුවන්.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
තමුන්නාන්සේ හැම වෙලාවේම කියන්නේ අර බලය යෙදුවා, මේ බලය යෙදුවා කියලා. එහෙම එකක් නැහැ. අපි ඒ වැඩේ හරියට කරනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මම මේ තමුන්නාන්සේට විරුද්ධව යමක් කියනවා නොවෙයි. ඒ නිසා කරුණාකරලා කලබල වෙන්න එපා.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ඔබතුමන්ලා ඒ කාලයේ හොඳට වැඩ කරපු ඇමතිවරු. හරිම හොඳයි.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමාගේ හිතේ තිබෙන දෙය ක්‍රියාත්මක කරන්න බැරි එකයි මේ තිබෙන ලෙඩේ. වෙන මොකුත් නොවෙයි. මම ඊයේ හරි, අද හරි පත්තරයක තිබෙනවා දැක්කා, ඇමතිවරයකු ඇවිල්ලා, පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරු ඇවිල්ලා, හමුදාවත් සිටියදී මේ පස් අරගෙන යනවා කියලා.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
එහෙම සිදුවීමක් සිදු වෙලා නැහැ. විවිධ දේවල් කියනවා නේ. මැණික් හම්බ වෙච්ච දවසේ ඉඳලා අපේ නිලධාරින් එතැන ඉන්නවා. එවැනි ප්‍රශ්නයක් ඇති වෙලා නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ ගොල්ලන්ට බලාගෙන ඉන්න විතරයි තිබෙන්නේ.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
නැහැ. එහෙම දෙයක් වුණේ නැහැ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අද පත්තරයේ තිබෙනවා.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
පත්තරවල තිබෙන ඔක්කෝම විශ්වාස කෙරුවොත් හරිද? තමුන්නාන්සේ හරි පුදුම කෙනෙක් නේ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට ආණ්ඩුව ආරක්ෂා කරන්න ඕනෑ බවත් අපි දන්නවා. ඒ වාගේම තමුනාන්නාසේගේ හෘදය සාක්ෂියට විරුද්ධව වැඩ කරන්නත් තමුන්නාන්සේට සිද්ධ වෙලා තිබෙනවා. අර මුලින් කිව්ව කාරණය සම්බන්ධව මම තව ටික දවසකින් ආපහු වතාවක් මේ පාර්ලිමේන්තුවේදී කථා කරන්නම්, තමුන්නාන්සේට ඒකට licence දෙන්න සිද්ධ වෙනවාද නැද්ද කියලා.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
මම තමුන්නාන්සේට විවෘතව කියන්නම්. ඒ ගැන මොනවා හරි තොරතුරක් තිබෙනවා නම් මට දන්වන්න. වරදක් තිබෙනවා නම් මම ඒක නිවැරදි කරනවා. මගේ අමාත්‍යාංශය සම්බන්ධව කිසිම දූෂණයක් කොයිම අවස්ථාවකවත්, කොතැනකවත් වෙන්න මම ඉඩ දෙන්නේ නැහැ. මට ඒක වගකීමෙන් කියන්න පුළුවන්.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
හුඟක් හොඳ ප්‍රකාශයක්. හිතට එකඟව නිවැරදිව ඒ කටයුත්ත කරන්න බැරි නම් ඔබතුමා ඇමතිකමෙන් අයින් වෙයි.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ඒක වෙනම කථාවක්.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඒක වෙනම කථාවක්. මම මීට වැඩිය කථා කරන්න යන්නේ නැහැ. කොහොම වුණත් අපට තිබුණු ලොකු ප්‍රශ්න විසඳා ගන්න-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ගරු මන්ත්‍රීතුමා කිව්වා නේ නිලධාරියකු හම්බ වෙන්න ඉඩ දෙන්න කියලා. මම ඒ අවස්ථාව දෙනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ස්තුතියි. එතකොට විසඳා ගන්න බැරි වෙලා තිබුණු ප්‍රශ්න රාශියක් විසඳා ගන්නට පුළුවන්. මේ නීතිය මොකක් වුණත් ඇමතිවරයා හැටියට තමුන්නාන්සේගේ ඒ කැමැත්ත ප්‍රකාශ කිරීම ගැන මම සතුටු වෙනවා. අපි ඒ ප්‍රශ්න ටික ඔබතුමාට ඉදිරිපත් කරන්නම්. අපි එකට ඉඳගෙන ස්වාධීනව වැඩ කරමු. මම කැමැතියි, පරිසර ඇමතිතුමා හැටියට ඔබතුමා සහ ඔබතුමාගේ නිලධාරින් එක්ක විතරක් ඒවා ගැන කථා කරන්න.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
නියෝජ්‍ය ඇමතිතුමාත් ඉන්නවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
නියෝජ්‍ය ඇමතිතුමාත් සම්බන්ධ කර ගනිමු. වෙනත් අය නොවෙයි. එහෙම නම් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය මම අවසන් කරනවා.

[අ.භා. 2.51]

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතාමත්ම කාලෝචිත, ඒ වාගේම ඉතාමත්ම හොඳ නියෝග ගරු ඇමතිතුමා ගෙන ඒම පිළිබඳව අපි ඉතාමත්ම සතුටට පත් වෙනවා. නමුත් ඇමතිතුමා කියපු විධියට තෙල් නිධියක් මතු වීම තුළ ඉදිරියේදී සිද්ධ වෙන්න යන අවදානම වළක්වා ගැනීමේ පෙර සූදානමක්ද කියලා ඒක ගැන කථා කරන අවස්ථාවේදීම අපට පුංචි සැකයකුත් මතු වෙනවා. [බාධා කිරීමක්] මා හිතනවා, ඇමතිතුමා මේ ආණ්ඩුවේ ක්‍රියා කලාපය ගැන දන්නවා කියලා. එවැනි තෙල් නිධියක් මතු වුණොත් මැණික් නිධියට වුණා වාගේ පොරකෑම් සිද්ධ වන බව දන්නා නිසා ඇමතිතුමාට පුංචි -[බාධා කිරීමක්] හරි, හරි, පොඩ්ඩක් අහගන්න කෝ. කලබල වෙනවා නේ. මේ අවස්ථාවේ මට පෙනෙනවා ඇමතිතුමා ඒ කලබලයෙන්ම තමයි හැසිරෙන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නියෝග ඉදිරිපත් කිරීම හොඳ දෙයක්. අපි කියන්නේ නැහැ නරක දෙයක් කියලා. ඉතාමත්ම හොඳින් කරනවා නම් ඒක මේ වෙලාවේ හොඳ දෙයක් කියලා අපි හිතනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වුණාට ලංකාව වැනි දූපත් රටක්, ඒ කියන්නේ රට වටේම මුහුද තිබෙන රටක් ආරක්ෂා කිරීමේ යුතුකම හා වගකීම රටේ සමස්ත ජනතාවට මෙන්ම අදාළ අමාත්‍යාංශය ප්‍රමුඛ සියලු දෙනාටම තිබෙනවා. සංචාරකයන්ගෙන් විශාල ප්‍රමාණයක් වැඩියෙන්ම ඇලුම් කරන්නේ ලංකාවේ මුහුද ආශ්‍රිත ප්‍රදේශයට. ඉතින් එහි සුන්දරත්වය රැකීම අප සියලු දෙනාගේම යුතුකමක් වෙනවා. කෝට්ටේ යුගයේ තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් උන්වහන්සේගේ කාව්‍ය සන්දේශයක මෙහෙම කියා තිබෙනවා:

"වල දින අදහසින් මෙන් සුරගඟ අහ    න
නල බල සසල දළ රළ පෙළ නුඹ නැගෙ    න
වෙල ළස ගැවසි මුතු සක් පබළු බබල    න
බල මහ මුහුද එම සඳ උතුරෙන් පෙනෙ    න"

ඒ කවියෙන් කියන්නේ මුහුදේ තිබෙන සුන්දරත්වය ගැනයි. මහ සමුදුරේ තිබෙන සුන්දරත්වය ගැනයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
සැළලිහිණි සන්දේශයේ නේද?

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
නැහැ, මම කිව්වේ කෝට්ටේ යුගය ගැන.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
කෝට්ටේ යුගයේ තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ගේ සැළලිහිණි සන්දේශයේ.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
ඔව්, සැළලිහිණි සන්දේශයේ. බොහොම හොඳයි ඔබතුමා. අපිව හොඳට test කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ප්‍රශ්නය තිබෙන්නේ මෙතැනයි. ලැබෙන්න තිබෙන තෙල් නිධිය ලැබුණාට පස්සේ වෙන්න යන විනාශය දැන් ඉඳලාම දැකලාද මෙච්චර කලබල වුණේ කියන ප්‍රශ්නය තමයි අපට තිබෙන්නේ. මොකද, සමුද්‍ර මෙතරම් හානියකට ලක් වෙයි කියලා ආණ්ඩුවේ ඇමතිවරුන්ට තම තමන් තුළම පුංචි සැකයක් මතු වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී කියන්න ඕනෑ, අපේ රටම තෙල් නිසා අතිවිශාල ප්‍රශ්නයකට ලක් වෙලා තිබෙන බව. මේ අවධිය වෙන කොටත් තෙල් නිධිය තුළින් අනාගතය සරු කර ගන්න දත කන, වළි කන ඇමති මණ්ඩලයක් මේ රට වටේම බලාගෙන ඉන්නවා. සමුද්‍ර පරිශ්‍රය විනාශ වෙනවා කියලා කල් තියාම දැනගෙනද කොහේද තමයි මේ කාරණයට එළැඹිලා තිබෙන්නේ කියන ප්‍රශ්නය තමයි අපට දැඩිව බලපාන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ධීවරයන් පිළිබඳවත් ඇමතිතුමා ටිකක් කල්පනා කරන්නට ඕනෑ. ඒක බොහොම වටිනවා කියන එක මට මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න සිදු වෙනවා. මොකද, ධීවරයෝ නැති සාගරයක් අපට වැඩක් නැහැ කියන මතයේ තමයි අපි පසු වෙන්නේ. නමුත් පසු ගිය දවස් කිහිපයේදී ධීවරයන්ට වෙච්ච බලපෑම දිහා බලපුවාම සමුද්‍රයෙන් ප්‍රයෝජනය ගන්න ඉන්න, මේ රටට අති විශාල සේවයක් ඉටු කරන ධීවරයෝ ගැන මේ ආණ්ඩුව අඩුම ගණනේ අංශ මාත්‍රයකින්වත් කල්පනා කළාද කියලා ප්‍රශ්නයක් එනවා. පරිසරය සංරක්ෂණය කරන්න ඉදිරිපත් වෙනවා වාගේම අඩුම ගණනේ මේ සමාජයට වැඩදායී පුරුෂයෝ බිහි කරලා තිබෙන ධීවරයෝ ගැනත් අප කල්පනා කරන්නට ඕනෑ. පසු ගිය දවසකදී මොකක්ද සිදු වුණේ? ධීවරයෝ ජීවිත පූජා කිරීමත්, ධීවර පවුල් සම්පූර්ණ වශයෙන් අනාථ වීමත් තමයි අපට දකින්නට ලැබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධීවරයන්ට අද ප්‍රශ්න රාශියක් තිබෙනවා. වැලිගම ප්‍රදේශයේ කප්පරතොට ධීවර තොටුපළ නිසි අන්දමින් හදා ගන්න බැරිව පසු ගිය දවස්වල පවුල් 500ක් විතර පාරට ඇවිල්ලා උද්ඝෝෂණයක් කළා. ඒ උද්ඝෝෂණය කරලා කිව්වේ, තොටුපළ හදලා දෙන්න කියලායි. හදිසියේ ඇති වුණු කුණාටු නිසා මේ ගමේ මරණ 25ක් විතර සිදු වෙලා තිබෙනවා, ඒ සම්බන්ධයෙන් යම් කිසි ක්‍රියා මාර්ගයක් ගන්න කියලායි ඒ අය කිව්වේ. පසු ගිය දවස්වල ධීවරයන්ට අති විශාල ප්‍රශ්න ඇති වෙච්ච වෙලාවේ අපේ රටේ ජනාධිපතිතුමා ගියේ එක ප්‍රදේශයකට පමණයි. එතුමා ගියේ තංගල්ල ප්‍රදේශයේ ධීවරයන්ගේ දුක සැප බලන්න විතරයි.

ලංකාව වටේටම මුහුද තිබෙන කොට, ඒ ඉන්න ධීවරයින්ට තිබෙන ප්‍රශ්න -ගැටලු- සම්බන්ධයෙන්, පරිසරය සංරක්ෂණය කිරීම සම්බන්ධයෙන් එතුමන්ලාට පැවරී තිබෙන වගකීම කියන මේ සියලු කාරණාවලදී එක කොටසක් විතරයි තෝරා ගත්තේ. තංගල්ල ප්‍රදේශයේ පුද්ගලයෝ පමණයි තෝරා ගත්තේ. නමුත් මේ ජීවන බර දරා ගන්න බැරිව තමන්ගේ කටයුතු හරියාකාරව කර ගන්න බැරිව විලාප දෙන පුද්ගලයෝ අතිවිශාල සංඛ්‍යාවක් පාරට බැස්සාම, උද්ඝෝෂණයක් කරපුවාම ඒ අයට ලැබුණේ රබර් උණ්ඩ පහරවල්, වෙඩි පහරවල් බව මා මේ අවස්ථාවේදී මතක් කර දෙන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මා හිතනවා, වර්තමාන රජයේ පාලකයින්ගේ නාස්තිකාර පාලන රටාව නිසා අද දවසින් දවස රටේ ප්‍රශ්න උග්‍ර වන තත්ත්වයකට පත් වෙලා තිබෙනවාය කියා. ඉන්ධන මිල ඉහළ යන අවස්ථාවේ අපේ සමහර නායකයෝ සිටියේ පිට රටවල්වල. අපේ රටේ නායකයා ලංකාවේ සිටියේ නැහැ. එතුමා සංචාරය අවසන් වෙලා ආපු ගමන්ම කළේ කොළඹ නගරය වටේ ඉදි කෙරෙන සක්‍රිය මාර්ගයකට මුල් ගල් තැබීමයි. ඒ වාගේම කොළඹ - නුවර පාරට මුල් ගල් තැබීම; කොළඹ - යාපනය මාර්ගයට මුල් ගල් තැබීම; හම්බන්තොට දක්වා අධිවේගී මාර්ගයක් සඳහා මුල් ගල් තැබීම; නෙළුම් කුලුන සඳහා මුල් ගල් තැබීමයි. මේ අවස්ථාවේදී අපි අහනවා, මේ රටේ තියෙන ප්‍රශ්න මෙච්චාද කියලා. මේ රටේ මිනිස්සුන්ට තුන් වේල කන්න හරිහමන් විධියට හම්බ කර ගන්න මුහුදු යන්න බැරිව, මුහුදෙන් ප්‍රයෝජනයක් ගන්න බැරිව තිබෙන මේ අවධියේදී අපේ රටට අත්‍යවශ්‍යයෙන්ම වැදගත් වන්නේ ඒවාද කියලා අපි පුංචි මට්ටමකට හෝ කල්පනා කළ යුතු කාලය එළැඹිලා තිබෙනවාය කියන එක අපි මේ අවස්ථාවේදී මතක් කළයුතු වෙනවා. ජනතාව මෙතරම් ප්‍රශ්න රාශියකින් ගැට ගැහිලා, මිරිකිලා, තෙරපිලා ඉන්න අවස්ථාවකදී ආණ්ඩුවේ ඇමතිවරුන්ට මෙය ඉතාමත් පුංචි සෙල්ලමක් හා විහිළුවක් බවට පත් වීම අපේ කනගාටුවට සහ කනස්සල්ලට හේතු පාදක වන කරුණක් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝක ආර්ථික අර්බුදය හමුවේ වුවත්, මහින්ද චින්තනයේ බලමහිමය තුළ ලංකාවට කිසිදු බලපෑමක් එන්නේ නැහැයි කියාපු ආණ්ඩු පාලකයෝ ඉන්න අවධියක් මේක. "කිසිම දෙයක් වෙන්නේ නැහැ; ලංකා ආර්ථිකය එන අවුරුද්ද වන කොට ලෝකයේ දෙවැනි වේගවත්ම ආර්ථිකය බවට පත් වෙනවා" කිව්වා. අද වැලේ වැල් නැති තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. නමුත් පිළිගන්නට කැමැති නැහැ. නොයෙකුත් බොරු, උප්පරවැට්ටි, ප්‍රෝඩාකාරී වැඩ සියලු දේ කරමින් යන නිසා අපි කියනවා මේ රට ඉතාමත්ම අනතුරකයි තිබෙන්නේ කියලා. ඒ වාගේම ආර්ථික සුනාමියකට ලක් වන කාලයකටයි අපි එළැඹිලා ඉන්නේ කියලා මේ අවස්ථාවේදී මතක් කළ යුතුව තිබෙනවා.

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, "කටුස්සාගේ කරේ රත්තරන් පැළඳුවා වාගෙයි" කියා කියමනක් තිබෙනවා. ඒ වාගේ රටට පැදෙන්න යන තෙල් නිධියක් ගැන දත හප හපා ඉන්න ඇමතිවරුන් ඉන්න මේ ආණ්ඩුවේ ගරු පරිසර ඇමතිතුමා සමුද්‍රය දූෂණය වීමට ඉඩ ඇතැයි කියන විශ්වාසයෙන් මේ නියෝග ගෙන ඒම ගැන මට පොඩි සැකයක් තිබෙනවා. මොකද, මේක අන්තිමට ඉවර වන්නේ බලු පොරයකින්. ඇමති පොරයකින් තමයි අන්තිමට තෙල් නිධිය බෙරා ගන්නත් වෙන්නේ. ඇමතිවරු මාරු වෙලා, ඉන්න ඇමතිවරුන්ගෙන් පිට වෙනත් ඇමතිවරු පත් වෙලා, අතිවිශාල ප්‍රශ්න රාශියකින් තමයි මෙයටත් අන්තිමට විසඳුමක් ලැබෙන්නේ. මේ කාලයේ ආණ්ඩුවේ ක්‍රියා කලාපය පිළිබඳව දැක්කාම අපිට අතිවිශාල, ආන්දෝලනාත්මක ප්‍රශ්න ඇති වෙනවා. යුද්ධයක් නැති කාලයේත් යුද වියදම් කියලා මුදල් වෙන් කරලා කටයුතු කරනවා වාගේම, ජීවත් වීමට බැරි ජනතාව පාරට බැස්සාම ඒ උද්ඝෝෂණවලට පහර දෙනවා. ඒ උද්ඝෝෂණ මැඩ පවත්වන්න යකඩ පොලුවලින් පහර දීලා, ලේ වැගිරීම් සිදු කරලා

අසාධාරණ විධියට කටයුතු කර තිබෙනවා. අන්තිමට හලාවත ප්‍රදේශයේ අපේ ඇන්තනි ප්‍රනාන්දු මහත්මයාගේ ජීවිතය පවා නැති වුණු තත්ත්වයකට පත් වුණා. රටේ ආරක්ෂාව ජාතික ආරක්ෂාවක් ලෙස සලකා ඒ අයට එලෙස පහර දීම අපි සම්පූර්ණයෙන්ම හෙළා දකිනවා.

ඒ විතරක් නොවෙයි. පසු ගිය දවසක ජීවන වියදම සම්බන්ධයෙන් ඇති වූ සිද්ධියකදී තුවාල ලැබූ රොෂේන් චානක මහතාව ඔහුගේ සහෝදර සේවකයින් රෝහලට ගෙන යන්න හදන කොටත් රජයේ ආරක්ෂක අංශ අඩුම ගණනේ ඔහු ඉස්පිරිතාලයට ගෙන යන එකත් ප්‍රමාද කරමින් කටයුතු කිරීම තුළ එතුමා මිය යාමත් මේ ආණ්ඩුවේ බරපතළ වරදක් හැටියට පෙන්වා දෙන්න අප මෙය අවස්ථාව කර ගන්නවා.

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, හලාවත ධීවර උද්ඝෝෂණයටත්, අනෙකුත් උද්ඝෝෂණවලටත් ආණ්ඩුව ප්‍රතිචාර දැක්වූ ආකාරයෙන් පෙනෙන්නේ මොකක්ද? උතුරේ ජනතාවට අසාධාරණකම් කරපු විධියටම දකුණේ ජනතාවටත් පුංචි පුංචි මට්ටම්වල පහරදීම්වලින් පටන් අරගෙන දැන් ඉතාමත් දැඩි ක්‍රියා මාර්ග ගැනීම තුළින් අපට පෙනී යන්නේ, ආණ්ඩුව පිළිබඳ විකල්ප මතධාරීන් සම්පූර්ණයෙන් සමනය කරන්න, දමනය කරන්න ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරගෙන යන බවයි. ඒ නිසා අවසාන වශයෙන් ඔබතුමාට කියන්න කැමැතියි, පාලකයින්ට අවශ්‍ය වූ විට මෙවැනි අමානුෂික පහරදීම් ක්‍රියාත්මක කිරීමට දේශප්‍රේමය සහ ජාති ආලය බාධාවක් නොවන අන්දමක් අපට පෙනෙන්න තිබෙන බව. ආණ්ඩුව හැම විටම විවිධ කරුණු කාරණා හුවා දක්වමින් ආණ්ඩුවේ නොහැකියාව වසා ගැනීමටත්, මේ සියලු දේ සාධාරණීකරණය කරන්නත් උත්සාහ කරනවා. මෙවන් පසුතලයක සමුද්‍ර පරිසරය රැක ගැනීමේ අරමුණ ඇතිව ගරු පරිසර ඇමතිතුමාට මේ නියෝග ගෙනෙන්න අවශ්‍ය වුණු හේතුව නම් තෙල් නිධිය නිසාමයි කියන එකයි අපට පැහැදිලි වෙන්නේ.

කෙසේ හෝ රටට හොඳ දෙයක් වනවා නම්, පරිසරයට හොඳ දෙයක් වනවා නම්, ගමට හොඳ දෙයක් වනවා නම් අපි ඒකට කැමැතියි. ඒකට අකමැතියි කියන්න තරම් නරුමයෝ වන විපක්ෂයක් නොවෙයි, අපි. හොඳ දේට හොඳයි කියන්නත්, ඒ වාගේම නරක දේට -අතිශයින් නරක නම්- ඒ සම්බන්ධයෙන් සම්පූර්ණයෙන්ම අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරන්නත්, උද්ඝෝෂණ කරන්නත්, දිවි දෙවැනි කොට රටේ ජනතාව වෙනුවෙන් කටයුතු කරන්නත් විපක්ෂයක් හැටියට අපි සියලු දෙනා සූදානම්ය කියන එකත් මේ අවස්ථාවේ දී මතක් කරන අතර, පුංචි කවියකින් මගේ කථාව අවසන් කිරීමට මා බලාපොරොත්තු වනවා.

තෙල් මිල අඩු කරනු වෙනුවට වෙඩි පහර
එල්ලය එයයි රුදු ගමනක අවිචාර
ආඩම්බර කාත්තේ සිහසුන භාර
ඇන්ටනි පවුලහට අද හිමි මහ පාර

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද ස්වාමීන් වහන්සේ.

[අ.භා. 3.02]

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමුද්‍රීය පරිසර දූෂණය වැළැක්වීම පිළිබඳව නීතිරීති සකස් කිරීම සඳහා සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ මෙම නියෝග ඉදිරිපත් කිරීම ගැන ඇත්ත වශයෙන්ම අපේ විශේෂ ප්‍රසාදයක් ගරු ඇමතිතුමාට හිමි වනවා. මක් නිසාද, ස්වාභාවික සම්පත් සුරැකීම හා පරිහරණය කිරීම ගැන විශේෂ සැලකිල්ලක් තිබිය යුතුය කියන එක පිළිබඳව කිසිදු විවාදයක් නැහැ. අපේ රට ඉතාමත්ම රමණීය රටක් හැටියට අපේ රටේ ජීවත් වන ජනතාවට වඩා, විදේශ රටවල ජීවත් වන ජන කොටස් අගය කර තිබෙන බව විදේශීය සංචාරකයන් හා ලේඛකයන් සඳහන් කර එවන වාර්තාවලින් අපට පෙනෙනවා. පෙරදිග ලෝකයා අපේ රට හඳුන්වපු එක නමක් තමයි "රත්නද්වීප". රත්නවලින් පිරුණු දිවයින. ඒ වාගේම අපේ රට හඳුන්වපු තවත් නමක් තමයි "සෙරන්ඩිබ්". දර්ශනීය රටක්, දර්ශනීය දූපතක් කියන අර්ථය ඇතිව "සෙරන්ඩිබ්", "සෙරන්ඩිපිටි" යන්නෙන් අපේ රට හඳුන්වලා තිබෙන්නේ නිකම්ම නොවෙයි කියන එක අපට පැහැදිලියි. එක පැත්තකින් අපේ රටේ තිබුණ ස්වාභාවික, රත්න, ධන නිධි, ධන සම්පත්. අනෙක් පැත්තෙන් පරිසරය පැත්තෙන් අපේ රටේ තිබුණ දර්ශනීය ස්වභාවය.

අතීතයේ පටන්ම මේ රට පාලනය කරපු අය; රජවරු, පාලකයෝ මේ දෙක රැක ගැනීම සඳහා ක්‍රියාත්මක වුණු ආකාරය පිළිබඳව අපේ පොත්පත්වල, ඓතිහාසික වාර්තාවල සඳහන් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අපේ මුහුදු වෙරළ, ඒ වාගේම වෙරළබඩ තැන්න, අඩ තැනි, ශේෂ කඳු, මධ්‍යම කඳුකරය, අපේ රට හරහා ගලා ගෙන යන ගංගා, ඇළ, දොළ, වනාන්තර, ස්වාභාවික ධන නිධි, වෙරළ වටා තිබෙන කලපු, බොකු ආදී මේ හැම එකක්ම අපට තිබෙන ලොකු සම්පත්. අපේ රට කුඩා රටක් වුණත් මේ රටේ මුහුදට ගලා ගෙන යන ගංගා 103ක් තිබෙනවා. විවිධ නම්වලින් හඳුන්වන ලොකු, කුඩා ගංගා 103ක් තිබෙනවා. ඒ ගංගා හැම එකක්ම මුහුදට වැටෙන තැන, අතීතයේ වාණිජ ව්‍යාපාර සඳහා හෝ එහෙම නැත්නම් ධීවර කටයුතු සඳහා හෝ පාවිච්චි කරන ලද වරායයන් හැටියට තමයි සඳහන් වන්නේ. මේවා අතර ප්‍රධාන වරායයන් තිබුණා. ඒ වාගේම අප්‍රධාන වරායයන් තිබුණා. රටක දියුණුවට වරායයන් වැඩිදියුණු කිරීම අවශ්‍යයි. විශේෂයෙන්ම අපේ රටේ ප්‍රධාන වරායයන් පිළිබඳව කථා කරන විට ඒ වරායයන් සඳහා නීතිරීති පද්ධතියක් තිබුණා.

සමුද්‍රීය පරිසර දූෂණය වැළැක්වීම සඳහා හේතු වන වරායයන් පිළිබඳව නීතිරීති පද්ධතියක් තිබුණා. නිදර්ශනයක් වශයෙන් යාපනයේ කයිට්ස් කියන ස්ථානය ගනිමු. කයිට්ස් කියන්නේ "ඌරාතොට" කියලා අපේ පැරණි පොත්වල සඳහන් වන වරායක්. අතීතයේ මේ වරායට නිරන්තරයෙන්ම ආපු දකුණු ඉන්දීය වාණිජ ව්‍යාපාරිකයෝ හිටියා. දකුණු ඉන්දියාව හරහා වාණිජ ව්‍යාපාරවල නියුක්තව සිටි අය අප්‍රමාණ ලෙස ආවා. මේ රටින් ඒ රටට යම් යම් දේ ගෙන ගිය අතර, ඒ රටින් යම් යම් දේ මේ රටට ගෙනාවා. මේ වාණිජ ව්‍යාපාරිකයින්ගේ පැමිණීම නිසා, නැව් ආදිය මේ වරායට පැමිණීම නිසා රට අභ්‍යන්තරයට සහ වරාය අවට සිදු විය හැකි අනතුරු පිළිබඳව කල්පනා කරපු අපේ රටේ රාජ්‍ය පාලකයා ඒ සඳහා නීතිරීති පද්ධතියක් හරි ගස්සලා ශිලා ලේඛනයක කොටලා වරායේ තැන්පත් කරලා තියෙනවා. ඕනෑ කෙනෙකුට අද එය බලන්න පුළුවන්. "නයිනතිවු" නමින් හඳුන්වන නාගදීපයේ නාගපූසානි අම්මාන් කියන කෝවිලේ පළමුවැනි පරාක්‍රමබාහු රජතුමාගේ මේ ප්‍රකාශනය -වරායේ නීතිරීති පිළිබඳව, පරිසර දූෂණය පිළිබඳව සඳහන් කරලා තිබෙන මේ කරුණු- අදත් දකින්නට ලැබෙනවා.

සමුද්‍රීය පරිසරය විතරක් නොවෙයි, රට අභ්‍යන්තරයෙහි වුණත් පරිසර දූෂණය නැති කර සංරක්ෂණය කර ගැනීම පිණිස පැරණි නීති රීති පද්ධති තිබුණු බව අපි දන්නවා. මේවා අලුත් නීතිරීති නොවෙයි. මේවා නැවත මතු කරලා ගන්නේ මේ රටේ අවශ්‍යතාවටයි කියන එක අපි සඳහන් කරන්නට ඕනෑ. ඒ වාගේම පැරණි නීතිරීතිවල ගස් කැපීම තහනම් කරලා තිබුණා. ගස් කැපීම තහනම් කරලා තිබුණේ ඒ ගස්වලින් පරිසරයට ලැබෙන විවිධ

[ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි ]

ප්‍රයෝජන ගැන සලකලා. ඒ වාගේම අපේ රටේ සමහර ගස් වර්ග විදේශීය රටවලට ගෙන ගිය ආකාරය ගැන අපේ පොත්වල සඳහන් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිදර්ශනයක් වශයෙන් කිව්වොත් ඉතාම පැරණි වකවානුවක එනම් බුදු හාමුදුරුවෝ ජීවමානව හිටපු කාල පරිච්ඡේදයේ -ක්‍රිස්තු පූර්ව 6 වන සියවස තරම් අතීත කාලයේ- අපේ රට ගැන කථා කරන කොට අපට කථා කරන්න බොහෝ දේවල් තියෙනවා. නැත්නම් මතු කරලා ගත යුතු බොහෝ දේවල් තියෙනවා. ඒ කාලයේ අපේ රටේ රත් හඳුන් තිබුණා. රත් හඳුන් අපේ පොත්වල සඳහන් කරලා තියෙන්නේ "ගෝ ශීර්ෂ චන්දන" කියලා. මේ රත් හඳුන් විශේෂයෙන් තිබිලා තියෙන්නේ රුහුණේ. එදා රුහුණ පාලනය කරලා තියෙන්නේ "ග්‍රාමණී" කියලා කෙනෙක්. ඒ කියන්නේ දුටුගැමුණු රජ්ජුරුවෝ නොවෙයි. ඊට බොහොම පෙරාතුව රුහුණ පාලනය කරලා තියෙන්නේ "ග්‍රාමණී" කියලා කෙනෙක්. ඉන්දියාවේ බරුකච්ච වරායත්, රුහුණේ මාගම්පුර තිබුණු වරායත් අතර නැව් ගමනාගමනයෙන් "ග්‍රාමණී" යටතේ තිබුණු රත් හඳුන් වනාන්තරයේ දැව විදේශීය රටවලට ගෙන ගිය ආකාරය පිළිබඳව පැහැදිලිව අපේ පොත්වල සඳහන් වෙලා තියෙනවා. මේ ගස් වර්ග, වනාන්තර එක පැත්තකින් අපි රැක ගන්නට ඕනෑ වාගේම ඒ ස්වාභාවික සම්පත් අපි නිසි පරිහරණයකට ලක් කරන්නත් ඕනෑ.

ගරු පරිසර ඇමතිතුමා සඳහන් කළා, අපේ රටේ තිබෙන සම්පත් අපි පරිභෝජනය කරන අතර ඒවා අපේ රටේ දේශීය ආදායම සඳහා ප්‍රයෝජනයට ගනිමින් නැවත සංරක්ෂණය කර ගැනීමේ කාර්ය භාරයත් කරන්නට ඕනෑය කියලා. ඒක බොහොම වැදගත් ප්‍රකාශයක්. අද ගහක් කැපුවාම ඒ වෙනුවට නැවත ගස් සිටුවීමක් නොකෙරෙනවා නම් අනාගතයේදී අපේ රට කාන්තාරයක් බවට පරිවර්තනය වෙන්න ඉඩ තිබෙනවා.

ඒ නිසා මේවා නීතිමය ක්‍රියා පද්ධතියකින් තහවුරු කර තැබිය යුතු කාරණා වශයෙන් දක්වන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැලි ගොඩ දැමීම ගැන දැන් මෙතැන කථා කෙරුණා. ගෙයක් හදන කෙනකුට වැලි ටිකක් ගන්න අවස්ථාව තිබෙන්න ඕනෑ. මේ කාරණය මහා පරිමාණයෙන් කරන්න ගියොත් ගංගා, ඇළ දොළ සම්පූර්ණයෙන්ම විනාශයට පත් වෙනවා. පහු ගිය කාල පරිච්ඡේදය තුළ ඒ තත්ත්වය අප දුටුවා. අප ඒ ගැන පරීක්ෂණ කරලත් බැලුවා. දැදුරු ඔයෙන් වැලි කැපීම නිසා දැදුරු ඔයේ ඉවුරු සහ ඒ පරිසරයේ තිබුණු ඉඩම් මොන තරම් විනාශයට පත් වුණාද කියන එක පැහැදිලිව අවබෝධ වුණා. ඒ නිසා ඒ පිළිබඳව දැඩි නීතිරීති ක්‍රියාත්මක කරලා ඒවා වළක්වා ගන්න කටයුතු කළා. මේවා ආරක්ෂා කරනවා වාගේම රටේ දියුණුව පිණිස හේතු වන යම් යම් නිර්මාණ කරන්නත් සිද්ධ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කනගාටු වෙනවා, මුලින් කථා කළ එක ගරු මන්ත්‍රීතුමෙක් නෙළුම් කුලුන සෑදීම පිළිබඳව අප්‍රසාද මුඛයෙන් කථා කරපු එක ගැන. නෙළුම් කුලුනේ ආකෘතිය උපුටා ගෙන තිබෙන්නේ පොළොන්නරුවේ නෙළුම් පොකුණේ කළු ගලෙන් හදා තිබෙන පිපිච්ච ලස්සන නෙළුම් මලේ නිර්මාණය අනුවයි. අපි නිකමට මෙහෙම හිතමු. කළු ගලේ ඒ නෙළුම් මල නිර්මාණය කරපු එක නිරර්ථක වැඩක්ය කියා අපේ පැරැන්නෝ ඒ ගැන විවේචනය කළා නම්, ඒක නොකෙරන පැත්තට කටයුතු කළා නම් අපේ පැරණි කලාකරුවන්ගේ කදිම විශිෂ්ට නිර්මාණයක් හැටියට මුළු ලෝකයාගේම -විදේශ සංචාරකයන්ගේ- දැඩි අවධානයට යොමු වන මේ පුරා වස්තුව අද අපට නැති වෙනවා නේද? රටක නගර අලංකාර කරන ඒවා, නගරයට පැමිණෙන ජනතාවගේ සහ නගරයේ වාසය කරන ජනතාවගේ පහසු විහරණය පිණිස නිර්මාණයන් කිරීම අවශ්‍යයි. රටක දියුණුව කියන්නේ ඒකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක මාර්ග හැදෙන්න ඕනෑ; නගර නිර්මාණය වෙන්න ඕනෑ; ගංගා ඇළ දොළ පවිත්‍ර වෙන්න ඕනෑ; ගෙවල් දොරවල් හැදෙන්න ඕනෑ. මිනිසුන්ගේ නෙත් සිත් පිනවන කලාගාර ආදිය සකස් කරන්න ඕනෑ. නාට්‍ය සංදර්ශන පවත්වන්නට අවශ්‍ය නාට්‍ය ශාලා සකස් කරන්න ඕනෑ. මේවා තමයි රටක තිබෙන දියුණුව. මේවා අද ඊයේ පටන් ගත්තු දේවල් නොවෙයි. ඒ ඒ යුගවල එක එක පාලකයන් ඒවා වැඩිදියුණු කරපු එක, ක්‍රියාත්මක කරපු එක හරි. නමුත් අපේ රටේත් යම් වකවානුවක සිට මානව සමාජය දියුණු වනකොට, මනස දියුණු වෙන වකවානුව වනකොට මේවා දියුණුවට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිදර්ශනයක් වශයෙන් කිව්වොත් අනුරාධපුර නගරය එක එක කොටස් වශයෙන් සංවිධානය කර නිර්මාණය කිරීම අවුරුදු දෙදහස් ගණනක් තරම් පැරණියි. අනුරාධපුරය තමයි ඒ කාලයේ ලංකාවේ ප්‍රධාන අගනුවර වශයෙන් පැවතුණේ. නගර නිර්මාණ ශිල්පියෙක් ලවා අනුරාධපුර නගරය නිර්මාණය කිරීම, අවශ්‍ය කරන සියලු කලාගාර ආදිය ඇතිව ඒ නගරය නිර්මාණය කිරීම වරදක්ය කියා අද අපි කියනවාද? අද අපි කියනවා, ඒ නගරය නිර්මාණය කිරීම ඉතා වැදගත්ය කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා නෙළුම් පොකුණ කලාගාරය නිර්මාණය කිරීම ඇත්ත වශයෙන්ම අපි සතුටට පත් විය යුතු කරුණක්. ලෝකයේ විදේශීය රටවලින් එන පුද්ගලයන්ට, අපේ රටේ තිබෙන හොඳ උසස් ගණයේ කලා නිර්මාණයන් වේදිකාගත කරලා පෙන්වන්න ඕනෑ. ලෝකයාට අපේ දියුණුව විදහා පෙන්වන්න ඕනෑ.

මම කල්පනා කරන හැටියට නම් අපි යමක් විවේචනය කරනකොට ඊර්ෂ්‍යා පරවශව විවේචනය කිරීම සුදුසු නැහැ. මොකද අපි යමක් විවේචනය කළ යුත්තේ, යමක අඩු පාඩු පෙන්වා දිය යුත්තේ යහපත් අදහසිනුයි. යහපත් අදහසකින් තොරව අපි යමක් කථා කරනකොට ඒක අපේ පරිහානිය පෙන්නුම් කරන ලක්ෂණයක් බවට පත් වෙනවා. හොඳ වැඩක් කළත් සමහර අය ඒක නරක දෙයක් විධියට දකිනවා. ඒක වැරදියි. ඒ නිසා මෙබඳු අවස්ථාවලදී පෞද්ගලිකත්වය ගැන හිතා නොවෙයි, අපේ රට, ජාතිය ගැන හිතලයි ක්‍රියා කළ යුත්තේ. පෞද්ගලිකව තමන්ට ලැබෙන ඡන්දය ගැන හිතා නොවෙයි, පෞද්ගලිකව තමන්ට ලැබෙන වරණය, ප්‍රසාදය ගැන හිතා නොවෙයි අපි ක්‍රියා කළ යුත්තේ. මෙබඳු අවස්ථාවලදී, සමස්තයක් වශයෙන් අපේ ජීවිත කාලය තුළදීම අපි කල්පනා කළ යුත්තේ පොදු ජනතාව ගැන හිතලායි; පොදු ජනතාවගේ යහපත ගැන හිතලායි.

පරිසරය ආරක්ෂා කිරීම, සමුද්‍රීය පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම වාගේම අපේ රටේ පරිසරයට දැනට ඒකාබද්ධව තිබෙන අතිශය වැදගත් වන පෞරාණික සිද්ධස්ථාන, පුරාවස්තු සහිත ස්ථාන, ඒවා සම්බන්ධව තිබෙන වනගත ප්‍රදේශත් අප රැක ගන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තව විනාඩි භාගයක් කියන්න ඕනෑ මේ කාරණය. මම ඊයේ පෙරේදා ත්‍රිකුණාමලය ප්‍රදේශයේ ගවේෂණයකට ගියා. ඒ ගවේෂණය යන වෙලාවේදී මම නිලාවැලි කිට්ටුව තිබෙන බොරළු කන්ද කියන ස්ථානය බලන්න ගියා. ඒ වටා ද්‍රවිඩ පවුල් ගණනාවක් පදිංචි වෙලා ඉන්නවා. අප ඒ අය සමඟ එහි ගියා. ඒ අය බොහොම සන්තෝෂෙන් අපව පිළිගත්තා. කුඩා ද්‍රවිඩ දරුවෝ කීප දෙනෙක් ඇවිල්ලා අපේ අත්වල එල්ලුණා. මම ඒ දරුවන්ට ඇඳුම් අරගන්න සල්ලි

වගයකුත් දුන්නා. මේ වාගේ සුහද මට්ටමකින් යුතුව අප එතැනට ගිහින් ඒ පුරාවස්තු භූමිය බැලුවා. ඒ පුරාවස්තු භූමිය බැලුවාම අපට පුදුම දුකක් ඇති වුණා. ඇත්ත වශයෙන්ම අපට හරිම වේදනාවක් ඇති වුණා. මේ බොරළු කන්ද කියන විශාල චෛත්‍යය හාරලා මුළුමනින්ම විනාශ කරලා. ඒ චෛත්‍යයේ ධාතු කරඬු දෙකක් - ගලින් නිර්මාණය කරපු අතිශය දුර්ලභ පුරාවස්තු දෙකක්- තිබිලා තිබෙනවා. ඉන් එකක් අරගෙන යන කොට පොලීසියට අහු වෙලා තිබෙනවා.

අනික් එකේ තිබුණු පුරාවස්තු අරගෙන ඒක පෙරළලා දමලා තිබිලා මට ඒක ලැබුණා. මම උප්පුවෙලි පොලීසියේ OIC මහත්තයාට කථා කරලා කිව්වා, "මෙහෙම වස්තුවක් තිබෙනවා, ඒක ඔබතුමා වහාම ගෙනැත් පොලීසියේ තැන්පත් කරන්න, නැත්නම් මේක විනාශ කරයි" කියලා. එතුමා තමන්ගේ රාජකාරිය හරියටම ඉෂ්ට කළා. එතුමා ඒ මොහොතේම ක්‍රියාත්මක වුණා. උප්පුවෙලි පොලීසියේ අද ඉන්න OIC මහත්තයා ඒක පොලීසියට ගෙනැල්ලා දැන් පොලීසියේ තැන්පත් කරලා තිබෙනවා. මේවා මේ රටේ ජාතික වස්තු. මේවා අර පරිසරය වාගේම පරිසරයට බද්ධ වෙලා තිබෙන වස්තු. මෙන්න මේවාත් අප සංරක්ෂණය කළ යුතුයි. මේවා පිළිබඳවත් ක්‍රියා මාර්ග ගැනීම ඉතාම අවශ්‍යයි කියන එක මේ අවස්ථාවේදී මා සඳහන් කරන්න ඕනෑ. ගරු පරිසර ඇමතිතුමා ඉදිරිපත් කරපු සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ නියෝග ඉතා කාලෝචිත වූ, වැදගත් නීති රීති පද්ධතියක් බව ප්‍රකාශ කරමින්, එයට අප සම්පූර්ණ සහයෝගය දිය යුතු බව තමුන්නාන්සේලාට මතක් කරමින්, මගේ වචන කීපය අවසන් කරනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ඔබවහන්සේට පින්. இப்பொழுது மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன் அவர்கள்! உங்களுக்குப் பத்து நிமிடங்கள் உண்டு.

[பி.ப. 3.19]

**ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கடல்சார் தீழ்ப்புத் தடைச் சட்டத்தின்கீழான ஒழுங்குவிதிகள் பற்றி இன்று நடைபெறும் விவாதத்திலே கலந்துகொண்டு உரையாற்றுவதையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். இயற்கைச் சூழலைப் பாதுகாக்குமுகமாக இந்த ஒழுங்குவிதிகள் இங்கே சமர்ப்பிக்கப்படுகின்றன. இவ்வேளையில், எமது பகுதிகளின் இயற்கைச் சூழல் அழிக்கப்படுவது சம்பந்தமாகக் குறிப்பிடுவது தகுதியானது என்று நான் சிந்திக்கின்றேன். மட்டக்களப்பு மாவட்டத்திலே செங்கலடிப் பிரதேச செயலாளர் பிரிவிலே சந்தனமடு என்கின்ற ஓர் ஆறு இருக்கின்றது. கடந்த வருடம் இம்மாவட்டத்தில் ஏற்பட்ட பெருவெள்ளத்தினால் சந்தனமடுப் பகுதியை அண்டிய கிராமங்கள் பாரிய அழிவை எதிர்நோக்கியிருந்தன. சந்தனமடு ஆற்றோரங்களில் மண் அகழும் செயற்பாடு கடந்த பல காலமாக நடைபெற்று வருகின்றது. இதன் அடிப்படையிலே கடந்த 6.5.2011ஆந் திகதி செங்கலடிப் பிரதேச செயலகத்தில் கூட்டப்பட்ட பிரதேச அபிவிருத்திக் குழுக் கூட்டத்திலே, அந்த ஆற்றோரங்களில் மண் எடுப்பதனால் அதன் அருகிலுள்ள கிராமங்கள் பெரும் பாதிப்பை எதிர்கொள்கின்றன என்கின்ற கருத்து முன்வைக்கப் பட்டதன்பேரில், அங்கு மண் எடுப்பது தடைசெய்யப்பட வேண்டும் என்றும் அந்த ஆறு பாதுகாக்கப்பட வேண்டும் என்றும் தீர்மானம் நிறைவேற்றப்பட்டது. மேலும் அந்த ஆற்றின் அருகில் இருக்கின்ற கிராம மக்கள் தங்கள் தேவையின் நிமித்தம், பிரதேச செயலாளரின் அனுமதியுடன், குறிப்பிட்டளவு மண்ணை அங்கிருந்து பெற்றுக்கொள்ளலாம் என்றும் இதற்கான அனுமதி பிரதேச செயலாளரினால் வழங்கப்பட வேண்டும் என்றும் தீர்மானம் மேற்கொள்ளப் பட்டது. அதன்படி, அங்கு பாரிய அளவில் மண் அகழ்வதற்கு அந்தப் பிரதேச அபிவிருத்திக் குழு தடை விதித்திருந்தது.

ஆனால், திடீரென கடந்த மாதத்திலிருந்து சந்தனமடு ஆற்றுப்பகுதியில் பல வாகனங்களில் மண் அகழ்ந்து செல்லப்படுவதாக எனக்கு முறைப்பாடுகள் கிடைத்தன. இது தொடர்பாக செங்கலடிப் பிரதேச செயலாளரை அணுகிய நான், "அந்த ஆற்றுப் பகுதியிலே மண் அகழ்வதற்குப் பிரதேச அபிவிருத்திக் குழு தடை விதித்திருக்கின்றது; ஆனால், அங்கு மண் அகழப்படுவதாகப் பொதுமக்களிடம் இருந்து எனக்கு முறைப்பாடுகள் கிடைத்திருக்கின்றன; யார் இந்த அனுமதியை வழங்கியது?" என்று விசாரித்தபோது, "எனது அனுமதி பெறப்படவில்லை; சிலவேளை நீர்ப்பாசனத் திணைக்கள அதிகாரிகள் இதற்கான அனுமதியை வழங்கியிருக்கலாம்" என்று அவர் கூறினார். நீர்ப்பாசனத் திணைக்களத்துக்குச் சென்று கேட்டபோது, அங்கும் அனுமதி பெறப்படவில்லை என்று அவர்கள் சொன்னார்கள். எனவே, என்ன நடந்தது என்று தொடர்ந்தும் விசாரித்துப் பார்த்ததில், மட்டக்களப்பு மாவட்டச் செயலகத்தில் இயங்குகின்ற புவிச்சரிதவியல் பகுதியின் பொறியியலாளரான ஜனாப் பாரிஸ் என்பவர் ஓர் அமைச்சரின் கடிதத்திற்கிணங்க இந்த அனுமதியைக் கொடுத் திருப்பது தெரியவந்தது. இந்த அனுமதியைப் பெற்றவர் யார் என்றால் பெரும்பான்மை இனத்தைச் சேர்ந்த திலகரத்ன என்பவர். முதலில் அவர் கிரான் பிரதேச செயலாளர் பிரிவில் முறக்கொட்டாஞ்சேனைக் கிராமத்தில் குறிப்பிட்ட ஒரு விலாசத்தில் வதிவதாகச் செங்கலடிப் பிரதேச செயலாளரிடம் கூறி, அந்த அனுமதியைக் கோரியிருக்கின்றார். அதன்பின்னர் செங்கலடிப் பிரதேச செயலாளர் அந்தப் பகுதியில் இவர் வதிகின்றாரா என்று கிரான் பிரதேசச் செயலாளரிடம் விசாரித்ததற்கிணங்க, சம்பந்தப்பட்டவர் குறிப்பிட்ட பகுதியைச் சேர்ந்தவர் அல்ல என்றும் குறிப்பிட்ட பகுதியில் வசிப்பவருமல்ல என்றும் அவரால் பதில் அனுப்பப் பட்டிருக்கின்றது. அதன் பிற்பாடுதான் அவர் நீர்ப்பாசனத் திணைக்கள அதிகாரியிடம் சென்று அனுமதி கேட்டிருக் கின்றார். அந்தப் பகுதிப் பொறியியலாளரும் அதனை மறுத்துவிட்டார். பின்னர் இவர் குறித்த புவிச்சரிதவியல் பொறியியலாளரைச் சந்தித்து, மாவட்டச் செயலகத்திலே அனுமதியைப் பெற்று, இந்த மண் அகழ்வு நடவடிக்கைகளை மேற்கொண்டு வருகின்றார். நான் இந்த விடயத்தை மாவட்டச் செயலாளரின் கவனத்திற்குக் கொண்டுவந்தேன். அவர் அந்த அதிகாரியிடம், பிரதேச அபிவிருத்திக்குழுக் கூட்டத்தில் மண் அகழ்வு தடைசெய்யப்பட்டதாகத் தீர்மானம் எடுக்கப்பட்டுள்ள தால் மண் அகழ வேண்டாம் எனக் கூறியபோதும், அந்த அதிகாரி தனக்கு அமைச்சரினால் அந்த அனுமதி வழங்கப் பட்டிருப்பதாகக் கூறி, அனுமதிக் கடிதத்தையும் காண்பித்திருக் கிறார். அதன்படி இன்றுவரையில் மண் அகழ்ந்து எடுத்துக் கொண்டே இருக்கின்றார்கள். கடந்த வெள்ளப்பெருக்கின் போது மட்டக் களப்பு மாவட்டத்திலே முற்றுமுழுதாக நீரினால் சூழப்பட்டுப் பாதிக்கப்பட்டது இந்தச் சந்தனமடு ஆற்றை அண்டிய கிராமம் என்பதனால்தான் நான் இவ்விடயத்தைக் கூறுகிறேன்.

இந்த அவையிலே பேசிய கௌரவ அமைச்சர் அவர்கள், இவ்வாறான மண் அகழ்வுகள் போன்ற இயற்கையைப் பாதிக்கும் நிகழ்வுகளுக்குத் தான் அனுமதி வழங்கப் போவதில்லை என்ற நல்ல கருத்தை முன்வைத்திருந்தார்.

[ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා]

ஆகவே, கௌரவ அமைச்சர் அவர்கள் இவ்விடயத்தில் கவனம் செலுத்தி உரிய நடவடிக்கை எடுக்கவேண்டும் என நான் அவரிடம் விநயமாகவும் அன்பாகவும் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa )

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Yes, Hon. Anura Priyadharshana Yapa, you can speak.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

Hon. Yoheswaran, I want to mention this. We do not issue permits without the sanction of the AGA of the area. If you refer this issue to me, I will go into the matter in detail and let you know. You can give me all the details and then I will hold an inquiry and give you a decision.

**ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)

Okay, Sir. கௌரவ அமைச்சர் அவர்களே, உடனடியாகப் பதில் அளித்ததற்கு எனது கௌரவமான நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

அதுமாத்திரமல்ல, தற்பொழுது வட பகுதியிலுள்ள முல்லைத்தீவு கடற்கரையோரப் பிரதேசம் கடல் மண் அகழும் செயற்றிட்டத்துக்கு உட்படுத்தப்பட்டிருப்பதாக எனக்குச் செய்தி கிடைத்திருக்கிறது. புல்மோட்டையிலே ilmenite factory இருக்கிறது. அந்த ilmenite factory க்குத் தேவையான மண், புல்மோட்டையை அண்டிய குச்சவெளிப் பிரதேச செயலாளர் பிரிவிலே அகழ்ந்தெடுக்கப்பட்டுவந்தது. அப்பிரதேசத்தின் நலன் கருதி அங்கு மண் அகழ்வதற்குச் சில தடைகள் விதிக்கப்பட்டதனால் அதனை அண்டியுள்ள முல்லைத்தீவுப் பகுதியிலே மண் அகழ்ந்தெடுக்கப்படுவதாக எங்களுக்குத் தகவல்கள் கிடைத்துள்ளன.

கௌரவ அமைச்சர் அவர்களே, கடந்த சுனாமி அனர்த்தத்தின்பொழுது புல்மோட்டைக்கு அருகிலுள்ள முல்லைத்தீவுப் பிரதேசம் மிக மோசமாகப் பாதிக்கப் பட்டிருந்தது பற்றி நீங்களும் அறிந்திருப்பீர்கள். தற்பொழு துள்ள சூழ்நிலையிலே அந்தப் பகுதி பாதுகாக்கப்பட வேண்டிய தன் அவசியத்தையும் நீங்கள் அறிவீர்கள். அப்பகுதிகளிலிருந்து மணல் அகழ்ந்தெடுக்கப்படுவதனால் முல்லைத்தீவுப் பகுதி மக்கள் பெரும் பாதிப்புக்கு உள்ளாகலாம் என்பதை அங்குள்ள மக்கள் எனது கவனத்துக்குக் கொண்டுவந்துள்ளனர். அதுமாத்திரமல்ல, புல்மோட்டையிலே உள்ள ilmenite factory யிலே பெரும்பான்மை இனத்தவர்களே அதிகமாக வேலை செய்கின்றார்கள். நான் பதினான்கு வருடங்கள் அந்தப் பகுதியிலே இளைஞர் சேவை அதிகாரியாகக் கடமையாற்றி யுள்ளேன். அங்கு தமிழ் மக்கள் சிறு தொகையினரே வாழ்கின்றார்கள். அப்பிரதேசத்திலே வசிப்பவர்களில் பெரும் பான்மையானவர்கள் முஸ்லிம் மக்களாக இருக்கின்ற பொழுதிலும் அந்த முஸ்லிம் மக்களுக்கு வேலைவாய்ப்பு வழங்கப்படுவதில்லை. அதாவது, அப்பிரதேசத்தின் சுற்றாட லிலுள்ள இயற்கை வளங்கள் அகழ்ந்தெடுக்கப்பட்டு, அப் பிரதேசத்திலுள்ள தொழிற்சாலையில் உற்பத்தி செய்யப்பட்டு, வெளிநாடுகளுக்கு ஏற்றுமதி செய்யப்படுகின்றபொழுதிலும் அங்கு வாழ்கின்ற மக்களுக்குத் தொழில் வாய்ப்புக்கள் வழங்கப்படாத நிலைமை காணப்படுகிறது. இதனைக் கௌரவ அமைச்சர் அவர்கள் கவனத்திற்கொள்வதுடன், அங்குள்ள ilmenite factory க்குத் தேவையான மண்ணை முல்லைத்தீவுக் கரையோரப் பகுதியிலிருந்து அகழ்ந் தெடுப்பதை நிறுத்துவதற்கு முன்வரவேண்டும் என்றும் கேட்டுக்கொள்கின்றேன். அவ்வாறே அங்குள்ள கடற்கரைப் பிரதேசத்தில் மண் அகழ்ந்தெடுக்கப்படுவதாகவும் தகவல்கள் கிடைத்துள்ளன. ஆகவே, எமது மக்களின் அன்றாட வாழ்க்கையையும் அப்பிரதேச மண் வளத்தையும் பாதிக்காத வகையில் அப்பிரதேச கடல் வளத்தைப் பாதுகாத்துப் பேண வேண்டிய அவசியம் ஏற்பட்டுள்ளது. எனவே, இவ்விடயத் தைக் கருத்திற்கொண்டு, உரிய நடவடிக்கை எடுக்க வேண்டும் எனக் கேட்டு, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி.

[අ.භා. 3.28]

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ නියෝග, හෙවත් සමුද්‍රීය පරිසර දූෂණය නැවැත්වීම සඳහා වන නියෝග පිළිබඳ සාකච්ඡා කරන මේ අවස්ථාවේ මටත් ඒ සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කිරීමට ලැබීම පිළිබඳව, ඒ සඳහා අවසර දීම පිළිබඳව මම සතුටු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සාකච්ඡා කළ යුතු වැදගත්ම කාරණයක් හැටියටයි මා මෙය දකින්නේ. ලංකාවට දැන් අවශ්‍ය වෙලා තිබෙන්නේ තෙල් සම්පත පමණයි. තෙල් සම්පත අපට ලබා ගැනීමේ වාසනාව අද ලැබිලා තිබෙනවා. මේ වන කොට අක් වෙරළ කැණීමේ කටයුතු ආරම්භ කර තිබෙනවා. එසේ කටයුතු කිරීමේදී සමුද්‍ර දූෂණයක් වේ නම් ඒ පිළිබඳ කටයුතු කිරීම රජයේ භාරදූර වග කීමක් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට අපේ ඉතිහාසය තුළ හොඳ පාඩම් දකින්නට තිබෙනවා. නොයෙක් රටවල -මෙක්සිකෝවේ- වූ සිදුවීම් අද අපට අමුතුවෙන් කිව යුතු දේවල් නොවෙයි. ඒ නිසා මෙවැනි නියෝග පනවලා සමුද්‍ර දූෂණය වැළැක්වීම අපේ යුතුකමක්. ගරු පරිසර අමාත්‍යතුමා ඊට අදාළ නියෝග සකස් කරමින්, පනවමින් අවශ්‍ය කටයුතු කිරීම සඳහා මේ ගෞරවනීය සභාව වෙත මේ කාරණය, මේ විෂයය අද ගෙනැල්ලා තිබෙනවා. අද තිබෙන වැදගත්ම කාරණය තමයි ඛනිජ තෙල් කැණීම ආරම්භ කිරීම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඛනිජ තෙල් කැණීමේදී අපට බරපතළ ප්‍රශ්න කීපයක් මතු වෙනවා. බැරි වෙලාවත් කාන්දු වීමක්, පිට වීමක් සිදු වුණොත් එහෙම විශේෂයෙන්ම සමුද්‍රය දූෂණය වෙනවා. එහි ප්‍රධානම බලපෑම ඇති වන්නේ සමුද්‍ර ජීවීන්ටයි, ජලජ ජීවීන්ටයි. ඒ විතරක් නොවෙයි. එයින් ඊළඟට ගැටලු මතු වන්නේ සමස්ත ධීවර ජනතාවටයි. අපි ගැටලු, ප්‍රශ්න රාශියකට මුහුණ දුන් උදවියයි. නැවත ඒ වාගේ තත්ත්ව ඇති නොවෙන්න කටයුතු කිරීම තමයි රාජ්‍යයකට තිබෙන වගකීම. එය මැනවින් ඉටු කිරීම සඳහා සමුද්‍ර දූෂණය වැළැක්වීම සඳහා නියෝග පැනවීමට මේ ගෞරවනීය සභාව අද සූදානම්. ඒ සඳහා අවශ්‍ය නීති රීති, ව්‍යවස්ථා, අණපනත්, නියෝග කියන මේ සියල්ල ක්‍රියාත්මක කළ යුතු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසායි මා මෙය ඉතාම වැදගත් අවස්ථාවක් හැටියට දකින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝක ඉතිහාසයේ සඳහන් වෙලා තිබෙන කාරණයක් ගැන මා කියන්නම්. එය තමුන්නාන්සේට අමුතු කාරණයක් නොවෙයි. ශුද්ධ වූ කුරානයේත්, ශුද්ධ වූ බයිබලයේත් සඳහන් වෙනවා, දෙවියන් ලෝකය මවන අවස්ථාවේදී එය අඳුරේයි -මහා ඝන අන්ධකාරයකයි- තිබිලා තියෙන්නේ කියා. දෙවියන් වහන්සේ ප්‍රකාශ කර තිබෙනවා, "එළිය වේවා!" කියලා. එතකොට මුළු පෘථිවි තලයම එළිය වුණා කියා ශුද්ධ වූ බයිබලයේත්, ශුද්ධ වූ කුරානයේත් සඳහන් වෙලා තිබෙනවා.

ඊළඟට බලන කොට, මුළු පෘථිවියම යට වෙලා තිබිලා තියෙන්නේ ජලයෙන්.

"ජලයෙන් මතු වේවා" කියා එදා දෙවියන් වහන්සේ ප්‍රකාශ කර තිබෙනවා. එහෙම ප්‍රකාශ කළාම පෘථිවිය මතු වුණා කියා ශුද්ධ වූ බයිබලයේ සඳහන් වනවා. එයින් පසු ඉර, හඳ, තාරකා, ගහකොළ, ඇළදොළ, ගංගා, උරගයින්, සිවුපාවුන්, ජලජ සතුන් මේ සියලු දේ මැව්වා කියන එක තමයි ශුද්ධ වූ බයිබලයේ සඳහන් වන්නේ. අවසානයේ මනුෂ්‍යයා මවලා මනුෂ්‍යයා නින්දකට පත් කරලා අද කරන operation එකක් වාගේ මනුෂ්‍යයාගේ ඉල ඇටයක් අරගෙන කාන්තාව නිර්මාණය කරලා පරිසරයත් එක්ක මනුෂ්‍යයාට ජීවත් වන්න සැලැස්සුවා කියන එකයි ශුද්ධ වූ බයිබලයේ සඳහන් වන්නේ. එතැනින් එහාට මා ඒ පිළිබඳව කථා කරන්නේ නැහැ. නමුත් ඒ පිළිබඳව එක කාරණයක් මතක් කරන්න කැමැතියි. ඒ "මතු වේවා" කියන කාරණය ගැනයි. නැවත මේ පෘථිවිය ජලයෙන් යට වන්න නොහැකිද? මතු වුණා නම් සියලු දූපත් මතු වුණා; පෘථිවිය මතු වුණා.

අද ලංකාවට මොකද වෙලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? අද ලංකාව කුඩා වෙලා. මහා සමුද්‍ර ඛාදනයක් -මුහුදු කැමක්- තිබෙනවා. සමහර පළාත්වල කිලෝ මීටර් තුන හතර අද මුහුදට යට වෙලා. මේ යට වීමක් තිබෙන්නේ; මේ මතු වීමක් තිබෙන්නේ. ඒකට පාරිසරික හේතු ගණනාවක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ලෝකයේ විශේෂඥයෝ ඒ ගැන කියනවා. Arctic කලාපයේ අවුරුදු 5000කට වැඩි අයිස් කඳු දැන් දිය වනවා. ආක්ටික් කලාපයේ ඕසෝන් පටලය හිල් වෙලා. මේවා පෘථිවිය විනාශ වීමේ මහා භයානක ලකුණු කියා අද විශේෂඥයෝ ප්‍රකාශ කරනවා. ඒකට හේතු වශයෙන් විද්‍යාඥයෝ දක්වන්නේ කාබන්ඩයොක්සයිඩ් වායු ගෝලයට මුසු වීමයි. පරිසර දූෂණය නිසා සිද්ධ වන්නේ ඒකයි.

අද පරිසර දූෂණය සිද්ධ වන්නේ කර්මාන්තශාලාවලින්, අපේ වාහනවලින් විතරක් නොවෙයි. අද ලෝකයේ අවි හරඹය නිසා -රසායනික අවි, තාක්ෂණික අවි, පරමාණු අවි වාගේ භයානක අවිවලින්- නිර්මාණය වන කාබන්ඩයොක්සයිඩ් මහා විෂ වායුව අද වායුගෝලයේ තැන්පත් වීම නිසා අවුරුදු 5000ක් පමණ තිබුණු මහා අයිස් කඳු අද දිය වෙනවා කියලා කියනවා. දැනට අවුරුද්දකට ඉස්සෙල්ලා කිසිම වර්ෂාවක් නැතුව, ජල ගැලීමක් නැතුව කල්පිටිය ප්‍රදේශයේ පල්ලියවත්ත කියන ප්‍රදේශයේ දූපත අඩි 4ක් යට වුණා. පවුල් 35ක් 36ක් පදිංචි වෙලා හිටියා. අඩි 6ක් යට වුණා නම් ඒ සියලු දෙනා මරණයට පත් වන්න තිබුණා. ඒ නිසා මේ මහා පරිසර දූෂණය අද වළක්වාලිය යුතු වනවා. ඒක මහා භයානකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට හොඳ ඉතිහාසයක් තිබෙනවා. 2004 දී ඉන්දුනීසියාව අවට මුහුදේ ඇති වූ භූ චලනය නිසා ලංකාවට සිදු වුණු විනාශය අපට මතකයි. මේ නිසා ලංකාවේ 50,000කට වැඩි ප්‍රමාණයක් මිය ගියා. විහාරමහා දේවියගේ කාලයේ ජල ගැල්ම නවත්වන්න එතුමිය මුහුදට බිලි කළා කියන ඉතිහාසය ඒ අවස්ථාවේදී අපට සිහි වුණා. කලින් අපි නිකමට හිතුවා, ඒක මහා මන:කල්පිත කථාවක් කියා. නමුත් බලන්න මේ යුගයේදී අපිට ඇස් දෙකෙන් ඒ අවස්ථාව දැක ගන්න පුළුවන්කමක් ලැබුණා. පරිසරය ආරක්ෂා කරනවා වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමුද්‍ර දූෂණයත් නවත්වන්න ඉතාමත් කඩිනමින් වැඩ පිළිවෙළක් අප පටන් ගත යුතුයි. මුල් කාලයේ දෙවියන්ගෙන් මනුෂ්‍යයන්ට ලැබුණු වරප්‍රසාද කිහිපයක් තිබුණා. නොමිලේ ආහාර ලැබුණා. අද ආහාර මුදලට ගන්න සිද්ධ වෙලා තිබෙනවා. ලෝකයේ මනුෂ්‍ය සංහතියට නොමිලේ ජලය ලැබුණා. අද බලන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ජලය මුදලට ගන්න සිද්ධ වෙලා තිබෙනවා. තව වැඩි කාලයක් නැහැ. හුළඟත් -ඔක්සිජන් වායුවත්- අපට සල්ලිවලට ගන්න සිද්ධ වෙයි. හුස්ම ගැනීමට බට ගහලා ටැංකිය පිටේ එල්ලා ගෙන ඉන්න කාලයක් ඉදිරි අනාගතයේ ඇති වෙයි කියායි මා විශ්වාස කරන්නේ. එවැනි පරිසර හානියක් මේ ලෝකයේ ඇති වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමුද්‍ර දූෂණය ගැන කථා කරද්දී විශේෂයෙන්ම ධීවර කර්මාන්තයේ අවිධිමත් ක්‍රම ගැනත් මා කථා කරන්න ඕනෑ. මාදැල් ව්‍යාපෘතිය කියන එක, මාදැල් ඇදීම කියන එක පනතකින් සම්මත වෙච්ච එකක්. නාවික සැතපුම් එකහමාරයි ඒ ගොල්ලන්ට මාදැල් අදින්න නියමය තිබෙන්නේ. මාදැල් අදිනවා කියන්නේ විශාල ට්‍රෝලිං ක්‍රමයක්; දෙපැත්තෙන් දැල එලලා ඇද ගෙන යන ක්‍රමයක්; මුළු මුහුදු පතුලම සූරා ගෙන එන ක්‍රමයක්. ඒක එච්චර හොඳ ක්‍රමයක් නොවෙයි. ඒ විධියට මුළු මුහුදු පතුලම සූරා ගෙන මාදැල ඇද ගෙන එන කොට ඒක නිකම්ම නිකම් ගල් පර නැති, කොරල් පර නැති මුහුදු තීරයක් වෙනවා. එහෙම එකක තමයි මාදැලක් අදින්න පුළුවන් වන්නේ. එහි බරපතළකම ගැන කියනවා නම්, එයින් අනාගතයේදී මුහුදේ ඉතාම බියජනක සිද්ධියක් ඇති වෙන්න ඉඩ තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2004 දී සිදු වුණු මුහුද ගොඩ ගැලීම අපට හොඳට මතකයි. එහිදී මොකක්ද සිද්ධ වුණේ? හුනු ගල් කඩපු තැන්වලින් ජලය පිටාර ගලලා මිනිස්සු මැරිලා ගියා. වෙරළේ වැටකෙයියා ගස් තිබුණු තැන්, කඩොලාන තිබුණු තැන් -උස් බිම්වල ඒවා පිහිටලා තිබුණු නිසා- ආරක්ෂා වුණා. ඒ තැන්වලින් ජලය පිටාර ගලා තිබුණේ නැහැ. මේ වර්ග සැතපුම් 25,000 අප ආරක්ෂා කර ගත යුතුයි. අපේ ගොඩ බිම මුහුදු ජලයෙන් යට නොවීමට අප වග බලා ගතයුතුයි. අපේ වෙරළ තීරය අප ආරක්ෂා කර ගතයුතියි. එහෙම නොවුණොත් ඉදිරි අනාගතයේදී අපේ අනාගත දරු පරම්පරාවට භයානක සිද්ධියකට මුහුණ දෙන්නට සිද්ධ වේවි කියලා මා හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මාදැල් ව්‍යාපාරය නිසා මුහුදුකැම්වලට ලක්වන ස්ථාන බලන්න. දැන් මාදැල් ව්‍යාපාරය නව තාක්ෂණයකට ගිහින්. දැන් එදා වාගේ මිනිසුන් විසින් මාදැල් අදින්නේ නැහැ. දැන් අදින්නේ ට්‍රැක්ටර්වලින්. ට්‍රැක්ටර්වලින් අදින කොට මොකද වෙන්නේ? නිතරම වෙරළ හැරෙනවා. අනෙක් කරුණ, පනතේ තිබෙන අන්දමට නාවික සැතපුම් එකහමාරක් නොවෙයි අදින්න තිබෙන්නේ. කිලෝමීටර් 10ක් 12ක් දුරට දැන් අදිනවා. මේ ට්‍රැක්ටර්වලින් අදින ක්‍රමය ඔබතුමාත් ගිහින් බැලුවා නම්, නිතරම එලෙස ඇදීමෙන් වෙරළ මොන තරම් බුරුල් වෙනවාද, මොන තරම් පහත් වෙනවාද කියන එක තමුන්නාන්සේට දැසින් බලා ගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිනපතා මෙලෙස සිදු වෙන කොට මෙයින් සිදු වන විනාශය අතිවිශාලයි. අද මාදැල් අදින සමහර තැන්වල වෙරළේ ඉකිරි නැහැ; මහා රාවණා රැවුල් කියන පැළෑටි වර්ගය නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා වෙරළේ සාමාන්‍ය පැළෑටි. සුළං රැල්ලට එන වැලිවලට මේවා වැහෙනවා. ඒ වැහෙනකොට නැවත දළු දමනවා. ආයෙත් වැලිවලට වැහෙනවා. ආයෙත් දළු දමනවා. වෙරළ ක්‍රම ක්‍රමයෙන් උස් වෙනවා. ඒක තමයි ස්වාභාවික ක්‍රමය. මේ ක්‍රමයට තමයි

[ගරු වික්ටර් ඇන්ටනි මහතා]

රටවල්, දූපත් ආරක්ෂා වුණේ. මේවා පිළිබඳ අපි සොයා නොබලන හේතුව මත අද ලංකාව මුහුදු ජලයෙන් යට වීමේ විනාශයකට ලක්වන එක නවත්වන්න පුළුවන්කමක් නැහැයි කියලායි මම විශ්වාස කරන්නේ. ඒක නිසා සමුද්‍ර දූෂණය විතරක් නොවෙයි, වෙරළ සංරක්ෂණයත් ඉතාමත් දැඩිව තිබෙන්න ඕනෑ කාරණයක්ය කියන එක මම තමුන්නාන්සේට මතක් කරන්න අවශ්‍යයි.

අද සමුද්‍ර දූෂණය බරපතළ ලෙස සිදු වනවා. මම කියන්නේ අපි මුළු ලංකාව වටෙන්ම ආරක්ෂා විය යුතු ජාතියක් නම්; අපි මුළු ලංකාව වටෙන්ම ආරක්ෂා විය යුතු මනුෂ්‍ය කොට්ඨාසයක් නම් මුළු ලංකාව වටේටම තිබෙන මුහුදු තීරයේ කොරල් පර ඇති කිරීම අපි ආරම්භ කරන්න ඕනෑ; මුළු ලංකාව වටේටම තිබෙන මුහුදු තීරයේ කඩොලාන වර්ග සිටුවීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න ඕනෑ. කෘත්‍රිම කොරල් පර හෝ ඇති කරලා මුහුද රට තුළට ගලා ඒම වළක්වා ගන්න ඕනෑ. මුහුද රට තුළට ගලා ඒම වළක්වා ගැනීමට අප පියවර ගත්තේ නැත්නම් අනාගත දරු පරම්පරාව ගැන විශ්වාසයක් තියන්න අපට බැහැ. දැනටමත් කිලෝමීටර් තුන, හතර මුහුදට බිලි වුණු පළාත් තිබෙනවා. තවම ඒ පිළිබඳව වැඩ පිළිවෙළවල් නැහැ. ඒ පිළිබඳව වැඩ පිළිවෙළවල් අවශ්‍යයි. සමුද්‍ර ඛාදනය කියන එක බරපතළ ප්‍රශ්නයක්. සමුද්‍ර දූෂණයත් ඒ වාගේම බරපතළ ප්‍රශ්නයක්.

තෙල් සම්පත අපට අවශ්‍යයි. අපි තෙල් නිධි කැණීම් කරන්න ඕනෑ. තෙල් සම්පත අපි මතු කර ගන්න ඕනෑ. නමුත් යම් කිසි විධියකින් තෙල් පිටවීමක් - leak වීමක් - සිද්ධ වුණොත් ඇති වන පරිසර හානිය අතිවිශාලයි. ඒ නිසා ඒ සඳහා අවශ්‍ය නියෝග පැනවීම අනිවාර්යයෙන්ම කළයුතුයි. සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ පරිසර අමාත්‍යතුමා පනවන මේ නියෝග වැදගත් නියෝග බවට පත් වේවි කියලා මම හිතනවා. ඒ තුළින් අපේ රට ආරක්ෂා වෙලා, රටේ අනාගත ජලජීවීන්ට සහ ධීවර ජන ජීවිතයට එල්ල වන හානි නවත්වා ගත හැකි වෙයි කියා මා විශ්වාස කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙමින් මගේ කථාව මෙයින් අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Presiding Member)
බොහොම ස්තුතියි. දැන් ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක් තිබෙනවා.

[අ.භා. 3.42]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ලෝකයේ ඇති වෙලා තිබෙන වෙනස්කම් දෙස බලන විට, අද අපේ රටේ සිදු වන සමුද්‍ර දූෂණය වැළැක් වීම සඳහා විශේෂයෙන්ම අවශ්‍ය පනතක් විධියට අප මේ සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත දකිනවා. ඒ වාගේම ගරු ඇමතිතුමනි, දූෂණය වන්නේ සමුද්‍රය විතරක් නොවෙයි. රට වටේ තිබෙන මුහුද දූෂණය වීම වළක්වා ගැනීම වාගේම රට අභ්‍යන්තරයේ තිබෙන සමස්ත දූෂණයත් වළක්වා ගත යුතුව තිබෙනවා.

මොකද, අපි එහෙම කියන්නේ, මේ තෙල් නිසා අද දූෂණය කියන මාතෘකාව ජනප්‍රිය මාතෘකාවක් බවට පත් වෙලා තිබෙනවා. ඔබතුමාම කිව්වා, ඇමතිවරුන්ට දැන් වළවල් දිහා බල බලා යන්න විධියක් නැහැ කියලා. නමුත් ඇමතිතුමනි, මේ දවස්වල ජනතාව සිටින්නේ, මේ තෙල් මිල නිසා වළේ වැටිලායි. ඒ නිසා ඒ වළේ වැටිලා සිටින ජනතාව දිහා බලන්න, ඇමතිවරුන්ට සිදු වනවා. ගරු ඇමතිතුමනි, එහෙම නැත්නම් ඔබතුමන්ලා දන්නේම නැතිව වළට වැටෙනවා. එතකොට ජනතාවට සිදු වනවා, වළ ගැට්ටට ඇවිල්ලා ඔබතුමන්ලා දිහා බලන්න. අද ඒ වළවල් දිහා බල බලා යන්න ඇමතිවරුන්ට විධියක් නැහැ; වෙලාවක් නැහැ කිව්වාම, ඒකෙන් ඔබතුමා අදහස් කළේ මොකක්ද? නිලධාරින්, එහෙම නැත්නම් මධ්‍යම පරිසර අධිකාරිය ඇතුළු එම ආයතන මඟින් අණපනත් තුළින් තමයි ඒවා ක්‍රියාත්මක වන්නේ. ඒවාට නීති තිබෙනවා, මේ හැම දෙයක්ම ඇමතිවරුන්ට බල බලා ඉන්න විධියක් නැහැ කියන එකයි ඔබතුමා අදහස් කළේ. ගරු ඇමතිතුමනි, එම අදාළ අමාත්‍යාංශයේ යන්ත්‍රණයක් තිබෙන බව ඇත්තයි. ඒ සඳහා අධිකාරි පිහිටුවා තිබෙන බවත් ඇත්ත. අණ පනත් තිබෙන බවත් ඇත්ත. නමුත් ඒවා ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රතිපත්ති, සැලසුම් සහ වැඩ පිළිවෙළවල් පිළිබඳව ප්‍රධාන වග කිවයුත්තා අමාත්‍යවරයායි. ඒ නිසා ඇමතිතුමා වළ දිහා බැලුවේ නැති වුණාට වළේ වැටිලා සිටින මිනිසුන් දිහා බැලීම ඇමතිවරයාගේ වගකීමයි. එම වගකීමෙන් මිදෙන්නට ඇමතිවරුන්ට බැහැ. නමුත් අද ප්‍රශ්නය තිබෙන්නේ එතැනයි. අද තිබෙන දූෂණය වැළැක්වීමේ දී සමුද්‍ර දූෂණය වාගේම, විශේෂයෙන්ම අනූපස් දෙනෙක් වෙච්ච කැබිනට් මණ්ඩලය මේ රටේ ඇති කර තිබෙන මේ දූෂණකාරී තත්ත්වය පිළිබඳවත් අවධානය යොමු කළ යුතු වනවා. මේ නියෝග සමුද්‍ර දූෂණයටම සීමා වන්නේ නැතිව, මේ රටේ සමස්ත දූෂණය වැළැක්වීම සඳහා ක්‍රියා මාර්ගයක්, වැඩ පිළිවෙළක් තමයි අද රටේ ජනතාව බලාපොරොත්තු වන්නේ. සමුද්‍ර දූෂණයත් වළක්වන්නට ඕනෑ.

පරිසර දූෂණය පිළිබඳව කථා කළොත් පසු ගිය කාලයේ අපි දැක්කා, විශේෂයෙන්ම උතුරුමැද පළාත, -අනුරාධපුරය, පොළොන්නරුව,- බදුල්ල දිස්ත්‍රික්කය, අම්පාර දිස්ත්‍රික්කයේ මායිම, දෙහිඅත්තකණ්ඩිය වැනි ප්‍රදේශවල වකුගඩු රෝගය ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙලා තිබෙන බව. දිනපතා වකුගඩු රෝගීන් ප්‍රමාණයක් රෝහල්ගත වනවා. සෑම නිවසකින්ම වාගේ වකුගඩු රෝගීන් හඳුනා ගැනීමට පුළුවන්කම ලැබෙනවා. එක්තරා විශේෂඥයෝ වගයක් කිව්වා, ඒකට ප්‍රධාන හේතුව ආසනික් නැමැති රසායන ද්‍රව්‍ය කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තවත් මතයක් ප්‍රකාශයට පත් වුණා, ලෙඩ්, කැඩ්මියම් වැනි බර ලෝහ වර්ග ශරීරගත වීම නිසාය කියලා. නමුත් ඒ කවර හේතුවක් වුණත් තවමත් වකුගඩු රෝගයට බලපාපු ඇත්ත හේතුව, ඒ පරිසර දූෂණය සිදු වන ඇත්ත හේතුව සොයා ගන්න අපොහොසත් වෙලා තිබෙනවා. ඒ පිළිබඳව පසු ගිය දවස්වල රජය මැදිහත් වෙලා යම් පරීක්ෂණයක් කළාය කියලා දැන ගන්නට ලැබුණා. නමුත් මේ වනතෙක් ඒ පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් වෙලා නැහැ. හැබැයි, අද පොළොන්නරුව සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල මේ ප්‍රශ්නය බරපතළ ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පරිසර දූෂණය හේතුකොට ගෙන ඇති වුණු තත්ත්වය නිසා හැම නිවසකම කවුරු හරි පුද්ගලයෙක් වකුගඩු රෝගියකු බවට පත් වෙලා තිබෙනවා. නමුත් ඒ පිළිබඳව නිවැරදි සමීක්ෂණයක් කරලා, වාර්තාවක් ඉදිරිපත් කරලා, ඒ පිළිබඳ පිළියම් යොදන්න තවමත් අපොහොසත් වෙලා තිබෙනවා. ඉතින් ඒ පරිසර දූෂණය නිසාම ඇති වුණු තත්ත්වයක්. එයට බලපාපු හේතු මොනවාද කියන එක තවම සොයා ගන්න බැරිවුණා. විද්‍යාඥයන් පවසන විධියට ගොඩ බිම වාගේ 23 ගුණයක් විශාල රොන් මඩ තට්ටුවක් අපේ මුහුදු පතුලේ තිබෙනවා. එය ගවේෂණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකාවට ලබා ගැනීම සඳහා අපට GeoCam ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න වෙලා තිබුණා. නමුත් ඒ GeoCam ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දුබලතාවන් නිසා ඒ සාගර පතුලේ තිබෙන මහා සම්පත අපේ ශ්‍රී ලංකාවේ ප්‍රයෝජනයට ගන්න පුළුවන් තත්ත්වයට තවම පත් වෙලා නැහැ. ඒ සමුද්‍රයේ ගැඹුරේ තිබෙන එම ස්වාභාවික සම්පත රටේ අනාගතය වෙනුවෙන් පාවිච්චි කරන්නට අපට තවම නෛතික බලය නිවැරදිව ලැබිලා නැහැ.

ඒ ලැබී නැත්තේ ඒ සඳහා මැදිහත් වුණු යන්ත්‍රණයේ තිබුණු දුර්වලතා නිසායි. මුහුදු පතුලේ තිබෙන ස්වාභාවික සම්පත් ටික ගන්න මැදිහත් නොවුණාට මුහුදු පතුලේ තිබෙන පරණ නැව්වල යකඩ ටික ගන්න නම් අද සමහර දේශපාලනඥයන් මැදිහත් වන බව ඇමතිතුමා දන්නවා. මුහුදු පතුලේ තිබෙන මුහුදු බත් වෙච්ච පරණ නැව්වල යකඩ කපා ගෙන, ඒවා විකුණන්න කරන මහා ජාවාරම් පිළිබඳව සමහර ඇමතිවරුන්ගේ නම්, ගම් පවා මාධ්‍යවලින් අපි දකිනවා.

ගරු ඇමතිතුමනි, ඒ දූෂණය වළක්වන්න පරිසර ආඥා පනතේ නීති යටතේ ඉඩක් නැතුව ඇති. ඒ කටයුතු ගැන අපේ පුංචිනිලමේ නියෝජ්‍ය ඇමතිතුමා වග බලා ගනියි කියලා හිතනවා. හැබැයි "වග බලා ගනියි" කියන්නේ පනත් කෙටුම්පතක් ගෙනෙයි කියලායි. එහෙම නැතුව වෙනත් අර්ථයකින් "වග බලා ගනියි" කියලා නොවෙයි. ඒක වළක්වන්න තිබෙන ප්‍රශ්නය පනත් නොවෙයි. ඒක වළක්වන්න දැනට නීතිය තිබෙනවා. හැබැයි ඒක ජාවාරමක්. ඒ ජාවාරම කරන්නේ කවුද කියලාත් ඔබතුමන්ලාට මා අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. ඒ ජාවාරම පිටුපස ඉන්නේත් දේශපාලනඥයන්ය, වග කිව යුත්තන්ය කියන එක මේ රටේ ජනතාවට රහසක් නොවෙයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා පරිසර ඇමතිතුමා විධියට යම් උත්සාහයක් දැරුවා, ලුණුගම්වෙහෙර මැණික් ඉල්ලම සම්බන්ධයෙන් ඇති වුණු ප්‍රශ්නය විසඳන්න. ඒ මැණික් ඉල්ලම ප්‍රදේශයේ ජනතාව විසින් අහම්බයක් ලෙස සොයා ගත්තාට පස්සේ ඒක වෙන්දේසි කළාය, ඒක වෙන්දේසි කරලා විශාල ලාභයක් ලැබුවාය කියලා ප්‍රසිද්ධ වුණා. හැබැයි ඒ ප්‍රසිද්ධ රහස ඒ ප්‍රදේශයේ කවුරුත් දන්නවා. ඒක හංගන්න දෙයක් නැහැ. ඔබතුමා පාර්ලිමේන්තුවේදී ඒක ප්‍රතික්ෂේප කළා. හැබැයි එය ඉතා පැහැදිලියි. ඒ ප්‍රදේශයේ ජනතාව ඇසින් දුටු සාක්ෂිත් එක්ක කියනවා, ඒ මැණික් ඉල්ලම මහ පාරේ ඇතිරුවාට පස්සේ, මහ පාරේ තිබුණු මැණික් ඉල්ලම, ටිපර් රථ 7ක්, 8ක් සමඟ ඇමතිවරයෙක් සහ ඒ අයගේ කණ්ඩායම ඇවිල්ලා පටවා ගෙන ගියේ කොහොමද කියන එක. ඒ ප්‍රදේශයේ ජනතාවට ඒක හංගන්න දෙයක් නැහැ. ඒක අද ජන මාධ්‍යය තුළිනුත් පළ වෙලා තිබෙනවා. ජන මාධ්‍යය ඒවා නිකම් ලිව්වේ නැහැ. ඒ ප්‍රදේශයේ ජනතාව ඉතා පැහැදිලිව කියනවා, ඒ ඇමතිවරයාත් එක්ක ග්‍රාම සේවා නිලධාරින් කිහිප දෙනෙක්, පොලිසියේ නිලධාරින් කිහිප දෙනෙක් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරින් කිහිප දෙනකුත් එයට සම්බන්ධ වුණාය කියලා.

ඒ ප්‍රදේශයේ අහිංසක ජනතාවට, දුප්පත් ජනතාවට තමන්ගේ ජීවිත සාක්ෂාත් කර ගන්න අහම්බෙන් ලැබුණු මැණික් ඉල්ලම, ඒ මැණික් ටික ඒ ප්‍රදේශයේ ජනතාවට ගන්න ලැබුණේ නැහැ. ඒ මහා නිධානය තිබුණු ඉඩමේ අයිතිකරුවාටත් ලැබුණේ රුපියල් ලක්ෂ දෙකක් විතර වටිනා පුංචි ගල් කැල්ලක්. ඇමතිවරු ගිහින් දේශපාලන බලය පාවිච්චි කරලා ඒක කොල්ල කනවා. ඒ දූෂණය වළක්වන්න, සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතින් බැරි බව මට තේරෙනවා. හැබැයි ඔබතුමාගේ පරිසර නීතිය යටතේ තිබෙන නීති මඟින් මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ ආයතනය මඟින් එය වැළැක්වීමේ හැකියාව තිබුණා. හැබැයි වැළැක්වූයේ නැහැ. ඒක සිද්ධ වුණා.

අද බොහෝ මන්ත්‍රීවරු, ඇමතිවරු කථා කළේ, රට පුරා විවිධ තැන්වල වැලි ගොඩ දැමීමේදී සිද්ධ වන අක්‍රමිකතා ගැනයි. ඒ ප්‍රශ්නය අද ඊයේ ආපු ප්‍රශ්නයක් නොවෙයි. ඒ ප්‍රශ්නයට අනුර ප්‍රියදර්ශන යාපා ඇමතිතුමා පෞද්ගලිකව වග කියන්න ඕනෑය කියලා මා කියන්නේ නැහැ. හැබැයි ඒ ප්‍රශ්නය කාලාන්තරයක් තිස්සේ තිබෙනවා. ඔබතුමන්ලාට බැරි වුණා, තවමත් ඒක නතර කරන්න. ඒ වැලි ගොඩ දැමීම පිටුපස තිබෙන මහා ජාවාරම තනිකරම දේශපාලන අධිකාරියේ මැදිහත් වීම යටතේයි කරන්නේ.

පරිසර ඇමතිවරු මාරු වන කොට පරණ දීපු permits cancel කරලා, අලුත් permits දෙනවා. අලුත් permits දෙන කොට ඒ ඇතුළේත් යම් යම් පුද්ගලයන්, නිලධාරින් අක්‍රමිකතාවන් කරනවා. ඒ පිටුපස නොනවතින ජාවාරමක්, දූෂණයක් තිබෙන්නේ. එම නිසා තමයි, මඩකලපුවේ වැලි ගොඩ දැමීමෙන් සිද්ධ වන අක්‍රමිකතාවන් පිළිබඳව, ත්‍රිකුණාමලය මුහුදු තීරයේ ඇති වෙලා තිබෙන දූෂණයන් පිළිබඳව, මීගමුවේ වෙරළාසන්නයේ ඇති වෙලා තිබෙන දූෂණයන් පිළිබඳව අද විවිධ තැන්වල කථා වෙන්නේ. ඊයේ කුරුණෑගලදී ඇති වුණු ඒ දූෂණය පිළිබඳව ඔබතුමාටත් විස්තර කරන්න සිද්ධ වුණා. ඉතින් ඒ පිටුපස තිබෙන්නේ පැහැදිලිවම දේශපාලන බලපෑම්. ඒ ගැන හරියට සොයා බලන්න. බොහෝ තැන්වල එහෙමයි. ඉතාම කලාතුරකින් එක තැනක, දෙකක එහෙම නැති වෙයි. හොර permits දෙන්නේ. හොර permits දීලා පොලිසියට අහු වුණාම නිදහස් කර ගන්න ඒවා පිටි පස්සේ ඉන්නේ වෙන කවුරුවත් නොවෙයි. ඒක ඉතා පැහැදිලියි.

ඒ පිටු පස්සේ බලය හොබවන ආණ්ඩුවේ ඇමතිවරයෙකු හෝ ප්‍රදේශයේ දේශපාලනඥයෙකු ඉන්නවා. ඒ නිසා තමයි වැලි ජාවාරමේ යෙදෙන බොහෝ අය ඒ ජාවාරම හොඳට කර ගන්න පුළුවන් වෙන්න ඒ දේශපාලනඥයන්ට උදව් කරන්නේ. ඒක නොනවතින දූෂණයක් විධියට අපේ රටේ තිබෙනවා. තවම ඒක වළක්වන්න හැකියාවක් ලැබුණේ නැහැ. ඒකම තමයි අද ලුණුගම්වෙහෙරෙත් තිබෙන්නේ. ලුණුගම්වෙහෙරෙන් රටට දීපු ආදර්ශය ඒක.

අද මුළු රටටම ප්‍රසිද්ධ වෙලා තිබෙනවා ආණ්ඩුවේ වග කිවයුතු ඇමතිවරයෙක් ලුණුගම්වෙහෙරේ මතු වෙච්ච මැණික් ඉල්ලම, පාරේ අතුරලා තිබ්බ මැණික් සහිත ඒ පස් ටික බලහත්කාරයෙන් තමන්ගේ බලය පාවිච්චි කරලා ඩැහැගෙන ගියා, කොල්ල කෑවා කියලා. එහෙම නම් අපි කොහොමද පරිසරය රකින්නේ? ඒ නිසා ගරු ඇමතිතුමාට මම කියන්නේ, රට ඇතුළේ තිබෙන ඒ සිදුරු වහන්නේ නැතුව, ඒ දූෂණ වළක්වන්නේ නැතුව මහ මුහුදේ තිබෙන දූෂණය වළක්වන්න හදන එක ඇත්තටම අමාරු වැඩක් බවයි. ඒක අමාරුයි. ඒ අමාරුකම ඇති වෙලා තිබෙන්නේ නීතිවල අඩු බවක් නිසා හෝ අණ පනත්වල හිඟයක් නිසා නොවෙයි. අණ පනත්, නීති තිබෙනවා. ඒ නීති ක්‍රියාත්මක කිරීමේදී දේශපාලන මැදිහත්වීම, බලපුළුවන්කාරකම පාවිච්චි වීමයි. ඒක නිසා තමයි මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ. ඒ නිසා තෙල් කැණීමේදී ඇති වන සමුද්‍ර දූෂණය වළක්වන්න යන කොට ඒ අනතුර තිබෙනවා. එතකොට එන්නේ ගමේ තිබෙන වැලි ගොඩ දැමීමේ පුංචි, පුංචි ජාවාරම නොවෙයි. මහා පරිමාණ සමාගම් මට්ටමෙන් තමයි මුහුදේ තෙල් කැණීම් සිද්ධ කරන්නේ. එතකොට සිද්ධ වන දැවැන්ත සමුද්‍ර දූෂණය යට ගහන්න ඒ සමාගම් කප්පම් දෙනවා. මහා පරිමාණයෙන් දෙන කප්පම්වලින් සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත් පැත්තකට විසි කර දමනවා. අපි පාර්ලිමේන්තුවේ නීති සම්මත කරනවා. හැබැයි කොමිස්වලට, කප්පම්වලට යටවෙලා අනාගතයේත් ඒ තත්ත්වය ඇති වන එක වළක්වන්න බැහැ ඒවා ක්‍රියාත්මක කරන යාන්ත්‍රණයක් නැත්නම්.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, කවුරුත් දන්නවා යාපනයේ සාමාන්‍ය, අහිංසක මිනිසුන්ට වැලි ලොරියක් ඕනෑ වුණාම කොහෙන්ද ගන්න තිබෙන්නේ කියලා. යාපනයේ සුප්‍රසිද්ධ පදනමක් තිබෙනවා. කවුද කරන්නේ? ඒ පදනම මෙහෙය වන්නේ කවුද? මේ ආණ්ඩුවේ ඇමතිවරයෙකුගේ අනුබලය යටතේයි. ඒ ප්‍රදේශයේ කාටවත් ව්‍යාපාරයක් කරන්න, තමන්ගේ ගෙයක් හදා ගන්න, ගොඩනැඟිල්ලක් හදා ගන්න වැලි ටිකක් ගන්න මාස තුනක් ඉන්න ඕනෑ ඒ අදාළ පදනමෙන් ඉල්ලුම් කරලා. රුපියල් 30,000ක් යනවා ඒ පදනමෙන් වැලි ලොරියක් ගන්න. ඒ පදනමෙන් පිට වැලි ගන්න බැහැ. ඒවා දූෂණ. කවුද කරන්නේ? දේශපාලනඥයෝ. ඒ බලයත් එක්කයි කරන්නේ. යාපනයේ යුද්ධය අවසන් වෙලා මුස්ලිම්, දෙමළ ජනතාව නැවත

[ගරු විජිත හේරත් මහතා]

තමන්ගේ ගෙවල් හදා ගන්න ලෑස්ති වන කොට අද ඒ දේශපාලන බලපුළුවන්කාරකම අහිංසක, දුප්පත් මිනිසුන්ට වැලි ලොරියක්, වැලි කියුබ් එකක් ගෙනි යන්න දෙන්නේ නැහැ. ඒකටත් ඒ දේපාලන අධිකාරිත්වය මැදිහත් වෙනවා. මට මතකයි ඒ කාරණය ගැන -මම නොවෙයි- මේ පාර්ලිමේන්තුවේදී බොහෝ මන්ත්‍රීවරු, ආණ්ඩු පක්ෂයෙත් සමහර ඇමතිවරු, මන්ත්‍රීවරු කථා කරලා තිබුණු බව. නමුත් අද වන තුරු ඒක නැවතිලා නැහැ. ඒ දූෂණය නවත්වලා නැහැ. ඉතින් අපි කොයි තරම් පනත් කෙටුම්පත් සම්මත කළත් වැඩක් වෙන්නේ නැහැ ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැත්නම්. එතැනයි ප්‍රශ්නය තිබෙන්නේ.

තෙල් නිසා සමුද්‍රය දූෂණය වන එක වැළැක්වීම ඉතාම වැදගත් දෙයක්; කළ යුතු දෙයක්. ඒ පිළිබඳව කාගේවත් විරුද්ධත්වයක් නැහැ. හැබැයි ප්‍රශ්නය තිබෙන්නේ අපි අද සම්මත කර ගන්නා මේ නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා ඔබතුමාගේ අමාත්‍යාංශයේ ඔබතුමාට කරන්න පුළුවන් දේ මොකක්ද කියන එකයි. අන්න ඒ විශ්වාසය තමයි අද රටේ ජනතාව ඉල්ලා සිටින්නේ. මේ නීතිය හරියට ක්‍රියාත්මක කරන්න. මේ නීතියට ලොකු, කුඩා සහ බලපුළුවන්කාර හා එහෙම නැති හැමෝටම සමානව හරියට ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියන එක ජනතාවට ආදර්ශයෙන් ඔප්පු කරලා පෙන්නුවොත් අන්න ඒක තමයි ජනතාවගේ එකම බලාපොරොත්තුව. පනත සම්මත වුණාය කිව්වාට පස්සේ ජනතාව සතුටු වෙයි. හැබැයි ජනතාවම දන්නවා ඔය නීතිය හැදුවාට වැඩක් නැහැ කියා. ඒවා අස්සෙන් රිංගලා යනවා බලපුළුවන්කාර දේශපාලනඥයන්. ඒ නිසා ඒ විශ්වාසය ඇති කිරීම තමයි මම හිතන්නේ තිබෙන අභියෝගය. ඒ අභියෝගයට මුහුණ දෙන්න නම්, මේ දූෂණය වෙච්ච දැවැන්ත දේශපාලන බල අධිකාරයක් ඇතුළේ ඒකට එරෙහිව යන පරිසර ඇමතිවරයෙක් ඉන්න ඕනෑ වෙනවා.

භය නැතිව, කොන්ද කෙළින් තියාගෙන ඒකත් එක්ක හැප්පෙන ඇමති කෙනෙක් ඕනෑ. කියන්නත් කනගාටුයි. ගරු ඇමතිතුමනි, මම කියන්නේ නැහැ ඔබතුමා ඒ ජාතියේ වැඩ කරනවාය කියා. හැබැයි මම නිර්භයව කියනවා, තවම ඔබතුමාට බැරි වුණා, ඒ ධෛර්යය, ඒ විශ්වාසය ඇතිව ඒවාට මැදිහත් වෙන්න. ඔබතුමා පෞද්ගලිකව ඒ කටයුතුවලට සම්බන්ධ නැහැ කියා මට කියන්න පුළුවන්. තමන්ගේ පක්ෂයේ ඉන්න මොන බලපුළුවන්කාරකම් තිබෙන ආණ්ඩුවේ ඇමතිවරයෙක් හරි ඒ වැරදි වැඩේ කරනවා නම් එවැනි ජාවාරම් නතර කරන්න, ඒක වැරදියි කියා නතර කරන්න, කැබිනට් මණ්ඩලයේ හරි, ආණ්ඩු පක්ෂයේ හරි, කොහේදි හරි තැනකදි ඒ සාධාරණත්වයේ නීතිය ක්‍රියාත්මක කරන්න ඔබතුමාට බලය තිබෙනවා. හැබැයි ඒක ක්‍රියාත්මක වෙලා නැහැ. එහෙම ක්‍රියාත්මක නොවීම නිසා තමයි මේ ප්‍රශ්නය මේ තරම් ඔඩු දුවලා, අද සමස්ත සමුද්‍රයේ දූෂණය ගැන විතරක් නොවෙයි මේ රටේම දූෂණය ගැන නිතර අපට අහන්න, කතා කරන්න ලැබෙන්නේ. ඒ නිසා පරිසරය පිළිබඳ ප්‍රශ්නයේදී පරිසර දූෂණය වැළැක්වීම සඳහා, ගොඩබිමේත්, සමුද්‍රයේත් දූෂණය වැළැක්වීම සඳහා ඒ අණපනත් සම්මත කරනවා වාගේම ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත් වීමක්, වැඩපිළිවෙළක් අවශ්‍ය වෙනවා. [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තුවක් තිබෙනවා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මූලාසනයෙන් නිවේදනය නිකුත් කරපු නිසා මම කථාව අවසන් කරන්න මෙහෙම කියනවා. අපි අණපනත් සම්මත කරමු; ඒ පිළිබඳව කිසි ගැටලුවක් නැහැ. සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත පරිසරය ආරක්ෂා කර ගැනීමට අදාළ වන වැදගත් පනතක්. හැබැයි ඒ වැදගත් පනත වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙන්නේ ඔබතුමාගේ ළඟින්ම ඉන්න මිතුරන් දේශපාලනය බලය පාවිච්චි කරලා කරන පරිසර දූෂණය වැළැක්වීම සඳහා කොන්ද කෙළින් තියාගෙන වැඩ කළොත් විතරයි කියන එකත් සඳහන් කරමින්, එහෙම කටයුතු කරන්න ඔබතුමාට ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[අ. භා. 4.00]

**ගරු ආචාර්ය සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் வீரசேகர)
(The Hon. (Dr.) Sarath Weerasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි කතා කරන්නේ 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ පනවනු ලැබූ නියෝගයන් සම්බන්ධයෙනුයි. සාගරය ගැන කතා කරනකොට ප්‍රථමයෙන්ම මට මතක් වෙනවා, අපේ ගෞතම බුදුරජාණන් වහන්සේ සාගරය ගැන සහ අපේ නායකයන් සම්බන්ධයෙන් කරන ලද ඉතා වැදගත් ප්‍රකාශනයක්. උන් වහන්සේ සාගරය ඉතාම ගෞරවණීය මට්ටමක ලා සලකපු කෙනෙක්. උන් වහන්සේ එදා සාගරයේ තිබෙන ගති ගුණ අපේ හොඳ නායකයන්ගේ ගති ගුණවලට සමාන කළා. සාගරය කවදාවත් වෙරළ ඉක්මවා ගිහින් ජනතාව පෙළන්නේ නැහැ. ඒ වාගේම තමයි හොඳ නායකයෙක් කවදාවත් තමාගේ සීමාවන් ඉක්මවා ගිහින් ජනතාව පෙළන්නේ නැහැ කියා උන් වහන්සේ ප්‍රකාශ කළා. ඒ වාගේම කල්ප කාලාන්තරයක් මුළුල්ලේ සාගරයට විවිධ ගංගා ජලය එකතු වුණත් කවදාවත් සාගරයේ ජල මට්ටම ඉහළ යන්නේ නැහැ. සාගරය ඒ තරමටම නිහතමානීයි. ඒ වාගේම හොඳ නායකයෙක් විවිධ කාල වකවානුවල, විවිධ දැනුම් සම්භාරයන් තමාට ලැබුණත් ඔහු තමාගේ හිස උදුම්මවා ගන්නේ නැතිව සාගරය වාගේ නිහතමානීව සිටිනවා. ඒ වාගේම කල්ප කාලාන්තරයක් තිස්සේ සාගරයට විවිධ රසයන්ගෙන් යුත් ගංගා ජලය එකතු වුණත් සාගර ජලයේ එක රසක්ම තමයි තිබෙන්නේ. ඒ, ලුණු රස පමණයි. ඒ වාගේම හොඳ නායකයෙක් සමාජයේ විවිධ ස්තරවල සිටින පුද්ගලයන් -දුප්පත් පුද්ගලයන්, පොහොසත් පුද්ගලයන්, රාජ කුමාරිකාවන්, රජවරුන්, හිඟන්නන් සහ දුගී අය ආදී වශයෙන්- ආශ්‍රය කළත් සාගරය සලකන්නා වාගේ ඔහු සෑම කෙනෙකුටම සලකන්නේ එකම විධියටයි. ඒ වාගේම සාගරයට කුණු කන්දල් හෝ මළ කඳක් වැටුණොත් උදේ වනකොට ඒක වෙරළට ගොඩ ගසා, සාගරය හැම තිස්සේම ප්‍රභාස්වරව, පිවිතුරුව තිබෙනවා. ඒ වාගේම තමයි හොඳ නායකයකුගේ මනසට ලෝභය, ද්වේෂය, ක්‍රෝධය වැනි කුණු කන්දල් ඇතුළු වුණොත් සාගරය කුණු ඉවත්කරන්නාක් මෙන් මනසින් ඒවා ඉවත් කරලා හැම තිස්සේම මනස ප්‍රභාස්වරව, ඉතාමත් පිරිසිදුව තබා ගන්නවා. ඒ ආකාරයෙන් තමයි බුදුරජාණන් වහන්සේ සාගරය සහ අපේ නායකයන් සංසන්දනය කළේ. බුදුරජාණන් වහන්සේ එහෙම ප්‍රකාශ කළේ එදා තෙල්වලින් දුවන නැව් නොතිබුණු යුගයකයි.

එදා රුවල් නෞකා තමයි තිබුණේ. එදා නෞකාවලින් සමුද්‍රය සහ පරිසරය දූෂණය වීමක් සිදු වුණේ නැහැ. ඒක තමයි උන්වහන්සේ දේශනා කළේ, මළකඳක් හරි කුණු කන්දල් හරි සාගරයට වැටුණොත් පසුව දා උදේ වන කොට ඒවා වෙරළට ගසා ගෙන ඇවිත් සාගරය ප්‍රභාස්වරව සිටිනවා වාගේ නායකයෝත් ප්‍රභාස්වරව සිටිය යුතුයි කියා.

නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වන කොට දිනපතා තෙල් ගැලුම් මිලියන 67ක් සාගරයට වැටිලා සාගරය දූෂණය වනවාය කියා සංඛ්‍යාත්මකව පෙන්වා දී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රට ඉතාම රමණීය රටක්. ඒ රට වටේම රමණීය සාගරයක් තිබෙනවා. අපේ රට වාගේ හත් ගුණයක Exclusive Economic Zone එකක් තිබෙනවා. ඒ වාගේම continental zone එක ගත්තාම අපේ රට වාගේ විසිඑක් ගුණයක සාගරයක් අපට හිමි වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටින් පහළට ගත්තාම ඇන්ටාර්ක්ටිකාවට යන තුරු කිසිම රටක් නැහැ. දකුණට ගත්තාම මැලේසියාවට, ඉන්දුනීසියාවට යන තුරු කිසිම රටක් නැහැ. වමට ගත්තොත් මැඩගස්කාර්වලට යන තුරු කිසිම රටක් නැහැ. ඉතාම සුවිශේෂී වූ පිහිටීමකයි අපේ රට තිබෙන්නේ. එදා යුරෝපීයයන්ගේ සේද මාවත - Silk Route එක - තිබුණේ අපේ රට හරහායි. මේ සුවිශේෂී පිහිටීම නිසා තමයි මේ සා විශාල සාගර ධනස්කන්ධයක් අපට හිමි වෙලා තිබෙන්නේ. ඒ ධනස්කන්ධය, ඒ සම්පත-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! Will an Hon. Member propose the Hon. R. Yogarajan to take the Chair?

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය (පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன - பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena - Minister of Parliamentary Affairs)

I propose that the Hon. R. Yogarajan do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ආර්. යෝගරාජන් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair, and* THE HON. R. YOGARAJAN *took the Chair.*

**ගරු ආචාර්ය සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் வீரசேகர)
(The Hon. (Dr.) Sarath Weerasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එසේ නම් ඒ මුහුදු සම්පත අප ආරක්ෂා කර ගත යුතුයි. ඒ මුහුදු සම්පත ආරක්ෂා කර ගන්නට නම්, අප මේ වාගේ නියෝග පනවා, සමුද්‍රය ආරක්ෂා කරන විධිවිධාන නිසි සේ ක්‍රියාත්මක කළ යුතුයි. එදා මෙදා තුර අපේ රට හරහා යන ඉතා විශාල සංඛ්‍යාවක් වූ නෞකාවලින් පිට වන අපද්‍රව්‍ය නිසා සිදු වන හානිය, ඒ වාගේම තෙල්වලින් වන මහා විශාල හානිය අපට සම්පූර්ණයෙන්ම නවත්වා ගන්නට බැරි නම් ඇත්ත වශයෙන්ම එය අවම කර ගන්නට අප උත්සාහ කළ යුතුයි. මේ සඳහා සමුද්‍රීය ආරක්ෂණ අධිකාරියක් 2008 වර්ෂයේදී පිහිටෙව්වා. ශ්‍රී ලංකා වෙරළ කලාපය තුළ තිබෙන ඒ දූෂණය වැළැක්වීම, ඒ දූෂණය පාලනය කිරීම හා කළමනාකරණය කිරීම යන මේ වගකීම් මෙම අධිකාරිය සතු වුණා. මොන යම් හෝ නැවක් සාගරයට තෙල් හෝ අපද්‍රව්‍ය පිට කළොත් ඒ තුළින් සාගරයට ඇති වන දූෂණ ප්‍රමාණය අනුව රුපියල් මිලියන 4 සිට රුපියල් මිලියන 11 දක්වා දඩයක් නියම කරන්නටත් ඇත්ත වශයෙන්ම මේ අධිකාරියට හැකි වී තිබෙනවා.

සමුද්‍රයේ ගැඹුර අනුව sunlight zone එක, twilight zone එක, midnight zone එක කියා කලාප තුනකට බෙදා තිබෙනවා. Sunlight zone එක කියන්නේ හිරු එළියේ බලපෑම ඇති වන ස්ථරය. ඒක අඩි 600ක් පමණ යටට යනවා. ඒ අඩි 600 ක් පමණ යටට යන තාක් කල් හිරු එළිය සාගරයට වැටෙනවා. හිරු එළිය සාගරයට වැටෙන නිසා කාබෝහයිඩ්රේට් නිපදවා ශාක ජීවත් වෙනවා. ඒ වාගේම හිරු එළිය වැටෙන නිසා වතුරේ තිබෙන උෂ්ණත්වය මත මහා සාගරයේ ඉන්න ජීවීන්ගෙන් සියයට අනූවක් ජීවත් වන්නේ මේ කලාපයේයි. ඒ වාගේම තිබෙන ශාකයන්ගෙන් සියයට අනූවක් හැදෙන්නේත් හිරු එළිය වැටෙන කලාපයේයි. නැව්වලින් සාගරයට දැවිතෙල් වැටුණාම මොකක්ද වෙන්නේ? ඒ තෙල්වල තිබෙන අපවිත්‍රකම නිසා ඒ ශාකයන් සම්පූර්ණයෙන් මිය යනවා. ඒ ශාකයන් මිය ගියාම ඒ ශාකයන් ආහාරයට අර ගෙන ජීවත් වන මත්ස්‍යයනුත් මිය යනවා. මත්ස්‍යයන් මිය ගියාම ඒ තිබෙන සම්පත් අපට සම්පූර්ණයෙන්ම නැති වෙලා යනවා. එම නිසා තෙල්වලින් සාගරයට වන oil pollution පුළුවන් තරම් අවම කර ගන්නට අප සම්පූර්ණ සැලසුම් ක්‍රියාත්මක කරන්නට ඕනෑ. Sunlight zone එකේ තමයි සියයට 90ක් පමණ ජීවීන් ඉන්නේ.

අපි දන්නවා ඛනිජ තෙල් ඇතුළු ස්වාභාවික සම්පත් මුහුදේ තිබෙන විට ඒ සඳහා කැණීම් කරන බව. අක් වෙරළ කැණීම් - offshore drilling - කරන විට ඒ සඳහා සමුද්‍ර ආරක්ෂණ බලපත්‍රයක් අදාළ සමාගම විසින් ගත යුතුයි. අපි තවම ඒක ආරම්භ කළේ නැති වුණාට හෙට අනිද්දා වන විට, අපේ ඛනිජ තෙල් සම්පත අනුව බොහෝ සමාගම් අක් වෙරළ කැණීම් සඳහා ඉදිරිපත් වේවි. එවිට ඔවුන් සමුද්‍ර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත යුතුයි. ඒ තුළින් කෙරෙන්නේ, ඒ ඛනිජ ද්‍රව්‍ය කැණීමේදී සහ ඒවා සොයා ගැනීමට කරන විවිධ පරීක්ෂණවලදී පිට වන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම, අවම කිරීම, නැවැත්වීම සහ පාලනය කිරීම සම්බන්ධයෙන් තිබෙන සැලැස්ම ඔවුන් ඒ බලපත්‍රය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුයි. ඇත්ත වශයෙන්ම මේවා ආරක්ෂණ පියවරයන් -precautions - හැටියට සලකන්න පුළුවන්. ඒ වාගේම තෙල් ප්‍රවාහනය, ගබඩා කිරීම සහ පිරිසිදු කිරීම පරිසරය ආරක්ෂා වන පරිදි සිදු කළ යුතුයි. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය මඟින් අනුමත කරන උපකරණ පමණක් පාවිච්චි කළ යුතුයි. ඔවුන්ට කැමති කැමති උපකරණ ගේන්න බැහැ. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය මඟින් අනුමත කරන උපකරණ පමණක් ගෙනැත් ඒවා කළොත් පමණයි මේ බලපත්‍රය ලැබෙන්නේ. ඒ වාගේ තමයි අක් වෙරළේ යම් කිසි ඉදි කිරීමක් කරනවා නම් ඒ සඳහා ජාත්‍යන්තර තෙල් දූෂණ වැළැක්වීමේ සහතිකයක් ඔවුන්ට තිබිය යුතුයි. ඒ වාගේ ඉදි කිරීම් කරන විට බොහෝ විට පරිසරය වාගේම සමුද්‍රය ඉතා විශාල වශයෙන් දූෂණය වීමට නැත්නම් අපවිත්‍ර වීමට ඉඩ කඩ තිබෙන නිසා එය වළක්වා ගැනීමට, පාලනය කිරීමට හෝ එය කළමනාකරණය කිරීමට ජාත්‍යන්තර තෙල් දූෂණ වැළැක්වීමේ සහතිකයක් අනිවාර්ය කරනවා. ඒ තුළින් අපට හැකි තරම් ඒ දූෂණය වළක්වා ගන්නට පුළුවන් වෙනවා.

අපේ රටේ තිබෙන වෙනත් පනත් සමුද්‍රය දූෂණය වීම වළක්වන්නට ඇත්ත වශයෙන්ම උපකාරී වෙනවා. එකක් තමයි වන සත්ව සහ වෘක්ෂලතා ආරක්ෂා කිරීමේ ආඥාපනත. වන සත්ව සහ වෘක්ෂ ලතා ආරක්ෂා කිරීමේ ආඥාපනත මඟින් සමුද්‍රීය ප්‍රදේශ කිහිපයක් ආරක්ෂා කරන්න පුළුවන් වෙනවා. පුත්තලමේ සිට අම්බලන්ගොඩ දක්වා තිබෙන ගල් පර සහ කොරල් පර සහිත වෙරළ මීට අයත් වෙනවා. මේ යටතේ මුහුදු පක්ෂීන් සහිත දූපත්, මුහුදු ජීවීන්, ශ්‍රී ලංකාවේ මුහුදට පැමිණෙන ඩොල්ෆින් සහ කැස්බෑවන් ඇතුළු සතුන් ඇත්ත වශයෙන්ම ආරක්ෂා වෙනවා. මම හිතන්නේ මේ වාගේ පනත් අපේ පැසසුමට ලක් විය යුතුයි. මේ වාගේ පනත් නියමිත පරිදි ක්‍රියාත්මක කිරීමට සියලුම ජනතාව සිතා ගත යුතුයි. ඒ තුළින් තමයි අපට මේ වාගේ පක්ෂීන්,

[ගරු ආචාර්ය සරත් වීරසේකර මහතා]

ඩොල්ෆින්, කැස්බෑවන්, මුහුදු පක්ෂීන් සහ මුහුදු ජීවීන් ආරක්ෂා කර ගන්න පුළුවන් වන්නේ. ඒ විධියට අපි ස්වභාව ධර්මය ආරක්ෂා කළොත් ස්වභාව ධර්මය විසින් අපිව ආරක්ෂා කරනවා ඇති.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ධීවර සහ ජලජ සම්පත් පනත කියලා තවත් පනතක් තිබෙනවා. ඒ පනත අනුව මුහුදට විෂ වායු, විෂ ද්‍රව්‍ය සහ පුපුරන ද්‍රව්‍ය දාලා මසුන් ඇල්ලීම සපුරා තහනම් වෙනවා. මම නාවික හමුදාවේ අවුරුදු 35ක් සිටි නිසා ඒ ගැන මට විවිධ අත් දැකීම් තිබෙනවා. සමහර ධීවරයින් ඩයිනමයිට් යොදලා මුහුදේ මොන තරම් විනාශයක් කරනවාද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩයිනමයිට් දැම්මාම ඒ පිපිරීමත් සමඟ ඇති වන දැඩි කම්පනය නිසා නැත්නම් පීඩනය නිසා මාළු පැටවුන් ඇතුළුව දහස් ගණනක් මත්ස්‍යයින් මිය යනවා. ඇත්ත වශයෙන්ම දහස් ගණනක් මත්ස්‍යයින් ඒ විධියට මිය ගියාම මත්ස්‍ය සම්පත අපට සම්පූර්ණයෙන්ම අහිමි වෙලා යනවා. නාවික හමුදාවේ සිටියදී අපට ඒ අත් දැකීම් ලැබුණා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, you have only one more minute.

**ගරු ආචාර්ය සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் வீரசேகர)
(The Hon. (Dr.) Sarath Weerasekara)
ඒ අත් දැකීම් අනුව ඩයිනමයිට් වැනි පුපුරන ද්‍රව්‍ය දමලා මත්ස්‍යයින් විනාශ කිරීම සම්පූර්ණයෙන්ම අවම කරලා තිබෙනවා. ඔවුන්ට දැඩි දඬුවම් ලබා දීලාත් තිබෙනවා.

ඒ වාගේම සමුද්‍ර දූෂණ - Marine Pollution - වැළැක්වීමේ අන්තර්ජාතික සම්මුතියක් තිබෙනවා MARPOL Convention කියලා. ශ්‍රී ලංකාව මේ සම්මුතියේ පාර්ශ්වකරුවෙක්. දැව් තෙල්වලින් පරිසරයට සිදු වන හානි වළක්වා ගැනීම ඒ රටවලට අනිවාර්ය කර තිබෙනවා. ඒ වාගේම ඒ නැව්වලින් පිට කරන දැව් තෙල් ප්‍රතිග්‍රහණය කිරීමේ මධ්‍යස්ථානයකුත් හදන්න පුළුවන්. ඒවා උපයෝගී කර ගනිමින් බලශක්තිය, ලිහිසි තෙල් - lubricant oil - නිෂ්පාදනය කරන්න පුළුවන්. එහෙම වුණොත් අපට සමුද්‍රය පවිත්‍ර කර ගෙන එය ආරක්ෂා කර ගනිමින් විශාල විදේශ විනිමයකුත් උපයන්න පුළුවන් වෙනවා. මේ ගැනත් රජයේ අවධානය යොමු විය යුතුයි කියලා මම හිතනවා.

කෘෂිකර්මය සඳහා අපි දැන් පළිබෝධ නාශක පාවිච්චි කරනවා. පළිබෝධ නාශක පොළොවට ගියාම ඒවා වැස්සට අහු වෙලා ගංගාවන් හරහා සමුද්‍රයට යනවා. ඒ නිසා පළිබෝධ නාශක භාවිතයත් අපි පුළුවන් තරම් අවම කර ගත යුතුයි; පාලනය කර ගත යුතුයි. කොම්පෝස්ට් පොහොර භාවිත කරලා පරාක්‍රමබාහු රජතුමන්ගේ කාලයේ අපේ රට පෙරදිග ධාන්‍යාගාරයක් වෙලා තිබුණා. එදා "නොමිනි" තිබුණේත් නැහැ. පළිබෝධ නාශක තිබුණේත් නැහැ. එදා දේශීය පොහොර තමයි අපි පාවිච්චි කළේ. එහෙම නම් දේශීය පොහොර පාවිච්චි කරන්න අදත් බැරි ඇයි කියන ප්‍රශ්නය අපට ඇත්ත වශයෙන්ම ඇති වෙනවා. ඒ තුළින් පරිසර දූෂණය වාගේම සමුද්‍ර හානියත් අපට සම්පූර්ණයෙන් අවම කර ගෙන අපේ සමුද්‍රය ආරක්ෂා කර ගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුහුදු පතුලේ තිබෙන නැව් නිසා සමුද්‍රය දූෂණය වෙනවාය කියලා ගරු මන්ත්‍රීතුමෙකු කිව්වා. නාවික හමුදාවේ හිටපු නිලධාරියෙකු හැටියට මම ඒක සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරනවා. මුහුදේ නැව් තිබෙනවා නම් අපි ඒවා ගොඩ ගත යුතුයි. ඒවා සම්පත්. ඒ සම්පත් අරගෙන අපේ ජාතියේ උන්නතිය සඳහා ඒවා පාවිච්චි කළ යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුහුදේ තිබෙන නෞකා ගොඩ ගත්තාට කවදාවත් සමුද්‍රය දූෂණය වෙන්නේ නැහැ. මුහුදේ තිබෙන ඒ සම්පත් අරගෙන අපට කෞතුකාගාරයක් හදන්න පුළුවන්. නැත්නම් ඒ සම්පත් අරගෙන ඒවා අපේ ජාතියේ වර්ධනය සඳහා පාවිච්චි කරන්න පුළුවන්. එසේ කියමින් මගේ මේ වචන ස්වල්පය සමාප්ත කරනවා. ස්තුතියි.

[பி.ப. 4.14]

**ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கடல்சார் தீழ்ப்புத் தடைச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் சம்பந்தமான இன்றைய விவாதத்திலே எனக்கும் பேசுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்காக உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். நான் முதலில் எங்களுடைய பிரதேசத்தில் மேற்கொள்ளப்பட்டுவருகின்ற ஆற்றுமணல் அகழ்வு நடவடிக்கையினால் ஏற்படுகின்ற பிரச்சினைகளை இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். வட மாகாணத்திலே, குறிப்பாக வன்னி மாவட்டத்திலுள்ள ஆற்றோரங்களில் மேற்கொள்ளப்படுகின்ற மணல் அகழ்வு நடவடிக்கைகள் காரணமாக மழைக்காலங்களில் அப்பிரதேசத்திலுள்ள பல கிராமங்கள் நீரில் மூழ்குகின்ற நிலைமை ஏற்பட்டிருக்கின்றது. எங்களுடைய மக்கள் இந்த ஆற்று மண்ணை அகழ்ந்தெடுத்துத் தங்களுடைய தேவைகளை இலகுவாகப் பூர்த்தி செய்யக்கூடிய வாய்ப்புக்கள் இருந்தும்கூட, அதனைப் பல மடங்கு விலைகொடுத்துத்தான் வாங்குகின்ற நிலை காணப்படு கின்றது. அங்கு ஒரு 'ரிப்பர்' மண்ணை 14,000 ரூபாய் கொடுத்துத்தான் வாங்கவேண்டும். அப்பிரதேசத்தில் பல ஆறுகள் இருந்தாலும்கூட, அங்குள்ள மக்கள் தங்களுடைய தேவைகளுக்கு ஆற்று மண்ணை அகழ்ந்து பயன்படுத்துவதற்கு அனுமதிக்கப்படுவதில்லை. ஏற்கெனவே எங்களுடைய கட்சியைச் சேர்ந்த உறுப்பினர் இது தொடர்பில் சுற்றாடல் அமைச்சர் அவர்களிடம் பேசியபோது அவர் தனது கருத்தைச் சொல்லியிருந்தார்.

தற்பொழுது, அனுராதபுரத்தில் ஆற்று மண் அகழ்வு நடவடிக்கைகள் இடம்பெற்று வருகின்றன. இவை எவ்வாறான சட்ட வரையறைக்குள் இடம்பெறுகின்றன என்பது பற்றிக் கண்டறியப்படல்வேண்டும். அங்குள்ள ஒவ்வோர் ஆற்றுப் பகுதிகளிலிருந்தும் மண்ணை அகழ்வதற் கென முகவர்கள் இருக்கின்றார்கள். நாங்கள் அவர்களிடம் மண் அகழ்வு அனுமதி தொடர்பான கேள்விகளைக் கேட்டால், அதற்கு அவர்கள் அநுராதபுரத்தில் பெற்ற அனுமதிப்பத்திரத்தைக் காட்டுகின்றார்கள். ஆனால், அவர்கள் எந்த வழியைக் கையாண்டு அதனைப் பெற்றிருக்கின்றார்கள் என்பதைக் கண்டறியவேண்டுமென நான் கௌரவ அமைச்சர் அவர்களிடம் மிகவும் விநயமாகக் கேட்டுக்கொள்கின்றேன். ஏனெனில், அண்மைக்காலங்களில் இடம்பெற்ற இயற்கை அனர்த்தங்களினால் மன்னார் மாவட்ட மக்கள் வேறு இடங்களுக்கு இடம்பெயரவேண்டிய நிலை ஏற்பட்டது என்பது உங்களுக்குத் தெரியும். இதற்குக் காரணம் இந்த ஆறுகளிலிருந்து மண் அகழப்படுவதேயாகும். எனவே, இதனைக் கடுப்படுத்தவேண்டும். இது தொடர்பில் கௌரவ அமைச்சர் அவர்கள் முனைப்புடன் செயற்படவேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். எங்களுடைய பிரதேசத்தில் இடம்பெறுகின்ற ஆற்று மண் அகழ்வு நடவடிக்கைகளினால்

அங்குள்ள மக்கள் மிகவும் கஷ்டப்படுகின்றார்கள். அதுமட்டுமன்றி, அவர்கள் தங்களுக்குத் தேவையான வீடுகளைக் கட்டுவதற்கு மற்றும் சிறுதேவைகளைப் பூர்த்திசெய்வதற்குப் பலமடங்கு விலைகொடுத்து ஆற்று மண்ணை வாங்கவேண்டிய நிலை ஏற்பட்டிருக்கின்றது. எனவே, மண் அகழ்வுக்காக வழங்கப்பட்டிருக்கின்ற அனுமதிப் பத்திரங்களை மீளாய்வு செய்து, அப்பிரதேச மக்களுடைய முக்கிய தேவைகளுக்கு மண்ணை அகழ்வதற்கு அனுமதி வழங்கலாம். அதேவேளை, இந்த அகழ்வின்போது குழிகளை ஆழமாகத் தோண்டுவதைத் தடுப்பதற்கான நடவடிக்கையையும் கௌரவ அமைச்சர் அவர்கள் மேற்கொள்ளவேண்டுமென்று நான் இச்சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்கின்றேன்.

அடுத்து, எதிர்காலத்தில் வடக்கு, கிழக்கு மாகாணங்களிலுள்ள பெருவாரியான கிராமங்கள் கடல் அரிப்பின் காரணமாக அழிந்துபோகக்கூடிய சாத்தியக்கூறுகள் காணப்படுகின்றன. குறிப்பாகத் திருகோணமலை, மட்டக்களப்பு மாவட்டங்களின் பல பகுதிகளிலும் மன்னார் மாவட்டத்தின் அரிப்பு, சிலாவத்துறை, பேசாலை மற்றும் தலைமன்னார் ஆகிய பகுதிகளிலும் யாழ். மாவட்டத்தின் பலாலி, காங்கேசன்துறை, வல்வெட்டித்துறை ஆகிய பகுதிகளிலும் கடல் அரிப்பானது மிகமோசமாகக் காணப்படுகின்றது. எனவே, இதனைக் கட்டுப்படுத்துவதற்கான நடவடிக்கைகளை அரசாங்கம் மேற்கொள்ளவேண்டும். 2012ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்ட உரையில் இதனைத் தடுப்பதற்கான சில வேலைத்திட்டங்கள் குறிப்பிடப்பட்டபொழுதிலும்கூட, அவை இதுவரை நடைமுறைப்படுத்தப்படவில்லை. இதனால், சுனாமி போன்ற அனர்த்தங்கள் ஏற்படுகின்றபொழுது, கடற்கரையோரங்களை அண்டிய கிராமங்கள் கடலுக்கு உள்வாங்கப்படுகின்ற, அதாவது அவை முற்றாக அழிகின்ற - ஒட்டுமொத்த அழிவை எதிர்நோக்குகின்ற - நிலை ஏற்படும் என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். இயற்கையைச் சீண்டுவதன் காரணமாகத்தான் - மண் அகழ்தல் மற்றும் காடுகளை அழித்தல் போன்ற செயற்பாடுகளினால்தான் பூகம்பம், வெள்ளப்பெருக்கு போன்றவை ஏற்படுகின்றன என்று ஆய்வறிக்கைகள்மூலம் தெரியவருகிறது. அந்த வகையில், எங்களுடைய நாட்டைப் பொறுத்தமட்டிலே கடலரிப்பு என்பது மிக மோசமான ஒரு நிலையை எட்டியிருக்கிறது. அதனைத் தடுப்பதில் கவனம் செலுத்த வேண்டும். இல்லையென்றால் எங்களுடைய மக்களைக் காப்பாற்ற முடியாத ஒரு நிலைக்குத் தள்ளப்படுவோம். சுனாமி எப்படி எங்களுடைய மக்களை ஆட்கொண்டதோ அதேபோல சிறியளவிலான இயற்கை அனர்த்தங்கள் ஏற்படுகின்றபோதும்கூட கடலின் ஆதிக்கம் அதிகமாக இருக்குமென்பதை இங்கு நான் குறிப்பிட விரும்புகின்றேன்.

இன்னொரு விடயத்தையும் குறிப்பிட விரும்புகின்றேன். அதாவது, எங்களுடைய பிரதேசத்திலே பவளப் பாறைகள் அதிகமாகக் காணப்படுவதால் மீன்கள் பெருகுவதற்கான வாய்ப்புக்களும் அதிகமாகும். இந்த பவளப்பாறைகள் இன்று அழிக்கப்பட்டு வருகின்றன. அதற்கு முக்கிய காரணம் இந்திய 'ரோலர்'களின் வருகையாகும். பெரிய அளவினதாகக் காணப்படுகின்ற இந்திய 'ரோலர்'கள் கடலிலே செல்கின்றபோது பவளப்பாறைகள் உடைக்கப்படுகின்றன. அவற்றின் வலைகள் - மடிகள் சங்கிலியால் பிணைக்கப்பட்ட இழுவை மடிகளாகக் காணப்படுகின்றன. அவற்றை இழுத்துக்கொண்டு போகின்றபோது கடலிலுள்ள உயிரினங்களும் அந்த மடிக்குள் செல்வதால் கடல்வாழ் உயிரினங்கள் அருகிவருகின்றன. இந்த நிலைமை தொடருமானால், ஒரு குறிப்பிட்ட காலப்பகுதிக்குள் எங்களுடைய மீனவர்கள் கடலுக்குச் சென்று தொழில் செய்வதற்கான வாய்ப்பை இழக்கக்கூடுமென்ற அச்சம் நிலவுகின்றது. எங்களுடைய மீனவர்களுக்கு வழமையாகக் கிடைக்கின்ற மீன் வகைகள் இப்பொழுது குறைந்திருக்கின்றன. அவர்கள் தூர இடங்களுக்குச் சென்று தொழிலை மேற்கொண்டாலும்கூட அவை குறைந்தளவிலேயே பிடிபடுகின்றன. ஆகவே, இத்தகைய இயற்கை வளங்கள் அழிக்கப்படுவதைக் கட்டுப்படுத்துவதற்கென இயற்றப்படுகின்ற சட்டங்கள் சரியானமுறையிலே, நீதியானமுறையிலே அமுல்படுத்தப்பட வேண்டும். தங்களுக்குத் தேவையானவர்களுக்கு விட்டுக்கொடுத்து ஏனோதானோ என்ற ரீதியில் நடந்துகொள்ளும் நிலை ஏற்படுமாக இருந்தால், வேறொரு தொழிலை நாடிச் செல்லவேண்டிய ஒரு நிலை நிச்சயமாக எங்களுடைய மீனவ சமூகத்துக்கு ஏற்படலாம். ஆகவே, இந்த கடல்சார் தீழ்ப்புத் தடைச் சட்டத்தின் கீழான இந்த ஒழுங்குவிதிகளை அமுல்படுத்துவதில் கூடிய கவனம் செலுத்த வேண்டும்.

மேலும், இந்திய 'ரோலர்'களின் பிரச்சினை என்பது அன்றிலிருந்து இன்றுவரை பாரிய பிரச்சினையாகவே இருக்கின்றது. இந்த விடயத்தில் இலங்கை அரசினதும் இந்திய அரசினதும் பேச்சுவார்த்தையில் எப்படி இணக்கம் காணப்படப்போகின்றதென்பது கேள்விக்குறியாக இருக்கின்றது. தமிழ்நாட்டிலிருந்து கச்சதீவுக்கு வந்து தொழில் செய்பவர்கள் எமது மீனவர்கள் தங்களைத் தாக்குவதாகச் சொல்கிறார்கள். ஆனால், இங்கே எங்களுடைய மீனவர்களின் அவல நிலையை நான் நேரடியாகவே பார்த்திருக்கிறேன். இரவிலே பார்த்தால் ஒரு கிராமமே கடலுக்குள் நிற்பது போன்று காட்சியளிக்கும். அந்தளவுக்கு நூற்றுக்கும் மேற்பட்ட இந்திய 'ரோலர்'கள் எங்களுடைய கடல் எல்லைக்குள் வந்து செல்கின்றன. இத்தகைய செயற்பாடுகள்தான் இங்கே காணப்படுகின்றன. எங்களுடைய மீனவர்கள் தங்களின் தொழிற்செயற்பாட்டை சிறிய வள்ளங்களைக் கொண்டுதான் மேற்கொள்கின்றார்கள். பெரிய 'ரோலர்'கள் அவர்களிடம் இல்லை. பொதுவாக அந்த மீனவர்கள் தங்களுடைய வலைகளை முதல்நாள் இரவிலே விரித்துவிட்டு அடுத்தநாள் காலையிலே போய் அவற்றைப் பார்ப்பார்கள். நூற்றுக் கணக்கிலே இந்திய 'ரோலர்'கள் வருவதால் அவர்களுடைய மீன் வளங்கள் இல்லாமற் செய்யப்படுகின்றன. இதனால் தமிழ்நாட்டு மீனவர்களுக்கும் எங்களுடைய மீனவர்களுக்கு மிடையிலே முறுகல்நிலை ஏற்படக்கூடிய வாய்ப்புக்கள் கூடுதலாக இருக்கின்றன. இந்த விடயத்தில் மேற்கொள்ளப்பட வேண்டிய நடவடிக்கைகள் பேச்சளவிலேதான் இருக்கின்றதேயொழிய இதற்கு ஒரு தீர்வு கிடைப்பதற்கான வாய்ப்புக்கள் மிக அரிதாகவே இருக்கின்றன. ஆகவே, இந்த விடயத்திலே அரசு கவனம் செலுத்த வேண்டும்.

இந்திய 'ரோலர்'களின் வருகைபற்றி நாங்கள் சொல்லிக்கொண்டிருக்கின்றோம். ஆனால், அதேநேரத்திலே, தொழிற்சாலையொன்றைக் கட்டுவதற்காக முள்ளிவாய்க்கால் பிரதேசத்திலே இருக்கின்ற கடலை அண்டிய பகுதியைச் சீனாவுக்குக் கொடுத்துவிட்டதாகச் சொல்கிறார்கள். இந்த நிலைமையில் இந்த அரசு எப்படி தன்னுடைய மக்களைக் காப்பாற்றப்போகின்றது? இந்த நாடு வெறும் பணத்தை மாத்திரம் சம்பாதிக்கின்ற அல்லது இலாபத்தை மாத்திரம் எதிர்நோக்குகின்ற சிந்தனையோடுதான் செயற்படுகின்றதா? அல்லது இந்த நாட்டிலே வாழுகின்ற ஒவ்வொரு குடிமகனையும் நல்லதொரு குடிமகனாக வாழ்வதற்கான வாய்ப்பை ஏற்படுத்த விரும்புகின்றதா? என்ற கேள்வியை நான் கேட்க விரும்புகின்றேன். ஏனென்றால், இன்றைக்கு தொழில் செய்வதற்காக வருகின்ற இந்திய 'ரோலர்'கள் மற்றும் வெளிநாட்டுக் கப்பல்களினால் எங்களுடைய இயற்கை வளங்கள் அழிக்கப்படுகின்றன. அத்தோடு, வெளிநாட்டிலிருந்து வருகின்ற கப்பல்கள், 'ரோலர்'கள் என்பவற்றினுடைய எரிபொருட்கள் கடலுக்குள் கலக்கின்றபோது கடல் மிகவும்

[ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා]

மாசடைகின்ற ஒரு நிலை ஏற்படுகின்றது. ஆகவே, அரசாங்கம் இதில் முழுக் கவனத்தையும் செலுத்தவேண்டும். ஏனென்றால், இந்திய மீனவர்கள் 'ரோலர்'களில் வந்து எங்களுடைய கடற்பரப்பிலே மீன் பிடிப்பதால் எங்களுடைய மீனவர்கள் தொழில் செய்வதில் பல பிரச்சினைகளை எதிர்கொள் கிறார்கள். இதனால் அன்றாடம் அவர்கள் தமது ஜீவனோபாயத்துக்காகக் குரல்கொடுக்க வேண்டியிருக்கிறது. அத்தோடு, 'பாஸ்' முறை, கரைவலை இழுக்கும் பகுதியான பாடு இல்லாமை போன்ற பிரச்சினைகள் இன்றைக்கும் இருக்கின்றன. அது முல்லைத்தீவு மாவட்டத்திலே ஒரு பாரிய பிரச்சினையை உருவாக்கியிருக்கிறது. இந்தவகையிலே வெறும் பேச்சுக்களோடும் சட்டங்களைக் கொண்டுவருவ தோடும் இருந்துவிடாமல், சட்டங்களை நடைமுறைப்படுத்து வதற்கான வழிகளைக் கையாளவேண்டும். ஊழல்கள் நடக்கின்றபோது சட்டங்களை நடைமுறைப்படுத்துவதற்கான வாய்ப்புக்கள் குறைவாக இருக்கும்.

இன்றைக்கு எங்களுடைய பிரதேசங்களிலே நடைபெறு கின்ற அநீதிகளைப்பற்றிக் கேட்கின்றபோது, அவற்றின் பின்னணியில் யாராவது ஓர் அமைச்சர் இருப்பது தெரிய வருகின்றது. இவ்வாறு அரசாங்கத்தோடு சம்பந்தப்பட்டவர்கள் பின்னணியில் இருக்கின்ற நிலைமை காரணமாக அதைத் தட்டிக்கேட்கின்ற வாய்ப்பு அதிகாரிகளுக்கும் இருக்காது. ஆகவே, அந்தப் பின்னணியை நீங்கள் கண்டறிந்து - அது அமைச்சராக இருக்கலாம் அல்லது வேறு யாராகவேனும் இருக்கலாம் - அதை உடனடியாக நிறுத்துவதனூடாகத்தான் எங்களுடைய வளங்களைக் காப்பாற்றமுடியும். தனிப்பட்ட அமைச்சரோ அல்லது அதிகாரியோ தன்னுடைய "பொக்கட்"டிலே இலாபத்தைப் பெற்றுக்கொண்டு தான் - தன்னுடைய பிள்ளைகள் - தன்னுடைய சந்ததி மட்டும் வாழ்ந்துவிட்டால் போதுமென்றிருந்தால், அது இந்த நாட்டுக்கு நல்லதொரு சகுனமாக இருக்கமுடியாது. ஆகவே, நல்ல விடயங்களை ஏற்படுத்துகின்ற சட்டங்களை இந்த நாடாளுமன்றத்திலே கொண்டுவருகின்றபோது அதை நடைமுறைப்படுத்துவதற்கான வாய்ப்பையும் ஏற்படுத்த வேண்டும். இந்தச் சட்டங்களை வெறுமனே மக்களை ஏமாற்றுவதற்காக உருவாக்குவதாக இருக்கக்கூடாது. ஆகவே, அமைச்சர்களாக இருக்கலாம், அரசாங்க அதிகாரிகளாக இருக்கலாம், அவர்கள் மக்களுக்கு நன்மை செய்பவர்களாக இருக்க வேண்டும் என்பதுதான் எங்களுடைய கோரிக்கையாக இருக்கிறது.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

கௌரவ உறுப்பினர் அவர்களே! உங்களுக்கு இன்னும் ஒரு நிமிடம் இருக்கிறது.

**ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)

ஆகவே, எங்களுடைய கடல் வளத்தை நாங்கள் காப்பாற்றுவதாக இருந்தால், எங்களுடைய மீனவர்களின் அபிலாஷைகளை முதலில் நிவர்த்தி செய்யவேண்டும். அத்துடன் கடல் வளத்தையும் இயற்கை வளங்களையும் அழிக்கின்ற சக்திகளை இனங்கண்டு, அவற்றுக்குக் காரண மானவர்களைத் தண்டிக்கின்றபோதுதான் இந்தச் சட்டங்கள் இயற்றியதன் பயனை அனுபவிக்கலாம் என்று கூறிக் கொண்டு, வாய்ப்பளித்ததற்கு நன்றிகூறி விடைபெறு கின்றேன்.

[4.28 p.m.]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

*Bismillahir Rahmanir Raheem.*

Mr. Presiding Member, it is my privilege today to speak on the Regulations moved by the Minister of Environment under the Marine Pollution Prevention Act, which is very timely and important as far as our tiny island is concerned.

The Hon. (Ven.) Ellawala Medhananda Thero put it right when he said that this is a small island and we all must get together to protect it. The most important thing is to protect the environment. If we interfere with the environment and the nature, the nature will punish you, the environment will punish you. That is the divine order. Therefore, we are born in this world in order to sustain our environment and maintain our nature. What is now happening is quite contrary to that.

I was able, Sir, to attend a conference held on 26th October, 2010 at Nagoya, Aichi, Japan and I have here with me the "Natural Capital Action Plan" endorsed at the Nagoya Parliamentarians Forum. My very good Friend, the Hon. Anura Priyadharshana Yapa also participated in a parallel conference at Nagoya at the same time. There I was searching for the Hon. Minister and he was searching for me because we were having a common goal in order to protect the environment. Sir, at the end of the Forum, under the Marine Ecosystems Recovery Strategy, they passed a resolution that all Parliaments in the world must bring in regulations based on the policy proposals that were adopted. Then, under the heading, "Part 2: Policy Proposals for Tropical Coral Reef Ecosystems," of the Report, "A Marine Ecosystems Recovery Strategy", it states, I quote:

> "Tropical shallow-water coral reefs are critically threatened by the cumulative and synergistic effects of climate change and direct human impacts."

I further quote:

> "The coral reef crisis is also a crisis of management. All but the most remote coral reefs have already been heavily impacted by direct human pressures.

That is the most important thing for us to pay our attention. It goes on:

> "Overfishing, destructive fishing practices, coastal pollution and coastal development account for most of these impacts, which not only destroy and degrade coral reefs but also considerably reduce their resilience to the effects of climate change."

I stated at this Conference that we have one of the finest coral reefs in Hikkaduwa, down South, where thousands and now lakhs of tourists, visit. Again

I quote:

"Increasing coral reef resilience by reducing direct human impacts will slow the rate of coral reef degradation caused by climate change, and, if $CO_2$ levels peak at or below 450 ppm, could prevent eco system collapse."

We must be warned about this.

Then, Item 2, under the heading, "Marine Protected Areas Coverage and Effectiveness" states, I quote:

At least 30 % of the world's coral reefs should be effectively managed in no-take marine protected areas (MPAs).

MPA designation and implementation: Well enforced protected areas can be very effective in reducing human impacts on coral reefs. A minimum of 30% protected area coverage for habitats is recommended to achieve ecosystem health. It is important to establish legislation mandating a target level of marine protected area coverage for coral reefs..."

Item 3 of the Report refers to "Water quality policy". This takes a prime place in the protection of the environment. It is not only an individual effort by the Minister, my good Friend, the Hon. Anura Priyadharshana Yapa, but also the effort of the Deputy Minister, the Hon. A.R.M.Abdul Cader, who is always very worried about pollution of the environment, especially air pollution. He is doing a good job of work and helping the Minister in a large scale in order to protect the environment.

Under "Water quality policy", it states:

"Land-based water pollution policies must be complemented by strong marine water quality targets and monitoring."

That is exactly a part of the job the Hon. Dinesh Gunawardene is handling. It further states:

"Legislators should pursue comprehensive legislation mandating a reduction of all major pollutants in coral reef waters to at least half of 2010 levels……."

Today, we have to learn a lesson from Japan on how they protect the ecosystem, the biodiversity and the coral reefs.

Then, Sir, under "Coastal Zone Planning" it states:

"Backed up by legislation to ensure the refusal, relocation or sufficient damage mitigation for all development projects identified by EIAs to have a negative impact on coral reefs."

The present Japanese Ambassador is also very keen in this respect. He has made certain suggestions and expressed sentiments sometime ago when he presented his credentials to the President. Emperor Hirohito and the present Japanese Prime Minister, Yoshihiko Noda have all been very much interested in this because they know how Hiroshima and Nagasaki had suffered those days. Still the people are affected by eating fish in the Pacific Ocean. That shows the extent of the calamity the Japanese people faced at that time.

Sir, I now quote from "Principles for Action" of the Report:

"IX. National governments should join and actively participate in all relevant international and regional fora for coral reefs, particularly the international Coral Reef Initiative (ICRI) and the UNEP Regional Seas Programme.

X. "Parliaments should ratify and adopt robust implementing legislation for all international and regional conventions and protocols..., "

This is exactly what our Minister of Environment is endeavouring to do today. In fact, I have given notice of a Motion to include this in our Constitution and also in the Marine Policy. It further states:

"... including the Convention on Biological Diversity (CBD), the Convention on International Trade in Endangered Species (CITES) and the Intergovernmental Science-Policy Platform on Biodiversity and Ecosystem Services (IPBES)."

Now, Sir, there are certain Members in this House who always see the negative side of a positive development.

My good Friend, the Hon. Harin Fernando, spoke about , මුල් ගල් තැබීම. නුවර මුල් ගල් තැබීම ගැන, යාපනයේ මුල් ගල් තැබීම ගැන කිව්වා. මෙහේ තෙල් මිල වැඩි වෙනවාලු, යාපනයට මුල් ගලක් තබනවාලු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක හොඳ නැද්ද? ඔබතුමා යාපනයේ ඉපදුනේ නැති වුණාට, එහි කරන දියුණුව නේ මේ කියන්නේ. කුරුණෑගල මුල් ගලක් තැබුවාලු. "නෙළුම් කුලුන", පොළොන්නරුව රාජධානිය යුගයේ නෙළුම් කුලුන ගැන අපේ ස්වාමින්වහන්සේ ලස්සනට කිව්වා. ඒවා නැත්නම් මොකටද? එහෙම නම් මේ ගොල්ලන්ට අභිවෘද්ධිය එපාද? මේ ගොල්ලන්ට දියුණුව එපාද? ඒක තමයි අපේ TNA එකේ සහෝදරවරු කියන්නේ. අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා කිව්වා, මෙහේ රත් හඳුන්, සුදු හඳුන් තිබිලා තිබෙනවාය කියලා. ඒ දවස්වල අපි ඒවා ගෙනෙන්නේ හිමාලය වනයෙන්. රුහුණේ පරුකච්ච වරාය සහ මාගම්පුර වරාය අතර ඇති වී තිබෙන සම්බන්ධකම ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද ස්වාමින්වහන්සේ ඉතාමත් ලස්සනට පැහැදිලි කළා. එපමණක් නොවෙයි, උන්වහන්සේ විසින් පොතක් ලියලා තිබෙනවා. ඒක තවම දොරට වැඩලා නැහැ. ඒ වුණත්, පුරාවිද්‍යා චක්‍රවර්තී, පුරාවිද්‍යා පරීක්ෂණ ශූරී පූජ්‍ය එල්ලාවල මේධානන්ද හිමිපාණන්ගේ අනුදැනුම අනුව මාගම රාජධානිය,- අපේ ඉතාහාසයේ ශ්‍රී විභූතිය පෙන්නුම් කරන ඉතාමත්ම වටිනා ග්‍රන්ථයක්- කොළඹ යුගයේදී ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමියන් විසින් ලියන්නට හේතු භූත වීම ගැන අපි ඉතාමත්ම සන්තෝෂ වෙනවා. රුහුණු පුරය පිළිබඳව උන්වහන්සේ එම ග්‍රන්ථයේ පෙරවදනේ කියනවා, "රෝහණ රාජ්‍යයේ හෙළි වී ඇති ඉතිහාසයට වඩා වැළලී ඇති කොටස විශාලයි." කියා. අන්න ඒක දැන් හෙළි වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් බලන්න මේ රටට මොකක් හෝ විජාතික බලපෑමක්, උවදුරක් සිද්ධ වෙන කොට දෙවි දේවතාවුන් වහන්සේලාගේ ආශිර්වාදය ලැබෙනවා. තමුන්නාන්සේ දන්නවා ඇති, මීට පෙර රත්නපුර ප්‍රදේශයේ පමණයි මැණික් තිබුණේ කියලා. මාගම්පුර මැණික් දැන් එනවා. ඇයි, උවදුරු එන කොට, ජිනීවාවලට යනකොට, විජාතික කුමන්ත්‍රණ ඇති කරන කොට, රටට පහළ වූ නායකයෙක්, පිනට පහළ වූ නායකයෙක් ඉන්න කොට ජනතාවගේ පිනට රුහුණු මාගම්පුරයේ දැන් මැණික් මතු වෙනවා.

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

இவ்வளவு காலமாக மாணிக்கக்கல் தோண்டியது இரத்தினபுரி மாவட்டத்தில். எங்களுக்கு என்.டீ.எச். அப்துல் கபூர் அவர்களைப்பற்றி நன்கு தெரியும். அதேபோல், நளீம் ஹாஜியார் அவர்கள் அங்கு சிங்கள மக்களோடு மிகவும் நெருங்கிய உறவை ஏற்படுத்துவதற்காகவேண்டி இரத்தினபுரி மாணிக்கக்கல் வியாபாரிகள், அகழ்வுசெய்தவர்கள் உதவினார்கள். ஆனால், இப்பொழுது பாருங்கள்! இந்த நாட்டுக்கு வெளிநாட்டிலிருந்து அனர்த்தங்கள் வரும்பொழுது - அந்த சதிகாரக் கும்பல்கள் உள்நாட்டு சக்திகளோடு சேர்ந்து சதி வேலைகளில் ஈடுபடும்பொழுது - இறைவன் இந்தப் பூமியிலே றுஹுணு மண்ணின் வயிற்றிலிருந்தும் மாணிக்கக்கற்களைப் பிரசவம் செய்கின்ற அற்புதமான காட்சியை இந்தக் காலகட்டத்தில் பார்த்து வருகின்றோம்.

එම නිසා මම වැඩිය කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. රෝහණ පුරයේ පුරාවස්තු මෙන්ම අභිලේඛන ආදිය ගැනද විස්තර තරමක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් පළ කර තිබෙනවා. එහෙත් පළ වී නැති කොටස් රාශියක්ම ගවේෂණය කරන්න ඕනෑ. උන් වහන්සේ ගවේෂණය කරනවා. හැම තැනම යනවා. රටේ ශ්‍රී විභූතිය, අපේ ඉතිහාසය ගෙනහැර පාලා උන්වහන්සේ කරන සේවය පිළිබඳව අපි මේ සභාවේදී උන්වහන්සේට අපගේ ශුභාශිංසනය පුද කරන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි මම තවත් දෙයක් කියන්නට කැමැතියි. ගරු අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා කියනවා, අපේ ධීවරයෝ,- [බාධා කිරීමක්]අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා සිංහල දන්නවාද?

எங்களுடைய மீனவர்களுக்கும் தமிழ்நாட்டிலிருந்து வருகின்ற மீனவர்களுக்கும் என்ன நடக்கின்றது? ஒரு பக்கத்தில் அவர்களுக்கு எந்தவித விமோசனமும் இல்லை. பாரத நாட்டின் முன்னாள் குடியரசுத் தலைவர் - ஜனாதிபதி - அப்துல் கலாம் அவர்கள் எங்களுடைய நாட்டுக்கு விஜயம் செய்திருந்தார். அவரோடு நாங்களும் யாழ்ப்பாணம் சென்றி ருந்தோம். எங்களுடைய அன்புக்குரிய நண்பர் அடைக் கலநாதன் அவர்களும் வந்திருந்தார். யாழ்ப்பாணத்தில் நடை பெற்ற கூட்டத்தில் இவர்களை எல்லாம் ஒன்றுகூட்டி, ஓர் அருமையான யோசனையைச் சொன்னார். அதை இவர்கள் மறந்துவிடக்கூடாது. அவர் என்ன யோசனையைச் சொன்னார் தெரியுமா?

He advised the fishermen. This problem was brought out by the fishermen's representatives when they met him there. Mr. Ashok K. Kantha, the amiable High Commissioner of India, was also present. Some of the Tamil Members of Parliament including the Hon. Selvam Adaikkalanathan were also present. After all, in order to avoid clashes, he said: "Where there is fish, there will be fishermen. They cannot care for borders because they do not know. Where there is fish, they will run after the fish. Therefore, the fishermen both across the Palk Strait and Sri Lanka, can agree to fish at a certain period of time. You can ask the others to fish for one or two months and they will go to the waters during that period. By doing so, this could be settled".

What has happened in Kachchativu? Fishermen from both countries met. The Hon. Adaikkalanathan seems to be missing from the House now. Sir, that story is published on the front page of "Ceylon Today" of 5th March, 2012 captioned "Kachchativu feast concludes successfully" reported by Lanka Paranamanna from Kachchativu.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
You have one more minute, Hon. Azwer.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I will take the time allotted to the Hon. Hisbullah also. Please permit me to speak.

Sir, these are the things that will be told to the "Wikipedia" and I do not know what the other "pedia" is. The diaspora-interested people are spying on us and are hell-bent in order to dislodge the best batsman at the governing crease in the world, that is His Excellency President Mahinda Rajapaksa. They cannot dislodge his wicket that easily. He will live long because God has blessed him by giving gems in the land that he was born - Magampura, Hambantota. There are some pictures published on page 7 of the same newspaper, under the title "Undying devotion". The Hon. Douglas Devananda, our Minister, went there. He sat with both the fishermen from India and Sri Lanka who came in boats.

Sir, in the past, there was a girl who was shown on TV saying, "we go there, make love and sometimes we get married". The Sri Lankan boys go to India; the Indian boys come to Sri Lanka. These types of things have happened in good environmental background. - [*Interruption.*] - That girl was relating it. I did not go to see that. The Hon. Minister of Environment or the Deputy Minister can go there because they have to protect the environment there also.

Then, what did the Hon. Douglas Devananda do? He spoke to the fishermen of both countries. What the Hon. Douglas Devananda, said is very significant. He said "all these days, we were partial and listening to our fishermen. Now, we have come to Kachchativu, the common place where both of us can meet, eat, celebrate, discuss and exchange friendly banters. Now, we have studied your problems. You have related all the problems to us. Therefore, now there is no problem; we both can tackle this on a common platform. That should be the way. Even the people from Kachchativu help us. Some people in India wanted to take Kachchativu away. They are threatening the Government of India but that will never happen. That is what I always say." I know my Friends from the TNA - formerly they were a federal party- from the time of Thanthai S.J.V. Chelvanayakam. I have been associated with the leaders of that party, the late Hon. A. Amirthalingam, the Hon. Chelliah Rajathurai and a whole lot of them. Sir, they have lived enough; we have lived enough in this world, in our

beautiful island. Our generation has got to live. What are we going to do? Are we to go to the diaspora and all the international fora with a begging bowl ? What can the diaspora do? You could see the result at Geneva. They themselves have understood. All the Muslim countries and the African countries have pledged support for us. Now, they have come to the stage asking us to speed up the implementation of recommendations of the LLRC. That is what exactly the Mahinda Rajapaksa regime is trying to do. Therefore, it is a futile attempt on the part of those Sri Lankans.

After all, a Tamil who is born in this country is a Sri Lankan. You maybe a Tamil or a Sinhalese. I am a Muslim. But, when we die, Sir, our bodies are not taken to Rameswaram, to Delhi, or any other place in Hindu Kush or the Himalayan border.

They are buried here. When we die, we are buried here. Our bodies are not taken to Riyadh, Jeddah, Kuala Lampur or Karachi. Normally, Sir, if we are in Colombo, we will be buried in Maligawatte, Kuppiyawatte or Jawatte. These are the three *wattes* in Colombo, that we will seek refuge at last in this life.

I reiterate that I am very sorry about the Hon. Sampanthan. - [*Interruption.*] You are going to take him to Norway. But, he finds no way. Let him find a way. Please ask him, teach him, and show him where to find a way. What is the use? His grandchildren - I know them and wish them well - are in London, they are doctors. They are still there studying. You know that even Somawansa's children are studying in the UK. Prabhakaran's children were studying abroad. Now, this is why they say they do not want development.

பாலங்கட்டுவிப்பதற்காகவும் பாதை போடுவிப்பதற்காக வும் தாங்கள் இந்தச் சபைக்கு வரவில்லையென்று தமிழ்த் தேசியக் கூட்டமைப்பு உறுப்பினர்கள் கூறுகின்றார்கள். அப்படியென்றால், எதற்காக இச்சபைக்கு வந்தீர்கள்? தேங்காய் துருவுவதற்காகவா வந்தீர்கள்? என்று நான் அவர்களிடம் கேட்கின்றேன். பாருங்கள்! இன்று துறைமுகங்கள் பல நிறுவப்படுகின்றன. காங்கேசன்துறைத் துறைமுகம்கூட அபிவிருத்தி செய்யப்படுகின்றது. இங்கே பாருங்கள்! எந்த நேரத்திலும் சொல்லப்படுகின்ற ஒரு பெயர் என்ன தெரியுமா?

Dr. Priyath B. Wickrama is the Chairman of the Sri Lanka Ports Authority.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Member, you have taken five minutes from the Hon. Minister's time.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, he gave me 12 minutes. The Hon. Hisbullah had given me his time. I will take another two or three minutes and wind up. So, Sir, Dr. Priyath B. Wickrama is in charge of the Ports Authority. A dedicated officer, any clever person - be it a Secretary, a Director or a Chairman of a corporation - will leave no stone unturned without attacking them in this House. These Government officials cannot come here and reply. Now, read the Magazine called "TARGET" of September, 2010. I quote:

" The Ceremonial Intake of Seawater into the Hambantota Harbour"

The Hambantota Harbour is being built; the Oluvil Harbour is being built. So many other harbours have been built. The Mattala Airport is coming up. These are developments in the modern age. What do they want us to do? Get into the tar barrel and die? Let them do that. That is why I speak in that tone to my very good Friend of the TNA. Now, they have understood. They are also now divided. Their party is divided into two or three groups. There is the Sampanthan group; the Mavai S. Senathirajah group and the Adaikkalanathan group. All these groups are fighting: "Why did we not go to Geneva? We should go". "No, we should wait here and carefully monitor the events". Okay, very good! You monitor them and live as Sri Lankans. Let your people enjoy life in our country in the future as well. They have a sure future.

When we go abroad, we come across people who ran away during the Black July in 1983. We went to the various cities in America. What do they say?

"நாங்கள் யாழ்ப்பாண மாம்பழம் உண்ண வேண்டும். இரண்டாவது, மூன்றாவது தலைமுறையினரான எங்களு டைய பேரப்பிள்ளைகள் அங்கே இருக்கின்றார்கள். நாங்கள் மீண்டும் யாழ்ப்பாணத்துக்குப் போக வேண்டும். அங்கே சூடுபட்ட நிலையிலே, குண்டுகள் துளைத்த நிலையிலே எங்களுடைய வீடுகள் இருக்கின்றன. நாங்கள் ஒருநாளைக்கு அங்கே போக வேண்டும். தெய்வமே! அவற்றைக் காப்பாற்றித் தாருங்கள்!"

Do you know, Sir, actually what is happening? Every Tamil and Muslim or anybody living in UK or in the so-called super power, the United States of America - America is doing all the villainous things. They want to control the whole world. Are we going to fall prey for that? No. We are a self-respecting nation. We have in our country enough rice, enough yams, enough *herali,* enough போதிய கீரை வகைகள் We are self sufficient in rice. Therefore Sir, nobody can make us cow down to their dictates.

So, Sir, I was just talking about this harbour. I again quote the magazine "TARGET":

"As Sri Lanka forges ahead to become the Wonder of Asia, one of the five hubs that are being developed is the naval and maritime centre. Hambantota Harbour is a pillar stone towards achieving this goal. "

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

His Excellency Mahinda Rajapaksa, the Chairman Dr. Priyath B. Wickrama and our Speaker, the Hon. Chamal Rajapaksa, the Hon. Basil Rajapaksa and the Hon. Namal Rajapaksa are all there.

Therefore, Sir, all these things add to our future prosperity of the country. That is what I am trying to say. We never neglected development, Sir, during the time of the war also - this is a very significant factor that the Western countries have taken note of. When the war was going on in the Eastern Province, 54 bridges were built over there. After that, it is still continuing. That is development. Those have been built when the war was going on. That is a great achievement. That is why we call our country, "ආශ්චර්යවත් ලංකාව" in the 21st Century. We will go on and on flourishing.

When we speak of gems, there was an article recently in the "Daily News", edited by the veteran journalist, Latheef Farook, on the land of gems - I do not want to read it for want of time - "Spain - Land of Gems".

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
You have taken ten minutes from the Hon. Minister's time.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I say Sri Lanka's Land of Gems today is Magampuraya in the deep South.

Thank you very much.

[අ.භා. 4.52]

**ගරු දිලිප් වෙදආරච්-චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1981 අංක 59 දරන පනතින් ස්ථාපිත 2008 අංක 35 දරන පනතින් සංශෝධිත සමුද්‍රීයීය පරිසර ආරක්ෂණ අධිකාරිය යටතේ ගෙනෙන ලද සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනත යටතේ කැබිනට් මණ්ඩලය අනුමත කර ඇති නියෝග ගරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ අවස්ථාවේදී අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීමට මා අවසර පතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැනට තිබෙන පනතින් සමුද්‍ර දූෂණ අවම කිරීමට නීතිමය බලතල තිබෙනවා. අප රටට අයත් අනන්‍ය ආර්ථික කලාපය තුළ සිදුවන සමුද්‍ර දූෂණ වැළැක්වීමටත්, ඒ සම්බන්ධව නීතිය ක්‍රියාත්මක කිරීමටත්, වන්දි අයකර ගැනීමටත් ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානයේ සාමාජිකයෙකු ලෙස අප රටට අවසර ලැබී තිබෙනවා.

අද දින මෙම සභාවට ඉදිරිපත් කරන නියෝග සම්බන්ධව ගරු පරිසර අමාත්‍යතුමාට ස්තුතිවන්ත විය යුතු අතර විශේෂයෙන්ම අප රටේ මන්නාරම් ද්‍රෝණියේ තෙල් ගවේෂණ කටයුතුවලදී සමුද්‍රීය පරිසරය දැඩි ලෙස ආරක්ෂා කිරීමට වගබලා ගත යුතු බව මට හැඟෙනවා.

දැනට අප රටේ වෙළෙඳ වරායන් විසින් අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහන පහසුකම් සැපයීම සිදු කළත් බොහෝ ධීවර වරායවල්වලින් එම කටයුතු නිසි ලෙස ඉටු නොවන බව පෙන්වා දිය හැකියි. සමුද්‍රීය දූෂණ කිව්වාම දියඹ මුහුදේ සිදු වන මහා පරිමාණ දූෂණ පමණක් නොව, වෙරළ ආශ්‍රිත සමුද්‍ර පරිසරයේ සිදු වන පරිසර දූෂණ ගැනත් අවධානය යොමු විය යුතුයි කියා මට හැඟෙනවා. ඒ වාගේම විශේෂයෙන්ම වෙරළ ආශ්‍රිත පරිසරයේ පිහිටි ජීවී විශේෂයක් වන කොරල් පර සහ කුඩා මුහුදු ජීවීන් මෙන්ම සුරතල් මත්ස්‍යයින්ගේ ජීවී කාලය සහ ව්‍යාප්තිය ගැනත් දැඩි අවධානය යොමු කළ යුතු බව මට හැඟෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුහුදු ජීවීන්ගේ ව්‍යාප්තියට බලපාන කඩොලාන පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීමට මෙම පනතින් අවධානය යොමු කළ යුතුයි. දැනට වෙරළ සිට කිලෝ මීටරයක් දුරට රට ඇතුළට වන්නට තිබෙන කලපු සම්බන්ධව වෙරළ කලාප කළමනාකරණ නියෝග මාලාවෙන් ආවරණය ඇතත් එය නිසි ලෙස ක්‍රියාත්මක නොවන බව පෙනී යනවා. කොරල් පර සහ කොරල් පරිසරය ආශ්‍රිත ජීවීන්, කැස්බෑවුන් සම්බන්ධව ක්‍රියාත්මක වීමේ බලතල ඇත්තේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවටයි. මෙම පරිසර පද්ධතිය සමුද්‍රීය දූෂණ හේතුවෙන් දැඩි බලපෑමට ලක්ව ඇති කලාපයක්. එබැවින් මේ සම්බන්ධවත් මේ ගරු සභාවේ අවධානය යොමු විය යුතුයි කියා මා විශ්වාස කරනවා. ඒ වාගේම, ධීවර වරායවල්වල මසුන් ගොඩ බෑමේ සහ මසුන් ඇසිරීමේ කටයුතුවලදීත් විශාල ලෙස සමුද්‍ර දූෂණයක් සිදු වෙනවා. වරාය පරිශ්‍රයේම අපිරිසිදු මුහුදු ජලය නැවත නැවත පාවිච්චි කිරීමෙන් වරාය ආශ්‍රිත සමුද්‍ර පරිසරය දූෂණය වනවා පමණක් නොව, මසුන් විෂබීජ සමඟ මිශ්‍ර වී පාරිභෝගිකයාට නරක් වූ මාළු පරිභෝජනයට ගැනීමට සිදු වී තිබෙනවා. එබැවින් ධීවර වරායන් ආශ්‍රිත සමුද්‍ර දූෂණය වැළැක්වීමට දැඩි ක්‍රියාමාර්ග ගත යුතු වනවා සේම ඒ හා අවශ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීමත් කළ යුතුයි.

ඒ වාගේම, යම් යම් පළාත් පාලන ආයතන මඟින් තම බල ප්‍රදේශවල අපවහන නළ පද්ධති සමුද්‍රයට හරවා තිබෙනවා. එමඟින් වෙරළාශ්‍රිත සමුද්‍ර පරිසරය දැඩි ලෙස දූෂණයට ලක් වී තිබෙනවා. සමහර සංචාරක හෝටල්වලින් ඉවත ලන අපද්‍රව්‍ය වෙරළට සහ මුහුදට මුදා හැරීම නිසා දූෂණය වී ඇති වෙරළ සහ අවට පරිසරය පවිත්‍රව තබා ගැනීමට දැඩි නීති ක්‍රියාත්මක විය යුතුයි. එසේම එම සංචාරක හෝටල්වලින් ඉවත ලන අපද්‍රව්‍ය බැහැර කිරීමට නිසි ක්‍රමවේදයක් අදාළ පළාත් පාලන ආයතන විසින් සැකසිය යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම සඳහන් කළ යුතු කරුණක් තිබෙනවා. එනම්, මහා පරිමාණ සමුද්‍ර දූෂණ හේතුවෙන් සිදු වන හානි. උදාහරණයක් ලෙස 2010 වසරේ සිදු වූ සල්ෆියුරික් අම්ලය අඩංගු නැවක් මුහුදුබත් වී රසායනික ද්‍රව්‍ය මුහුදට මුසු වීම පෙන්වා දෙන්නට පුළුවන්. එවැනි අවස්ථාවලදී අදාළ නැව් සමාගම්වලින් වන්දි අය කර ගැනීමේදී, සමුද්‍ර කලාපය ආශ්‍රිතව සිය ජීවිකාව කර ගෙන යන සාම්ප්‍රදායික මාදැල් කාර්මිකයින් සහ සුළුපන්න ධීවර කාර්මිකයින් පත් වන අසරණභාවය ගැන සලකා බලා ඔවුන්ට සාධාරණ වන්දියක් ලබා දීමට සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ අවධානය යොමු විය යුතු බව මා යෝජනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ හිතවත් ගරු වික්ටර් ඇන්ටනි මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, මුහුදු කැමක් ඇති වී තිබෙන බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුහුදු කැමක් නොවෙයි මුහුදු වැලි විකුණා ගෙන කැමකුයි ඇති වෙලා තිබෙන්නේ.

හම්බන්තොට දිස්ත්‍රික්කය පුරාම ඒ තත්ත්වය තිබෙනවා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ කිරින්ද වරායේ බිලියන් ගණනක, කෝටි ගණනක වැලි ධීවර අමාත්‍යාංශයේ වරාය අධිකාරියෙන් අද විකුණනවා. ඒකට මිල පාලනයක් නැහැ. විකුණා ගෙන කනවා. කිරින්ද වරායේ, කලමැටිය වරායේ, හම්බන්තොට වරායේ, තංගල්ල වරායේ වැලි ඉවත් කරන්න ඒ කාලයේ -එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ- නැව් තිබුණා. පොකිරිස්සා නැව, වැලිගොච්චා නැව ආදී වශයෙන් නැව් කිහිපයක් තිබුණා. ඒ නැව්වලින් වරාය හාරලා, වැලි අරගෙන ගිහිල්ලා ඈත මුහුදේ දමලායි එන්නේ. ඒක තමයි මුහුදේ වරාය ගොඩ වන කොට සම්ප්‍රදායානුකූලව ක්‍රියාත්මක වුණු දේ. අද ඒ නැව් නැහැ. අද ඒ එක නැවක්වත් නැහැ. අද කරන වැඩේ තමයි සෑම වරායකම, තොටුපොළකම වැලි ඉවත් කරන්න මුදලාලිලාට භාර දෙන එක.

ආණ්ඩුවේ මුදලාලිලාට භාර දීලා තිබෙන්නේ. මුදලාලිලාගේ වැඩේ වරායේ වැලි පිරුණත් නැතත් හැම තිස්සේම වැලි හාරලා අර ගෙන යන එකයි. තංගල්ල වරායේ, කුඩාවැල්ල වරායේ, හම්බන්තොට වරායේ, කිරින්ද වරායේ ඒක කරනවා. ඒ විධියට මුළු රට වටේම තිබෙන මහ මුහුදේ වැලි හාරලා විකුණා ගෙන කෑමක් තමයි සිද්ධ වෙලා තිබෙන්නේ. එතකොට තමයි මුහුදු කැම ඇති වන්නේ. මුහුදු බාදනයක් ඇති වෙලා තිබෙනවා කියලා කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. මුහුදු බාදනය ඇති වන්නේ මුහුදේ තිබෙන වැලි විකුණා ගෙන කන නිසායි. අන්න ඒ වාගේ පරිසර හානි වළක්වන්න කටයුතු කළොත් හොඳයි කියලා මම යෝජනා කරනවා.

ඒ වාගේම තවත් කාරණයක් තිබෙනවා. පසු ගිය දවස්වල ලුණුගම්වෙහෙර ප්‍රදේශයේ අහිංසක, දුප්පත් ගොවි ජනතාවට මැණික් ඉල්ලමක් පෑදුණා. අපේ දිස්ත්‍රික්කයේ නිසා අපි ඒ ගැන දන්නවා. මැණික් ඉල්ලමක් කිව්වාට මම හිතන විධියට ඒක ඒ කාලයේ රජවරු නිධන් කරපු මැණික් මුට්ටියක්. ඒක පාර හදන බැකෝ එකට පටවලා, ගෙනැල්ලා පාරේ තුනී කළා. ඒවා නිල් මැණික්. ඔක්කොම කපාපු නිල් මැණික්. ඒ මැණික් ඒ අහිංසක දුප්පත් මිනිස්සු අහුලා ගත්තා. පැය 12ක් යන්න හම්බ වුණේ නැහැ, පාරවල් වැහුවා, හමුදාව දැම්මා, ආවා, මිනිස්සු අත්අඩංගුවට ගත්තා. ඒ ආවේ රජයේ වාහන. නානා ප්‍රකාර වාහන. මැති ඇමතිවරු වාහන පහකින් හයකින් ආවා. පටවා ගත්තා. යන්න ගියා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ කතරගම දෙවි හාමුදුරුවන්ගේ අඩවියට ඇවිල්ලා අහිංසක දුප්පත් ජනතාවගේ මැණික් කොල්ල කෑවේ මේ ආණ්ඩුවේ ප්‍රධාන නිලධාරින්, ප්‍රධාන මැති ඇමතිවරුන්ය කියන එක මේ උත්තරීතර සභාවේ දී මම නිර්භයව ප්‍රකාශ කරනවා. අන්න ඒ වාගේ දූෂණ කරන, මංකොල්ල කන ආණ්ඩුවක් තමයි අද මේ රටේ තිබෙන්නේ. ඒ නිසා මම මේ ගරු සභාවේ දී තමුන්නාන්සේලාට කියන්නේ ඒ විධියට අහිංසක දුප්පත් මිනිස්සුන්ගේ දේවල් මංකොල්ල කන්නේ නැතිව, මේ දූෂණ වංචා නතර කරන්නය කියන එකයි.

මෙවැනි යෝජනාවක් ගෙන ඒම ගැන අපේ පරිසර ඇමතිතුමාට මගේ ගෞරවණීය ස්තුතිය පුද කරනවා. විශේෂයෙන්ම මේ අමාත්‍යාංශය තුළින් අපේ රටේ ධීවර ක්ෂේත්‍රය රැක ගන්න හැකි වේවා කියා ප්‍රාර්ථනා කරමින්, මට මේ අවස්ථාව ලබා දීම ගැන ස්තුතිය ප්‍රකාශ කරමින් මම නිහඬ වනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please!

Will an Hon. Member propose Hon. Alhaj A.H.M. Azwer to take the Chair.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
I propose that Hon. Alhaj A.H.M. Azwer do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ආර්. යෝගරාජන් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு ஆர். யோகராஜன் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. R. YOGARAJAN *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු පාලිත රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා.

[අ. භා. 5.02]

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද පරිසර අමාත්‍යාංශය යටතේ සමුද්‍ර ආරක්ෂාව පිළිබඳව රෙගුලාසි ගෙනැවිත් තිබෙන අවස්ථාවේ කථා කරන්නට බලාපොරොත්තු නොවුණු මාතෘකාවක් ගැනත් මට කථා කරන්න සිදු වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ඔබතුමා මූලාසනයට එන්න පෙර කරපු කථාවට පිළිතුරු වශයෙනුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමුද්‍රයත් එක්ක එකට බැඳුණු තැනක් තමයි වෙරළ. සමුද්‍රය ආරක්ෂා කරනවා වාගේම වෙරළ ආරක්ෂා කිරීමත් සුවිශේෂී කාර්යයක් විධියට මා දකිනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් වයඹ පළාත නියෝජනය කරන ඇමතිවරයකු නිසා වයඹ වෙරළ පිළිබඳව ඔබතුමාට හොඳ අවබෝධයක් තිබෙනවා ඇති. කාලාන්තරයක් තිස්සේ ඔබතුමා මේ ගරු සභාව නියෝජනය කරනවා. විශාල වශයෙන් මහජන වැඩ කටයුතුවල යෙදිලා ඉන්නවා. ඔබතුමා රට පුරාම වැඩ කටයුතු කරනවා. ඒ වාගේම ඔබතුමාගේ දිස්ත්‍රික්කයට අල්ලපු දිස්ත්‍රික්කය වන පුත්තලම් දිස්ත්‍රික්කය පිළිබඳවත් හොඳ අවබෝධයක් ඔබතුමාට තිබෙනවා.

ගරු ඇමතිතුමනි, පසු ගිය කාල පරිච්ඡේදය තුළ සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම සඳහාය කියලා පුත්තලම් දිස්ත්‍රික්කයේ මුහුදු තීරය, කලපු තීරය සමස්ත වශයෙන්ම විනාශ කරලා හමාරයි. ඒ සියල්ල සිදු කළේ මේ ගරු සභාව තුළ ඔබතුමාගේ පැත්ත නියෝජනය කරන ගරු ඇමතිතුමන්ලාගේ, ඒ වාගේම පළාත් සභාවේ ගරු ඇමතිතුමන්ලාගේ ආශිර්වාදය යටතේයි. අපේ ගරු වික්ටර් ඇන්තනි මන්ත්‍රීතුමාත් ඒ ගැන දන්නවා. එතුමා කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ සභාපතිවරයා වශයෙන් වැඩ කටයුතු කරනවා. පසු ගිය සභා වාරයේදී ජනතාව නැගිටලා ඒ ගැන එතුමාට පැමිණිලි කළා.

ගරු ඇමතිතුමනි, පුත්තලම දිස්ත්‍රික්කයේ කල්පිටිය වෙරළ තීරයේ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් අක්කර

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

සිය දහස් ගණනක් මේ වන කොට පෞද්ගලික ආයතනවලට විකුණලා ඉවරයි. ඒ විකුණුවේ සියලුම දේශපාලන අධිකාරි නායකයින්ගේ ආශීර්වාදය යටතේයි. කල්පිටිය වෙරළේ කන්දකුලි ඊච්චන්කාඩු කියන තැන අක්කර 100ක් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ තියෙනවා. කඩොලාන වගාව වෙරළ තීරයට අත්‍යවශ්‍යයි. ගරු ඇමතිතුමනි, කඩොලාන වගාව ගැන ඔබතුමා දන්නවා. ඉස්සන් වගාව ඇති වෙන්න, ඉස්සෝ වර්ධනයක් ඇති වෙන්න ඉතාමත්ම අවශ්‍ය වන කාරණයක් තමයි කඩොලාන. හැබැයි කඩොලාන සමස්ත වශයෙන් විනාශ කරමින් ඊච්චන්කාඩු වත්තේ අක්කර 100ක ප්‍රමාණය අද "ටී 56 නීල්" කියන එක් කෙනායි, "ජෝන් බොස්කෝ" කියන එක් කෙනායි පෞද්ගලිකව විකුණලා සල්ලි හම්බ කර ගෙන තියෙනවා. පුත්තලම දිස්ත්‍රික්කයේ වයඹ පළාත් සභාවේ ඇමතිවරයෙක් මේ ගනුදෙනුවට සම්බන්ධ වුණා. ඒ පළාත් සභා ඇමතිවරයාගේ ආශීර්වාදය යටතේ මේ කොටස විකුණලා දැම්මා. මේ ජෝන් බොස්කෝ කියන පුද්ගලයා කියන්නේ ඒ පළාත් සභා ඇමතිවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයෙක් කියලායි. දැන් මේ පිළිබඳව පැමිණිලි කරලා තියෙනවා. අපි මේ සභාවේ ඒ ගැන කථා කරලා තියෙනවා. අපේ ජ්‍යෝෂ්ඨ අමාත්‍ය ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා මේ සභාවේදී නැඟිටලා කිව්වා, “මේවා පිළිබඳව පරීක්ෂණ පවත්වනවා, ඒ පුද්ගලයින් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වනවා, නීතිය ක්‍රියාත්මක කරනවා” කියලා. හැබැයි එහෙම කථා කරලාත් දැන් අවුරුද්දකට ආසන්න වනවා, ගරු ඇමතිතුමනි. අද වන තුරු කිසිදු ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ කියන එක අපි කනගාටුවෙන් වුණත් ඔබතුමා මේ සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ නියෝග ගෙනෙන දවසේ මේ සභාවේදී මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම තමයි ගරු ඇමතිතුමනි, කල්පිටිය මොහොත්තුවාරම Dutch Bay කියන තැන අක්කර 200ක් පෞද්ගලික ආයතනවලට -කොළඹ අයට- විකුණලා ඉවරයි. අපි කොළඹ අයට කියලා නරකට කථා කරනවා නොවෙයි. නමුත් කඩොලාන විනාශ කරමින්, වෙරළ විනාශ කරමින්, පරිසරය විනාශ කරමින් තමයි මේ ඉඩම් අද භාවිතයට අරගෙන තිබෙන්නේ. ඒවා රජයේ ඉඩම්. එහෙම නැත්නම් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ එන රක්ෂිත ඉඩම් තමයි අද මේ විධියට පාවිච්චි කරලා තියෙන්නේ. ඒ ඉඩම් විකුණන්නත් සම්බන්ධ වෙලා තියෙන්නේ අර මම කලින් කියපු කට්ටියමයි, ගරු ඇමතිතුමනි. නීල් කියන පුද්ගලයෙක් තමයි මේ ඉඩම මිලදී අරගෙන දැනට විවිධ වැඩ කටයුතු කරගෙන යන්නේ.

ආලන්කුඩාවේ අක්කර 50ක තව ඉඩමක් තියෙනවා. රොබට් කියන තැනැත්තා මේ ඉඩම මිලදී අරගෙන තියෙනවා. අර මම ඉහතින් කියපු "ටී 56 නීල්" කියන එක්කෙනායි, "ජෝන් බොස්කෝ" කියන එක්කෙනායි තමයි මේ ගනුදෙනුව - deal එක- කරලා තියෙන්නේ. ලක්ෂ ගණනින් ඒ ගොල්ලෝ මුදල් ඉපැයුවා. ඒකට අදාළ පළාත් සභා ඇමතිවරයාට මුදල් ලැබුණා කියලා අපට ආරංචියි. එතැනින් පස්සේ කොතරම් පැමිණිලි කළත් මේ සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිදු වන්නේ නැහැ. ධීවර ජනතාව, ධීවර සංවිධාන, ප්‍රදේශයේ ජනතාව ගිහිල්ලා ප්‍රාදේශීය ලේකම්තුමාට, දිස්ත්‍රික් ලේකම්තුමාට, ඒ වාගේම පොලීසියට පැමිණිලි කරලා තියෙනවා. කිසිදු ආයතනයකින් කිසිම පරීක්ෂණයක් සිද්ධ වෙන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම මම දන්නා විධියට පොලීසියට මේකට කරන්න දෙයක් නැහැ. ක්‍රියාත්මක වෙන්න තියෙන්නේ ප්‍රාදේශීය ලේකම්තුමාට සහ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවටයි. නමුත් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මෙය බොහොම කනගාටුදායක තත්ත්වයක්. ඒ අන්දමට පරිසරය හිතුමතේ විනාශ කරනවා. රටේ දේශපාලනයට සම්බන්ධ වෙච්ච, පාලනයට සම්බන්ධ වෙච්ච උදවියගේ ගෝල බාලයනුත් මේකෙන් මුදල් හම්බ කරනවා. මෙච්චරයි වෙලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම තමයි දලුවේ මාම්පුරි වෙරළ තීරයේ අක්කර 200ක ඉඩම් ප්‍රමාණය අපේ විදේශ කටයුතුවලට සම්බන්ධ අමාත්‍යවරයෙකුගේ කණ්ඩායමක් විසින් ඒ ගනුදෙනුව කරලා දැන් ඒක පෞද්ගලික ආයතන සතු කරගෙන තිබෙනවා. ඔවුන් කිසිදු ඉවක් බවක් නැතිව නීති රීති පැත්තක දමලා කිසිම දෙයක් නැතිව කඩොලානත් විනාශ කරලා, වෙරළත් විනාශ කරලා දමනවා. බොහොම කනගාටුයි. මේ නීති ගෙනාවාට වැඩක් නැහැ. ඒකයි මම කියන්න හදන්නේ, ගරු ඇමතිතුමනි. නීති ගෙනෙනවා; රෙගුලාසි ගෙනෙනවා; පාර්ලිමේන්තුවේ සම්මත කරනවා; විවාද කරනවා; පොත්වලට අච්චු ගහනවා; ඊට පස්සේ අදාළ තැන්වලට යවනවා. හැබැයි නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වෙන්නේත් නැහැ. පොලීසිය ක්‍රියාත්මක වෙන්නේත් නැහැ. ඒ වාගේම ප්‍රාදේශීය සභාව ක්‍රියාත්මක වෙන්නේත් නැහැ. ප්‍රාදේශීය ලේකම් ක්‍රියාත්මක වෙන්නේත් නැහැ. ක්‍රියාත්මක වෙන්න හැකියාවක් නැහැ.

අර උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිෂන් සභාව විසින් නිර්දේශපාලනීකරණය කරන්න, ස්වාධීන කොමිෂන් සභා ටික ස්ථාපිත කරන්න කියලා නිර්දේශ කරලා තිබෙන්නේ ඔන්න ඕකට තමයි. මේ දේශපාලන අධිකාරිය යටතේ ඉන්න හොර ගෝල බාලයෝ ටික මේ හොරා කෑම නැවැත්වීම සඳහා. මේක ක්‍රියාත්මක නොවන තාක්කල්, මේ පනත් කොච්චර ගෙනාවත්, නීති රීති කොච්චර ගෙනාවත්, රෙගුලාසි කොච්චර ගෙනාවත් මේ රටේ වැඩක් වෙන්නේ නැහැයි කියන එක බොහොම පැහැදිලිව අපි කියන්න ඕනෑ, ගරු ඇමතිතුමනි. ඒ වාගේම අපේ වික්ටර් ඇන්ටනි ගරු මන්ත්‍රීතුමාගේ සභාපතිත්වයෙන් මේ පෙබරවාරි මාසයේ 29වැනි දා කල්පිටිය ප්‍රාදේශීය සංවර්ධන කමිටු රැස්වීම තිබුණා. ගරු ඇමතිතුමනි, ඒ රැස්වීමේදීත් කන්දකුලි ධීවර සංවිධානයේ සභාපතිවරයා වන සුගත් නැඟිටලා මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්න කියලා පැමිණිලි කළා.

ගරු වික්ටර් ඇන්ටනි මන්ත්‍රීතුමා කිව්වා මේ පිළිබඳව සලකා බලනවා කියලා. සලකා බලන්න දෙයක් නැහැ. දැන් අනික් කට්ටිය බලලා ඉවරයි. මේ ගොල්ලෝ සලක සලකා ඉන්නවා. වැඩේ දීලා ඉවරයි. දැන් සලකන්න දෙයක් නැහැ. කට්ටියට සලකා ගෙන ඉවරයි. ගරු අනුර ප්‍රියදර්ශන යාපා ඇමතිතුමනි, ඒකයි වෙලා තිබෙන්නේ. ඒ කට්ටියට සැලකිලා තිබෙන නිසා දැන් මේවා සම්බන්ධව නීතිය ක්‍රියාත්මක වන්නේ නැහැ. අන්න එතැනයි ප්‍රශ්නය තිබෙන්නේ.

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
ගරු මන්ත්‍රීතුමනි, මට පොඩි අවස්ථාවක් දෙනවාද?

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ඔබතුමා කථා කරලා ඉවරයි නේ.

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
ඔබතුමාට විරුද්ධව නොවෙයි මා මේ කථා කරන්නේ.

එවැනි දෙයක් සිද්ධ වුණේ නැහැ. ධීවර සමිතියක සභාපතිවරයෙක් ඉඩම් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේදී කථා කළේ නැහැ. ඒක නිසා ඔබතුමා කිව්ව කාරණය පොඩ්ඩක් නිවැරැදි වන්න ඕනෑ. ඔබතුමා ඒ ගැන හරියට තොරතුරු ගත්තා නම් ඒක දැන ගන්න පුළුවන්. ඒක නිසා එය පොඩ්ඩක් නිවැරැදි වන්න ඕනෑය කියන එකයි මා අදහස් කරන්නේ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමනි.

කල්පිටිය, කන්දකුලියේ සුගත් කියන මහත්මයා -ධීවර සංවිධානයේ සභාපතිවරයා- මේ පිළිබඳව ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේදී අදහස් දැක්වූවා. එහෙම කථා කළේ නැහැ කියලා ඒක ඔබතුමාට ප්‍රතික්ෂේප කරන්න පුළුවන්. නමුත් සත්‍යය ඒකයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය ඉදි කරන කොට අපි ඒකට විරුද්ධ වුණා. ගරු ඇමතිතුමනි, අපි කිව්වා, "නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය ඉදි කළාම මේ පරිසරය විනාශ වෙනවා" කියලා. නුවරඑළියේ හැදෙන එළවලු ටික නොරොච්චෝලේ හොඳට හැදෙන බව ඔබතුමා දන්නවා. ඒ වාගේම එහි හොඳට දුම්කොළ ටික වැවෙනවා; පොල් ටික වැවෙනවා. ඒ ප්‍රදේශයේ ධීවර කර්මාන්තය හොඳට තිබුණා. ගරු ඇමතිතුමනි, නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය ඉදි කරලා මේ සියල්ල අද විනාශ වෙලා තිබෙනවා. නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය ඉදි කළේ දකුණු ඉන්දියාවටත් එක්ක විදුලිය දෙන්නයි. රුපියල් 5.24කට විදුලි ඒකකයක් දෙන්න කියලා තමයි තමයි මේ නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය ඉදි කළේ. විදුලිය මෙගාවොට් 300ක් ලබා දෙන්න කියලා තමයි මේ බලාගාරය ඉදි කළේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රධාන පොදු පෙරමුණ, එක්සත් ජනතා නිදහස් සන්ධානය, සමගි පෙරමුණ කියන මේ සියලු ආණ්ඩු මේ රටේ තිබුණා. අප නිදහස ලබා ගෙන දැන් අවුරුදු 64ක් ගත වෙලා තිබෙනවා. මේ කාල පරිච්ඡේදයෙන් දෙකෙන් පංගුවක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, ඉතිරි දෙකෙන් පංගුව එක්සත් ජාතික පක්ෂයත් මේ රට පාලනය කරලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂ පාලන සමය තුළ විදුලි බලාගාර 23ක් ආරම්භ කරලා මෙගාවොට් 1,766ක් අදටත් ජාතික විදුලිබල පද්ධතියට එක්කාසු වෙනවා. ගරු ඇමතිතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රධාන ආණ්ඩු කාල තුළ මේ මිහි පිට -මේ දූපත තුළ- විදුලි බලාගාර 9යි ඉදි කරලා තිබෙන්නේ. ඒ විදුලි බලාගාර 9නුත් මෙගාවොට් 915යි විදුලිය නිෂ්පාදනය කරන්න පුළුවන් වන්නේ. ඒ මෙගාවොට් 915නුත් මෙගාවොට් 600ක්ම අද ක්‍රියාත්මක වන්නේ නැහැ. මෙගාවොට් 300ක් ඉලක්ක කරගෙන නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය ඉදි කළා. මෙගාවොට් 300ක් තියා අද මෙගාවොට් එකක්වත් නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාත් මේ ගැන දන්නවා, මොකද ඔබතුමාත් හිටපු දිස්ත්‍රික්කය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යුගදනවි බලාගාරයෙන් විදුලිය මෙගාවොට් 300ක් නිපදවන්න බලාපොරොත්තු වුණා. ඒකත් -

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! There is a point of Order being raised by the Hon. Victor Antony.

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් මේ ගරු සභාව නොමග යැවීම පිළිබඳව මා කනගාටු වෙනවා. මොකද මේ වන විටත් නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය ක්‍රියාත්මකයි. එයින් විදුලිය මෙගාවොට් 300ක් නිපද වෙනවා. මේක මේ ගරු සභාව නොමඟ යැවීමක්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
That is not a point of Order. ගරු පාලිත රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කර ගෙන යන්න.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු වික්ටර් ඇන්ටනි මන්ත්‍රීතුමනි, වාඩි වෙන්න. ඔබතුමාට අවස්ථා දෙකක්ම දුන්නා. දැන් ඇති.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නොරොච්චෝලේ බලාගාරය ක්‍රියාත්මක වෙනවාද කියන එක අද කවුරුත් දන්නවා. පසු ගිය සතියේ විවාදයේදී විදුලිබල ඇමතිතුමාත් පිළිගත්තා නොරොච්චෝලේ ක්‍රියාත්මක නැහැ කියලා. ආරම්භ කරපු දවසේ ඉඳලා මේ වන විට තුන් වතාවක් එම බලාගාරය වහන්න සිදු වුණා. නොරොච්චෝලේ බලාගාරය අකර්මණ්‍ය වුණාම එහි අලුත්වැඩියාව - repair එක- පටන් ගන්න, techniciansලාට ඒ ළඟට යන්න දින 15ක් ඒක නිවෙන්න ඕනෑ. දින 15ක් නිවුණාට පස්සේ තව දින 30ක් යනවා අනිවාර්යයෙන්ම එහි අලුත්වැඩියාව සිදු කරන්න. මේ අනුව එක වතාවක් අබලන් වුණාම අවම වශයෙන් දින 45ක් යනවා එහි අලුත්වැඩියාව සිදු කරන්න. දැන් මේ වෙන කොට එය තුන් වතාවක් අබලන් වෙලා තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. චීනයෙන් brand new එකක් ගෙනාවේ. Exim Bank එකෙන් ගත්තේ සියයට හයේ පොලියට, ණයට. කොමිස් කුට්ටිය ගියා. ඕස්ට්‍රේලියාවෙන් කථා කළා මීට වඩා හොඳ එක - original එක- දෙන්න. ඕස්ට්‍රේලියාවෙන් අර කොමිස් එක ගහ ගන්න බැරි හින්දා චීනයෙන් ගත්තා. මේකයි ඇත්ත කතන්දරේ. අපි එදා චීනයට ගිහිල්ලාත් මේකට විරුද්ධ වුණා. හීබි ප්‍රාන්තයට ගිහිල්ලා එහිදී මේ විදුලි බලාගාරය දැකපු ගමන් අපි කිව්වා, "මේක අරගෙන ලංකාවට ගියොත් විශාල විනාශයක් වෙන්නේ" කියලා. මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා කණ්ඩායම් නායකයා විධියට අපත් එක්ක හිටියා. මම එතුමාට එහේදීත් -චීනයේදීත්- කිව්වා. එතුමා බැංකොක්වලට ඇවිල්ලාත් මගෙන් ප්‍රකාශයක් ගන්න හැදුවා. [බාධා කිරීමක්] මෙතුමාත් ගියා. මම ප්‍රකාශයක් දුන්නේ නැහැ. මෙතුමා සාක්ෂි දරනවා. මේක සුදුසු නැහැ කියලා තමයි ඒ වෙලාවේ ඉඳලා කිව්වේ. ඒ වාගේ අද නොරොච්චෝල් බලාගාරයෙන් වැඩකුත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දැන් කියාගෙන ආවේ සමස්ත ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රධාන පොදු පෙරමුණු, සන්ධාන, සමගි පෙරමුණු ආණ්ඩු කාල පරිච්ඡේද තුළ මෙගාවොට් 916ක විදුලියක් නිෂ්පාදනය කරන්න තමයි බලාගාර හදලා තිබෙන්නේ කියන එක. විදුලි බලාගාර 9යි ඔවුන් හදලා තිබෙන්නේ. ඒකෙනුත් යුගදනවි බලාගාරයේ මෙගාවොට් 300 අද ක්‍රියාත්මක නැහැ; නොරොච්චෝලෙත් මෙගාවොට් 300 අද ක්‍රියාත්මක නැහැ. එහෙනම් නිදහසින් පසුව ගතවුණු අවුරුදු 64ක කාල පරිච්ඡේදය තුළ එම කාලයෙන් දෙකෙන් පංගුවක් මේ රට පාලනය කරපු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පාලන කාලය තුළ හදපු විදුලි බලාගාරවලින් මෙගාවොට් 315යි අද වෙන කොට ජාතික විදුලි grid එකට ඇතුළත් කරන්නේ කියන එක මම බොහොම පැහැදිලිව කියනවා.

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
විදුලිය කැපුවේ නැහැ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

විදුලිය කැපුවේ නැහැ? පැය 18ක් විදුලිය කපලා තිබුණා. මෙතුමන්ලාට දැන් මතක නැහැ.

එදා -2001දී- අප ආණ්ඩුව භාර ගන්න කලින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි රට පාලනය කළේ. ඒ, චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ පාලන කාල පරිච්ඡේදය තුළයි. ඔබතුමාත් අපත් එක්කයි හිටියේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විදුලිය කපපු වෙලාවේ ඔබතුමාත් මේ සභාවේ අපේ පැත්තේ ඉඳ ගෙන කථා කළා මට මතකයි. එදා පැය 18ක් විදුලිය කැපුවා.

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனி)
(The Hon.Victor Antony)

දැන් කපන්නේ නැහැ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

විදුලි බල ඇමතිවරයා වශයෙන් එදා ගරු කරු ජයසූරිය මහත්තයා කිව්වා, දින 180ක් ඇතුළත පැය 24 පුරා ලංකාවේ විදුලිය දෙන්න බැරි නම් මම මේ ඇමති ධුරයෙන් අයින් වෙනවා කියලා. අන්න එහෙම මිනිස්සුයි එක්සත් ජාතික පක්ෂයේ වැඩ කරලා තිබෙන්නේ. ඒ ආදර්ශය පෙන්නලා තිබෙනවා. ඒ ගරු මන්ත්‍රීතුමාට ඒ අතීතය අමතක වීම පිළිබඳව මම කනගාටු වෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රටේ පැය හයක් විදුලිය කැපුවා. Airport එකේ ලන්තෑරුම් පත්තු කර ගෙනයි වැඩ කටයුතු කළේ. ඒ කාලයේ එහෙමයි කටුනායක airport එකේ කටයුතු කළේ. එහෙම පාලනයක් තමයි තිබුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ පාලන කාලය තුළ. එක්කෝ ඔබතුමන්ලා දන්නේ නැති මේ මගුල් නොකියා ඉන්න ඕනෑ. මට ඒක නොවෙයි, කියන්න අවශ්‍ය වෙලා තිබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නොරොච්චෝලේ බලාගාරය ඉදි කළා. ඒ බලාගාරය ඉදි කළාට පස්සේ අද දැවැන්ත ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. එදා අප සාකච්ඡා කරන කොට අපට කිව්වා, "ගල් අඟුරු නැව එනවා. ගල් අඟුරු නැවෙන් ගෙනැල්ලා barge එකෙන් මෙහේට ගෙනෙනවා. කිසිම කෙනකුට කරදරයක් නැහැ" කියලා. ධීවරයාට සාම්ප්‍රදායිකව කර්මාන්තය කර ගන්න පුළුවන් කිව්වා. ඒ වාගේම ගල් අඟුරු බලාගාරයේ පාවිච්චි කරන වතුර මහ මුහුදට පිට කරනවා කිව්වා. ඒ වතුරත් එක්ක රස්නේ වතුර යනවා කිව්වා. එතකොට මුහුදේ දැනට එතැන ඉන්න සාම්ප්‍රදායික මාළු අහිමි වේවි කියා අපි කිව්වා. නමුත් රස්නේ වතුරට කැමැති මසුන් මුහුදේ ඉන්නවා, ඒ මසුන් එතැනට එනවා, එතකොට ධීවරයාගේ ආර්ථිකය දියුණු කර ගන්න පුළුවන්, ඒ මසුන් අල්ලලා ගෙනෙන්න පුළුවන් කියා එදා අපත් එක්ක ඒ සාකච්ඡාවලදී කිව්වා. උපදේශක කාරක සභාවේදී කිව්වා; වෙනත් සාකච්ඡාවලදී කිව්වා. හැබැයි අද මොකක්ද වෙලා තිබෙන්නේ ගරු ඇමතිතුමනි? අද ගල් අඟුරු නැව ආවාම මීටර් 500ක් ඇතුළත කිසිම ධීවරයකුට යන්න පුළුවන්කමක් නැහැ. දැලක් එළන්න පුළුවන්කමක් නැහැ. මේ කෙටි කාලය තුළ නාවික හමුදාව දෙවතාවක් ගිහින් ධීවරයන්ට පහර දීලා ඔවුන්ගේ දැල් ටිකත් එක්කම කපා දමලා එලෙව්වා ගරු ඇමතිතුමනි. මා මේ සහතික වශයෙනුයි කියන්නේ. අප ඒ දිස්ත්‍රික්කයේ ඉන්න මිනිසුන් වශයෙන් අසත්‍ය නොවෙයි මේ සභාවේ කියන්නේ. අපි ඇත්තයි කථා කරන්නේ. ඒකයි ඇති වෙච්ච තත්ත්වය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සමුද්‍රය ආරක්ෂා කරන්න ඕනෑ. කිසිම වියදමක් නැතිව, කන්න බොන්න නොදී, පොහොර නොදී, තෙල් නොදා ආදායම් ලැබෙන එකම ව්‍යාපාරය මේ මත්ස්‍ය සම්පත හා සම්බන්ධ ධීවර කර්මාන්තයයි. මසුන් අල්ලන්න යන වියදම, ධීවර කාර්මිකයාට යන වියදම ආදිය හැරුණාම වගාව සඳහා වියදමක් නොකර ආදායමක් ලබා ගන්න පුළුවන් එකම කර්මාන්තය තමයි ධීවර කර්මාන්තය. එහෙම නම් ඒ ධීවරයන්ට ඒ කර්මාන්තය කරන්න මේ සමුද්‍රය ආරක්ෂා වෙන්න ඕනෑ. සමුද්‍රය දූෂණය නොවෙන්න ඕනෑ. ඒ සමුද්‍රය තුළ ධීවරයන්ට නිදහසේ කටයුතු කරන්න පුළුවන් වෙන්න ඕනෑ. ගල් අඟුරු බලාගාරයක් කියලා ශත පහකවත් වැඩක් නැති අට මහලක් ගෙනැල්ලා අටවපු නිසා අද ධීවර කර්මාන්තයත් නැහැ, වෙරළත් විනාශයි, එහි තිබුණු පොල් ටිකත් විනාශයි, එළවලු ටිකත් විනාශයි, දුම් කොළ ටිකත් විනාශයි ගරු ඇමතිතුමනි. මෙච්චරයි වෙලා තිබෙන්නේ. අද සමස්ත පරිසරයම ඒ ගල් අඟුරු බලාගාරයත් එක්කම දවසින් දවස විනාශ වේ ගෙන යනවා. මෙන්න මේ වාගේ සැලසුමක් නැති විගඩම් වැඩ කරන නිසා තමයි විනාශයන් සිද්ධ වන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංගණන අනුව රටේ ඉන්නවා කියන්නේ වල් අලි 3,500යි. අපේ ගරු ගොවිජන සේවා හා වනජීවී ඇමතිතුමා බෝඩ් එකක් දමලා 'වල් අලියා' කියන නම වෙනස් කරලා ඒක 'වන අලියා' කළා. පරිසරය නිසා මේ ගැනත් අපට කථා කරන්න සිදු වෙනවා. වල් අලි 3,500ක් ඉන්න රටේ මේ ආණ්ඩුවට තවම බැරි වෙලා තිබෙනවා, විදුලි වැටවල් යොදලා, ක්‍රමවත් වැඩ පිළිවෙළක් දමලා වල් අලි ටික ආරක්ෂා වන විධියටත්, ගොවි ජනතාව ආරක්ෂා වන විධියටත් වැඩ කටයුතු කරන්න. මේ කෙටි කාලය තුළ මොන තරම් අලි ප්‍රමාණයක් විනාශ වුණාද? හිතු මනාපයේ මිනිසුන් වෙඩි තියලා අලි මරලා දමන්න පටන් ගත්තා. 100කට වැඩි අලි ප්‍රමාණයක් මේ මාස තුන හතරක කාල පරිච්ඡේදය තුළ විනාශ වෙලා තිබෙනවා. නමුත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට පරිසර ඇමතිවරයා වශයෙන් ඔබතුමාට බලතල නැහැ. මොකද, එකම අමාත්‍යාංශය පුංචි පුංචි කැලිවලට කඩලා. පරිසර ඇමති, වනජීවී ඇමති. මේ විධියට එකම අමාත්‍යාංශය කෑලි 40කට විතර කඩලා තිබෙනවා ඇමති ධුර ලබා දීම සඳහා. ගරු ඇමතිතුමනි, ඔබතුමාට කර ගන්න දෙයක් නැහැ. අපි ඒ බව දන්නවා. නමුත් ගරු ඇමතිතුමනි, මේ විවාදයේදී පරිසර ඇමතිතුමා වශයෙන් කටයුතු කරන ඔබතුමාට කියන්න වෙනවා මේ කරන විනාශය ගැන. පරිසරය විනාශ කිරීම, පරිසරයේ ජීවත් වන සතුන් විනාශ කිරීම. මේ රටට සම්පතක් අලියා. පරිසරය විනාශ කරමින් ඒ සම්පත විනාශ කරනවා ගරු ඇමතිතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම හලාවත ජීවත් වන ධීවරයා, වෙරළේ ජීවත් වන ධීවරයා, මුහුදේ ජීවත් වන ධීවරයා ගැන කථා කරමින් අර ඇන්තනී ප්‍රනාන්දු ඝාතනය කිරීම පිළිබඳවත් අපි එදා විවාදයේදී කථා කළා. ඒ විවාදයේ කථා කරද්දී, "ධීවර සහයෝගිතා සංවිධානය" නම් රාජ්‍ය නොවන සංවිධානයේ වැඩ කරන හර්මන් මහත්මයා -ඔහු- මේ ධීවරයන් කුලප්පු කළා, උණුසුම් කළා, කැරළි ගැස්සෙව්වා කියලා ගරු ධීවර අමාත්‍යවරයා මේ සභාවේදී කිව්වා. දැන් ඒ මනුස්සයාට අද ජීවත් වෙන්න විධියක් නැහැ.

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனி)
(The Hon.Victor Antony)

ඩොලර් කාක්කා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කන්නේ ඩොලර් නොවෙයි. කල්පිටියේ ඉඩම් ටික විකුණාගෙනයි මෙතුමන්ලා කන්නේ. රුපියල්වලිනුයි කන්නේ. රුපියල්වලින් කන ඒවායේ නම් ටික මම කිව්වේ නැහැ. ඒ ටික කිව්වොත් එහෙම -

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
තමුන්නාන්සේ කරන දේවල් ගැන අහන්න දෙයක් නැහැ. තමුන්නාන්සේ ගැන ආයෙත් කථා කරන්න දෙයක් නැහැ නේ. අපි බොහොම පිරිසිදුව ආපු මිනිස්සු. ඇඟිල්ල දිගු කරන්න බැහැ, තමුන්නාන්සේට.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
කොච්චර පිරිසිදුද කියනවා නම්-

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
තමුන්නාන්සේට බැහැ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
හෙළදනවි ආයතනයට ඊයේ පෙරේදාත් බවුසරයක් දැම්මා කොච්චර පිරිසිදුද කියනවා නම්.

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
මොනවාද? බවුසරයක්?

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

අපෙන් පිරිසිදුකම අහන්න එපා. උප්පත්තියේ ඉඳලා පිරිසිදුකම කියන්නම්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
පෞද්ගලික දේවල් කියන්න එපා. ඒවා ස්ථාවර නියෝගවලට විරුද්ධයි. [බාධා කිරීමක්]

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ධීවර ඇමතිවරයා වශයෙන් සිටියදී මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොටු ගැහුවා; දැල් ගැහුවා. රුපියල් 175,000, 275,000යි 300,000යි කියලා රුපියල් 75,000ක් වටින්නේ නැති කුඩුවක් අරගෙන ගිහින් මිනිසුන්ගෙන් ගසා කෑවා. එවැනි ඉතිහාසයක් තියෙන්නේ. ඒ නිසා ඒවා ගැන කථා කරන්න බැහැ.

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මොකක්ද point of Order එක?

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

තවත් මොනවාද කථා කරන්නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒක point of Order එකක් නොවෙයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
සභාවේ පෞද්ගලික දේවල් පිළිබඳව කථා කරන්න බැහැ. දෙපාර්ශ්වයම කියපු දේවල් ඉවත් කරනවා.

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
මේවා ඇත්තද කියලා බලන්න පාර්ලිමේන්තු කණ්ඩායමකට මම එන්න කියනවා. නිලධාරින් ගෙන්වා ඇත්තද කියා බලන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඒක හොඳ ආරාධනයක්.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා බොරු නම් රිදෙන්නේ නැහැ.

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
මම කෑම ටික දෙන්නම් එන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒ හෝටලයට ඔබතුමත් ආවා නේද?

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ සභාවේ එක කාරණයක් පිළිබඳව කථා කළා. මම මේ ගැන කථා කරන්න හිටියේ නැහැ. නමුත් ඔබතුමා කථා කළ නිසා මේ ගැන කථා කරන්න වනවා.

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ මානව හිමිකම් උල්ලංඝනය කිරීම පිළිබඳව දරුස්මාන් වාර්තාව ඉදිරිපත් කළා. ජිනීවා මානව හිමිකම් කොමිසම විසින් දරුස්මාන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කළා. ඒකට දරුස්මාන් කමිටුව කියා අපි කවුරුත් කියනවා. ඒ දරුස්මාන් වාර්තාව මේ රජයට ඉදිරිපත් කළා. ඒ වාර්තාව ඉදිරිපත් කළාම මේ රජය ඒක පිළිගත්තා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක පිළිඅරගෙන ලියුම් දෙසිය ගණනක් ලිව්වා. ඒ සියලු කාරණා පිළිබඳව අපේ ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා හොඳටම දන්නවා. එහෙට ලියුම් ලිව්වා; මෙහෙට ලියුම් ලිව්වා. ඒ ලියුම්වලදී මේ ආණ්ඩුව පිළිගත්තා, උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිෂන් සභාවත් එනවා, මේකට විසඳුමක් වශයෙන් තමයි ඒ කොමිෂන් සභාව පත් කර තිබෙන්නේ, ඒකෙන් ලැබෙන්නාවූ යෝජනා, නිර්දේශ අපි ක්‍රියාත්මක කරනවා කියා. මේක පිළිගත්තා. මේක පිළිඅරගෙන ජිනීවා මානව හිමිකම් කොමිසමට ලිපි ලිව්වා.

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මොකක්ද point of Order එක?

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
සමුද්‍ර බාදනය ගැන කථා කරන්නේ. දරුස්මාන් වාර්තාව ගැන නොවෙයි. මෙතුමාට උගන්වන්න, විෂයට අදාළව කථා කරන්න. මොන්ටිසෝරියක්ද පාර්ලිමේන්තුව?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
That is not a point of Order.

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)
මොනවාද, මේ කථා කරන්නේ? "කොහේද යන්නේ - මල්ලේ පොල්" වාගෙයි. [බාධා කිරීමක්]

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා කථා කරනකොට මෙතුමා මැරිලා ඉන්න ඇති.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමා කථාව කර ගෙන යන්න.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
කොහොම හරි ඊළඟ වතාවේ මෙහාට නොවෙයි එන්න වන්නේ. මොන්ටිසෝරියට තමයි යන්න වන්නේ.

මේ කිසිම එලක් නැතුව බාධා කිරීමට විතරයි ඉගෙන ගෙන තිබෙන්නේ. වෙන මොකක්වත් දන්නේ නැහැ. එතුමන්ලා කථා කරනකොට අපි අහගෙන හිටියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් මේ ගරු සභාවේ කථා කළා. ඔබතුමා රාමේෂ්වරම් ගැන කථා කළා. අපි අහගෙන හිටියා; බාධා කළේ නැහැ. එහෙම ඉන්න පුරුදු වන්න කියා දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කළ නිසයි මා මේ ගැන කථා කරන්නේ. නැත්නම් කථා කරන්න නොවෙයි හිටියේ. සමුද්‍රය ගැන තමයි කථා කරන්නේ. හැබැයි, සමුද්‍රයට එහා පැත්තෙන් ඉන්න දරුස්මාන් ගැනත් මට කථා කරන්න වනවා. සමුද්‍රයට උඩින් නේ එන්නේ. සමුද්‍රයෙන් වට වෙලා තිබෙන දූපත, මේ ලස්සන රට ඒ වාර්තා නිසා හෝ ඒ වාර්තා අනුව ලියපු ලියුම් අනුව හෝ විනාශ වනවා නම් එතකොට සමුද්‍රයත් විනාශ වනවා. ඒකත් පොඩ්ඩක් තේරුම් ගන්න. එහෙම නැතුව බාධා කළාට වැඩක් නැහැ. ඒ දරුස්මාන් වාර්තාව පිළිගත්තා. උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව පිළිගන්නවාය කියලා කිව්වා. ඒ වාර්තාවට අනුව කටයුතු කරනවාය කිව්වා. එහෙම කියලා ඉවර වෙලා අද එහෙ ගිහින් එකක් කථා කරනවා. මහින්ද සමරසිංහ අමාත්‍යතුමා ජිනීවාවලට ගිහින් එතුමා කරපු කථාව එක්තරා පුවත් පතක මෙහෙම සඳහන් වනවා. "යුද්ධයේ තුවාල සුව කරන්න බාධා නොකර සහය දෙන්න - ඇමති මහින්ද සමරසිංහ ජිනිවා සමුළුවට කියයි. "

".......උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමෙන් පෙන්වා දී ඇති පරිදි සාපරාධී සිදුවීම් සොයා බලා ඊට වගකිව යුතු පුද්ගලයන්ට එරෙහිව නීති මඟින් ක්‍රියාත්මක කරනු ඇත. අවශ්‍ය තන්හිදි තීරණ පතා සාපරාධී ක්‍රියා සම්බන්ධ සිද්ධි නීතිපතිවරයාට ඉදිරිපත් කර ද ඇත. අන්තර් ජාතික මානව හිමිකම් කඩ කිරීමේ චෝදනා සම්බන්ධයෙන් නීතිපතිවරයා දැන් කරුණු සොයා බලාගෙන යයි.

උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශ අනුව අවශ්‍ය තැන්හිදී යුද්ධාධිකරණ ක්‍රියාවලියද අරඹා ඇත."

එහෙම නම් යුද අධිකරණයට ගෙනියන්නේ කවුද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? යුද අධිකරණයට ගෙනියන්න පුළුවන් වන්නේ යුද්ධය කරපු කට්ටිය; එහෙම නැත්නම් යුද හමුදාවේ ඉන්න කට්ටිය. නැත්නම් යුද හමුදාවේ ඉන්න කට්ටිය ගෙනියන්නේ නැතුව, පුළුවන්කමක් නැහැනේ, අපේ අනුර ප්‍රියදර්ශන යාපා ඇමතිතුමාව ගෙනියන්න; සුසන්ත පුංචිනිලමේ නියෝජ්‍ය ඇමතිතුමාව ගෙනියන්න. මහින්ද අමරවීර ඇමතිතුමාව ගෙනියන්න පුළුවන්කමක් නැහැ නේ යුද අධිකරණයට? එහෙම නම් යුද අධිකරණයට ගෙනියන්න පුළුවන් වන්නේ යුද්ධය කරපු යුද හටයා; යුද්ධය මෙහෙයවපු උදවිය. එහෙම නම් කාවද මේ පාවා දීලා තිබෙන්නේ?

ඔබතුමා මාගේ කාලය අවසන් කියලා කියන්න බලා ගෙන සිටින නිසා මම මේ ටික ඉක්මනට කියන්නම්.

දැන් බලන්න මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දරුස්මාන් වාර්තාවට අදාළ ඇමුණුම් අංක 2.16.1හි කියන්නේ මොකක්ද? ජී.එල්. පීරිස් අමාත්‍යවරයා විසින් එහෙමත් නැත්නම් රජය විසින් යැවූ වාර්තාව ගැනයි මම කියන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහි මෙසේ කියනවා:

"හමුදාව සම්බන්ධයෙන් යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමය අත්‍යන්තයෙන්ම නිදහස ලැබූ අවස්ථාවේදී පැවති බ්‍රිතාන්‍ය නීති විද්‍යා මූලධර්ම වලින් උකහා ගන්නා ලද්දකි. යුද හමුදාව, නාවුක හමුදාව සහ ගුවන් හමුදා පනත් යටතේ වැටෙන උල්ලංඝණය කිරීම් සම්බන්ධයෙන් සැක කරනු ලබන සන්නද්ධ සේවා සාමාජිකයන් යුද අධිකරණය නමැති යාන්ත්‍රණයක් මගින් හෝ සිවිල් උසාවියකදී පරීක්ෂණයකට ලක් කල හැකිය. බෙහෝ නඩු ගොනු කර ඇති අතර, ඉන් එකක් නම් "මිරිසුවිල්" නඩුවයි. මෙම නඩුවේදී වර්ෂ 2000 දී සාමාන්‍ය වැසියන් පැහැරගෙන ගොස් මරා දැමීම සම්බන්ධයෙන් විශේෂ අධිකරණයක් ඉදිරියේ යුද හමුදාවේ සාමාජිකයන් හතර දෙනෙකු විනිශ්චයකට භාජනය වෙමින් පවතී"

ඒත් එක්කම තවදුරටත් මෙහෙම කියනවා:

"... හමුදා සාමාජිකයන්ට සහ පොලිස් නිලධාරීන්ට එරෙහිව ගොනු කර ඇත. පොලිස් නිළධාරීන් ආයතන සංග්‍රහය යටතේ ද, විනය පරීක්ෂණ වලට යටත් වේ."

එතකොට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කවුද මේ කියන්නේ? මේ ආණ්ඩුව කියනවා. තවදුරටත් මෙහෙමත් කියනවා:

" සිවිල් (රාජ්‍ය නිළධාරීන්) විසින් උල්ලංඝණයවීම් සිදු වී තිබේ නම් ඔවුන්ට එරෙහිව සිවිල් නඩු පැවරිය හැකිය. ශ්‍රී ලංකාව විසින් තම බැඳීම සහතික කර ඇති ජාත්‍යන්තර වගවීම් උල්ලංඝණය වී තිබේ නම් භූමියේ බල පවත්වන අපරාධ නීතියට අනුකූලවද නඩු පැවරිය හැකිය. එහෙත් මෙම උල්ලංඝණයවීම් අදාල වරදවල් වල විශ්ලේෂණාත්මක පාරාමිතය යටතට වැටුනොත් පමණක් නඩු නිමිත්තක් ඇති වෙයි."

එතකොට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කවුද මේ කරලා තිබෙන්නේ? මේ ආණ්ඩුව ගිහිල්ලා ජිනීවාවල එක කතන්දරයක් කියනවා; තව තැනක තව කතන්දරයක් කියනවා. යුද්ධය කරපු යුද සෙබළාව රජය විසින් පාවාදීමක් සිදු කරලා තිබෙනවා. රජය විසින්, ආණ්ඩුව විසින්, මේ ආණ්ඩුවේ ඇමතිවරුන් විධියට හමුදාව පාවා දීමක් සිදු කරලා තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ස්තුතියි, අවසන් කරන්න.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මම අවසන් කරනවා, මට තව විනාඩියක් දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඊයේ පෙරේදා දවසක තමුන්නාන්සේලා සියලු දෙනාවම අරන් ගිහින් දියතලාවේ පුහුණුවක් තිබුණා. අපි දැක්කා, සුදු පාට ලස්සන ටී-ෂර්ට් එකක් ඇඳලා ඔබතුමාත් ඉඳ ගෙන ඉන්නවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
පරිසර දූෂණයට ඒක අදාළ නැහැ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
දියතලාව ඉතාමත් වටිනා පරිසරයක් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා ඒ පරිසරයට ගැළපෙන ලස්සන ටී-ෂර්ට් එකක් ඇඳ ගෙන සිටියා. ඒ ටී-ෂර්ට් එකේ ලස්සන badge එකක් තිබුණා. විශේෂ බල කායේ -SF එකේ -බැජ් එකේ තිබෙනවා, "නොහැක්කක් නොමැත" කියලා. අපි දැක්කා, ඔබතුමන්ලාගේ ටී-ෂර්ට් එකේත් ලස්සන badge එකක් ගහලා තිබුණා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඒ ගැන අපි කථා නොකර ඉදිමු. එය මේ විෂයයට අදාළ නැහැ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
"කවුරු හරි පාවා දී අපි බේරෙන්නෙමු" කියලා ලස්සන badge එකක් ගහලා තිබුණා. අන්න ඒ න්‍යාය අනුව හමුදාව පාවා දීලා ඔබතුමන්ලා බේරෙන්න හදන එක ගැන අපි කනගාටු වනවා කියන එක ප්‍රකාශ කරමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මමත් ඒ පුහුණුවට ගියා. මම නම් එහෙම දෙයක් දැක්කේ නැහැ; එහෙම දෙයක් තිබුණේ නැහැ.

දැන් ගරු සුසන්ත පුංචිනිලමේ නියෝජ්‍ය ඇමතිතුමා.

[අ.භා. 5.27]

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Deputy Minister of Fisheries and Aquatic Resources Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පැරණි මිත්‍රයන්ගේ කථා සියල්ලටම ඇහුම්කන් දුන්නා. [බාධා කිරීමක්] දැනුත් මිත්‍රයි. පරණ මිත්‍රකම් ගොඩක් දීර්ඝයි නේ. අපේ ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා, හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා, විජිත හේරත් මන්ත්‍රීතුමා, දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා, ඒ වාගේම රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේත්, ඒ වාගේම පරිසර අමාත්‍යාංශයේම කොටසක් වන මැණික් හා ස්වර්ණාභරණ අංශය යටතේත්, ඒ වාගේම ධීවර කටයුතු යටතේත් නොයෙක් නොයෙක් කරුණු කාරණා -අපි ඇත්ත නැත්ත දන්නේ නැහැ- මේ ගරු පාර්ලිමේන්තුවේදී විදහා දැක් වූවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනුර ප්‍රියදර්ශන ඇමතිතුමා සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ මේ නියෝග ගෙනැත් තිබෙන්නේ, ඉදිරි කාලයේදී අපේ රටේ තෙල් සම්පත ගන්න කොට ඉදිරියට මේ රටට විශේෂයෙන්ම ධීවර ජනතාවට එහෙම නැත්නම් අපේ රටේ පරිසරයට, යම් හානියක් වෙනවා නම් ඒ හානිය වළක්වා ගන්නත් ඒ වාගේම යම් හානියක් වුණොත් ඊට වන්දි ලබා ගන්නත් අවශ්‍ය කරන නීති රීති අද පාර්ලිමේන්තුවේදී සම්මත කර ගන්නටයි. එය කරලා තිබුණේ නැත්නම් අපේ විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් කියයි, "එදා මෙය කළේ නැති නිසා තමයි මෙන්න මේ දේ සිදු වුණේ." කියලා. ඒකත් ආණ්ඩුවටම තමයි හැම වෙලාවේම බැර කරන්නට හදන්නේ. ඒ වාගේම අපේ මේ කථා කරපු මන්ත්‍රීවරුන් සියලු දෙනාම නොයෙක් නොයෙක් කාරණා පිළිබඳව කරුණු දැක්වූවා. අපේ ධීවර ජනතාව වෙනුවෙන් අපිත් කනගාටු වනවා. අපේ වික්ටර් ඇන්ටනි ගරු මන්ත්‍රීතුමා සඳහන් කරපු ආකාරයට හලාවත එම ධීවර තරුණයා මිය යාම පිළිබඳව අපිත් කනගාටු වනවා. ඒ සම්බන්ධයෙන් රජය දැන් ස්වාධීන පරීක්ෂණයක් කරගෙන යනවා. යම් අසාධාරණයක් සිදු වෙලා තිබෙනවා නම් ඒ සඳහා වග කිවයුතු අයට දඬුවම් පමුණුවන්නත් රජය කටයුතු කරගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම එම ධීවර ප්‍රශ්නය සම්බන්ධයෙන් ගත්තොත්, ලෝකයේ තෙල් මිල වැඩි වන ප්‍රශ්නයට ලංකාවේ කොයි ආණ්ඩුව තිබුණත් එයට මුහුණ දෙන්නට සිදු වනවා. අතීතයේත් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩු, එහෙම නැත්නම් එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩු, එහෙමත් නැත්නම් ජනතා විමුක්ති පෙරමුණ සමඟ සන්ධාන ගතවුණු ආණ්ඩු, ඒ සෑම ආණ්ඩුවක්ම මේ ප්‍රශ්නයට මුහුණ දීලා තිබෙනවා. හැබැයි, ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් යුත් අපේ ආණ්ඩුව වාගේ එම ධීවර ජනතාවට මේ වාගේ සහන දෙන ක්‍රමයක් මොනම ආණ්ඩුවක් විසින්වත් ඇති කරලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන්ම බහු දින යාත්‍රාවලට, එක් දින යාත්‍රාවලට, ඒ වාගේම සුළු වශයෙන් ධීවර කර්මාන්තය කරන යාත්‍රාවලට දෙන්නට පුළුවන් උපරිම සහන අද වනකොට ධීවර ජනතාව වෙනුවෙන් මේ ආණ්ඩුව ලබා දීලා

[ගරු සුසන්ත පුංචිනිලමේ මහතා]

තිබෙනවා. ඒ සහන ලබා දීපු නිසා තමයි ලංකාවේම ධීවර ජනතාව අද මේ ආණ්ඩුව කෙරෙහි ප්‍රසාදයකින් කටයුතු කරන්නේ. විශේෂයෙන්ම මෙය අපේ රටට විතරක් බලපාපු ප්‍රශ්නයක් නොවෙයි. මොකද, අපේ රටෙන් තෙල් හමු වන්නේ නැහැ. අනාගතයේ දී අපේ රටෙන් තෙල් හමු වන්නට අවස්ථාව තිබෙන්නට පුළුවන්. නමුත් අපි ඒ ප්‍රශ්නයට සාර්ථකව මුහුණ දුන්නා. මා නියෝජනය කරන්නේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය. එහි සිටින්නේ බහුතරයක් ධීවර ජනතාව. අපි එම ප්‍රශ්නයට සාර්ථකව මුහුණ දුන් නිසා තමයි එම ධීවර ජනතාවගේ ප්‍රසාදය අද වනකොට ආණ්ඩුවට හිමි වෙලා තිබෙන්නේ. නමුත් විරුද්ධ පක්ෂය හැම වෙලාවේම බලන්නේ, යම් දෙයක් සිදු වුණා නම් තමන්ට වාසියක් ගන්න පුළුවන් විධියට එහි වැරැද්දක් උලුප්ප උලුප්පා පෙන්වමින් ජනතාව පාරට ගෙනෙන්නට කටයුතු කරන්නයි. එය විරුද්ධ පක්ෂයේ කාර්යභාරයක් ලෙස ඉටු කරන්නට හදනවා. රටක් වශයෙන් ඒවා අසාර්ථක සිදු වීම්. යම් කිසි ව්‍යසනයක් සිදු වනකොට අපි රටක් වශයෙන් එක් විය යුතුයි. නමුත් එහෙම එක් වන්නේ නැති එක තමයි අපේ කනගාටුවට කාරණයක් වන්නේ.

ධීවර ජනතාවගේ පැත්තෙන් ගත්තොත්, අද ගෙනාපු මේ නියෝගයන් විශේෂයෙන්ම ඉතා වැදගත් වනවා. මොකද, යම් කාරණා විශේෂයෙන්ම බලපාන්නේ ධීවර ජනතාවටයි. ධීවර සම්පත නැති වෙලා, ධීවර සම්පත විනාශ වෙලා, නොයෙකුත් විශාල පරිසර හානි ඇති වන්නට පුළුවන්. මා හිතන්නේ අපේ වික්ටර් ඇන්ටනි ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වාගේ, - එතුමා සුනාමියට බලපාපු කරුණුත් කිව්වා.- ඇත්ත වශයෙන්ම අප විසින් පරිසරය විනාශ කරපු ස්ථානවල තමයි මේ සුනාමි ව්‍යසනය වුණත් වැඩි වුණේ. හික්කඩුවේත් මේ දේ සිදු වුණා. ඒ වාගේම හම්බන්තොට බ්‍රවුන්ස් බීච්, යාල සෆාරි හෝටලය වාගේ තැන් විනාශයට පත් වුණේ එම හෝටල් ඉස්සරහා තිබුණු ස්වාභාවික වැලි කඳු කපා ඉවත් කරපු නිසායි. විශේෂයෙන්ම ඒ තැන්වල සුනාමිය නිසා සිදු වුණු හානිය ප්‍රබල වුණා. ඒ වාගේ මේ රටේ සුනාමිය නිසා සිදු වුණු හානිය, අනවසර වැලි ගොඩ දැමීම වැනි නොයෙකුත් කරුණු කාරණා හදාරලා තමයි අපි මේ වාගේ නියෝග ගෙනල්ලා ඉදිරි අනාගතයේ දී මේ සමුද්‍ර දූෂණය සිදු වන එක වළක්වන්නට කටයුතු සූදානම් කරගෙන යන්නේ. විශේෂයෙන්ම අනාගතයේ දී අපේ රටේ දියුණුව ගැන සලකා යම් කාරණයක් පිළිබඳ අපි කථා කරනකොට ඒ පිළිබඳව ගැඹුරට හදාරා තිබෙන්නට ඕනෑ.

විජිත හේරත් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, වැලි ගොඩ දැමීමේ බලපත්‍ර පිළිබඳව. මා ගරු ඇමතිතුමාගෙන් ඇහුවා, මොකක්ද මේ හොර බලපත්‍ර කියලා එකක් තිබෙනවාද කියලා. එහෙම එකක් නැහැ. හොර බලපත්‍ර ගහන මනුෂ්‍යයෙක් අහුවෙලා තිබෙනවා. ඒ මනුෂ්‍යයා අහු වෙච්ච නිසා ලංකාවේම නීත්‍යානුකූල බලපත්‍ර ලබාගෙන වැලි ප්‍රවාහනය කරන ලොරි ටික නතර කරලා. ඉතින් ඒ නතර කරපු පමණින් ඒවා හොර බලපත්‍ර වන්නට කොහෙත්ම ඉඩ නැහැයි කියලා ගරු ඇමතිතුමා ප්‍රකාශ කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් පලතුරු ගොඩක් ගත්තාම, එහි ඉඳුණු ඒවා වාගේම කුණු වුණු ඒවාත් තිබෙනවා. ඒ නිසා යම් වැඩක් කරද්දී හොර වැඩත් සිදු වනවා. ඒවා සිදු නොවනවා නොවෙයි. ඒක නිල් ආණ්ඩුවද, කොළ ආණ්ඩුවද කියලා නැහැ.

කොයි කාලයේත් ඒ වාගේ දේවල් සිදු වන්න පුළුවන්. ඒවා සම්පූර්ණයෙන් නැති කරන්න පුළුවන් නම් අපි කවුරුත් කැමැතියි.

අපේ පාලිත රංගේ බණ්ඩාර මන්ත්‍රීතුමා විශේෂයෙන්ම කථා කළා, ලුණුගම්වෙහෙර මැණික් ඉල්ලම පිළිබඳව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේම රටක කොහෙන් හෝ මැණික් සම්පත හම්බ වනවා නම් ඒක ඒ රටේ, ඒ ප්‍රදේශයේ ජනතාවගේ සෞභාග්‍යයක් හැටියට තමයි සලකන්නේ. රටක එවැනි සම්පත් බිහි වන්නේ රටේ නායකයාගේ යහ පාලනය නිසා ඒ රටට යහපතක් වෙන්නයි. ඒ වාගේ දෙයක් ඇති වුණාම මා කලින් කිව්වා වාගේ ඉදුණු පලතුරු එක්ක කුණු වෙච්ච පලතුරුත් තිබෙනවා වාගේ සුළු සුළු සිදු වීම් වෙන්න පුළුවන්. ඉතින් එක සිදු වීමක් සිදු වුණු පමණින් එහෙම කියන එක වැරැදියි. සමස්තයක් වශයෙන් හැම කෙනාටම ඒක ගැළපෙන්නේ නැහැයි කියලා අපි කියන්න ඕනෑ. ඒ මැණික් ඉල්ලම නිසා අද වන කොට රටේ සමස්ත ජනතාව කුඩා පරිමාණයේ සිට මහා පරිමාණයේ මැණික් වෙළෙන්දා දක්වා විශාල ආදායමක් ලබා ගෙන තිබෙනවා. ඒ වාගේම රටට විශාල ආදායමක් ලැබී තිබෙනවා. කතරගම අවට ප්‍රදේශයේ අහිංසක මිනිස්සු විශාල ප්‍රමාණයක් අද යමක් කමක් ඇති මිනිසුන් බවට පත් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමා කිව්වා, අපේ රටේ මැණික් සම්පත පිළිබඳව ගවේෂණයක් කරලා, වෙනත් රටවල වාගේ මැණික් තිබෙන ප්‍රදේශ හඳුනා ගෙන, ගම්වල අයට වාගේම නගරවල අයටත් ඒවා ලබා ගන්න පුළුවන් ක්‍රමවේදයක් ඇති කරන්න එතුමා සැලසුම් කර ගෙන යනවාය කියලා.

ඒ විතරක් නොවෙයි. විශේෂයෙන්ම ධීවර ජනතාවට බලපාන යම් කිසි කරුණු කාරණා තිබෙනවා නම්, වික්ටර් ඇන්ටනි මන්ත්‍රීතුමා කිව්වා වාගේ යම් කිසි ක්‍රමවේදයක් වෙනස් කරලා කොහේ හෝ මාදැල් කර්මාන්තය කරනවා නම්, ධීවර අමාත්‍යාංශයේ NARA ආයතනය ඒ පිළිබඳව අධ්‍යයනයක් කරලා, එසේ සිදු වන්නට හේතුව සොයා බලා, දැනට තිබෙන නීතිරීති වෙනස් කරලා හෝ අලුත් නීතිරීති ගෙනැවිත් හෝ ධීවර ජනතාවට අහිතකර තත්ත්වයක් ඇති නොවන විධියට වැඩ කටයුතු කරන්න අපි බලාපොරොත්තු වනවා.

අපේ දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා කිව්වා, අපගේ වරායන්වල තිබෙන වැලි ගොඩ දමන එක නොයෙක් නොයෙක් අයට භාර දීලා තිබෙනවාය කියලා. මා දන්නා විධියට දැනට අපේ අමාත්‍යාංශයෙන් යන්ත්‍රෝපකරණ ඇණවුම් කරලා තිබෙනවා. සාමාන්‍ය ක්‍රමය තමයි අවශ්‍ය ප්‍රමාණයට වැලි ගොඩ දමා ඒවා නැවතත් වෙරළට මුදා හරින එක. එහෙම මුදා හැරියොත් තමයි ඒ ක්‍රියාදාමය හරියාකාරව සිද්ධ වන්නේ. වැලි වැඩිපුර ප්‍රමාණයක් තිබෙනවා නම් තමයි ඒවා විකුණන්නට හෝ වෙනත් කාර්යයන් සඳහා යොදා ගන්නට හැකියාව ලැබී තිබෙන්නේ.

මඩකළපුව දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීතුමාත් මේ ගරු සභාවේ කථා කළා. ඒ වාගේම අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා කථා කරමින් කිව්වා, ඉන්දීය ධීවර යාත්‍රා අපේ මුහුදු තීරයට එනවාය කියලා. ඇත්ත වශයෙන්ම ඉන්දීය ධීවර යාත්‍රා අපේ මුහුදු තීරයට එනවා. ඒ එන බෝට්ටු යකඩ බෝට්ටු. ඒ බෝට්ටුවල හැපුණොත් විනාශ වන නිසා ඒ බෝට්ටුවලට අපේ බෝට්ටු කිට්ටු කරන්නවත්, අපේ නාවික යාත්‍රා කිට්ටු කරන්නවත් බැහැ. ඉදිරියේදී ඉන්දීය ධීවර යාත්‍රා අපේ මුහුදු තීරයට පැමිණීම වැළැක්වීම සම්බන්ධයෙන් පසු ගිය මාසයේ ඉන්දියාවෙන් පැමිණි විශේෂ දූත පිරිස සමඟ සාකච්ඡා කළා. අනාගතයේදී මේ ක්‍රියාදාමය නතර කරන්නත්, ඒ සඳහා අවශ්‍ය කරන උපකරණ ලබා ගෙන ඒවා ස්ථාපිත කරන්නත් ධීවර අමාත්‍යාංශයත්, අපේ රාජිත සේනාරත්න ඇමතිතුමාත්, ලේකම්තුමිය ඇතුළු සියලු දෙනාමත් මේ වන කොට සාකච්ඡා කර ගෙන යනවා. දැනට සාකච්ඡා වට කිහිපයක් පවත්වා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. ඊයේ චීනයෙන් පැමිණි දූත පිරිසක් සමඟ ධීවර ජනතාව සම්බන්ධයෙන් සාකච්ඡා කළා. අපදාවලට ලක් වන ධීවරයන් සම්බන්ධයෙනුත්, ස්වාභාවික විපත් ඇති වන කොට ඒ සම්බන්ධයෙන් කටයුතු කරන යන්ත්‍රෝපකරණ ගෙන්වා ගෙන, ඒවා ගැන ජනතාව දැනුවත් කරලා එවැනි ව්‍යසනයන් ඇති නොවන්න කටයුතු කරන්නත්, අපේ ධීවරයන් ගසා ගෙන ගියොත් ඒ බෝට්ටු ලංකාවට නැවත රැගෙන ඒමට අවශ්‍ය කරන උපකරණ ලබා ගන්නත් අපදා කළමනාකරණ අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කරමින් පවතිනවා.

ගරු මන්ත්‍රීතුමන්ලා ප්‍රකාශ කළා වාගේ වැලි ගොඩ දමන එක මුදලාලිලා කරනවාද, වෙනත් කවුරුත් කරනවාද කියලා අපි දන්නේ නැහැ. සමහර විට දැනට අප සතුව යන්ත්‍රෝපකරණ නැති නිසා කාගේ හෝ යන්ත්‍රෝපකරණ කුලියට අරගෙන වැලි ගොඩ දමා, අනවශ්‍ය වැලි ප්‍රමාණය ඉවත් කරනවා වෙන්නත් පුළුවන්. නමුත් ඉදිරියේදී අපේ අමාත්‍යාංශය මඟින් අපේ දෙපාර්තමේන්තුව හරහා අවශ්‍ය කරන ඒ යන්ත්‍රෝපකරණ ගෙන්වා ගෙන ඒ කටයුතු කිරීමට අවශ්‍ය කරන පියවර ගන්නා බව ප්‍රකාශ කරනවා. මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි, අපේ අමාත්‍යාංශ අතර සම්බන්ධීකරණයක් ඇති කරන්න අපි ඉදිරියේදී කටයුතු කරන බව. විශේෂයෙන්ම පරිසර අමාත්‍යාංශය සහ අපේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව වාගේම අනෙකුත් දෙපාර්තමේන්තු ඇතුළු සියලු ආයතන එකට එකතු වෙලා සාකච්ඡා කරලා තමයි ඉදිරියේදී ක්‍රියාමාර්ග ගන්න යන්නේ. අපි දැනට ගන්නා වූ ගොඩක් ක්‍රියාමාර්ග වරදින්න හේතුව තමයි, අපි තනියම ඒ දේවල් ක්‍රියාත්මක කරන්න යෑම. නමුත් අපි දැන් ඒ ක්‍රමවේදයෙන් බැහැරව එකිනෙකට සම්බන්ධ වන විෂයයන්, කරුණු එකට සාකච්ඡා කරලා හරියට ඒ කටයුතු කළොත් මම හිතන්නේ ඉදිරියේදී පරිසර දූෂණය, වෙරළ දූෂණය, එහෙම නැත්නම් නාස්තිය වැළැක්වීමේ හැකියාව තිබෙනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඒ බවද ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා.

## භික්ෂූන් වහන්සේලාට නොමිලේ ප්‍රවාහන පහසුකම්
## பிக்குமாருக்கு இலவச போக்குவரத்து வசதிகள்
## FREE TRANSPORT FACILITIES FOR BUDDHIST MONKS

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේදී මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකාව තුළ 2600 වැනි සම්බුද්ධ ජයන්තිය සැමරීම වෙනුවෙන් භික්ෂූන් වහන්සේලාට නොමිලේ රජයට අයත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල සේවාවට අයත් බස් වල හා රජයට අයත් දුම්රිය සේවා මැදිරිවල නොමිලේ ගමන් කිරීමේ අවස්ථාව ලබා දිය යුතු යැයි යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව ඉතාම කාලීන යෝජනාවක්. මොකද, අද මේ ප්‍රශ්නය කාලීන ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ගරුතර මහා සංඝ රත්නය ආගම ධර්මය ගැන සාකච්ඡා කරන අවස්ථාවලදීත්, පෞද්ගලික සාකච්ඡාවලදීත් මේ පහසුකම් ගැන කතිකාවතක් ඇති වෙලා තිබෙනවා. මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ අපේ සමහර විහාරස්ථාන පොහොසත් විහාරස්ථාන නොවන බව. එදා සිංහල රජ කාලයේ විහාරස්ථානයක් ආරම්භ කරන කොට සිංහල රජ දරුවන් ඒ විහාරස්ථානය වෙනුවෙන් නින්ද ගම්, ඒ වාගේම හැටපස් අමුණු ගම්වරක් ලබා දුන්නා. නමුත් අද එවැනි තත්ත්වයක් නැහැ. අද විහාරස්ථාන ආරම්භ කරන්නේ භික්ෂූන් වහන්සේලා. ඒ විහාරස්ථාන ආරම්භ කළාට පස්සේ ඒවා පවත්වා ගෙන යන්න කටයුතු කරන්නේ දායක සභාව. බොහෝ විහාරස්ථාන අවට ඉන්න දායක සභාව හා ජනතාව ජීවන බරින් මිරිකී සිටින දුප්පත් ජනතාවක්. ඇත්ත වශයෙන්ම දායක සභාවෙන් ඒ විහාරස්ථානවලට ලැබිය යුතු දාන වේල ලැබෙනවා. නමුත් බොහෝ විහාරස්ථානවලට දායක සභාවට මුදල් දීමේ අපහසුතාවක් තිබෙනවා. එම නිසා තමයි මම යෝජනා කරන්නේ භික්ෂූන් වහන්සේලාට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්වල සහ රජයට අයත් දුම්රිය මැදිරිවල නොමිලේ ප්‍රවාහන පහසුකම් ලබා දෙන්න කියලා.

රජයට මේ පහසුකම ලබා දෙන්න පුළුවන් නම් ශාසනික කටයුතු ඉදිරියට කර ගෙන යන්න ඒකෙන් විශාල දායකත්වයක් ලැබෙනවා. බුරුමය, කාම්බෝජය, ලාඕසය වැනි බොහෝ බෞද්ධ රටවල භික්ෂූන් වහන්සේලාට මේ පහසුකම් ලබා දී තිබෙනවා. අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වෙනවා, බෞද්ධාගමට ප්‍රමුඛස්ථානයක් ලබා දිය යුතුයි කියා. අනිකුත් ආගම්වලට සමාන අයිතිවාසිකම් දෙන අතර බෞද්ධාගමට ප්‍රමුඛස්ථානයක් ලබා දිය යුතුයි කියා අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වෙනවා. ඒ නිසා මේ යෝජනාව සම්බන්ධයෙන් රජය යහපත් ප්‍රතිචාරයක් දක්වාවිය කියා මා හිතනවා. මේ සම්බන්ධයෙන් රජය වෙනුවෙන් කවුරු හරි කථා කරනවාද කියාත් මම අහන්න කැමැතියි. මම කනගාටු වෙනවා, අපේ ගරු අග්‍රාමාත්‍ය, බුද්ධ ශාසන හා ආගමික කටයුතු ඇමතිතුමා මේ අවස්ථාවේ පාර්ලිමේන්තුවේ නොසිටීම ගැන. මම මේ ඉල්ලීම කරන්නේ ගරුතර මහා සංඝ රත්නයත් සමඟ සාකච්ඡා කිරීමෙන් පසුවයි. මහා නායක ස්වාමීන් වහන්සේලා සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව තමයි මම මේ ඉල්ලීම ඉදිරිපත් කරන්නේ. ඇත්ත වශයෙන්ම බෞද්ධ රටක් වශයෙන් අපි කනගාටු වෙන්න ඕනෑ බුද්ධ ශාසන හා ආගමික කටයුතු ඇමතිතුමා මේ අවස්ථාවේදී පාර්ලිමේන්තුවේ නොසිටීම ගැන.

මම මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ අපේ පී. හැරිසන් මන්ත්‍රීතුමා මේ යෝජනාව ස්ථිර කරනවා. තවත් මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් කතා කරන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. විශේෂයෙන්ම, 2600 සම්බුද්ධත්ව ජයන්තිය සමරන අවස්ථාවේදී රජයෙන් ලබා දිය යුතු දායකත්වය මොකක්ද කියා මම අහනවා. අපි රූපවාහිනියෙන් දකිනවා, 2600 සම්බුද්ධත්ව ජයන්තිය සමරනවාය කියා. නමුත් විහාරස්ථාන දියුණු කිරීම සඳහා ප්‍රායෝගිකව වැඩ පිළිවෙළක් තිබෙනවාද කියන එක ගැන මම රජයෙන් ප්‍රශ්න කරනවා. භික්ෂූන් වහන්සේලා හමු වුණාම උන්වහන්සේලා නිතර කියන එකක් තමයි, රජයට මේ ගැන ප්‍රායෝගික වැඩ පිළිවෙළක් නැහැ කියන එක. 2600 සම්බුද්ධත්ව ජයන්තිය සමරනවාය කියා රූපවාහිනී වැඩසටහන් තිබෙනවා. නමුත් විහාරස්ථාන තෝරා බේරා ගෙන ඒවා දියුණු කිරීම සඳහා පැහැදිලි වැඩ පිළිවෙළක් නොමැති වීම ගැන අපි කනගාටු වෙනවා. ස්තුතියි.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා ඉදිරිපත් කර තිබෙන්නේ කාලෝචිත යෝජනාවක්ය කියන එකයි මගේ අදහස. මොකද, මම දන්නවා අපේ ස්වාමීන් වහන්සේලා හුඟ දෙනෙක් පාවිච්චි කරන්නේ දේශපාලන වේදිකාවලට විතරයි කියා. මැතිවරණ කාලයට උන් වහන්සේලාට කියනවා සිංහලකම, බෞද්ධකම එළි දක්වන්නය කියා. අද මම විශේෂයෙන්ම තමුන්නාන්සේලාට මතක් කරනවා, මේ රටේ පන්සල් 10,334ක් තිබෙන බව. මේවා දැනට බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වෙච්ච ඒවායි. භික්ෂූන් වහන්සේලා 40,000ක් විතර මේ රටේ ඉන්නවා. භික්ෂූන් වහන්සේලා මෙතරම් විශාල ප්‍රමාණයක් හිටියත් මම තමුන්නාන්සේලාට මතක් කරන්න ඕනෑ, පන්සල් වැඩි කොටසක භික්ෂූන් වහන්සේලාට ලැබෙන සිවුපසය දිහා බැලුවාම සෑහීමකට පත් වෙන්න බැහැ කියන එක.

අපේ හිතවත් ගරු සුසන්ත පුංචිනිලමේ නියෝජ්‍ය ඇමතිතුමා මේ සභාවේ ඉන්නවා. එතුමා දන්නවා, ත්‍රිකුණාමලය ප්‍රදේශයේ ඉන්න ස්වාමීන් වහන්සේලා පහු ගිය කාලයේ පැවැති දුෂ්කර අවස්ථාවලදී බුද්ධ ශාසනය ආරක්ෂා කර ගන්න ලොකු කැප වීමක් කළාය කියන එක. ඒ නිසයි මම කිව්වේ අපේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා ඉදිරිපත් කර තිබෙන්නේ කාලෝචිත යෝජනාවක්ය කියා. මොකද, ඒ භික්ෂූන් වහන්සේලාට අපි ලොකු ගෞරවයක් දක්වන්න ඕනෑ. අපි දැක්කා පහු ගිය දවස්වල බුරුම රටෙන් පිරිසක් ගෙන්වා මේ රටේ පන්සල්වල මහණ කළ බව. ඇතැම් පන්සල් වැහිලා ගිහින්ය කියා සමහරුන් කියනවා. මා ජීවත් වන අනුරාධුපර දිස්ත්‍රික්කයේ පන්සල් 700ක් විතර තිබෙනවා.

මේ පන්සල් 700න් මේ වාගේ පහසුකම් ලැබෙන පන්සල් සංඛ්‍යාව ගත්තොත් පන්සල් 100ක්වත් නැති තරම්. පදවිය වාගේ ප්‍රදේශයක් ගත්තොත් එහි පන්සල් 13ක් විතර තිබෙනවා. ඒවා හරිම දුෂ්කර පන්සල්. දුෂ්කරය කියන්නේ එක පැත්තකින් එම ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට මේ පන්සල් නඩත්තු කරන එක හරි අපහසු කාර්යයක් වෙලා තිබෙනවා. මොකද, ස්වාමීන් වහන්සේලාගේ පහසුකම් සපයන්නට ඕනෑ. එක්කෝ ධර්ම දේශනාවකට ගිහින් ලැබෙන පිරිකරෙන්, එහෙම නැත්නම් දායකයෝ දෙන දෙයකින් තමයි ඒ ස්වාමීන් වහන්සේලාට වැඩ කටයුතු කර ගන්නට සිද්ධ වෙලා තිබෙන්නේ.

ගරු අනුර ප්‍රියදර්ශන යාපා ඇමතිතුමා කිව්වා දානය දෙන්නේ නැහැ කියා. දානය දෙන ඒවා ඔක්කොම මම තමුන්නාන්සේට මතක් කරන්නම්. [බාධා කිරීමක්] මම දෙනවා. භය වෙන්නට එපා. [බාධා කිරීමක්] ඔබතුමා එහෙම දෙනවා. ඒ විතරක් නොවෙයි. දුෂ්කර පළාත්වල තිබෙන ඒ පන්සල්වලට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආදායම් මාර්ග නැහැ. අප දන්නවා, නගරබදව තිබෙන පෞරාණික පන්සල්වලට, රජමහා විහාරස්ථානවලට නින්දගම් තිබෙනවා. ඒවාට ආදායම් මාර්ග තිබෙනවා. නමුත් ගම්බද ප්‍රදේශවල තිබෙන පන්සල්වලට අර දායකයන්ගෙන් ලැබෙන ආධාරය හැරෙන්න වෙන කිසිවක් ලැබෙන්නේ නැහැ. එම නිසා අප යෝජනා කරන්නේ මේ විහාරස්ථානවල ස්වාමීන් වහන්සේලාට අඩුම තරමේ ගමන් යාමට ප්‍රවාහන පහසුකමවත් ලබා දෙනවා නම් ලොකු දෙයක් කියායි. ඉතිහාසයේ ලංකාවේ බස් කොම්පැනි කාලයේ මේ පහසුකම දීලා තිබෙනවා. ප්‍රනාන්දු මැතිතුමාගේ කොළඹ බස් කොම්පැනිය තිබුණු කාලයේ එතුමා ස්වාමීන් වහන්සේලාට නොමිලේ බස්වල ගමන් කිරීමට පහසුකම දුන්නා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ -අපේ අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමාගේ දිස්ත්‍රික්කයේ- " ග්‍රීන් ලයින්" කියා පෞද්ගලික බස් රථ සමාගමක් තිබුණා. ඒ බස් රථ සමාගම ස්වාමීන් වහන්සේලාට ගමන් බිමන් යන්න ඒ පහසුකම දුන්නා. ඒ බස් කොම්පැනි කාලයේදී. ඒ විතරක් නොවෙයි. මේ ගරු සභාව නියෝජනය කළ ආචාර්ය දහනායක මැතිතුමා අගමැතිව සිටි කාලයේ මේ ගරු සභාවට යෝජනාවක් ගෙනැවිත් සම්මත කර ස්වාමීන් වහන්සේලාට කූපන් ක්‍රමයකට බස්වල යන්නට පුළුවන් විධියට අවස්ථාව දී තිබෙනවා. එම නිසා මේක අලුතෙන්ම පටන් ගන්නා ක්‍රමයක් නොවෙයි.

ගරු කිරිඇල්ල මන්ත්‍රීතුමා කිව්වා අද විදේශ රටවල මේ පහසුකම තිබෙනවාය කියා. බුරුමයේ තිබෙනවා. මේ පහසුකම තායිලන්තයේ දෙනවා. ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා ඒ බව දන්නවා. මේක අලුත් දෙයක් නොවෙයි. බුද්ධ ශාසනය වෙනුවෙන් ලොකු කැපවීමක් කරන භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් මේ පහසුකම ලබා දීම ඉතා වැදගත් වෙනවා. බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා මේක කාලෝචිත යෝජනාවක්. සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් අපේ ගරු අගමැතිතුමා උත්සව රාශියකට ගිහින් තිබුණා. නමුත් සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් තමුන්නාන්සේලා මොනවාද කර තිබෙන්නේ? විශේෂයෙන් අපේ දිස්ත්‍රික්කයේ දැයට කිරුළ ප්‍රදර්ශනයත් එක්කම සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් ඒ ප්‍රදේශවලට, ශාසනයට ඇති වෙලා තිබෙන ප්‍රගතිය මොකක්ද කියා අප සොයා බැලුවා. එතුමන්ලා පන්සල් 262ක් තෝරා ගෙන තිබුණා. ඒ පන්සල් 262න් පන්සල් 25කට රුපියල් ලක්ෂය ගණනේ දීලා තිබෙනවා. ඒ වාගේම අනුරාධපුර දිස්ත්‍රික්කයේ දහම් පාසල් 706ක් තිබෙනවා. එයින් දහම් පාසල් 21කට රුපියල් 15,000 ගණනේ දී තිබෙනවා. ලක්ෂ 25යි පන්සල්වලට. දහම් පාසල් 21කට රුපියල් 15,000 ගණනේ දීලා කිබෙනවා. ඒ ඔක්කොම ගත්තොත් සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් රුපියල් ලක්ෂ 28කට ලක්ෂ 30කට වඩා දීලා නැහැ. සම්බුද්ධත්ව ජයන්තියට මේ විධියට සැලකුවාට දැයට කිරුළ සංදර්ශනය භාරව කටයුතු කළ ගරු සියඹලාපිටිය ඇමතිතුමා කියනවා, ඒ සංදර්ශනය වෙනුවෙන් කෝටි 2,180ක් වියදම් කර තිබෙනවාය කියා. [බාධා කිරීම්] ඔබතුමා කියන ඔය සංවර්ධනය වෙලා තිබෙනවා නම් මම මෙහෙම කියන්නේ නැහැ නේ. [බාධා කිරීම්] මේ පන්සල්වලට දුන්නු ගණන තමයි මේ. [බාධා කිරීම්] මා බොරු කියනවා නම් ඔබතුමාගේ කථාවේදී මේක නිවැරදි කරන්න. [බාධා කිරීම්] මම අනුරාධපුරය ගැනයි කිව්වේ. පන්සල් 262න් පන්සල් 25කට දීලා මුදල් තිබෙනවා. මම නැහැ කියන්නේ නැහැ. දහම් පාසල්-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! බොරුවක් වශයෙන් කියනවා නම් තමුන්නාන්සේට කියන්න බැහැ ඒක නිවැරදි කරන්නය කියා. බොරුවක් වශයෙන් නම් තමුන්නාන්සේ කියන්නේ-

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

නැහැ, නැහැ. මම අසත්‍යය කියනවා නම් ඒක නිවැරදි කරන්න ඔබතුමාට පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අසත්‍යය කියන්නේ නැහැ. මට මේ සභාව නොමඟ යවන්න අවශ්‍යතාවක් නැහැ. මම ඒ දිස්ත්‍රික්කයේ කෙනෙක් හැටියටයි කථා කරන්නේ. මම කිව්වේ පන්සල් 262ක් තෝරා ගෙන තිබුණා කියලායි. එහෙම නම් මට කියන්න තිබුණා නේ පන්සල් 700ම තෝරා ගත්තා කියලා. පන්සල් 262ක් තෝරා ගෙන තිබෙනවා. එයින් පන්සල් 25කට දීලා තිබෙනවා. [බාධා කිරීමක්] ඉතින් ඒක කියන්න කෝ, කවදාද හම්බ වෙන්නේ කියලා. සම්බුද්ධත්ව ජයන්තිය මේ වෙසක් පොහොයෙන් ඉවරයි. දැන් අවුරුද්දේ තුන්කාලක් ගිහින් ඉවරයි. මේ වෙසක් පොහොයෙන් සම්බුද්ධත්ව ජයන්තිය ඉවරයි. හැබැයි පන්සල් 25ටයි දීලා තිබෙන්නේ.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே )
(The Hon. Susantha Punchinilame)
බුද්ධ ශාසන නියෝජ්‍ය අමාත්‍යතුමා කිව්වා දෙනවා කියලා.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මම දන්නේ නැහැ. [බාධා කිරීමක්] ඒ විතරක් නොවෙයි, දහම් පාසල් 706ක් තිබෙනවා. ඒ දහම් පාසල් 706න් 21කට විතරයි දීලා තිබෙන්නේ. ඒක නිසායි මම මේ කියන්නේ. තමුන්නාන්සේලාට මේ වෙනුවෙන්ම, දැයට කිරුළ වෙනුවෙන් -මෙතුමා කිව්වා ප්‍රදේශයේ සංවර්ධනයත් එක්කම -[බාධා කිරීමක්]ඒක බොහොම හොඳයි. අපි නැහැයි කිව්වේ නැහැ නේ. [බාධා කිරීමක්] පාරවල් හැදුවා. හැබැයි සම්බුද්ධ ශාසනයට සලකලා තිබෙන්නේ මේ විධියටයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විශේෂයෙන්ම බස් ගාස්තු දිහා බැලුවාම පදවියේ මගියෙකුට කොළඹට එන විට අඩුම ගණනේ රුපියල් දාහක්වත් වියදම් වෙනවා. මේ වාගේ දුෂ්කර ප්‍රදේශවල ඉන්න භික්ෂූන් වහන්සේලාට පිරිවෙන් අධ්‍යාපනයට විතරක් නොවෙයි, බෙහෙත් හේත් ටිකක් ගන්න යන එන ගමන් තිබෙනවා. මම තමුන්නාන්සේට මතක් කරන්නේ, දායකයන්ගෙන් යැපෙන අය හැටියට ඒ අයට මේ ගමන් පහසුව ලබා දෙන්න පුළුවන් නම් ඒක ඉතාමත්ම මහඟු කාර්යයක් බවයි. ඒ නිසා මම විශේෂයෙන්ම මේ සභාවේදී තමුන්නාන්සේට කියන්නේ, බුද්ධ ශාසනය වෙනුවෙන් මේ කාර්යයට ආණ්ඩුවේ දායකත්වය ලබා දෙයි කියලා අපි විශේෂයෙන් බලාපොරොත්තු වෙන බවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි අනුරාධපුරයේ බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය තිබුණා. එහිදී එක ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ නමකට රුපියල් 13,000ක පමණ සිව් පසය ලබා දුන්නා. හැබැයි ඒ බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය 1987දී බුද්ධ ශ්‍රාවක විශ්වවිද්‍යාලය බවට පත් කළාට පසුව ඒ අයට ලැබෙන්නේ රුපියල් 2,000ක් විතරයි. මේ රුපියල් 2,000න් කරන්න දෙයක් නැහැ. ඒ භික්ෂූන් වහන්සේලාට දානමාන හදා ගන්න වෙන්නෙත් මේ රුපියල් 2,000න්. විශ්වවිද්‍යාලයෙන් කෝකියෙක් සහ ගෑස් ටික දෙනවා. එච්චරයි. මම දන්නවා සමහර දවස්වලට ඒ ස්වාමීන් වහන්සේලාගේ දාන වේලට සකස් කර ගන්න වෙන්නේ එක ව්‍යාඤ්ජනයකුයි, බතුයි විතරයි. මේ වාගේ දුෂ්කර ජීවිතයකුයි ඒ ස්වාමීන් වහන්සේලා ගත කරන්නේ. ඒ නිසා මම ආණ්ඩුවෙන් බොහොම ඕනෑකමින් ඉල්ලනවා මේ සම්බන්ධයෙන් අපිට සෑහීමකට පත් වෙන්න පුළුවන් පිළිතුරක් ලබා දෙන්න කියලා. අපේ ජෝන් අමරතුංග මැතිතුමාටත් අවස්ථාව ලබා දෙන්න තිබෙන නිසා තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙමින් මම නවතිනවා. බොහොම ස්තුතියි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිශයින්ම වැදගත් යෝජනාවක් තමයි අපේ ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා මේ සභාවට ඉදිරිපත් කළේ. අපට අහන්න ලැබුණා භික්ෂූන් වහන්සේලාට සහ ආගමික පූජකතුමන්ලාට මොන විධියේ ඉතිහාසයක් තිබුණාද කියන එක සහ ඒ ඉතිහාසය තුළ ආගමික පූජකතුමන්ලාට සහ විශේෂයෙන්ම භික්ෂූන් වහන්සේලාට තිබුණ සහන, ආධාර වාගේම අනුග්‍රහ මොනවාද කියන එක පිළිබඳව. මම කියන්නේ එවැනි අනුග්‍රහයක් - අවස්ථාවක්- බෞද්ධ භික්ෂූන් වහන්සේලාට ලබා දෙනවා නම් ආගමික පූජකතුමන්ලාටත් -මේ රටේ තවත් ආගම් කිහිපයක් තිබෙනවා. අපේ ක්‍රිස්තියානි ආගම, කතෝලික ආගම සහ තමුන්නාන්සේගේ ඉස්ලාම් ආගම තිබෙනවා. ඒ ආගමික පූජකතුමන්ලාටත්- ඒ සහනය ලබා දිය යුතුයි කියලා මම යෝජනා කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හින්දු පූජකවරු.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඔව්. විශේෂයෙන්ම අපේ කතෝලික පූජකතුමන්ලා, කන්‍යා සොහොයුරියන්, සහෝදරයන් අද ලංකාවේ විවිධ පළාත්වල සේවයේ යෙදෙනවා. සමහර අය ආගමික කටයුතුවල, තවත් සමහර අය සමාජ සේවා කටයුතුවල සහ අධ්‍යාපනික කටයුතු ආදී වශයෙන් විවිධ කටයුතුවල යෙදෙනවා. මේ පූජකතුමන්ලාටත් අද යාම ඒම විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. අපි කවුරුත් පිළිගන්න ඕනෑ අද ඉන්ධන මිල වැඩි වෙලා තිබෙනවාය කියන එක. එදා වාහනයක් පාවිච්චි කළා නම් අද ඒ වාහනය පාවිච්චි කරන්න දෙපාරක් හිතන්න වෙනවා. අනෙක් අතින් බස් ගාස්තු වැඩි වෙලා තිබෙනවා. ඒකත් යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීතුමා පැහැදිලි කරලා දුන්නා.

මේ හැම දෙයක් ගැනම අපි කල්පනා කරලා බලපුවාම දැහැමි සමාජයක් මේ රටේ ගොඩ නඟනවා නම් ඒ කාර්යයේ යෙදිලා ඉන්න පූජකතුමන්ලාට මේ සහනය ලබා දීම අතිශයින්ම යෝග්‍යයි කියා මම හිතනවා. මේ සහනය බෞද්ධ භික්ෂූන් වහන්සේලාට පමණක් නොවෙයි, කතෝලික පියතුමන්ලාට, ඒ වාගේම කතෝලික කන්‍යා සොහොයුරියන්ට, සහෝදරතුමන්ලාට, විශේෂයෙන්ම අධ්‍යාපන කටයුතුවල යෙදී සිටින පූජකතුමන්ලාට සහ අනෙකුත් ආගමික පූජකතුමන්ලාට -මවුලවිතුමන්ලාට- ලබා දිය යුතුයි කියලා මම යෝජනා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන්නේ තමුන්නාන්සේත් ඔය ආසනයේ ඉඳගෙනම ඒ ඉල්ලීම කරාවිය කියලායි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඉස්සර එහෙම ක්‍රමයක් තමයි තිබුණේ. සියලුම ආගම්වල ඉන්න දහම් පාසල් ගුරුවරුන්ට ඒ සහනය දුන්නා. එවැනි ක්‍රමයක් යොදන්න පුළුවන්. අපි ඒකට විරුද්ධ නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ ඔය ආසනයේ ඉඳගෙන ඔය කරන ඉල්ලීම සාධාරණයි. මම දන්නේ නැහැ, හින්දු පූජකතුමන්ලා ගැන. අපේ කතෝලික සභාවේ නම්, ඒ පූජකතුමන්ලා පිළිබඳව යම් කිසි පදනමක් තිබෙනවා. හැම කෙනෙකුටම ඒ පූජක පදවිය ලබන්නත් බැහැ. ඒ වාගේම කන්‍යා සොහොයුරියන්ගේ පදවිය හැම කෙනෙකුටම ලබන්නත් බැහැ. ඒ නිසා බොහොම පහසුවෙන්ම අපට හඳුනා ගන්න පුළුවන් වෙනවා, කාටද ඒ පහසුකම දිය යුත්තේ කියන එක. මම දන්නවා, අද මේ පිළිබඳව උත්තර දෙන්න ඉන්න ඇමතිවරු ස්ථිර වශයෙන්ම කියයි මෙක වහාම ලබා දිය යුතුයි කියලා. ඒ ගැන සැකයක් නැහැ. එහෙම නොකිව්වොත් ඒ අය ගමට යන්නේ කොහොමද කියන එක ගැන කියන්න මම දන්නේ නැහැ. ප්‍රශ්නයක් ඇති වෙන්න පුළුවන්. මම ප්‍රාර්ථනා කරනවා, එහෙම තත්ත්වයක් ඇති නොවේවා කියලා. ප්‍රවාහන ඇමතිතුමාත් ඇවිල්ලා ඉන්නවා. එතුමා බොහොම ආසාවෙන් ඉන්නවා, මේ ප්‍රශ්නයට උත්තරයක් දීලා ඒ පිං සියල්ලක්ම පමුණුවා ගන්න. එතුමා බොහොම සාධාරණ, යහපත් ජීවිතයක් ගත කරන ඇමතිවරයෙක්. මම දන්නවා, එතුමා ගැන. භික්ෂූන්වහන්සේලාට දෙන ඒ පහසුකමම කතෝලික පියතුමන්ලාටත්, කන්‍යා සොහොයුරියන්ටත් ඒ වාගේම අනෙකුත් ආගම්වල නිරත වෙලා ඉන්න පූජකතුමන්ලාටත් ලබා දේවිය කියා බලාපොරොත්තු වෙමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද යෝජනාව පිළිබඳව කථා කිරීමේදී ප්‍රශ්නය තිබෙන්නේ ඒ යෝජනාවේ හරය පිළිබඳව නොවෙයි. එම යෝජනාව ගෙන ඒමේ අවසාන අරමුණ භික්ෂූන් වහන්සේලාට ඒ පහසුකම ලබා දීමට වඩා යම් ආකාරයකින් රජයට පහර ගැසීමටය කියායි මම දකින්නේ. [බාධා කිරීමක්] එතුමා නොමිලේ බස්වල යන්න ඉඩ දෙන්න කියලා කියනවා. හැරිසන් මන්ත්‍රීතුමා කියනවා, බුද්ධ ශාසන අමාත්‍යාංශයේ වැඩ කටයුතු නියම විධියට සිද්ධ වෙලා නැහැ, දීපු මුදල් ප්‍රමාණය මදි, භික්ෂූන් වහන්සේලාට සලකනවා මදි කියලා. මේ විධියට තමයි මේ යෝජනාව ඉදිරිපත් කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකට තමයි කියන්නේ අනුන්ගේ මඟුල් ගෙවල්වල ගිහිල්ලා කෑම බෙදනවා කියලා. තමන් අවුරුදු ගණනක් බලයේ හිටියා. මේක මතක් වුණේ නැහැ. ඒ කාලයෙත් CTB එක තිබුණා. ඒ කාලයේ මේ පහසුකම් මොනවාවත් දුන්නේ නැහැ. අපේ ආණ්ඩුව ආවට පස්සේ මෙහෙම කියනවා. ඒක තමයි අනුන්ගේ මඟුල් ගෙවල්වල ගිහිල්ලා එතැන තිබෙන ඒවා බෙදලා දෙන්න හදනවාය කියන්නේ.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු ඇමතිතුමනි, බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨයේ 1984ට ඉස්සර වෙලා-

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මට කථා කරන්න දෙන්න කෝ. මේ බස් ප්‍රශ්නයට ඒක අදාළ නැහැ නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්නේ විපක්ෂයේ ඉන්න කොට මෙවැනි යෝජනාවක් ගෙන ඒමේ අරමුණ ගැනයි. ඊ ළඟට හෙට යෝජනාවක් ගෙනෙයි සියලුම වැන්දඹු කාන්තාවන්ටත් මේ පහසුකම දෙන්න ඕනෑ කියලා. ඊළඟට කියයි, සියලුම රණවිරුවන්ටත් දෙන්න ඕනෑ, සියලුම පාසල් ශිෂ්‍යයන්ටත් දෙන්න ඕනෑ කියලා. ඉතින් ඒ නිසා-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කිරීමට තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
රීති ප්‍රශ්නයක්. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු ඇමතිතුමා භික්ෂූන් වහන්සේලා සම කරන්නේ වැන්දඹු කාන්තාවන්ටයි. භික්ෂූන් වහන්සේලා සම කරන්නේ වැන්දඹු කාන්තාවන්ටයි. මොනවාද කියන්නේ ඇමතිතුමා?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
There is no point of Order in that. Hon. Minister, you carry on.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මේ විධියට දවසින් දවස දැන් එක්සත් ජාතික පක්ෂයට-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
I am seized of your point.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, give me the mike.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
You already stated what you want to say.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
දැන් එක්සත් ජාතික පක්ෂයට මාතෘකා නැති වේ ගෙන යන වෙලාවක්. මේ ඇති වෙන ආර්ථික සංවර්ධනය, අපේ ප්‍රගතිය මේවා යටපත්-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමාට point of Order එක ඉදිරිපත් කරන්න ඉඩ දෙන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order. Hon. Presiding Member, he cannot attribute a motive to me. ගරු ඇමතිතුමනි, මගේ හිතේ මොනවා තිබෙනවාද කියලා ඔබතුමා කොහොමද කියන්නේ? මම මේ කථා කරන්නේ යෝජනාව ගැනයි. මගේ හිතේ තිබෙන දේ ගැන ඔබතුමා කොහොමද කියන්නේ?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
තමුන්නාන්සේ යෝජනාවක් ගෙනාවම ඒ කාරණය ගැන විග්‍රහ කරන්න මට ඉඩ තියෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාවට අපේ විරුද්ධත්වයක් නැහැ. නමුත් මේ යෝජනාව ගෙනාපු ආකාරය, ඒකෙදී කරුණු ඉදිරිපත් කළ ආකාරය දිහා බලන්න. අපේ ජනාධිපතිතුමා මේ රටේ බුද්ධ ශාසනයේ පමණක් නොවෙයි, සෑම ආගමකම විරස්ථිතිය වෙනුවෙන් අති විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. ඒ සඳහා වැඩ කටයුතු රාශියක් කරලා තිබෙනවා. මල්වතු, අස්ගිරි ඇතුළු අනෙකුත් ප්‍රධාන විහාරස්ථාන පිළිබඳව බලන්න. ඒ වාගේම පූජා භූමි සංවර්ධනයට, ඒ වාගේම දහම් පාසල් සංවර්ධනයට, අනෙකුත් ආගම්වල දහම් පාසල් සංවර්ධනයට කටයුතු කර තිබෙන ආකාරය බලන්න. මේ ළඟදී මන්නාරම බිෂොප්තුමා ගෙන්වා විශාල මුදල් ප්‍රමාණයක් ලබා දුන්නා. මේ වාගේ සොච්චමක් නොවෙයි. ඒ අනුව පෙනෙනවා, අපේ රජය කවදාවත් ආගමික සංවර්ධනය අමතක කරලා නැහැ කියා. ඒ සඳහා අවශ්‍ය මුදල්, අවශ්‍ය ආධාර, අවශ්‍ය ගෞරවය හැම වෙලාවේම අපේ රජය විසින් ලබා දීලා තිබෙනවා. ඒක නිසා අපේ රජයට ඇඟිල්ල දිගු කරන්න පුළුවන්කමක් නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒ කියන්නේ මේ යෝජනාව පිළිගන්නවාද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඇමතිතුමා කිව්වා, ඒකට විරුද්ධ නැහැයි කියලා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
අපි ආගමික වැඩ කටයුතු අත හැර දාලා තිබෙනවා කියලා කිව්වා. එහෙම නැහැ. එවැනි වැඩ කටයුතු විශාල ප්‍රමාණයක් අපි කරලා තිබෙනවා. ඒ වාගේම බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය ගැන කිව්වා. එය විශ්වවිද්‍යාලයක් බවට පත් කළේ භික්ෂූන් වහන්සේලාගේ ඉල්ලීම පරිදියි. ඒක අපි බලෙන් කරපු දෙයක් නොවෙයි. එතකොට එය විශ්වවිද්‍යාලවල කටයුතුවලට අනුගත වෙන්නට ඕනෑ. ඒ වාගේම අද පිරිවෙන් අධ්‍යාපනය සඳහා විශාල මුදලක් ලබා දී තිබෙනවා. කවුද පිරිවෙන් ආචාර්යවරුන්ට මුදල් ගෙවන්නේ? පිරිවෙන් නඩත්තු කරන්නේ කවුද? ඒවා කරන්නේ රජයෙන්. එපමණක් නොවෙයි. අපේ රජය බුද්ධ ශාසනයේ විරස්ථිතිය සඳහා වැඩ පිළිවෙළ රාශියක් කරලා තිබෙනවා. ඒ වෙනුවෙන් විශාල වශයෙන් මුදල් වියදම් කරලා තිබෙනවා. විශේෂයෙන්ම ත්‍රස්තවාදීන්ගේ ග්‍රහණයට හසු වෙලා තිබුණු පන්සල්වල ස්වාමීන් වහන්සේලා නඩත්තු කිරීම සඳහා වැඩ පිළිවෙළ රාශියක් ක්‍රියාත්මක කළා. උන්වහන්සේලාට වාහන පවා ලබා දුන්නා. ආරක්ෂාව ලබා දුන්නා, සිවිල් ආරක්ෂක භටයෝ ලබා දුන්නා. ඒ විධියට ඒ ප්‍රදේශ ආරක්ෂා කිරීමේ විශාල වැඩ පිළිවෙළක් අපේ රජය මඟින් කරලා තිබෙන බව මතක් කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද උදේත් රාමක්‍රිෂ්ණන් ශාලාවේදී අපේ අගමැතිතුමා ආගමික ස්ථාන විශාල ප්‍රමාණයක් සඳහා; බෞද්ධ, හින්දු, මුස්ලිම්, ක්‍රිස්තියානි මේ කියන ආගමික ස්ථාන විශාල ප්‍රමාණයක් සඳහා විශාල මුදල් ප්‍රමාණයක් බෙදලා දුන්නා. ඒ නිසා මේ රජය කවදාවත් ඒ අංශය අමතක කරලා නැති බව කියන්නට ඕනෑ. මේ රජය ආගමික විරස්ථිතිය අමතක කරපු රජයක් නොවෙයි. ඒක නිසා එක කාරණයක් අරගෙන කථා කරන්න එපා. අනිත් එක, සම්බුද්ධත්ව ජයන්ති කාලය ඉවර වන වෙලාවේ තමයි එක්සත් ජාතික පක්ෂයට මේක මතක් වෙලා තිබෙන්නේ. සම්බුද්ධත්ව ජයන්තිය ආරම්භ කරපු වෙලාවේ යෝජනාවක් හැටියට මේක ගෙනෙන්න තිබුණා. මේ යෝජනාව ඒ අවස්ථාවේදී ගෙනාවා නම් ඒ වෙලාවේදීම අපට ඒ පිළිබඳව සලකලා බලන්න පුළුවන්කම තිබුණා. තව මාස තුනකින් ඒ සම්බුද්ධත්ව ජයන්ති කාලය අවසන් වෙනවා. මේ ගොල්ලෝ නිදා ගෙන ඉඳලා දැන් ඇස් ඇරිලා. මොකද, අද කථා කරන්න වෙන කාරණයක් නැහැ.

භික්ෂූන් වහන්සේලා සිවුපසය නැතිව ඉන්නවා කියලා කිව්වා. මම කියන්න කැමැතියි, මාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන මහවැලි ප්‍රදේශවල භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් ඒ පන්සල්වලට අපි කුඹුරු දීලා තිබෙන බව. අපේ ශ්‍රී ලාංකීය බෞද්ධ ජනතාව භික්ෂූන් වහන්සේලා බඩගින්නේ තියන ජනතාවක් නොවෙයි. ඒක නිසා උන්වහන්සේලා සිවුපසය නැතිව ඉන්නවා කියන කාරණය පිළිබඳව මම එකඟ වෙන්නේ නැහැ. ඒ වාගේ ස්ථාන තිබෙනවා නම් බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් විශේෂයෙන්ම ඒ පිළිබඳව සොයා බලා වැඩ කටයුතු කරනවා. අපේ අගමැතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත් භික්ෂූන් වහන්සේලාගේ පමණක් නොවෙයි, අනෙක් ආගමික පූජකවරුන්ගේත් අවශ්‍යතා පිළිබඳව සොයා බලනවා. ඒ සඳහා විශාල පිරිසක් අද බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශයට එනවා. අපි ඒ අවශ්‍යතාවන් ඉටු කරලා දෙනවා. ඒ නිසා මේ රජයට කිසිම ආකාරයකින් ඇඟිල්ල දිගු කරන්නට පුළුවන්කමක් නැහැ.

මේ වාගේ ක්‍රමයක් ඇති කිරීම සඳහා, මෙවැනි පහසුකමක් සලසා දීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම පිණිස අපි මේ යෝජනාව බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශයට ඉදිරිපත් කරන බව රජය වෙනුවෙන් ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු හුනෛයිස් ෆාරූක් මහතා**
(மாண்புமிகு ஹுனைஸ் பாறூக்)
(The Hon. Hunais Farook)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எமது நாட்டின் மேதகு ஜனாதிபதி அவர்கள் தனது ஆட்சிக் காலத்தில் சமய விடயங்களுக்காக - அது பௌத்த மதமாக இருக்கலாம், இஸ்லாம் மதமாக இருக்கலாம், கிறிஸ்தவ மதமாக இருக்கலாம், இந்து மதமாக இருக்கலாம் - எந்தவித பாகுபாடுமின்றி நிதி உதவி வழங்குகின்றார். குறிப்பாக மத ஸ்தாபனங்களைப் புனரமைத்தல் செயற்பாடுகளுக்கு அவர் பாரியளவில் நிதி ஒதுக்கீடுகளை மேற்கொண்டிருக்கிறார். நாங்கள் இஸ்லாம் மதத்தை எடுத்துக்கொண்டால், முஸ்லிம் சமய பண்பாட்டலுவல்கள் திணைக்களத்தில் பதிவு செய்யப்பட்டிருக்கின்ற அஹதியா பாடசாலைகள், பள்ளி வாசல்கள் என்பவற்றைப் புனரமைப்பதற்காக 2012ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டத்தில் விசேட நிதி ஒதுக்கப்பட்டிருந்ததை நாங்கள் காணக்கூடியதாக இருந்தது. அவ்வாறே, கடந்த வருடம் நானும் கௌரவ பிரதம அமைச்சர் அவர்களும் வவுனியா மாவட்டத்துக்குச் சென்று அங்குள்ள இந்து ஆலயங்களுக்கு தலா ஓரிலட்சம் ரூபாய் வீதம் வழங்கியது எனக்கு ஞாபகம் இருக்கின்றது. அதேபோல், கிளிநொச்சி, யாழ்ப்பாணம் ஆகிய மாவட்டங்களில் குறிப்பாக யுத்தத்தினால் பாதிக்கப்பட்ட மத ஸ்தலங்களைப் புனரமைப்பதற்கென விசேட நிதி உதவிகள் வழங்கப் பட்டிருக்கின்றன. யுத்த காலத்தில் காத்தான்குடி பள்ளிவாசல் பாதிப்புக்குட்பட்டதனால், விசேட நிதி ஒதுக்கீட்டின்மூலம் பல இலட்சம் ரூபாய் செலவில் அப்பள்ளிவாசலைப் புனர் நிர்மாணம் செய்வதற்கான வேலைத்திட்டங்கள் முன்னெடுக் கப்பட்டு வருகின்றன. ஏற்கெனவே கௌரவ அமைச்சர் அவர்கள் கூறியதுபோன்று இந்த நாட்டைச் சுதந்திரத்துக்குப் பின்னர் ஆட்சி செய்த எந்த அரசாங்கத்தோடு ஒப்பிட்டாலும் எமது மேதகு ஜனாதிபதி அவர்களின் அரசாங்கம்தான் பல்வேறு பாரிய வேலைத்திட்டங்களை முன்னெடுத்து வருவதைக் காணக்கூடியதாக இருக்கின்றது.

[ගරු හුනෛයිස් ෆාරුක් මහතා]

இவ்வாறான நல்ல பல விடயங்களை அரசாங்கம் முன்னெடுத்து வருகின்ற இவ்வேளையில், "பிக்குமாருக்கு அரச பஸ் மற்றும் புகையிரதங்களில் இலவசமாகப் பயணம் செய்வதற்குரிய வசதிகளைப் பெற்றுக்கொடுத்தல்" தொடர்பிலான முன்மொழிவை இன்று ஒத்திவைப்புப் பிரேரணையாகக் கொண்டுவந்திருப்பது உண்மையில் வரவேற்கத்தக்கது. அதேபோன்று எமது நாட்டிலுள்ள அஹதிய்யா பாடசாலைகளில் கடமையாற்றுகின்ற ஆசிரியர்கள், குர்ஆன் மத்ரஸாக்களில் கடமையாற்றுகின்ற மௌலவி ஆசிரியர்கள் - இஸ்லாம் மதத்தைப் போதிக்கின்ற ஆசிரியர்கள், இந்து மத போதகர்கள், கிறிஸ்தவ மத போதகர்கள் ஆகியோருக்கும் இச்சலுகை வழங்கப்படுதல் வேண்டும். இச்செயற்பாடானது மேதகு ஜனாதிபதி அவர்களின் இன, மத, மொழி பேதமற்ற செயற்பாடுகளுக்கு ஓர் முன்னுதாரணமாக அமையுமென நான் இச்சபையில் எடுத்துக்கூற விரும்புகின்றேன். இவ்வாறான நல்லதொரு பிரேரணை முன்வைக்கப்பட்டிருக்கின்ற இவ்வேளையில், நான் ஒரு வேண்டுகோளை விடுக்க விரும்புகின்றேன். அதாவது வட மாகாணத்தைப் பொறுத்தமட்டில் 1990ஆம் ஆண்டு வடக்கிலிருந்து முஸ்லிம்கள் ஒட்டுமொத்தமாக வெளியேற்றப் பட்டார்கள் என்பது அனைவரும் அறிந்த விடயமாகும். இன்று நாங்கள் புத்தளம் ஊடாக மன்னார் மாவட்டத்தை நோக்கிச் செல்லும்போது அங்குள்ள முஸ்லிம் கிராமங்களில் விடுதலைப் புலிகளால் அழிக்கப்பட்ட பள்ளிவாசல்களின் எச்சங்களைக் காணக்கூடியதாக இருக்கின்றது. உதாரணமாக மறிச்சுக்கட்டிக் கிராமத்தில் விடுதலைப் புலிகளால் சேதமாக்கப்பட்ட அழகான பள்ளிவாசலைப் பார்க்கின்றபோது, எங்களது மனம் கவலையில் ஆழ்கின்றது. இதேபோன்றுதான் வடக்கிலுள்ள அத்தனை பள்ளிவாசல்களும் விடுதலைப் புலிகளால் முற்றுமுழுதாக அழிக்கப்பட்டன என்று நான் நினைக் கின்றேன். அத்துடன் அந்தப் பள்ளிவாசல்களோடு காணப் பட்ட குர்ஆன் மத்ரஸா மற்றும் அரபு மத்ரஸாக்களும் அழிக்கப்பட்டன. எனவே, பிரதம அமைச்சர் அவர்கள் தலைமையிலான பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சு இவற்றைத் திருத்தியமைப்பதற்காக அல்லது மீள அமைப்பதற் காக நிதி ஒதுக்கீடு செய்து அதற்கான வேலைத்திட்டம் ஒன்றை நடைமுறைப்படுத்த வேண்டுமென்று நான் இந்தச் சபையிலே தாழ்மையாகக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
නන්‍රි. මීළඟට ගරු කුමාර වෙල්ගම ඇමතිතුමා.

**ගරු කුමාර වෙල්ගම මහතා (ප්‍රවාහන අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார வெல்கம - போக்குவரத்து அமைச்சர்)
(The Hon. Kumara Welgama - Minister of Transport)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු කිරිඇල්ල මන්ත්‍රීතුමා 2600 සම්බුද්ධත්ව ජයන්තිය ඉවර වෙන්න යන මේ මොහොතේ මෙවැනි යෝජනාවක් ගෙන ඒම ගැන මා පුදුමයට පත් වෙනවා. මොකද, අපේ ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා කිව්වා වාගේ මේ යෝජනාව හරි නම් ගේන්න තිබුණේ 2600 සම්බුද්ධත්ව ජයන්තිය පටන් ගන්න අවස්ථාවේදීයි. නැත්නම් ඊට ඉස්සෙල්ලායි. නමුත්, ඊට ඉස්සෙල්ලා මේ යෝජනාව ගෙනාවේ නැතිව අන්තිමට ගෙනාවේ ආණ්ඩුව අපහසුතාවට පත් කරන්නයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හොඳ බෞද්ධයෙක්. සැදැහැවත් බෞද්ධයෙක්. මම මේ ප්‍රවාහන අමාත්‍යාංශයේ ඇමතිකම භාර අරගෙන අවුරුදු දෙකක් වෙනවා. මීට ඉස්සෙල්ලා මා මේ අමාත්‍යාංශයේම නියෝජ්‍ය ඇමතිවරයා හැටියට කාලයක් හිටියා. මම ලංකාවේ සෑම තැනකම යනවා. කලුතර දිස්ත්‍රික්කය ඇතුළු හැම තැනම යනවා. දැන් කලුතර දිස්ත්‍රික්කයේ අපේ ගම්වල ගත්තොත්, ගරු ස්වාමීන් වහන්සේලා ඉන්නවා; කතෝලික පූජකතුමන්ලා ඉන්නවා; ඉස්ලාම් පූජකතුමන්ලා ඉන්නවා; හින්දු පූජකතුමන්ලා ඉන්නවා. මේ හැම කෙනකුම අපි මුණ ගැහෙනවා. විශේෂයෙන්ම දිස්ත්‍රික්කයේ ප්‍රධානියා හැටියට, සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා හැටියට නිතරම අපි මුණ ගැහෙනවා. නමුත් කිසිම කෙනෙක් මේ මොහොත වනකම් මෙවැනි යෝජනාවක් මට නම් ඉදිරිපත් කරලා නැහැ. දැන් මේක ගන්නේ තමුන්නාන්සේලා නොවෙයිනේ. මේක දෙන්න යන්නේ පූජකතුමන්ලාට. උන් වහන්සේලාගේ එහෙම අදහසක් තිබෙනවා නම් මම ප්‍රවාහන ඇමතිවරයා හැටියට මගෙන් pass එකක් ඉල්ලනවානේ. ගරු හැරිසන් මන්ත්‍රීතුමනි, මගෙන් pass එකක් ඉල්ලන්න ඕනෑ. ඉස්සර ඉල්ලනවානේ pass. දැන් බලන්න, අපේ ජනමාධ්‍යවේදීන් සමහර වෙලාවට pass ඉල්ලනවා. ඒ වාගේ pass එකක් ඉල්ලන්න පුළුවන්. නමුත් කවදාකවත්, කිසිම දවසක ආගමික පූජකතුමන්ලා එහෙම ඉල්ලලා නැහැ. ඉල්ලනවා නම් ඉල්ලන්න ඕනෑ මගෙන්. මගෙන් ඉල්ලුවා නම් මම pass එකක් දෙනවා. නමුත් මගෙන් ඉල්ලුවේ නැහැ. මම දන්නේ නැහැ, මොකද කියලා. දැන් මෙතුමන්ලා කියනවා බස් ගාස්තු වැඩි වුණාම අතේ සල්ලි නැහැ කියලා. එහෙම එකක් මට නම් පේන්න නැහැ. බස්වල යන අයගේ අඩුවක් මම දැකලා නැහැ. බස්වල යනවා. දැන් අපේ ආදායම දවසින් දවස, දවසින් දවස වැඩි වෙනවා මිසක් අඩු වෙන්නේ නැහැ. ඉතින් මම දන්නේ නැහැ, මෙය මේ ගරුතර පූජ්‍ය පක්ෂයත් එක්ක සාකච්ඡා කර ගෙනා යෝජනාවක්ද කියලා. මම නම් හිතන්නේ නැහැ- [බාධා කිරීමක්]

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු ඇමතිතුමනි, පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්ද?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
කියන්න.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ඔබතුමා බොහොම හොඳ බෞද්ධයෙක් හැටියටයි මා දකින්නේ. මහානායක ස්වාමීන් වහන්සේලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කළොත් මේ ගැන ඔබතුමා හොඳ ප්‍රතිචාරයක් දක්වනවාද?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මහානායක ස්වාමීන් වහන්සේලාට ඉල්ලීමක් කරන්න, ඒක එතැනට දමන්නේ දැන් තමුන්නාන්සේලානේ? ඇයි, තමුන්නාන්සේලා ඒ තත්ත්වයට වැටෙන්නේ? අපි කියන්නේ මහානායක ස්වාමීන් වහන්සේලාට උවමනා නම් එහෙනම් උන් වහන්සේලා ඉල්ලන්න එපායැ? එහෙම නම් උන් වහන්සේලා ඉල්ලන්න ඕනෑ. මේක මේ එක්සත් ජාතික පක්ෂය විපක්ෂයේ ඉන්න කොට තමයි ඉල්ලන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ එක්සත් ජාතික පක්ෂය අවුරුදු කීයක් බලයේ හිටියාද? ඒ එක කාලයකදීවත් මේ වාගේ යෝජනාවක් ගෙනාවාද? අපි ස්වාමීන් වහන්සේලාව නොමිලයේ යවන්න ඕනෑය කියලා. කවදාකවත් කළේ නැහැනේ. ප්‍රවාහන ඇමතිවරුන් හැටියට විජේපාල මෙන්ඩිස් මහත්තයා හිටියා; එම්.එච්. මොහොමඩ් මහත්තයා

හිටියා; මාරපන මහත්තයා හිටියා. දැන් එහෙනම් මේ සත්ක්‍රියාව, තමුන්නාන්සේලා මේ ඉල්ලන ඉල්ලීම ඇයි, එදා මතක නැති වුණේ?

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
එදා අපි දුන්නා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
කොහේද දුන්නේ?

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ආරණ්‍ය ස්වාමීන් වහන්සේලාට කූපන් ක්‍රමයට බස්වල යන්න අවස්ථාව දීලා තිබුණා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
එහෙම කූපන් ක්‍රමයක් තිබුණේ නැහැ. දැන් අපි දීලා තිබෙනවා, සියයට 20ක වට්ටමක්, ඕනෑම පූජකවරයෙකුට. බුද්ධාගමේ විතරක් නොවෙයි, ක්‍රිස්තියානි ආගමේ විතරක් නොවෙයි, මුස්ලිම් ආගමේ විතරක් නොවෙයි, ඕනෑම ආගමක කෙනකු බස් එකේ යන්න pass එකක් ගන්නවා නම් අපි සියයට 20ක වට්ටමක් දීලා තිබෙනවා. අපි මේක නිකුත් කරලා තියෙන්නේ, 2011 අංක 01 දරන ශ්‍රී ලංගම ධාවන කොට්ඨාස චක්‍රලේඛනයෙන්.

ඒ චක්‍රලේඛනය අනුව අපි සියයට 20ක වට්ටමක් දීලා තිබෙනවා. ඒ අනුව ඕනෑම ස්වාමීන් වහන්සේ කෙනකුට ලංකාවේ ඕනෑම තැනකට යන්න පාස් එකක් ගන්න පුළුවන්. අපි ඒකට සියයට 20ක වට්ටමක් දීලා තිබෙනවා.

ලංගම කියන්නේ ලාභ ලබන ආයතනයක් නොවෙයි කියලා තමුන්නාන්සේලා දන්නවා. ලංගමයේ ප්‍රශ්න ගොඩයි. ලංගමයේ ගොඩක් ප්‍රශ්න තිබෙනවා. මම මේ කථා කරන්නේ මේ යෝජනාවට විරුද්ධව නොවෙයි. මම කියන්නේ ලංගමය කියන ආයතනය ඉතාම අමාරුවෙන් ගෙන යන ආයතනයක් බවයි. අපි ඇත්ත කථා කරනවා නම්, ලංගම සේවකයන්ගේ පඩි අඩුයි. නමුත් ඒ ගොල්ලන් වැඩ කර ගෙන යනවා. ඒ ගොල්ලන් ලංගමයට ආදරෙයි. සියයට 20ක වට්ටමක් ලබා දෙන එකත් ඒ වාගේ බොහොම අමාරුවෙන් පවත්වා ගෙන යන ආයතනයකට මහා ලොකු දෙයක්. දැන් පෞද්ගලික බස් රථවලින් ඒ විධියට දෙනවාද? ඒක මට පොඩ්ඩක් කියන්න. මේ රටේ පෞද්ගලික බස් රථ 20,000ක් ධාවනය වනවා. අපි ධාවනය කරන්නේ බස් රථ 5,000යි නේ. පෞද්ගලික බස් රථ 20,000ක් තිබෙනවා. එහෙම නම් මේ යෝජනාව පෞද්ගලික බස් රථවලටත් ගේන්න ඕනෑ කියලයි මම හිතන්නේ. මොකද, ඒ ගොල්ලන් සහ අපි එකඟ වෙලා තිබෙන ආකාරයට පෞද්ගලික බස් රථ සියයට 60ක් ධාවනය වන විට, ලංගම බස් රථ ධාවනය කරන්න පුළුවන් සියයට 40යි. අපි මේ ගැන එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා. එහෙම නම් ශ්‍රී ලංගමට විතරක් නොවෙයි, දුම්රියට විතරක් නොවෙයි, තමුන්නාන්සේලා පෞද්ගලික අංශයටත් මේ යෝජනාව ඉදිරිපත් කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා. එම නිසා-

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
පෞද්ගලික බස් රථ ඇමතිවරයෙක් ඉන්නවා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මේ යෝජනාවේ තිබෙන්නේ පෞද්ගලික අංශයක් ගැන නොවෙයි නේ. මේ යෝජනාවේ තිබෙන්නේ ශ්‍රී ලංගම සහ දුම්රිය දෙපාර්තමේන්තුව කියලායි.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ඒක වෙනම ඉදිරිපත් කරන්න ඕනෑ නැහැ. ඔබතුමාට පුළුවන් ඒ ඇමතිතුමා එක්ක සාකච්ඡා කරලා ඒක ක්‍රියාත්මක කරන්න.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
නැහැ, නැහැ. තමුන්නාන්සේලාගේ ඉල්ලීම ගැන නේ මම කියන්නේ. මේකෙන් ආණ්ඩුවට පහර ගහන්න හදනවාය කියන එක ඒකෙන් තේරෙනවා නේ. අර පුයිවට් බස්කාරයා ගැන හිතුවේ නැහැ. එහෙම නම් ඒ අය ගැනත් හිතන්න එපායැ. පුයිවට් බස්කාරයා ගැන හිතුවේ නැහැ, ආණ්ඩුවට පහර ගහන්න ඕනෑ නිසා ලංගමයි, දුම්රියයි දැම්මා. ඒකෙන්ම තේරෙනවා නේ. මෙහෙම නම් කවදාවත් බලයට එන්න බැහැ නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා කියනවා පෞද්ගලික අංශයෙන් ඉල්ලුවේ නැහැයි කියලා. නමුත් බෞද්ධාගමට ප්‍රමුඛස්ථානයක් දෙනවාය කියලා අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වෙලා තිබෙන බව ඔබතුමා දන්නවා. එතකොට රාජ්‍ය අනුග්‍රහය තමයි අවශ්‍ය වන්නේ. වැදගත් වන්නේ රාජ්‍ය අනුග්‍රහයයි. භික්ෂූන් වහන්සේලාට, සම්බුද්ධ ශාසනයට අවශ්‍ය වන්නේ රාජ්‍ය අනුග්‍රහයයි. මම මේ කථා කරන්නේ රාජ්‍ය අනුග්‍රහය ගැනයි.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
එතකොට දැන් භික්ෂූන් වහන්සේලාට රාජ්‍ය අනුග්‍රහය ලැබෙන්නේ නැද්ද? මට ඒක ගැන කියන්න. දැන් මේ රජයෙන්-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒක අපි වෙනම දවසක කථා කරමු. දැන් අපේ යෝජනාව ගැන කථා කරමු කෝ. යෝජනාවේ පෞද්ගලික අංශය ගැන නැහැ නේ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
නැහැ, නැහැ.දැන් රාජ්‍ය අනුග්‍රහය ගැන මට කිව්වේ තමුන්නාන්සේ නේ. මම අහන්නේ-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
රජයට අයත් ලංගම. රජයට අයත් දුම්රිය. මම කථා කරන්නේ රාජ්‍ය අනුග්‍රහය ගැනයි.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
රජයට අයත් ලංගම, රජයට අයත් දුම්රිය ඇති. හරි. නමුත් පෞද්ගලික අංශයේ අයත් සල්ලි හම්බ කරනවා නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා යෝජනාවෙන් පිට කථා කරන්නේ. ඒකයි මම කියන්නේ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
නැහැ, යෝජනාවෙන් පිට නොවෙයි මම මේ කථා කරන්නේ.මම මේ කියන්නේ ද්වේශ සහගතව මේ ගැන බලන්න එපා කියලායි.[බාධා කිරීමක්]නැහැ, ද්වේශ සහගතව මේ ගැන බලන්න එපා. මොකද, මේක-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේකත් මතක් කරන්න ඕනෑ. රජය දුන්නොත්, පෞද්ගලික අංශයත් ඒක අනුගමනය කරයි.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
තමුන්නාන්සේ ඒක දන්නේ කොහොමද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම දන්නවා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
දැන් තමුන්නාන්සේම මෙතැන දී කිව්වා, තමුන්නාන්සේගේ හිත කියවන්නේ කොහොමද කියලා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නැහැ, රජය දුන්නොත්; රාජ්‍ය අනුග්‍රහය දුන්නොත් පෞද්ගලික අංශයත් ඒකට පෙළ ගැහෙනවා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඔහොම ඉන්න, මම කියන්නම්. දැන් ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා යමක් කියන කොට, ඔබතුමා කිව්වා"ඔබතුමා කොහොමද මගේ හිත ගැන කියන්නේ" කියලා. දැන් ඒකම මම තමුන්නාන්සේගෙන් අහනවා. ඒ නිසා වැරදි විධියට, රජය අපහසුතාවට පත් වන විධියට හැම දෙයක් ගැනම බලන්න එපා. මොකද, විශේෂයෙන්ම හාමුදුරුවරු -

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
නැහැ, මේක රජය ජනප්‍රිය වන වැඩක්.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
නැහැ, නැහැ. රජය ජනප්‍රිය වෙලා තිබෙන්නේ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මේකෙන් රජය අපහසුතාවට පත් වන්නේ කොහොමද? භික්ෂූන් වහන්සේලා සහ පූජකවරුන් ඇතුළු සියලුම ආගමික නායකයන්ට එවැනි අවස්ථාවක් දුන්නාම ඔබතුමන්ලා ජනප්‍රියත්වයට පත් වනවා. අපි තමුන්නාන්සේලාව ජනප්‍රිය කරවන්න යෝජනාවක් තමයි ගෙනැල්ලා තිබෙන්නේ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මම හිතන්නේ මේ රජය තරම් ජනප්‍රිය රජයක් මේ ශ්‍රී ලංකාවේ කවදාවත් තිබිලා නැහැ. ඩඩ්ලි සේනානායක මහත්තයාගේ පාලන කාලයත් අපි දන්නවා. ජේ.ආර්. ජයවර්ධන මහත්තයාගේ පාලන කාලයත් දන්නවා. ප්‍රේමදාස මහත්තයාගේ පාලන කාලයත් දන්නවා. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහත්තයාගේ පාලන කාලය නම් මතක නැහැ. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ පාලන කාලයත් දන්නවා. මේ විධියට දිගටම බලා ගෙන ආවොත් අපේ අතිගරු ජනාධිපතිතුමාගේ රජය එන තෙක්ම කාලය අපි දන්නවා. මම හිතන විධියට; මම ලබා තිබෙන අත්දැකීම අනුව; මම අහලා තිබෙන විධියට; මම දැකලා තිබෙන විධියට මේ ආණ්ඩුව තරම් -අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව තරම් - ජනප්‍රිය ආණ්ඩුවක් මේ රටේ කවදාවත් තිබිලා නැහැ. එතුමා තරම් ජනප්‍රිය පුද්ගලයෙක් මේ රටේ ආණ්ඩුවල කවදාවත් ඉඳලා නැහැ.

මේ කල් තැබීමේ යෝජනාවේ තිබෙන්නේ භික්ෂූන් වහන්සේලා ගැන නේ. භික්ෂූන් වහන්සේලා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට හරි ආදරෙයි. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඉන්න මම කියන්නම්. භික්ෂූන් වහන්සේලාට රජයට අයත් බස්වල හා රජයට අයත් දුම්රිය සේවා මැදිරිවල නොමිලේ ගමන් කිරීමේ අවස්ථාව දුන්නා හෝ නොදුන්නා කියලා භික්ෂූන් වහන්සේලා මේක ගැන අහන්නේත් නැහැ. මේක තමුන්නාන්සේලා බලෙන් පටවන්න යන දෙයක්.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
එහෙම දේවල් ඉල්ලන්නේත් නැහැ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මෙහෙම දේවල් භික්ෂූන් වහන්සේලා ඉල්ලන්නේත් නැහැ. අපේ භික්ෂූන් වහන්සේලාට සල්ලි තියෙනවා. සල්ලි නැහැයි කියලා කියන්න බැහැ නේ. සල්ලි තියෙනවා. තමුන්නාන්සේලාට කාලා ඉන්න බැරි මෙන්න මේකයි. මොකද මේ භික්ෂූන් වහන්සේලා සියයට 95ක්ම මහින්ද රාජපක්ෂ මහත්තයාට ඉතාම ලැදියි; ආදරෙයි. ඒක අපි දන්නවා. කතෝලික පියතුමන්ලාත් එහෙමයි. බේරුවලට ගියොත් අපේ මවුලවි, අපේ ඉස්ලාම් පූජකතුමාත් එහෙමයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මවුලවිවරු.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

බලන්න, කොච්චර ආදරෙයිද කියලා. අපේ ජනාධිපතිතුමාගෙන් මේවා කිසි දෙයක් ඉල්ලන්නේ නැහැ නේ. එතුමා ගියාම අත් දෙක අල්ලාගෙන බොහොම ආදරයෙන් කථා කරනවා. ඕක කඩන්න නේ තමුන්නාන්සේලා හදන්නේ. මේ වාගේ පුහු යෝජනා ගෙනැල්ලා, මේ වාගේ බාල යෝජනා කරලා ඕවා කඩන්න බැහැ. මීට වැඩිය ගොඩක් දේවල් තියෙනවා, තමුන්නාන්සේලාට කරන්න. අපි විපක්ෂයේ ඉන්න කාලයේ ගොඩක් දේවල් කළා නේ. මහින්ද රාජපක්ෂ මහත්තයා විපක්ෂයේ ඉන්න කාලයේදීත් ගොඩක් දේවල් කළා නේ. අන්න ඒවා ඉගෙන ගන්න. අන්න ඒ විධියට යන්න. මොකක්ද මේ? අරගේ යනවා. එතැන පොඩ්ඩක් ඉන්නවා. විනය පරීක්ෂණ දානවා. සජිත් ප්‍රේමදාස මහත්තයා එක පැත්තක්. දයාසිරි ජයසේකර මහත්තයා තව පැත්තක්. ලක්ෂ්මන් කිරිඇල්ල මහත්තයලා තව පැත්තක්. රනිල් මහත්තයා තව පැත්තක්. එහෙම වෙන්න දෙන්න එපා. මේ විපක්ෂය හොඳ වැදගත් විපක්ෂයක්. මේ රටේ පිළිගත්ත විපක්ෂයක්, එක්සත් ජාතික පක්ෂය කියන්නේ. ලංකාවේ තිබෙන හොඳම පක්ෂ දෙක තමයි එක්සත් ජාතික පක්ෂයයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි. මේ දෙකම නැති වෙච්ච දවසට තමුන්නාන්සේලා හිතන්න පුළුවන් රටට යන කල දසාව ගැන. ඉතින් මේ පක්ෂ දෙකම තියෙන්න ඕනෑ. අපි ආසයි මේ පක්ෂ දෙකම තියෙනවාට. තමුන්නාන්සේලා මේ වාගේ යෝජනා ගෙනෙන්න ඉස්සෙල්ලා මේ පක්ෂය ඇතුළේ සමගිය ඇති කර ගන්න කෝ. මොකද අපිත් බලාගෙන ඉන්නවා එක්සත් ජාතික පක්ෂය යම් කිසි හොඳ වැඩ පිළිවෙළක් ගෙනේවි කියලා. ඒක නිසා මේ යෝජනාව ගැන අපි සලකලා බලනවා.

දැන් අපේ ගරු සභානායකතුමා කිව්වා වාගේ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය කියලා වෙනම අමාත්‍යාංශයක් තියෙනවා නේ. ඒ යටතේ ජනාධිපතිතුමාගේ උපදේශක කාරක සභාවක් තියෙනවා, බුද්ධ ශාසන හා ආගමික කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව නමින්. විශේෂයෙන් ආගම් සම්බන්ධව. බුද්ධ ශාසන හා ආගමික කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේදීත් කථා කරලා, තීන්දු කරලා නායක හාමුදුරුවරුන් එක්ක කථා කරලා, රදගුරුතුමන්ලා එක්ක කථා කරලා මේ යෝජනාව ගෙනාවාම අනේ අපි අත් දෙකම උස්සනවා. මේ අත් දෙකම උස්සනවා. මේ යෝජනාව තමුන්නාන්සේලා ගෙනාවේ ඒකට නොවෙයි. තමුන්නාන්සේලා මේක ගෙනාවේ අපිව අමාරුවේ දාන්න. හැබැයි, ගරු හැරිසන් මන්ත්‍රීතුමා නම් එහෙම නැහැ. හැරිසන් මන්ත්‍රීතුමා අපි දන්න බොහොම හොඳ කෙනෙක්. කිරිඇල්ල මහත්තයාත් ඉතින් අපි එක්ක නේ හිටියේ. ඒක නිසා කිරිඇල්ල මහත්තයා ගැනත් අපි දන්නවා.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

එතුමා තමුන්නාන්සේව අමාරුවේ දාන්නේ නැහැ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

නැහැ, නැහැ. මාව අමාරුවේ දාන්නේ නැහැ. මාව කොහේ අමාරුවේ දාන්නද? මම pavement එකේ ඉන්න නිකම් සාමාන්‍ය මිනිහෙක්. මාව අමාරුවේ දාන්න බැහැ. මම සාමාන්‍ය ජීවිතයක් ගත කරන මනුස්සයෙක්. මම කිව්වේ මේ වාගේ දේවල් ගෙනැල්ලා රජය අපහසුතාවට පත් කරන්න එපා කියලායි. මේකෙන් රජය අපහසුතාවකට පත් වෙන්නේ නැහැ. ඇත්තටම අපහසුතාවකට පත් වෙන්නේ නැහැ. තමුන්නාන්සේලා ඒ මුවාවෙන්, ඒ අදහසින් ගෙනාවත් කවදාවත් මේකෙන් රජය අපහසුතාවට පත් වෙන්නේ නැහැ. මේවා සාමාන්‍යයෙන් අපේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා අරන් පැත්තකින් තියයි. මේ රටේ මෙච්චර දේවල් තියෙද්දී මේක මේ මහින්ද මහත්තයා අමාරුවේ දාන්න විපක්ෂයෙන් ගෙනෙන දෙයක්. බලන්න, කොහොමද යුද්ධය අවසන් කළේ කියලා? යූඑන්පී එකේ රංජන් විජේරත්න මහත්තයාගේ කාලයේ, ප්‍රේමදාස මහත්තයාගේ කාලයේ, ජේ.ආර්. ජයවර්ධන මහත්තයාගේ කාලයේ මේ යුද්ධය කළා නේ. අපට මතකයි, එක කාලයක් අපේ ගමේ හිටපු ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා ජාතික ආරක්ෂක අමාත්‍යවරයා හැටියට යුද්ධය බොහොම හොඳට කරගෙන ආවා. නමුත් යුද්ධය නැවැත්තුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ ගැන දන්නවා ඇති. ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා අපේ ගමේ. ඇතුලත්මුදලි මහත්තයාට අපි අදත් ගරු කරනවා. යුද්ධය අතරමඟ නැවැත්තුවා. මේ යුද්ධය දිනන්න බැහැ කියලා මුළු ලෝකයම කිව්වා නේ. ප්‍රභාකරන් ගැන නිකම් ශක්‍ර දේවේන්ද්‍රයා වාගේ කථා කළේ; ශක්‍ර දේවේන්ද්‍රයා වාගේ. අන්තිමට අපේ ජනාධිපතිතුමායි, අපේ රණ විරුවෝයි ඔක්කොම එක්කහු වෙලා මේ යුද්ධය අවසන් කළා නේ.

ඇමෙරිකාවටවත් තවම බැරි වුණා නේ ඒ දෙය කරන්න. ඉන්දියාවට පුළුවන් වුණාද? ඉන්දියාවේ කොච්චර ප්‍රශ්න තිබෙනවාද? ඉන්දියාවටත් බැරි වුණා. නමුත් ජනාධිපතිතුමා එතුමාගේ පින් බලයෙන් යුද්ධය අවසන් කළා. එතුමා කොහේ හරි තැනකට ගිහින් සිට ගත්තාම එතුමාගේ ඇඟෙන් රශ්මිය විහිදෙනවා. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුනි, දැන් තමුන්නාන්සේලා කොච්චර කෑ ගැහුවත් ජනාධිපතිතුමා දැක්කාම ළඟට ගිහිල්ලා එතුමාගේ අත් දෙකම අල්ලා ගන්නවා. මම ඒක දැකලා තිබෙනවා. මෙතුමන්ලා කොච්චර කෑ ගැහුවත් එහෙමයි කරන්නේ. අපට වැඩිය ඔබතුමන්ලා තමයි ගිහින් එතුමාගේ අත් දෙක අල්ලා ගන්නේ. අපි ටිකක් පස්සට වෙලා ඉන්නවා. විපක්ෂයේ මෙතුමන්ලා ගිහිල්ලා ජනාධිපතිතුමාගේ අත් දෙකම අල්ලා ගන්නවා. ඒක තමයි එතුමාගේ පින් බලය; එතුමාගේ ඇඟෙන් විහිදෙන රශ්මිය. ඒක කවදාවත් නැති කරන්න බැහැ.

අපේ ගරු සභානායකතුමා කිව්වා වාගේ අප මේක බුද්ධ ශාසන අමාත්‍යාංශයට ඉදිරිපත් කරලා එතැනින් අපිට කරන්න පුළුවන් මොකක්ද කියලා බලමු. නැතිව අප මේ යෝජනාව කුණු කූඩයට විසි කරන්නේ නැහැ. ඒ වාගේම ලංගමය දියුණු කරන්නත් තමුන්නාන්සේලාගේ සම්පූර්ණ සහයෝගය දෙන්න. ඒකේ හුළං අරින්න ලෑස්ති වන්න එපා; බස් ගිනි තියන්න ලෑස්ති වන්න එපා බස්වල වීදුරු කඩන්න ලෑස්ති වන්න එපා. මොකද ඒවායේ වීදුරු කැඩුවාම අන්තිමට ඒවා හදන්න අපට සල්ලි යනවා. ඒවා නවත්වලා මේ සේවාව දියුණු කරන්න තමුන්නාන්සේලාගේ අශිර්වාදය ලබා දෙන්න. මොකද මේ යෝජනාවෙන් ඉල්ලා තිබෙන්නේත් ලංගමයයි, දුම්රියයි තුළ භික්ෂූන් වහන්සේලාට නොමිලේ යන්න දෙන්න කියලා නේ. එහෙම නම් ඉතින් ලංගමයටත් තමුන්නාන්සේලාගේ පූර්ණ ආශිර්වාදය දීලා ලංගමය ගොඩ ගන්න තමුන්නාන්සේලාගේ සම්පූර්ණ ශක්තිය, ධෛර්යය කුමාර වෙල්ගමට දෙන්නය කියා ඉල්ලා සිටිමින්, සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.32ට, අද දින සභාසම්මතිය අනුව 2012 මාර්තු 08 වන බ්‍රහස්පතින්දා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 6.32 மணிக்கு பாராளுமன்றம், இன்றைய தீர்மானத்திற்கிணங்க 2012 மார்ச் 08, வியாழக்கிழமை பி.ப.1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 6.32 p.m. until 1.00 p.m. on Thursday, 08th March, 2012, pursuant to the Resolution of Parliament of this Day.*

## ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

1 වන ප්‍රශ්නය - 1759/'11
2 වන ප්‍රශ්නය - 1760/'11
3 වන ප්‍රශ්නය - 1761/'11
4 වන ප්‍රශ්නය - 1762/'11
5 වන ප්‍රශ්නය - 1763/'11
6 වන ප්‍රශ්නය - 1764/'11
7 වන ප්‍රශ්නය - 1765/'11
8 වන ප්‍රශ්නය - 1766/'11
9 වන ප්‍රශ්නය - 1767/'11
10 වන ප්‍රශ්නය - 1768/'11
11 වන ප්‍රශ්නය - 1769/'11
12 වන ප්‍රශ්නය - 1770/'11
13 වන ප්‍රශ්නය - 1771/'11
14 වන ප්‍රශ්නය - 1772/'11
15 වන ප්‍රශ්නය - 1773/'11
16 වන ප්‍රශ්නය - 1774/'11

ලිඛිත පිළිතුරු අපේක්ෂාවෙන් ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා විසින් අසා ඇති අද දින න්‍යාය පත්‍රයේ සඳහන් ඉහත අංක දරන ප්‍රශ්නවලට පිළිතුරු දීමට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍ය ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා සති දෙකක් කල් ඉල්ලා ඇත.

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

**சந்தா ;** ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.